100/2

# සපරගමු

LIBRARY
06 MAY 1996
Sabaragamuwa University

සංස්කාරකවරු:

මාහල්ලේ විපුලතිස්ස හිමි
අමුතාගොඩ ඉන්දරතන හිමි

ප්‍රකාශනය:

සපරගමු මහා සංඝ සභාව

# සපරගමු

LIBRARY
13 MAY 1996
Sabaragamuwa University

සංස්කාරකවරු:

මාහල්ලේ විපුලතිස්ස හිමි
(B. A., M. A. රාජකීය පණ්ඩිත)

අමුනාගොඩ ඉන්දරතන හිමි
(B. A., Dip. in Ed., M. Ed.)

ප්‍රකාශනය:

සපරගමු මහා සංඝ සභාව

නිකුත් වීම:
1995 ඔක්තෝබර්

ISSN 1391 - 1457

මුද්‍රණ අධීක්ෂණය:
අසෝක බටදූවආරච්චි

මුද්‍රණය:

සීමාසහිත 'දීපානී' මුද්‍රණ / ප්‍රකාශන (පෞද්ගලික)
464, හයිලෙවල් පාර,
ගංගොඩවිල - නුගේගොඩ
දුර ඇමතුම: 852530

# සභාපති මණ්ඩලයෙන්...

ආදි මානවයා, බලංගොඩ මානවයා වැනි පුරාවිද්‍යාත්මක අගයන්ගෙන් යුත් සාධක තිබීම, සොබා දහමේ ආශීර්වාදය ලැබූ වැසි වනාන්තර ආදිය සුරක්ෂිත වී පැවැතීම, ශ්‍රීපාදස්ථානය වැනි බෞද්ධ පූජනීය ස්ථාන පිහිටීම ආදිය නිසා ජගත් කීර්තියට පත් ප්‍රදේශයක් ලෙස "සපරගමු" පළාත ශ්‍රී ලංකාවේ පළාත් අතර විශිෂ්ටත්වයෙන් කැපී පෙනෙන්නකි.

ශාසන පරිහානිකර සමයේ බෞද්ධ පොත්පත් හා ඒවා රැක ගත් ගණින්නාන්සේලාගේ තත්ත්වයට පිරිහී ගියේ නමුදු භික්ෂු ශාසනය සුරැකීමේ ගෞරවයේ වැඩි කොටසක් සපරගමුවට හිමි වේ. සරණංකර සංඝරාජ හිමියන්ගෙන් පසු ශාසනික හා ධාර්ම ශාස්ත්‍රීය සේවාවන් පුනර්ජීවනය ලබමින් දියුණු තත්ත්වයට පත් කිරීමෙහි ලා සපරගමු භික්ෂූන් වහන්සේලා ඇතුළු ගිහි වියතුන්ගෙන් ද සිදු වූයේ අමිල සේවයකි.

මෙබඳු පසුබිමකින් යුතු සපරගමු ප්‍රදේශයේ අප වර්තමාන බුදුසසුන හා සිංහල ජාතිය මුහුණ පා ඇති අර්බුදකාරි පරිසරය තුළ භික්ෂු ශාසනයේ ඒකරාශී වීම අත්‍යවශ්‍ය කරුණක් ව පවතින හෙයින් එහි පළමු පියවර ලෙස ශ්‍යාමෝපාලි වංශික නිකායත්ත සියළු පාර්ශ්වයන්හි භික්ෂු මහා සංඝයාගේ එකමුතුවක් ගොඩ නැඟීම සඳහා පළාතේ ඒ ඒ පාර්ශවයන්හි සියළු සංඝනායක මහාස්ථවිරයන් වහන්සේලා රැස්වී ශ්‍රී බුද්ධ වර්ෂ 2538 වප් පුර අටවක ද (පොදු වර්ෂ 1994 ඔක්තෝබර් 11 වන දින) රත්නපුර ශ්‍රී සද්ධර්මාලංකාර සුධර්මශාලා විහාරස්ථානයේ දී "සපරගමු මහා සංඝ සභාව" නමින් සංවිධානයක් පිහිටුවා ගත්තෙමු. එයින් අපේක්ෂිත ශාසනික හා ජාතික අරමුණු අපමණ ය. දැනටමත් ඒ අතින් සෑහෙන කාර්‍ය්‍ය භාරයක් අප සංඝ සභාව මඟින් සිදු කරමින් පවතී. ඉදිරියේ දී කළ යුතු

අතිවිශාල කාර්ය භාරයක් අප සතුව ඇත. ඒ සඳහා ඔබ සැමගේ ප්‍රබුද්ධ අවධිය අප අපේක්ෂා කරන අතර එහි පළමුවන සංවත්සරය නිමිති කොට මෙවැනි ධර්ම, ශාස්ත්‍රීය සංග්‍රහයක් නිකුත් කිරීමට ලැබීම අප සැමගේ අමන්දනන්දයට හේතු වේ.

වෙහැල්ලේ ධම්මපාල නායක ස්ථවිර (මල්වතු පාර්ශවය)
කවුඩුවාවේ සංඝරතන නායක ස්ථවිර (අස්ගිරි පාර්ශවය)
තෙපුලංගොඩ පඤ්ඤානන්ද නායක ස්ථවිර (කෝට්ටේ පාර්ශවය)
දියපොට විජිත මහානායක ස්ථවිර (වනවාසී පාර්ශවය)
මුද්දුවේ පඤ්ඤාසේකර නායක ස්ථවිර
හඳපාන්ගොඩ විමල නායක ස්ථවිර
තලාවේ සුමනතිස්ස නායක ස්ථවිර
හත්තැල්ලේ චන්දරතන නායක ස්ථවිර
බලංගොඩ මේධානන්ද නායක ස්ථවිර
ආගරේගම ඤාණිස්සර නායක ස්ථවිර

## මේ ගැන....

ලොව ආගමික ඉතිහාසයෙහි තම සසුන එහි සාමාජිකයන් අතරත සමගිය ඇතිතාක් කල් ස්ථිරසාර ව පවතී ය යි ප්‍රකාශ කරමින් පිහිටුවන ලද ආයතනයක් ඇත්නම් ඒ බුදුරජුන් විසින් පිහිටුවන ලද සංඝ සංස්ථාව යි. මේ සංඝ සංස්ථාව තුළට පිවිසි සෑම සාමාජිකයකුගේ ම ප්‍රත්‍යෙක හා සංස්ථාගත පාරිශුද්ධිය නිරන්තරයෙන් ම සුරක්ෂිත ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය (පාරිසුද්ධිං පනායස්මන්තො පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා) විනය ප්‍රඥප්තීන් සමූහයක් ම උන්වහන්සේ විසින් පෙන්වා දී ඇත. ප්‍රජා තාන්ත්‍රික මූලික හරයන් යටතේ උන්වහන්සේ විසින් ගොඩ නංවන ලද මේ භික්ෂු ශාසනය යට කී සමගියත් පාරිශුද්ධියත් සිය සංස්ථාව තුළ සුරක්ෂිත කර ගැනීම සඳහා තත්කාලීන ශාසන භාරධාරී මහතෙරවරුන් විසින් ඇතැම් විට සියවසක් හමාරක් තුළ දෙතුන් අවස්ථාව බැගින් පාහේ සිදු කළ සංගායනා, ශාසන ශෝධන, කතිකාවත් ආදියෙන් මනාව පැහැදිලි වේ. ඒ සඳහා තත්කාලීන රාජ රාජ මහාමාත්‍යාදීන්ගේ නොමඳ අනුග්‍රහය ද උන්වහන්සේලාට ලැබුණි.

ආරම්භයෙහි සිට ම බුදු දහම රාෂ්ට්‍ර පාලකයන් සමඟ ගැටුම් ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කළේ ය. (අනුජානාමි භික්ඛවේ රාජානං අනුවත්තිතුං) එහෙත් එක් අතකින් රාජ්‍ය තන්ත්‍රයේ ඒකාධිකාරී බලතල ප්‍රතික්ෂේප කළ බුදුදහම තම ව්‍යාප්තිය සඳහා රජුගේ අනුග්‍රහය නිරන්තරයෙන් ලබා ගත්තේ ය. බුදුදහම විසින් ආර්ථික හා දේශපාලනික දර්ශනය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ අශෝක අධිරාජයා තම අනුග්‍රහය යටතේ අනුබුදු මිහිඳු මාහිමියන්ගේ මාර්ගයෙන් ලක්දිව බුදු සසුන පිහිටුවිනු ලැබී ය.

එතැන් සිට බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට මෙරට යටත් වන තාක් රජුත් සසුනත් අතර පැවති මේ දැඩි සබඳතාව විසින් ලාංකික සංඝ සංස්ථාව තුළ යට කී සමගියත් පාරිශුද්ධියත් නොමඳ ව සුරක්ෂිත විය. එද සිට ම මෙරට පාලකයන් තමාත් සසුනත් අතර පැවති සබඳතාව දුටුගැමුණු රජුගේ චිරප්‍රසිද්ධ සටන් පාඨය වූ "මාගේ මේ ව්‍යායාමය භූදෙක් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයාගේ චිරස්ථිතිය සඳහා ය" යන්නෙන් හා මෙරට ශාසන ඉතිහාසයෙහි සසුන පිරිහී භේදභින්න වී පැවති සෑම අවස්ථාවක දී ම

එය පිරිසිදු කොට පුනර්ජීවනයට පත් කිරීම තම යුතුකමක් හා වගකීමක් ලෙස සලකා ශාසනශෝධන කර වීමට මෙරට පාලකයන් පෙළඹීමෙන් ම පැහැදිලි වේ.

(අජ්ඤාන දුර්ජ්ඤාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විපවේග විහතවූ අපායන්නවහ ශාසනවවර කුලපුත්‍රයන් දැක සුපරිශුද්ධ බුද්ධ ශාසනයෙහි මාවැනි ආජ්ඤාචක්‍රවර්තියකු මෙවැනි කිලුටක් දැක දැක උදසීන වූවහොත් බුදුසසුන නස්සි, බොහෝ සත්හුද අපායභාගී වෙති.

''පස්වා දහසක් පවත්නා බුදුසස්නට මා වහල්වූව මැනාවැයි.........'' — පොළොන්නරු ගල් විහාර කතිකාවත — මේ හැරෙන්නට දඹදෙනි, කෝට්ටේ ආදි පසුකාලීන කතිකාවතක දී ම ඒ ඒ රජවරු සසුන රැකීමට තමා සතු වගකීම පැහැදිලි කරයි.)

රජුත් සසුනත් අතර ද පැවති මේ දැඩි සබඳතාව මෙරට ඉතිහාසය තුළ ඒ දෙපාර්ශ්වයේ සංරක්ෂණයත්, චිරස්ථිතියත් සඳහා සාපේක්ෂව ඉවහල්ව පැවති අයුරු ඉතා පැහැදිලිව දක්නට ඇත. මේ ඓතහාසික යථාර්ථය අවබෝධ කර ගත් කතෝලික හා ක්‍රිස්තියානි පල්ලිය තම ආධිපත්‍යය මෙරට තුළ තහවුරු කිරීම සඳහා මේ සාපේක්ෂ සබඳතාව කඩා බිඳ දැමීම අනිවාර්යයෙන් ම කළ යුත්තක් බව වටහා ගෙන ක්‍රියා කළ අයුරු උඩරට ගිවිසුමෙහි පස්වන වගන්තිය ඉවත් කර වීමට බ්‍රිතාන්‍ය පාලකයන්ට එරෙහිව ක්‍රිස්තියානි පල්ලිය ගෙන ගිය ආවේගවත්, ප්‍රකෝපී ක්‍රියාදාමය තුළින් පැහැදිලි වේ. ආගම ඇදහීම පෞද්ගලික කාර්යයක් බවත් එය හා රජය අතර සබඳතාවක් නොතිබිය යුතු ය යනුවෙන් බුදු දහම හා සම්බන්ධ යෙන් ඔවුන් බිහි කළ රුචියෙන් ද පැහැදිලි වෙයි. අතිශය ශ්‍රද්ධාවත් බෞද්ධ අග්‍රාමාත්‍යවරයෙකු වූ ඩී. එස්. සේනානායක මහතා ලවා මෙරට බෞද්ධයන් අමතා ''ආනේඩුව සරණං ගච්ඡාමි'' යි නොකියන ලෙසට කළ ඝෝරනාඩුව ඒ ආක්‍රමණික බලවේග කෙතරම් ප්‍රබලව හා ස්ථාවරව හෙළ රජුත් බුදුසසුනත් අතර තිබූ ඒ ඓතිහාසික සබඳතාව සංකල්පයක් ලෙසින් ම උපුටා දැමීමට සමත් වෙමින් පැවතියේ ද යන්න පැහැදිලි කරයි.

එවැනි පරිසරයක් තුළ ලක් බුදුසසුනේ නියාමක බලවේගය වූ සංඝ සමාජය හෙදහින්න කොට කඩා බිඳ දැමීමටත් එහි පාරිශුද්ධිය සඳහා වූසා තිබූ විවිධ බාධක නොසලකා හැර කවර පාදඩයෙකුට වුව ද චීවරය තුළට රිංගා එය දූෂණයටත් පරිභවයටත් ලක් කිරීමට නින්දේ ම ඉඩකඩ සලසා ලීමටත් පියවර ගෙන ඇත.

මේ පසුබිම යටතේ මෙරටට කඩා වැදුණු විවිධ ජාත්‍යන්තර ආක්‍රමණික බලවේග අද සහ සසුන පමණක් නො ව බුදු දහම ද ඇතුළුව මෙරට 'සිංහල

බෞද්ධ උරුමයන් කුළුගැන්වී ඇති සියලුම අනන්‍යතා ලක්ෂණයන් අකාමකා දැමීමට විවිධ වූත් විචිත්‍ර වූත් කෙළක් උපක්‍රමික සංවිධාන බිහි කොට ඇත.

එහෙයින් මේ විනාශකාරී ආක්‍රමණික ප්‍රවාහය මැඩ අපගේ සිංහල බෞද්ධ සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහාත් සර්ව ආගමික හා බහු ආගමික මෙන් ම බහු ජාතික මායාවෙන් ගිනිකන වැදි බලකාමයෙන් වැයි. ගිය මෙරට පක්ෂ දේශපාලකයන්ටත්, එය හිසින් ගෙන වල්මත් වී ඇති මිනිසුන්ටත් මේ යථාර්ථය තේරුම් කර දීම සඳහා සමගිය ඒකමුතු බව පදනම් කොට ගත් කිසියම් යෝධ සංවිධානයක් ගොඩ නැඟිය යුතුව ඇත. මෙම කාර්යයෙහි ලා මෙරට ජාතික හා ආගමික බලවේගයන්හි නියාමක ශක්තිය වූ සිංහල සංඝ සංස්ථාව ඒකරාශී කිරීම යුගයේ අත්‍යවශ්‍ය කාර්යයක් වී ඇත. එය ක්ෂණයකින් කිරීම දෙඩම් ගොඩක් බඳ ගැනීම වැනි දුෂ්කර හා නිරර්ථක කාර්යයක් බව වටහා ගත් අප එහි ප්‍රථම පියවර ලෙස සපරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ සියම් නිකායික සියලු පාර්ශ්වයන්හි භික්ෂු මහා සංඝයා වහන්සේ එක ම සංවිධානයක් යටතේ ඒකරාශී කිරීම සඳහා පියවර ගතිමු. අනතුරුව එම නිකායස්ථ කෑගලු දිස්ත්‍රික්කයත් ඇතුළු මුළු සපරගමු පළාතේ ම තත් පාර්ශ්වීය භික්ෂු මහා සංඝයා ඒකරාශී කොට අමරපුර, රාමඤ්ඤ දෙනිකායික භික්ෂු මහා සංඝයා වහන්සේ ද අයත් වන සේ සමස්ත ත්‍රෛනිකායික මහා සංඝ සංවිධානයක් දක්වා මෙම කාර්යය ඉදිරියට ගෙන යාම අපගේ අරමුණ වී ඇත.

මෙම කාලය තුළ අප සංඝ සභාව විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ සියම් මහ නිකායික සියලු භික්ෂු මහා සංඝයා හිදැල්ලන, පැල්මඩුල්ල, කලවාන, ඇඹිලිපිටිය යන මධ්‍යස්ථාන හතරකට රැස් කොට තත් නිකායික සියලු පාර්ශවයන්හි නායක, අනුනායක, අධිකරණ සංඝනායක ආදී මහාස්ථවිර පාදයන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් විශේෂ සංඝ සම්මන්ත්‍රණ පවත්වා උන්වහන්සේලා දැනුවත් කොට ඇත. ඒ අතර තත් නිකායික තරුණ සාමණේරයන් වහන්සේලා එක් රැස්කොට උන්වහන්සේලාගේ ගැටළු හා උන්වහන්සේ සතු වර්තමාන හා අනාගත වගකීම් සම්භාරය පිළිබඳ පුළුල් අවබෝධයක් ද ලබා දී ඇත.

ඒ අතර පාප් ආගමනය පසුබිම් කොට මෙරට භික්ෂු මහා සංඝයා වහන්සේ අවතක්සේරුවට ලක් කිරීමට ජාත්‍යන්තර බලවේග ක්‍රියාත්මක වූ ආකාරය පසුබිම් කොට ඇති වූ සිද්ධි මාලාවේ යථාර්ථය පිළිබඳ මෙරට ජනතාව දැනුවත් කිරීම හා ඒ ක්‍රියාදාමය පිළිබඳ අපගේ විරෝධය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටීම වැනි ශාසනික වැදගත්කමින් යුතු සෑම අවස්ථාවක දී ම

අප සපරගමු සංඝ සභාවේ අදහස ප්‍රසිද්ධියේ පළ කරමින් එවැනි අනතුරු වලින් ලක් බුදුසසුන බේරා ගැනීම සඳහා අපට ගත හැකි හා අප විසින් ගත යුතු පියවරවල් නොබියව ගෙන ඇත. දිඹුලාගල නාහිමි ඝාතනයෙන් සංවේගයට පත් වූ අප සංඝ සභාව ප්‍රදේශයේ දනපතියන් කිපදෙනකුගේ ද දායකත්වයෙන් රුපියල් හැත්තැපන්දහසක පමණ දනෝපකරණ එම විහාරස්ථානයට සපයා දුනිමු.

උතුරු නැගෙනහිර ප්‍රශ්නය පිළිබඳව දනට ඉදිරිපත් කොට ඇති යෝජනා මාලාව පිළිබඳ අප සංඝ සභාවේ ස්ථාවරය ද මේ ඊයේ පෙරේද අප විසින් ප්‍රසිද්ධියට පත් කර ඇත.

මෙලෙස වර්තමානයේ ප්‍රත්‍යක්ෂ වශයෙන් අප සංඝ සමාජයටත් සමස්ත වශයෙන් රට, දය හා සමයටත් එළඹී ඇති තර්ජන, ගර්ජන හා අභියෝග මෙන් ම ආක්‍රමණික බලපෑම් පිළිබඳව ද සිදී බිදී විසිරී නො ව සැදී යෙදී එක්වී එක් හඬක් වී ඒවා අභිභවනය කිරීමට අපගේ විසුරුණු ශක්තිය කුළු ගැන්වීම අප සපරගමු මහා සංඝ සභාවේ අරමුණ ගෙන ක්‍රියා කරමු.

ඒ සඳහා අප නිකායික මල්වතු, අස්ගිරි, කෝට්ටේ හා වනවාසී ආදී පාර්ශ්වයන්හි මහානායක නාහිමිවරුන්ගේ අනුමැතිය හා සහයෝගය ද ප්‍රාදේශීය නායක, අනුනායක, අධිකරණ නායක ආදී නාහිමිපාණන් වහන්සේලාගේ නායකත්වය හා ආධාර අනුබලය මෙන් ම අවශ්‍ය මඟ පෙන්වීමාදියත් නොමඳව ලැබෙන බව මෙහි ලා සඳහන් කරමු.

අප මහා සංඝ සභාවේ ප්‍රථම සංවත්සරය මෙම වසරේ නොවැම්බර් 11 වන දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ගෙන, ඒ නිමිති කොට විශේෂ සම්මන්ත්‍රණ, සාකච්ඡා, ගිලානෝපස්ථාන, සහසතු දන ආදියට අමතරව මෙවැනි වාර්ෂික සංග්‍රහයක් ද පළ කිරීමට තීරණය කළෙමු. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අප සංඝ සභාව සතුව නැති හෙයින් ප්‍රදේශයේ සීමිත විහාරස්ථාන කීපයකින් එම මුදල් ලබා ගැනීමට තීරණය කළෙමු. ඒ සඳහා මුදල් ආධාර කළ සියලුම ගරුතර විහාරාධිපති හිමිවරුන්ටත් මේ සඳහා ලිපි සම්පාදනය කළ හිමිවරුන්ටත් අප සංඝ සභාවේ ප්‍රාදේශීය සම්මන්ත්‍රණයන්හි දී වෙහෙස මහන්සි නොබලා වැඩම කළ හා දේශන පැවැත්වූ මෙන් ම ඒවා තම විහාරස්ථානයන්හි සංවිධානය කළ සියලු ගරුතර හිමිවරුන්ටත්, යටත් පිරිසෙයින් මසකට වරක් වත් අප සංඝ සභාවේ රැස්වීම් සඳහා තම අධ්‍යාපනික ආයතනයේ ඉඩකඩ පමණක් නොව ප්‍රත්‍ය පහසුව පවා සපයමින් ක්‍රියා කළ රත්නපුර සුධර්මශාලා සද්ධර්මාලංකාර පිරිවෙන් විහාරාධිපති ශාස්ත්‍රවේදී ගරු දෙනගම පියදස්සි

හිමියන්ටත්, මෙම සංග්‍රහයෙහි ලිපි යතුරු ලියනය කොට සහාය දුන් සසික නිශාන්ත් ආනන්ද මහතාටත්, විශේෂයෙන් නුගේගොඩ, ගංගොඩවිල, 'දීපානී' මුද්‍රණාලයාධිපති අශෝක බටදූව ආරච්චි මහතා ඇතුළු එහි කාර්‍ය මණ්ඩලයටත් අපගේ හෘදයංගම ස්තූතිය පළ කරමු.

කෙසේ නමුත් අප තැබූ මේ එක් පියවරක් පමණි. යා යුතු මග බොහෝ දුරට ඇත. ඒ සඳහා මෙරට ශාසනමාමක ගිහි බෞද්ධ ජනතාවගේ ශ්‍රද්ධාමය කැප වීම ද අපි අපේක්ෂා කරමු.

''ආරභථ නික්ඛමථ – යුඤ්ජථ බුද්ධ සාසනේ
ධුනාථ මච්චුනෝ සේනං – නලාගාරංව කුඤ්ජරෝ''

මාහල්ලේ විපුලතිස්ස ස්ථවිර
අමුත්තාගොඩ ඉන්දරතන ස්ථවිර

රජමහා විහාරය,
දෙල්ගමුව,
කුරුවිට.
1995.09.08

# සපරගමු මහා සංඝ සභාව



ඉදිරි පෙළ (වමේ සිට) : කරදන මංගල හිමි, බලංගොඩ මේධානන්ද අධිකරණ නායක හිමි, හඳපාන්ගොඩ විමල ශ්‍රීපාදස්ථානාධිපති හිමි, වේහැල්ලේ ශ්‍රී ධම්මපාල ප්‍රධාන සංඝනායක හිමි, හත්තැල්ලේ චන්ද්‍රරතන උප ප්‍රධාන [illegible] එල්ලාවල මේධානන්ද හිමි, කෝප්පකන්දේ සුමනතිස්ස උපප්‍රධාන සංඝනායක හිමි, පන්නිල ධම්මතිලක [illegible]

පසු පෙළ (වමේ සිට) : නැදුන්ගමුවේ සුමනසාර හිමි, අස්ගහුලේ විමලරතන හිමි, නිවිතිගල ධම්මරතන හිමි, දෙනගම පියදස්සී හිමි, ඇහැලපේ සීවලී හිමි, අමුතාගොඩ ඉන්ද්‍රරතන හිමි, මාහල්ලේ විපුලතිස්ස හිමි, මාපොටේ නාගිත හිමි, දුම්පහළ සීලානන්ද හිමි, කරවිට උපනන්ද හිමි, කෝම්පිටියේ සුසීල හිමි, කැම්පනේ ගුණරතන හිමි, කුකුලේගම සුමන හිමි.

(ඡායාරූපය: ධර්මප්‍රිය ලියනආරච්චි - රත්නපුර)

# පටුන


1. සපරගමුව හා මහා සංඝ සභාව....
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, පුරාවිද්‍යා චක්‍රවර්ති, ශාස්ත්‍රපති
එල්ලාවල මේධානන්ද හිමි 1

2. භික්ෂුව හා දේශපාලනය....
විදුහල්පති රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
මාහල්ලේ විපුලතිස්ස හිමි 11

3. සඳවාර පරිහානිය හා අපේ වගකීම් ....
ශාස්ත්‍රපති, කැම්පනේ ගුණරතන හිමි 27

4. නවක සහ පරපුරට බලපාන
ප්‍රධාන ආගමික ගැටළු හා අභියෝග කීපයක්
රාජකීය පණ්ඩිත, මහාචාර්ය විමල විජයසූරිය 37

5. බෞද්ධ ආගමික ජීවිතයේ
ගුරු සිසු සබඳතා හා නව ප්‍රවනතා...
මාහල්ලේ විපුලතිස්ස හිමි 47

6. කුංගු ....
කැම්පනේ ගුණරතන හිමි 63

7. විහාරස්ථාන කළමනාකරණය...
පිරිවෙන් පරීක්ෂක, ශාස්ත්‍රපති,
පණ්ඩිත කැලිගම විජිතානන්ද හිමි 69

8. මූලික බුදු සමයෙන් පිළිබිඹු වන අයුරු
භික්ෂූන් වහන්සේ ගුරුවරුන් ලෙස
පුහුණු කළ ආකාරය
කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ මහාචාර්ය
හෙන්රි වීරසිංහ 77

9. අද භික්ෂුව සතු ජාතික මෙහෙවර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය
බෙල්ලන්විල විමලරතන හිමි 83

10. පිරිවෙන් අධ්‍යාපනය හා නූතන අභියෝග . . .
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ
පාඨමාලා සංස්කාරක, අධ්‍යාපනපති,
අමුනුගොඩ ඉන්දරතන හිමි 87

11. බුදු සිරිත කෙලසීමේ මහා කුමන්ත්‍රණය
බුද්ධ පුත්‍ර 99

12. බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය . . .
නීතිඥ සතිස්චන්ද්‍ර ධම්සිරි 105

13. නිර්මාණවාදී හා බෞද්ධ මත සැසඳුම
ගුණරුවන් 120

# සපරගමුව හා මහා සංඝ සභාව

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ.
පුරාවිද්‍යා චක්‍රවර්ති,
**එල්ලාවල මේධානන්ද හිමි**

''සබර – පොලිස්'', ''දිසාපති – සබර'' යන වාක්‍ය යෙදූ වාහන මා නිතර දක ඇත. මේ යෙදුම්වලින් අදහස් කරන්නට ඇත්තේ ''සපරගමු පොලිසිය'', ''දිසාපති සපරගමුව'' යන කරුණු විය හැකි නමුත් ඉන් වෙනත් අර්ථයක් ද කියැවෙයි. ''සබර'' යනු ''වැද්ද'' හෝ ''මලේච්ඡයා'' යන තේරුම දෙන හෙයිනි. මේ යෙදුම්වල ඇති වරද ගැන නොයෙක් විට සිතුවෙමි. මෙය 1815න් පසුව බහුල වශයෙන් සිදු වී ඇති වරදකැයි සිතමි. මෙය සත්‍ය වශයෙන් නිවැරදි කළ යුත්තකි.

පසුගිය වසරක සපරගමු කොඩිය නිර්මාණය කිරීම ගැන රත්නපුර පළාත් සභා කාර්යාලයේ සාකච්ඡාවක් කැඳවා තිබිණ. මේ සාකච්ඡාවට මම ද සහභාගි වීමි. එහි දී සපරගමු කොඩිය ගැන කරුණු හා එහි ආකෘතියක් ද මවිසින් ඉදිරිපත් කරන ලද අතර කීප දෙනෙක් එයට සහාය ද දුන්හ. බහුතරය එය සුදුසු බවට අදහස් දක්වූහ. කෙසේ හෝ කොඩිය නිර්මාණය වී ඇත්තේ ඒ ස්වරූපය අනුව ය. මෙම සාකච්ඡාවේ දී ''සබර'' යෙදුම ''සපර'' විය යුතු බවත් එය එසේ කරන ලෙස යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කෙළෙමි. එහෙත් ''සපර'' තවම ''සබර'' ලෙස ම ය.

සපරගමුව, පොළොන්නරු යුගයට පෙර වෙනම පෙදෙසක් ලෙස සඳහන් වී නැති අතර ඊට පෙර යුගයේ ඉන් කොටසක් රෝහණ දේශයටත් කොටසක් දක්ෂිණ දේශයටත් අයත් වූයේ වණ. එය වෙනම ප්‍රදේශයක් ලෙස ස්ථිර ලෙස වෙන් කර ඇත්තේ ද කෝට්ටෙ යුගයේ පමණ වත් සිට බව පෙනේ. මේ ගැන මතුවට කරුණු දක්වෙයි. මුලින් ම සපරගමු නාමය ගැන කරුණු දක්වීම උචිත ය යි සිතමි.

සපරගමුව යන්න සබරගමු, සපරගමු, සපරපුර, සබරගමුරට, හබරගමු යනු වශයෙන් සිංහල ලේඛනවල සඳහන් වී තිබේ. ''සපරෙ රට්ඨයෙ'', ''සපරග්ගාමවිහරට්ඨයෙ'', ''සපරගමුමහා රට්ඨයෙ'' යනු වශයෙන් පාලි ලේඛනවල ද, ''සපරාඛ්‍ය විශ්‍රුත පුරෙ'' යනු වශයෙන් සංස්කෘත ප්‍රබන්ධවල ද, ''සප්පර්ගම්'' යනු වශයෙන් පුරුතුගීසි, ඕලන්ද හා ඇතැම් ඉංග්‍රීසි ලේඛනවල ද සඳහන්ව තිබේ.

සිංහල ලේඛනවල සපරගමු වචනය මුලින් ම සඳහන් වන්නේ සීතාවක යුගයේ 1 රාජසිංහ රජු දවස රචිත සැවුල් සන්දේශයේ ය. එහි දෙතැනක මේ වචනය සපරපුර හා සපරගමුපුර විසින් සඳහන් වී තිබේ. ඊට පසු රචනා වී ඇති කුස්තන්තීනු හටනේ ද එක් තැනක සපරපුර යන වචනය යෙදී තිබේ. කන්දඋඩරට පාලනය කළ 1 විමලධර්මසූර්‍ය රජුගේ කාලයෙහි සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය දක්වා තොරතුරු දැක්වෙන මන්දාරම්පුර පුවතෙහි දහවරක් පමණ මේ වචනය යෙදී ඇත. ඉන් එක වරක් පමණක් "සබරගමු'' වශයෙන් යෙදී තිබේ. දඹදෙනි යුගයේ ඉදි කරන ලද රත්නපුර සමන් දේවාලය නැවත ප්‍රතිසංස්කරණය කර එයට ගම්බිම් පූජා කර වන් සිරි පැරකුම්බා රජු විසින් සමන් දේවාලය භූමියෙහි ශිලා ලේඛනයක් පිහිටුවන ලදී. ඒ කෝට්ටේ යුගයේ දී ය. මේ ලිපියෙහි "නවයොදුන් බඳ සපරගමුවෙහි'' යන යෙදුම දක්නට ලැබේ, නව යොදුනක් පමණැති සපරගමුව යන අරුත මින් සමහරු ගනිති. එහෙත් ඒ යුගයේ නවයොදුන් කෝරළය සපරගමුවට සම්බන්ධව තිබූ බවට ද සැලකිය හැකි ය.

1 විමලධර්මසූර්‍ය රජුගේ සිට කන්දඋඩරට පාලනය කරන ලද සියලු රජවරුන්ගේ යුගවලට අයත් යම් යම් දීමනා දෙන ලද සන්නස්, තුඩපත් ආදිය රැසක් සපරගමුවේ ඇතැම් පරම්පරා සතුව ඇත්තේ ය. මේ ලේඛනවල සපරගමු හා සබරගමු යන දෙවදන මිශ්‍රව යෙදී ඇතත් බහුල වශයෙන් ඇත්තේ සපරගමු යන වචනය යි.

1 පරාක්‍රමබාහු මහරජු විසින් පොළොන්නරුවෙහි කරන ලද ශාසන ශෝධනයට සහභාගි වූ සංඝයා ගැන විස්තර කරන මහාවංශය සපරගමු රටින් පැමිණි තෙර නමක ගැන ද දක්වයි. එහි දී යොද ඇත්තේ "සපර රට'' — "සප්පරෙ රට්ඨෙ" යන වචනය යි. 1 විමලධර්මසූර්‍ය රජු දළඳ වහන්සේ දෙල්ගමුවෙන් කන්දඋඩරටට වැඩමවා ගැනීමේ විස්තරය දක්වන අවස්ථාවෙහි මහාවංශය සපරගමුව සඳහන් කරන්නේ ''සපරගමු මහරට'' — "සපරගමු මහා රට්ඨයෙ'' වශයෙනි. 1800 තරම් මෑතක රචිත පාලි ප්‍රබන්ධවල ද සපරගමු රට — සපරග්ගාමවිහ රට්ඨය වශයෙන් සපරගමුව සඳහන් කර තිබේ. මුලින් කී සමන් දේවාලය සෙල්ලිපියේ අග ඇති

සංස්කෘත ශ්ලෝකයක "සඑර නම් ප්‍රසිද්ධ පුරයෙහි" — "සඑරාඛ්‍ය විශ්‍රැත පුරෙ" යනුවෙන් ම සපරගමුව සඳහන් කර තිබේ.

මේ ලේඛන පරීක්ෂා කර බැලීමේ දී අපට පෙනී යන්නේ පොළොන්නරු යුගයේ සිට 1800න් පසු යුගය දක්වා ම ලියැවී ඇති සම්භාව්‍ය ලේඛනවල "සපර" සද යෙදී ඇති බවත් 1 විමලධර්මසූර්‍ය රජුගේ යුගයෙන් පසු ඉතා කලාතුරකින් ලේඛනවල "සබර" සද මිශ්‍රව යෙදී ඇති බවත් ය.

සපර, හා සබර, වදන් පිළිබඳව මඳ නමුත් විමසීමක් මෙහි ලා අභිමත ය. ශබර, සබර හා ශවර, ශබ්ද සංස්කෘත ලේඛනවල හා සාහිත්‍ය ග්‍රන්ථවල දක්නට ලැබේ. අමරකෝෂයෙහි චණ්ඩාල ප්‍රභෙදයන් ලෙස "කිරාත" හා "ශබර" වර්ගයක් සඳහන් වෙයි. ශබ්දස්තෝම මහා නිධියෙහි මත්ස්‍ය ප්‍රභෙද වූ ශඵර හා සඵර දෙසදක් දක්වෙතත් සබර හෝ ශබර හෝ සදක් දක්වා නැත. 1 රුද්‍රදමන් ක්ෂත්‍රප රජුගේ ගිර්නාර් සංස්කෘත සෙල් ලිපියේ සබරමති ප්‍රදේශය හැඳින්වීමට "ස්වභ" සද යොදා තිබේ.

සර් එම්. මෝනියර් විලියම්ස්ගේ සංස්කෘත ඉංග්‍රීසි ශබ්ද කෝෂයෙහි ශබර, සබරු, ශවර, යන තෙසදක් දක්වෙයි. ඒ සඳහා "නා නා වර්ණ, විචිත්‍ර, හා වයිරන් වැටුණු" යන අර්ථයන් ද දක්වා තිබේ. එසේ ම ඉන්දියාවේ කඳුකර පෙදෙස්හි වසන ම්ලේච්ඡ වර්ග යන අර්ථය ද ප්‍රධාන වශයෙන් දක්වා ඇත. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි සපරග්‍රාම, සපරපුර, යන්නට "සබරගමුව" යයි අර්ථ කථනය කරයි. එය සාවද්‍ය ය. ශබර, දේශයක් ඉන්දියාවේ කඳුකර පළාත්හි වසන ම්ලේච්ඡ ජාතියක්, යනුවෙන් ද ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයෙහි කෙරෙන අර්ථ කථනය මෝනියර් විලියම්ස් ශබ්දකෝෂය අනුව යාමකි.

"ශඵර" හා "සඵර" ශබ්ද ද සංස්කෘත සාහිත්‍යයේ යෙදී තිබේ. ඉන් මත්ස්‍ය ප්‍රභෙදයක් (පෙටියන්) අදහස් කරතැ යි ශබ්දකෝෂවල දක්වෙයි. අර්ථ විසින් සලකන කල සපරගමු යන්නේ "සපර" කොටස මේ එක වදනකින්වත් ප්‍රභවය වූවක් නොවේ. එය ප්‍රභවය වී ඇත්තේ නැතහොත් හැඩගැසී ඇත්තේ පොදුවර්ෂ පූර්ව, යුගයේ සිට ව්‍යවහාර වූ මැණික්, විශේෂයෙන්, නිල් මැණික් වාචක සිංහල ශවෙර වචනයෙනි. මේ වචනය බ්‍රාහ්මී ලෙන් ලිපිවල පෞද්ගලික නාමයක් ලෙස ද යෙදී තිබේ. වර්තමාන "මැණිකේ", "නිල්මැණිකේ", "පලිඟු මැණිකේ" වැනි යෙදුම්වලට පැරණි "ශවෙර" වචනය සමාන ය. දුටුගැමුණු කුමරුගේ මව වූ විහාර මහා දේවිය බ්‍රාහ්මී ලිපිවල (අබි) ශවෙර වශයෙන් දක්වෙයි. තෙල වචනය

''විහාර'' වචනය දක්වා පෙළබසට විකාශනය වී ඇත. ලේඛන ව්‍යවහාර යෙන් ඈත්ව තිබුණ ද ජනව්‍යවහාරයෙන් ඈත් නොවූ මේ වචනය මැණික් බහුල ප්‍රදේශය වූ සපරගමුව හැඳින්වීමට ''සපර'' විසින් යෙදී තිබේ.

ඉංග්‍රීසි භාෂාවේ නිල් මැණික් හැඳින්වීමට ''සැපයර්'' (Sapphire) යන වචනය යෙදී තිබේ. ග්‍රීක භාෂාවේ නිල් මැණික්වාචී ''සෆිරෝස්'' (Sappheiros) සදක් යෙදී තිබේ. සපරගමුවේ නිල්මැණික් (සපර) ගෙන ගිය විදේශීන් සිංහල සපර සද මේ ලෙස ඔවුන්ගේ භාෂාවට හුරුව යොදා ගත් බව මෙයින් පෙනී යයි.

''සපර'' සද සමඟ යෙදී ඇති ''ගොමු'' හෝ ''ගමු'' හෝ සද ''ගාම'' හෝ ''ග්‍රාම'' හෝ සදින් භින්න වූවක් නොවේ. එය ''ගුල්ම'' සදට සමාන ය. ගල්ගමුව, ලියගොමුව, වනගොමුව, ආදී තැන්වල ඇත්තේ මේ ''ගොමු'' සදේ ම සාවද්‍ය යෙදුමකි. ගල් බහුල වූයේ ගල්ගමුව ය. ලිය (වැල්) බහුල වූයේ ලියගොමුව ය. මේ නයින් සපර (නිල් මැණික්, මැණික්) බහුල වූයේ සපරගමුව ය. එය ම්ලේච්ඡ හෝ ව්‍යාධවාචී සබර සදක් කැලම නොවේ.

සපරගමු වචනය විවරණය වීමෙන් පසු එයට සම්බන්ධ ප්‍රදේශය හා එහි ඉතිහාසය පිළිබඳව ද තරමක් දුරට හෝ පැහැදිලි කිරීම වැදගත් වෙයි. වර්තමාන සපරගමුව දිසා දෙකක එකතුවකි: එනම් රත්නපුර, හා කෑගල්ල යනුවෙනි.

**රත්නපුර දිසාව**

1. කුරුවිටි කෝරළය
2. කුකුළු කෝරළය
3. නවදුන් කෝරළය
4. කඩවතු කෝරළය
5. මැද කෝරළය
6. අටකලං කෝරළය
7. කොලොන්නා කෝරළය, යනුවෙන් කෝරළ හතකට ද ;

**කෑගල්ල දිසාව**

1. හතර කෝරළය

2. තුන් කෝරළය යනුවෙන් හැඳින්වෙන කෝරළ හතකට ද බෙද තිබේ. මහනුවර යුගයේ දී රත්නපුර දිසාව, කුරුවිටි, කුකුළු, කඩවතු, මැද, නවදුන් හා අටකලං වශයෙන් කෝරළ හයකට බෙද තිබූ අතර කෑගලු දිසාව ඒ ලෙස ම විය. කෝට්ටේ යුගයේ දී, තුන් කෝරළය හා පාත බූලත්ගම සඳහන් වේ. රත්නපුර දිසාවට සම්බන්ධව එතරවා කෝරළය, කුරුවිටි කෝරළය, කුකුළු කෝරළය, නවදුන් කෝරළය, කඩවතු කෝරළය, මැද කෝරළය, අටකලං කෝරළය හා හේවාගම් කෝරළය යෙදී තිබේ. මේ යුගයට පෙර සපරගමුවේ සීමා පිළිබඳ විස්තරයක් දක්වෙන ලේඛන විරල ය. පොළොන්නරු යුගයේ ''සපර රට'' ''සපරෙ රට්යෙ'' යනුවෙන් දක්වෙතත් සපර රට කෙතෙක් දුරට පැතිරී තිබුණේ ද යන්න ගැන සාධක හමු වී නැත.

ත්‍රිසිංහලය යන ව්‍යවහාරය ආරම්භ වූයේ පොළොන්නරු යුගයේ දී වුවත් එයට තුඩුදෙන ව්‍යවහාර අනුරාධපුර යුගයේ අවසාන භාගයේ සිට පැවතුණි. එම යුගයේ රෝහණ දේශය ව්‍යවහාරයේ තිබුණ ද මායාරට නමින් හැඳින්වූ දේශය දක්ෂිණ දේශයටත් මලය රටටත් අයත් වූ බව පෙනේ. මේ ප්‍රදේශයේ ආදිම යුගයේ බිහි වූ රාජධානිය කල්‍යාණි රාජ්‍යය යි. සපරගමුවෙන් කොටසක් රුහුණු දෙසට අයත් වූ අතර අනෙක් කොටස කැලණි රාජ්‍යයට අයත් වූයේ විය. එම රාජ්‍යය අභාවයට යාදී පැතිරුණු දක්ෂිණදේශයට එම කොටස පසුව අයත් වූ අතර ''මායා රට'' ව්‍යවහාරයට පැමිණි පසුව එම කොටස ඒ ප්‍රදේශයට අයත් විය. රෝහණ දේශයට අයත් වූ කොටස වෙනසක් නොමැතිව එයට ම අයත්වැ පැවතිණි.

වර්තමාන සපරගමු පළාතට අයත් ප්‍රදේශ ගණනක පොදු වර්ෂ පූර්ව යුගයේ ආර්‍ය්‍ය ජනාවාස බිහි වී තිබිණි. මේ පිළිබඳ සටහන්, වළවේ, කැලණි නදී නිම්නයන්හි මෙන් ම කඳුකර කොටස්හි ද දක්නට ලැබේ. මේ ජනාවාස ආශ්‍රයෙන් මුල් ම යුගයේ බිහිවැ ගිය කුඩා රාජධානි දෙකක් ද එම යුගයේ දී දක්නට ලැබේ. ඒවා නම් කැලණි රාජධානිය හා ගිරනුවර රාජධානිය යි. කැලණි රාජධානිය කැලණි ගං නිම්නය ආශ්‍රිතව පිහිටියේ ය. එහි පාලකයන් පිළිබඳව එන තොරතුරු කෑගලු දිසාවට අයත් යටහලෙන, ලෙණගල ආදි පූජනීය ස්ථානවල පිහිටුවා ඇති බ්‍රාහ්මී ලෙන්ලිපිවලින් හමුවෙයි. මේ රාජධානියට අයත් ප්‍රදේශය පළමුවන පැරකුම්බා රජුගේ ජාත භූමිය ද ඇතුළත් කරගෙන සිටී.

මෙහි දී වඩාත් අවධානය යොමු කළ යුත්තේ රෝහණ දේශයට සම්බන්ධ වූ කොටස ගැන ය. මන්ද, ඒ පිළිබඳ වැඩි ගවේෂණයක් කර නැති හෙයින් තොරතුරු අප්‍රකටව ඇති බැවිනි. ගිරිනුවර රාජධානිය

මෙ කොටස ආශ්‍රිතව බිහිවැ ගිය බව පෙනේ. එය වලවේ නදී නිම්නය ඇසුරු කර පැවති බවට කරුණු පෙනි යයි. ගිරිනුවර රාජධානිය ගැන මුල්වරට මෙන් ම අවසාන වරටත් තොරතුරු දක්වෙන්නේ ධාතුවංශයේ ය. එහි විස්තර ජිනකාලමාලියටත් සංක්‍රමණය වී ඇත. කාවන්තිස් රජතුමාගේ විස්තර ඉදිරිපත් කරන ධාතුවංශය ගිරිනුවර විසූ අභය රජු මාගම කාවන්තිස් රජුගේ සොහොයුරියක වූ සෝමාදේවිය පාවා ගෙන සිටි බව කියයි. ගිරිඅභය. කැලණි පාලකයාගේ බෑණා කෙනෙකු හැටියට ද එහි දක්වේ.

ගිරිනුවර, ගිරිදනව්ව වැනි වචන පැරණි වංශ කථාවල නොයෙක් විට යෙදී ඇත. කාවන්තිස් රජු බණ අසා උතුරුසළුව පිදීමට සිත හදමින් සිටි අවස්ථාවෙහි කවුඩුවා කී පණිවිඩ අතරින් එකක් ගිරිපා දනව්වෙහි "කොන්තරට්ඨක" විහාරයේ තෙරුන් පිරිනිවි බව ය. වෙළුසුමන කථාව පවසන "රසවාහිණිය" ;

"ගිරිනාම ජනපදෙ කුටුම්බියංගණ නාම ගාමකෙ"

යනුවෙන් සඳහන් කරයි. එය ථූපවංශයේ ගිරිනිල් දනව්ව වශයෙන් දක්වෙයි. "ගිරිනාම ජනපදෙ" යනු මහාවංස පාඨය යි. ගොඨයිම්බර කථාවස්තුව ගිරි ජනපදයක් දක්වයි. පණ්ඩුකාභය කුමරුගේ මාමා ගිරිඛණ්ඩ පර්වතයෙහි සියක් කිරියක ගොයම් කරවී ය. මෙබඳු යෙදුම් ගැන විමසන විට ගිරිනුවර ගැන නිගමනයකට බැසීම අපහසු වෙයි. ගිරිනුවර පිහිටියේ මලය රටේ යයි සමහරු දක්වති. ගිරිනුවර ගැන විමසන සමහරු එහි සීමා මෙසේ දක්වති. බටහිරි සීමාව සමනල කන්ද ය. නැගෙනහිර සීමාව මැණික් ගඟේ ඉහළ කොටස ය. උතුරු සීමාව මලය රට ය. දකුණු සීමාව අනුමාන වශයෙන් මලය රටේ පාමුල දක්වා ය. මෙම සීමා සමහර අතින් මෙයට වඩා දුරස්ථරකර පෙන්වීමට පුළුවන. ගිරිදනව්වේ පිහිටි අගනුවර ගිරිනුවර විය යුතු ය. ගිරිපාදනව්ව විස්තර කරන සමහරුන් එම වචනයේ යථාර්ථය ගැන සැලකිලිමත් වී නැති බව පෙනේ. "ගිරිපා දනව්වෙහි කොන්තරට්ඨක වෙහෙර.........." ආදි වශයෙන් ධාතුවංශයේ එන ජේදය පාලි ලළාට ධාතුවංශයේ මෙසේ දක්වෙයි.

"ගිරි පබ්බතපාදෙ කොට පබ්බත විහාරෙ
කොටරට්ඨකො නාම ථෙරො මග්ගෙ සමං කත්වා
ගිරි පබ්බත මත්ථකෙ.........."

ආදි වශයෙනි. ගිරිපබ්බතපාද, ගිරිපා දනව්ව යන වචනවල යථාර්ථය අනුව එය කිසි කලෙක උස්ම ගල්කඳු සහිත පෙදෙසකට යෙදිනැ යි සිතිය නොහේ. ගිරි යන්න පාලියේ පර්වතය, කන්ද ආදි අර්ථවල යෙදෙන

බව පෙනේ. පාද යන්න පිරිවර පර්වතය යන්න පිරිවර, පර්වතය යන අර්ථයෙහි යෙදිය හැකි වුවත් එය තවත් පදයක් සමඟ සමාස වූ විට මුල, පහත, යන අදහස ස්ථිර ලෙස ගෙන දෙයි. එහෙයින් මෙහි අර්ථගත යුත්තේ ගිරිපර්වත පාමුලෙහි පිහිටි දනව්වෙහි යනුවෙනි. ගිරිපබ්බත පාද යන්න ගිරිපා, ගිරිවා විසින් බිඳී සිංහලෙන් සිටී. මේ නිසා මලය රටේ කඳු පාමුල සිට විහිදෙන ප්‍රදේශය, වලවේ ගඟේ සීමාව සහිතව ගිරි දනව්ව පිහිටි ප්‍රදේශය සේ සැලකිය හැකි ය. වර්තමාන ගිරුවා පත්තුව ද එයට අයත්ව තිබූ බව පෙනේ.

ගිරිනුවර මේ ප්‍රදේශයේ අගනුවර වශයෙන් පැවති බව සැලකිය හැකි ය. මේ රාජධානිය බිහිවැ ගියේ ඉපැරණි ආර්‍ය ජනාවාස ආශ්‍රයෙන් බවට සැකයක් නැත.

භාරතයේ සිට පැතිර ගිය ආර්‍ය කණ්ඩායම් මාර්ග තුනක් ඔස්සේ මේ දිවයිනට සංක්‍රමණය වූ බව පෙනී යයි. එසේ පැමිණි ආර්‍යයෝ ගංගා නිම්න ආශ්‍රිතව ජනපද පිහිටුවා ගත්හ. ගිරිනුවරත් එසේ පැමිණි ආර්‍යයන් පිහිටුවාගත් ජනපදයක අගනුවර ලෙසට කල්පනා කළ හැකි ය. මෙම ආර්‍යයන් නිසැක ලෙසට මෙහි ළඟා වන්නට ඇත්තේ බටහිර දිග මුහුදු මාර්ගයෙනි. මේ මගින් මෙහි සංක්‍රමණය වන්නට වලවේ ගං මුවදෙරින් එනම් පසු කලෙක ගොඩපවත වරාය නමින් හැඳින්වූ ස්ථානයෙන් රටට ඇතුළු වීමට පුළුවන. වර්තමානයේ වලවේ නමින් හැඳින්වෙන ගඟ අතීතයේ කිනම් ලෙසකින් හැඳින්විණිදැ යි අවිනිශ්චිත ය. මෑතක යුගයකට අයත් වන මානාවුලු සන්දේශයේ වනනදී, වනවාහිණී නම්වලින් එය හඳුන්වා ඇත. ''වලව'' යන්න ගැන දක්නා පෙදෙසක් ගැන මෑත යුගයේ ලියැවුණු නීලකොබෝ සන්දේශයෙන් ද දැක්වෙයි. එහි ගමන් මාර්ගය අනුව වලවේ ගඟ හා නිඹරුක්වැටිය (කොහොඹ වැටිය) අතර වලවේ ගඟට ඉතාම සමීපව එය පිහිටි බව පෙනේ. වල්ලව නම් විහාරයක් ගැන රසවාහිණියේ ද සඳහන්ව තිබේ. ''වලව'' වචනය ''වලභි'' යන්නට ඉතා සමාන ය. වලභි යනු භාරතයේ කඨියවාර් ප්‍රදේශයට අයත් කොටස කට ව්‍යවහාර කළ ස්ථාන නාමයකි. මේ ප්‍රදේශයට අයත් ගිරිනුවරක් ගැන පො.ව. 150 වර්ෂයට අයත් ජුනාගාද් සෙල්ලිපියේ සඳහන් වේ. මෙහි අශෝක සෙල්ලිපියක් ද පිහිටියෙන් එහි පෞරාණිකත්වය ගැන සැකයක් නැත. මෙහි සඳහන් වන 1 රුද්‍රදමන් රජුගේ සංස්කෘත අභිලේඛනයෙන් වටිනා ඓතිහාසික තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි ය. මෙහි තවත් ප්‍රදේශ නාමයක් හැටියට ''ශ්වභ'' යනු දක්වා ඇති බව මුලින් ද කියා ඇත.

මෙ සටහනින් පෙන්වා දිය හැක්කේ ඉන්දියාවේ සිට ඉහත කී ප්‍රදේශ ආශ්‍රයෙන් පැමිණි ආර්‍ය ජන කණ්ඩායම් වලව, සපර, යන ජනපද බිහි කරන්නට ඇති බවයි. වලව ''වලභි'' යන්නේ ස්වරූපය වූ අතර මැණික් බහුල නිසා අනෙක දේශීය සපරගාම විය. වලව ජනපදය හරහා ගැලූ නදිය ඒ නමින් ම වලවේ ගඟ විය. මෙ ජනාවාසය ක්‍රමයෙන් වලවේ ගඟ දිගේ එහි ඉහළ නිම්නය දක්වා පැතිරී ගියේ ය. මෙ ජනාවාස ඇසුරින් පැන නැඟුණු අගනුවර ගිරිනුවර නමින් මාතෘභූමිගත සිහිවීමක් වශයෙන් ඔවුන් තබා ගන්නට ඇත. ගිරිනාරයට (ගිර්නාර්) සමාන ලංකාවේ ගිනිකොණ දිග තැන්නේ පිහිටි පර්වත වේදිකාවේ ආරම්භක පෙදෙස ඔවුනට මෙ සඳහා අනුබලයක් මෙන් ම සාධකයක් ද වන්නට ඇත. පැරණි ජනසංක්‍රමණයන් පිළිබඳ ඉතිහාසය විමසා බැලීමේ දී ඔවුන් අලුතින් පැමිණි ප්‍රදේශයේ හුරුපුරුදු නම් ව්‍යවහාර කිරීම සිරිතක්ව පැවති බව පෙනේ. මේ අනුව භාරතයේ බටහිරි දිග මාර්ගය ඔස්සේ ව්‍යාප්තව ගිය ආර්‍ය ජනයා ගිර්නාර්ය, වලභිය, ශ්වභය, භාරුකච්ඡය ආශ්‍රය කරමින් මෙහි පැමිණ එයට සමාන නිර්මාණයන් කළ බව සැලකිය හැකි ය. ටොලමිගේ ලංකා සිතියමෙහි ගිනිකොණ දිගට ගලන ගඟක් වන ''බැරකොස්'' යන්න භාරතයේ භාරුකච්ඡ යන්න සිහිපත් වන්නක්ව තිබීම ද මෙයට සාධකයකි.

වලවේ මුව දෙරින් රටට ඇතුළුවූ මෙහි පදිංචිවූවන් ගිරි රාජධානිය ලෙස සංවිධානය වන්නට ඇත. දළ වශයෙන් වලවේ ගඟ, කළු ගඟ අතර හා මධ්‍ය කඳුකරයේ කොටසකුත් සහිත ප්‍රදේශය එයට අයත් විය.

මෙහි එක් පැත්තකින් කතරගම රාජධානිය ද අනෙක් පසින් කැලණි රාජධානිය ද පිහිටා තිබිණි. මෙහි අගනුවර ගිරිනුවර විය. එය කිනම් ප්‍රදේශයක පිහිටියේදැ යි මෙහි ලා මඳක්වත් විමසිය යුතු වෙයි. ගිරි රාජධානියට අයත් පෙදෙසෙහි ඉපැරණිම සාධක හමුවන්නේ කල්තොට සිට දකුණු ගිනිකොණ දිග මුදු තීරය දක්වා විහිදෙන බිම් තීරුවෙහි බව පෙනේ. මෙහි ඉහළ කොටස බෙහෙවින්ම අතීත සෞභාග්‍යය කියාපාන සලකුණුවලින් පිරී පවත්නේ ය. බඹරගල, බුදුගල, කූරගල, පොල්ලමුරේ, යටිමල්කඩුව, පියන්ගිරිඔය, දේවගිරිය, ඉඳුරුගහයාය, කිරිමකුළුගොල්ල ආදී ස්ථානවල දක්නා පොදු වර්ෂ පූර්ව යුගයේ අභිලේඛන රැස විශාල ජනසමූහයක් මෙහි විසූ බවට සාධක වෙයි. තෙත් කලාපයට පවා සංක්‍රමණය වූවන් විසූ බවට කිරිබත්ගල කන්දේ ලෙන්ලිපිය පවා සාධක සපයයි.

පුරාණ අගනුවරවල භූමිශාස්ත්‍රය අනුව බලන කල මෙම කොටසෙහි රාජධානියේ අගනුවර පිහිටා තිබිනැ යි කිය හැකි ය. සපරගමු පළාතේ මැද කෝරළයේ හෙලපල්ල කොටසේ උග්ගල් කල්තොටට මයිල 13ක්

පමණ දුරින් පහත්බිම් පෙදෙසක පිහිටි ''හඳගිරිය'' නමින් දන්නා භූමි භාගයක් වෙයි. එහි භූමිය පරීක්ෂා කිරීමේ දී ඉතා පැරණි යුගයකට අයත් වන නටබුන් තැනින් තැන මතුවී තිබෙනු දැකිය හැකි ය. කුඹුරු කර වීමේ දී එහි තිබී පැරණි ගඩොළු මතු විය. ඒවා සමහරක අක්ෂර සටහන් පවා දක්නට ලැබේ. මෙහි පිහිටි මාලිගාව, වීදියේයාය, වැනි ස්ථාන නාමාදිය අනුව මෙය ඉපැරණි රාජධානියක අගනුවරක් බවට කෙනෙකු තුළ හැඟීමක් නිරායාසයෙන් වුව ද ඇති වේ. මෙම ප්‍රදේශය පිළිබඳව මුලින්ම පරීක්ෂණයක් කළ සී. එච්. කොලින්ස් මහතා හඳගිරිය පො.ව. පූර්වදෙවන ශතකයට අයත් රාජධානියක අගනුවරක් විය හැකි බව දක්වා ඇත. මේ නිගමනයට තුඩුදුන් සාධක සහ සාමාන්‍ය විස්තරයක් ද ඔහු විසින් සපයා ඇත. හඳගිරිය යන්න පසුව ඇතිවූ නමක් බව පෙනේ. එහි මුල්ම නාමය ගිරිනුවර යන්නයි. හඳගිරියට මයිල හයක් පමණ දකුණින් පිහිටි ගල්පායේ විසිරී ගිය නටබුන් රාශිය ද මේ අදහස තහවුරු කරයි. එහි ''වල්දෙහි කොටුවෙගලින්'' ලැබුණු 10 හෝ 11 වන සියවසට අයත් ගෙවී ගිය සෙල්ලිපියක ගිරිමණ්ඩල යන්න කියවිය හැකි ය. ගිරි නගරය ගැන කරුණු දක්වන මහාවංශ ටීකාව එයට පර්‍යාය නාමයක් ලෙස ''ගිරිමණ්ඩල'' යන්න දක්වයි.

ධාතුවංශය රෝහණයේ ඉතිහාසය කියැවෙන ග්‍රන්ථයකි. එහි ගිරිනුවර ලෙස දැක්වෙන රාජධානිය මහාවංශ කථාව ලියැවෙන විට චන්දන ගාමය හැටියට ඇතුළත් වී තිබේ. එහි ක්ෂත්‍රිය පරපුරක් විසූ බවත්, අනුරාධපුර බෝධිරෝපන උත්සවයට ගිය ඔව්හු බෝධි අංකුරයක් තෑගි ලත් බවත් එහි සඳහන් වෙයි. කැලණි රජ පරපුර අනුරාධපුර රජ පරපුරෙන් ප්‍රභවය වූ බව පෙනේ. ගිරිනුවර පාලකයා කැලණි රජ පවුලේ ඥාතියෙකි. ඔහු මාගම රජපවුලට ද සම්බන්ධ ය. මේ ඥාති සම්බන්ධකම් මතුවී පෙනෙන්නේ කාවන්තිස් රජුගේ යුගයේ දී වුව ද ඊට පෙර සිට පැවති බව පෙනී යයි.

ගිරිනුවර පාලනය ගෙනගිය රජ පෙළපත ගැන තොරතුරු කිරිමකුළු ගොල්ල ලිපිවලින් පැහැදිලි වෙයි. එහි දක්වෙන අයතිශ, අයතෙර, අයමහශිව යන ක්ෂත්‍රියවරුන් බෝධිරෝපන උත්සවයට ගිය උදවියගේ පරපුරට අයත් වූවන් බවට සැක නැත. ඔවුන් ලත් බෝධි ශාඛාව හඳගිරියේ වෙහෙරගොඩැල්ලේ මැතක් වන තුරුම තිබී අභාවයට ගියේ ය. දුටුගැමුණු මහරජු සිංහල දේශය එක්සේසත් කිරීමෙන් මේ කුඩා පාලක ප්‍රදේශ අභාවයට ගියේ ය.

නැවත වරක් සපරගමුවට අයත් ප්‍රදේශ ඉතිහාසය සමඟ බැඳෙන්නේ පළමුවන විජයබාහු රජතුමාගේ යුගයේ සිට ය. එතුමා සොළී සටනට

සේනාව එක්රැස් කළ ප්‍රදේශ අතර සපරගමුවේ ඕපනායක පෙදෙසේ වාසය කර ඇත. මහ පැරකුම්බා රජුගෙන් පසු වරින් වර සපරගමුව ඉතිහාසයට එක්වී කෝට්ටේ යුගයේ සිට විශේෂ තැනක් ගත්තේ ය. සපරගමුව ලෝක ඉතිහාසයට එක්වී ඇත්තේ බුදු පද පහස ලත් සමනළ කන්දත්' රත්න වර්ගත් නිසා බව පෙනේ.

### මහා සංඝ සභාව

සපරගමුවේ පිහිටුවන ලද ශ්‍යාම නිකායික මහා සංඝ සභාව ''සපරගමු මහා සංඝ සභා'' නම් වෙයි. ''මහා'' වචනයේ මූලිකයා, ප්‍රධානියා පළමුවෙන් ඇති වූ තැනැත්තා ආදී අර්ථ රැසක්ම දක්නට ලැබෙන බව ශබ්දකෝෂකරුවෝ කියති. කාල, මහාකාල වූයේ පළමු උපන් අය නිසා පසුව උපන්නහුගෙන් වෙන්කර ලීමට ය. ශ්‍රෙෂ්ඨාර්ථය මෙන් ම ජ්‍යෙෂ්ඨාර්ථය ද එහි වෙයි. ලංකාවේ ජ්‍යෙෂ්ඨ නිකාය ශ්‍යාම නිකාය යන හෙයින් ''මහා සංඝ සභා'' යෙදුමේ දී එම නිකායික සංඝ සභාව වාච්‍ය වෙයි. සෙසු අන්‍ය සංඝ සභාවක් ''මහා'' විය නොහැකි ය. මෙහි ලා දීර්ඝ විස්තර හෝ තර්ක විතර්ක හෝ ඇති වීමට ශාස්ත්‍රනයින් හේතු නැත.

---

දේව ඇදහිල්ලට පාපයන්ගේ පැවැත්ම බරපතල බාධකයකි. සදාකාලික යහපතට විරුද්ධ දුක, වේදනාව, අපරාධ දූෂිතකම ආදිය සර්ව බලධාරී බලවේගයට පිළිතුරක් නොලැබිය හැකි අභියෝගයකි.

— චාර්ල්ස් බැබිලෝ

# භික්ෂුව හා (පක්ෂ) දේශපාලනය

ශාස්ත්‍රපති පණ්ඩිත
**මාහල්ලේ විපුලතිස්ස හිමි**

අනුබුදු මිහිදු මහරහතන් වහන්සේ ලක්දිවට බුදු දහම ගෙන ආ ද සිට ම ලක්දිව භික්ෂුවත් දේශපාලනයත් අතර පැවතියේ අවියෝජනීය සබඳතාවකි. එද උන්වහන්සේ ලක්දිව ප්‍රථම විහාරය වූ මහා විහාරය සඳහා සීමා ලකුණු කරද්දි "ස්වාමීනි, මම සම්බුදුරජුන්ගේ ආඥාව තුළ වෙසෙනු කැමැත්තෙමි. එහෙයින් රජ මාළිගය ද ඇතුළු වන සේ සීමා බන්ධනය කරන්න" යනුවෙන් දෙවන පෑතිස් රජු කළ ප්‍රකාශනය තුළින් රජුත් පන්සලත් අතර කවරාකාර සබඳතාවක් ගොඩ නැඟී තිබුනේ ද යන්න මනාව පැහැදිලි වේ.

ලක්දිව පාලකයාත් බුදු සසුනත් අතර එද සිට ම තිබූ මේ සබඳතාව නිසා රජු හා පොදු ජනතාව අතර පැවති සීමාවන් පටු වූවා පමණක් නො ව භාරතයෙහි හෝ යුරෝපයෙහි මෙන් ප්‍රජාපීඩක ඒකාධිපතියන් බිහි නොවීමට ද හේතු විය. රජු යනු පොදු ජනතාවගෙන් ඉහළට නැඟී ආ දෙවියෙක් හෝ දේව නියෝජිතයෙක් හෝ නො ව පොදු ජනකාය අතරින් ඔවුන්ගේ සුභ සාධනය සඳහා පරමාර්ථ කොට ගෙන ප්‍රජානායකත්වයට පත් වූ තවත් මිනිසෙක් පමණක් ය යන ආකල්පය පිළිගෙන තිබූ අයුරු අනුරපුර යුගයේ රාජ්‍යත්වය පිළිබඳ යථා තත්ත්වය විමසීමේ දී පැහැදිලි වෙයි. අතරින් පතර ඉඳ හිට මෙයට වඩා වෙනස් අවස්ථාවක් දෙකක් දක්නට ලැබුන ද පිළිගත් සාම්ප්‍රදායික තත්ත්වය එය යි. අතීතයේ මෙරට සිටි සියලු පාලකයෝ පාහේ ම භික්ෂූන් වහන්සේගේ අවවාද අනුශාසනා අනුව දහම් මඟෙහි පිහිටා, ධාර්මික ව, ධර්මානුකූල ව ලෝක ශාසන සේවාව කළහ. මහා වැව් මහා දගැබ් බඳවා අර්ථයෙන් හා ධර්මයෙන් මෙරට පෝෂණය කළහ. ජාතියේ අනුශාසකයන් හා මුරදේවතාවුන් වූ භික්ෂූන් වහන්සේ සිංහල ජාතියට හෝ බුදු දහමට උවදුරක්, ආක්‍රමණයක්, විපතක් පැමිණි සෑම අවස්ථාවක දී ම නිරන්තර ප්‍රබුද්ධතාවකින් යුතු ව

සිට ඒ පිළිබඳ දැනුමක්, අවබෝධයක් පාලක පාලිත දෙපක්ෂයට ම ලබා දී එයින් දේශයත්, ජාතියත්, බුදු සසුනත් ගලවා ගැනීමට අවශ්‍ය පියවර ගත්හ. එදා සිට ම අද දක්වා ලාංකික භික්ෂූන් වහන්සේ කළ දේශපාලනය එය විය. දේශ රක්ෂණය එය විය. එම දේශපාලනයේ යෙදීම සිවුරු පටිය කරේ බැඳි දවසේ සිට ම උන්වහන්සේ තම පැවිදි ජීවිතයේ වගකීමක් හා යුතුකමක් ලෙස සැලකූහ.

එදා ලාංකික භික්ෂූන් වහන්සේ දේශය රැකීමේ පාලනය හා සම්බන්ධ කාර්ය භාරයෙහි යෙදී නියැලී ක්‍රියා කළ හෙයින් හා ඒ කාර්ය භාරය උන්වහන්සේ සතු ප්‍රධානතම වගකීමක් ලෙස මෙරට පොදු ජනතාවගේ ද පිළිගැනීම වූ හෙයින් මෙරට අතීත රජමහ ඇමති ආදී පාලකයෝ ද දැහැමෙන් සෙමෙන් රට පාලනය කිරීමට උන්වහන්සේගේ අවවාද අනුශාසනා ලබා ගත්හ. උන්වහන්සේගේ අනුශාසනාවන් නොඉක්ම වූහ. මේ රටේ බුදු සසුන සුරැකීම තම මූලික වගකීමක් ලෙස තැකූ සිංහල භික්ෂූන් වහන්සේ ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ශාසන මාමක, දේශමාමක, ධාර්මික රජකු සිහසුන්ගත කිරීමේ අත්‍යවශ්‍යතාව අවධාරණය කොට සැලකූහ. එලෙස සිහසුන්පත් රජු උන්වහන්සේගේ අවවාද අනුශාසනා ඔස්සේ සිංහල ජාතියත්, සිංහල දේශයත්, ලක් බුදුසසුනත්, ලක් සභපරපුරත් රක්ෂණය කිරීම සහ චිරස්ථායි කිරීම තම පරම යුතුකම ලෙස සිතා ක්‍රියා කළේ ය.

එදා සිට මෙරට බ්‍රිතාන්‍යයන් බලය අල්ලා ගන්නා තුරු මේ රටේ රජුත් භික්ෂුවත් අතරත පැවතුනේ මේ ආකාරයේ දැඩි සබඳතාවකි. 1815 උඩරට ගිවිසුමේ දී මෙරට පාලනය භාරගත් බ්‍රිතාන්‍ය පාලකයන් ලක් රජයේ පරම වගකීම වූ බුදු සසුන සුරැකීමේ කාර්ය භාරය නීත්‍යානුකූල ව භාරගත් නමුදු ක්‍රිස්තියානි පල්ලියේ තදබල විරෝධය හා බලපෑම යටතේ එම ගිවිසුමේ තීන්ත වේලීමට පෙර ඒ සියලු පොරොන්දු කඩා බිඳ දැමූහ.

එතැන් සිට ඉංග්‍රීසීහු ක්‍රිස්තියානි මිෂනාරි ආක්‍රමණික බලවේගයන්හි මෙහෙය වීමෙන් භික්ෂූන් වහන්සේට එතෙක් හිමි ව තිබූ පොදු ජන නායකත්වය සිඳබිඳ දැමීම සඳහාත් ගම හා පන්සල වෙන්කොට තැබීම සඳහාත්, නොයෙකුත් කුටෝපාය යෙදූහ. ක්‍රිස්තියානි පල්ලියේ නොමඳ බලපෑමත්, අවවාද අනුශාසනාත් ඇති ව ගෙන ගිය මේ ආක්‍රමණික ක්‍රියාදමයේ දී භික්ෂූන් වහන්සේට නොයෙකුත් තර්ජන, ගර්ජන හා හිංසන පීඩන ආදී නොයෙකුත් බාධකයන් ඇති කළහ. එදා උඩරට ගිවිසුමේ වූ පොරොන්දු කඩ කිරීම නිසාත් සිංහල ජාතිය හා බුදුසසුන මෙරටින් අතුගා දැමීම ඔවුන්ගේ එක ම අරමුණ බව භික්ෂූන් වහන්සේටත්, ජනප්‍රධානීන්ටත්

අවබෝධ වූයෙන් ඔවුහු ඒ ඇවට්ලිකාර ආක්‍රමණිකයන්ගෙන් ජාතියත්, ශාසනයත් ආරක්ෂා කර ගැනීම එක ම අරමුණ කොට ගෙන අභිමි වූ නිදහස යළි ලබා ගැනීම සඳහා පුළුල් සටනක් ගෙන ගියහ.

එතැන් සිට මෙරට නිදහස ලබන තෙක් මේ සටනේ අනුශාසකයන් වූයේ භික්ෂූන් වහන්සේ ය. අවවාදයෙන් පමණක් නො ව ක්‍රියාවෙන් ද උන්වහන්සේ මේ ජාතික නිදහස් සටනේ පෙරමුණ ගෙන ක්‍රියා කළ අයුරු කුඩාපොළ වැනි මහතෙරවරුන්ගේ ක්‍රියා කලාපය පෙන්වා දෙයි. අතීතයේ මහතිස්ස, මසානාම වැනි මහතෙරවරුන් රට, දැය, සමය වෙනුවෙන් අනුගමනය කළ හැඟීම්බර ආකල්පය අනුව උන්වහන්සේලා ද ක්‍රියා කළහ. වීර කැප්පෙටිපොළ, ගොංගාලේගොඩ බංඩා, පුරන්අප්පු වැනි ජාතිමාමක වීරයන් ගෙන ගිය නිදහස් සටනට පණ පෙව්වෝ උන්වහන්සේ ය. 1815 සිට ම විවිධ ක්‍රිස්තියානි හා කතෝලික බලවේග මෙ රට ආක්‍රමණය කළවුන්ට පාවාඩ එලමින් සුද්දන් හා එකතු ව ඔවුන්ගේ උපදේශකයන් වී, අද උතුරේ හා නැගෙනහිර කේන්ද්‍ර කොට ගෙන මුළු ලක්දිව පුරා ඇමෙරිකානු ඇංග්ලිකන් හා රෙපරමාදු ගැලවීමේ හමුද ආදී විවිධ ක්‍රිස්තියානි ආක්‍රමණික සංවිධාන ක්‍රියා කරන ආකාරයෙන් ම මෙරටින් සිංහලකමත් බුදුදහමත් අතුගා දැමීම සඳහා ක්‍රියා කරන්නාක් මෙන් එද ද ක්‍රියා කළහ. සුද්දන් මේ රටේ සිංහල බෞද්ධයනට කරන කෙනෙහිලිකම් මදියැ යි කියමින් බ්‍රිතාන්‍ය මහරජුට පෙත්සම් ඉදිරිපත් කළහ.

එද සිංහල ජාතියත් බුදුසසුනත් ආරක්ෂා කර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේ දේශපාලනික අරගලයක් දියත් කළහ. ක්‍රිස්තියානි සුදු ආණ්ඩුව සහ පල්ලිය තම ධන බලය හා රාජ්‍ය බලය යොද ගනිමින් මෙරටින් බුදු සසුන අතුරුදන් කිරීමට නොයෙකුත් මිලේච්ඡ ප්‍රචාර සහ පිළිවෙත් අනුගමනය කරද්දී මිගෙට්ටුවත්තේ ගුණානන්ද වැනි භික්ෂූන් වහන්සේලා පානදුරා වාදය වැනි විවිධ වාදවිවාද පවත්වමින් බුදුදහමේ බුද්ධි විෂයයක පරම සත්‍යය මහින් කිතුනු දහම වැනි දේව ආගම්වලින් එල්ල කළ ප්‍රහාරයන්හි මිථ්‍යා ස්වරූපය ලොවට ම හඩ නගා කියමින් හෙන්රි ස්ටීල් ඕල්කට්, බ්ලැවැස්කි මැතිණිය වැනි විද්වතුන් ලක්දිවට ගෙන්වා ගෙන තමා ගෙන යන සාධාරණ සටන සඳහා ආධාරෝපකාර ලබා ගත්හ. වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේ විසින් දල් වූ සිංහල භාෂා සාහිත්‍යය ඇතුළු ප්‍රාචීන පාණ්ඩිත්‍යයේ පහන්සිල හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක වැනි මහ පඬිරුවන් විසින් විද්‍යොදය, විද්‍යාලංකාර වැනි මහ පිරිවෙන් අරඹමින් තවතවත් ආලෝකවත් කළහ. මේ අතර අනගාරික ධර්මපාල තුමා වැනි ජාතික

වීරයෝ මිථ්‍යාදෘෂ්ටික පරසුද්දන්ගෙන් හෙළබිමත් බුදු දහමත් බේරා ගැනීම සඳහා ඉදිරියට එන ලෙස සිංහල බෞද්ධයන්ගේ කන් බිහිරි කරවන කාහල නාදයක් නඟන්නට වූහ. පඩික්කං පිරවීමට වඩා විශාල වගකීමක් හා කාර්‍ය්‍ය භාරයක් භික්ෂූන්ට ඇති බව ධර්මපාල තුමා හඬ නඟා කියා සිටියේ ය. ටිබැට් ජාතික ඇස්. මහින්ද හිමියෝ සිංහල ජාතියට සිදු වී ඇති මේ හානිය, විනාශය, ආක්‍රමණය, නොපෙනීමට හේතුව සිංහලයන්ගේ ඇස්ගෙඩිවලට හෙන ගසා තිබීමද යි ප්‍රශ්න කරමින් පෙන්නා දුන්නේ කුමක් ද ? මේ ලක්බිමෙ සිවුරු දරු කවරෙකුගේ වුව ද එක ම යුතුකම එක ම වගකීම සිංහලකමත් බෞද්ධකමත් ආරක්ෂා කිරීම බව නොවේ ද ?

එහෙත් අවසානයේ මෙරට නිදහස ලබන අවස්ථාව වන විට සිදු වූ තත්ත්වය කුමක් ද ? නවසිය හතළිස් ගණන් වන විට මේ රටට නිදහස ලබා නොදිය හැකි තත්ත්වයක් උදා වී ඇති බව පෙනී ගිය ඉංග්‍රීසිහු ක්‍රිස්තියානි පල්ලියේ ද ජාත්‍යන්තර කුමන්ත්‍රණකරුවන්ගේ ද අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයන්ගේ ද උපදෙස් පරිදි ක්‍රියා කළහ. ඒ අනුව ඔවුන් විසින් ප්‍රදානය කරනු ලබන නිදහස, මෙරට ජනහද ගැහෙන රිද්මයේ උත්පාදක බලවේගය වූ භික්ෂූන් වහන්සේට හෝ උන්වහන්සේගේ අවවාද අනුශාසනා වලට සවන් දෙන හෝ පිරිසක් හෝ කෙනෙකු අතට යා නොදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම යි. බටහිර ක්‍රිස්තියානි පසුබිම යටතේ පිහිටුවන ලද ඔවුන්ගේ අධ්‍යාපන ආයතන විසින් බිහි කරන ලද්ද වූ ද, බටහිර සංස්කෘතික දූහු හරයන් විසින් තෙම්පරාදු කිරීමෙන් සිංහල බෞද්ධ සාංස්කෘතික ගති ලක්ෂණයන් අකාමිකා දමන ලද්ද වූ ද, යුරෝපීය අධිරාජ්‍යවාදී සුදු පාලකයන් තම ස්වාමිවරුන් කොට සලකන්නා වූ ද, ඔවුන්ටත් වඩා ඉහළින් ස්වදේශියත්වය පාගා පරදේශියත්වය ඉස්මුදුනින් පිළිගන්නා වූ ද, අන්ධ අනුකාරකයන් ලෙස පරදේශීයත්වය හිසින් ගෙන ඔවුන්ට බැලමෙහෙ කරන්නා වූ ද, තමාගේ අතීතයත් ඉතිහාසයත් නොතකන්නා වූ ද, පරගැති කුප්පහියන් රැළක් ඒ සඳහා වේලාපහින් ම හදවඩා තබා ඔවුන් අතට එම නිදහසේ දයාදය භාර දීමට කටයුතු සැලසීම එහි ප්‍රධානතම කාර්යය විය.

ඔවුන් මෙරට නිදහස උරුම කරගත් ද සිට කළේ කුමක් ද ? තමාට ඒ නිදහසේ සසුන්පත ලබා ගැනීම සඳහා දහදිය සහ ලේ වැගුරූවා වූ සිය දහස් ගණන් වීරෝදාර අතීත මුතුන් මිත්තන් ගෙන ගිය අභීත වීර වික්‍රමාන්විත සාඩම්බර විමුක්ති අරගලය පිළිබඳ සියලු ඓතිහාසික සත්‍යයන් අකාමකා දැමීම යි. මෙරට සිංහල බෞද්ධ ඉතිහාසය අකාමකා දැමීම සඳහා නොකළ තිරශ්චීන මලේච්ඡ ජඩකමක් නැති තම හාම්පුතුන් වූ සුද්දන්ගේ කළු ලපවල සුදුහුණු ගෑම යි. 1818 සහ 1848 ආදී ඓතිහාසික

අරගලයන් තුළින් සුද්දන්, මෙරට ගම්නියම්ගම් වසා දෝරේ යැවූ සිංහල බෞද්ධයාගේ රුධිර ප්‍රවාහය පිළිබඳ ව අබමල් රේණුවක් හෝ තැකීමක් නොකිරීම යි. වීර කැප්පෙටිපොළ, පුරන්අප්පු, ගොංගාලේගොඩ බංඩා, කුඩාපොළ හිමියන් වැනි වීරයන්ගෙන් උදුරා ගත් ධීරවීර අභිමානවත් ජීවිත ඉදිරියේ ගොළු බිහිරන් සේ සිටිමින් එක ද ලේ බිඳුවක් නොසොල්වා ඉංග්‍රීසීහු මල් බඳුනක තබා අපට නිදහස ප්‍රදනය කළ බව කියා පෑම යි. සුද්දන්ට, බටහිර කතෝලික ක්‍රිස්තියානි පල්ලියට පරගැති බවට ආවැඩීම යි.

නිදහස සඳහා සටන් කළ මෙරට භික්ෂූන් වහන්සේ ඇතුළු පොදු ජනතාව 1948න් පසු යළිත් දකුණු ඉන්දීය ද්‍රවිඩයන් ඇතුළු බටහිර යුරෝපිය ජාතීන් තුනක් විසින් ඔද තෙද සිඳ දැමූ සිංහල බෞද්ධ උරුමය පුනරුදයට පත් කොට නිදහස් නිවහල් ජාතියක් වශයෙන් නැඟී සිටිය හැකි ය යන උද්දමයෙන් පරම චිත්තප්‍රීතියට, අමන්දනන්දයට පත් වූහ. එහෙත් සිදු වූයේ කුමක් ද ? බටහිර සංස්කෘතිය විසින් සංකර කරනු ලැබූ මේ බමුණු කුලය තමාගේ හම කළු වීමේ දෝෂයෙන් මහත් දුක්ඛ දෝමනස්සයන්ට පත් ව සුද්දන්ටත් වඩා සාහසික ලෙස හා අන්ධානුකරණ ලෙස මෙරට සිංහලකමත් බෞද්ධකමත් අකාමකා දැමීම සඳහා කැසපට කවා ගැනීම යි. කතෝලික හා ක්‍රිස්තියානි පල්ලියේ හා පාසලේ නොමඳ ආශීර්වාදය ලබමින් කොක්ටේල් පාටි, හුලාහුප්, රොක්ඇන්රෝල් නටමින් මේ සිංහල ද්වීපය, ධර්මද්වීපය එක ම පුංචි එංගලන්තයක්, පැරිස් පුරවරයක්, රෝමයක් කිරීමට වලිකෑම යි.

නිදහසට පසු ව උදා වූ මේ තත්ත්වය සුද්දන් විසින් අපේක්ෂා කළ දෙය යි. එතෙක් යට වී පැගී සිටි සිංහල බෞද්ධයා පාගා දැමීමේ, එතෙක් ඔවුන් ජීවිත පුද රැකගත් උදාර ජාතික ආගමික උරුමයන් සුණුවිසුණු කිරීමේ කොන්තරාත්තුව ස්වදේශීය කළු සුද්දන් විසින් නිදහසේ ව්‍යාජයෙන් භාර ගැනීම යි. මේ පසුබිම යටතේ භික්ෂූන් වහන්සේටත් ජාති හිතෛෂීන්ටත් නැවතත් තමන්ට අහිමි වෙමින් පවත්නා මේ උරුමයන් ලබා ගැනීමටත් ආරක්ෂා කර ගැනීමටත් කිසියම් ක්‍රියා මාර්ගයක් ගැනීමට සිදු විය.

දේශපාලන භික්ෂූන් නමින් හා භික්ෂු දේශපාලනය නමින් අධිරාජ්‍යවාදී දේශීය ආක්‍රමණික පරගැතියන් විසින් නින්ද අපහාස කොට හංවඩු ගසනු ලැබුවා වූ ද, ඔවුන් විසින් ලත් තැන ම ලොප් කොට දැමීමට දිරි ගත්තා වූ ද, ලාංකික භික්ෂු බලවේගය නැඟී ආවේ මෙරට ඉතිහාසය විසින් උන් වහන්සේට උරුම කොට දුන් ඓතිහාසික වගකීම හා කාර්‍ය්‍ය භාරය ඉටු කර ලීමේ පරමාර්ථයෙනි. භික්ෂූන් වහන්සේ තැබූ මේ යෝධ පියවරින්

යට කී දේශීය බැලයන් මෙන් ම ආක්‍රමණික බලවේගයන් ද කෙතරම් බියකට, තැති ගැන්මකට, ලොමු ඩැහැ ගැනීමකට පත් වූවාහු ද යන්න ''භික්ෂූන්ට දේශපාලනය එපා'' යන සටන් පාඨය පොදු ජනතාව වෙත ඉදිරිපත් කොට මේ ව්‍යාපාරයේ පෙරමුණ ගත් භික්ෂූන්ට ගසා, තලා, මරා, ඔළු පලා, තර්ජන ගර්ජන කොට මහත් මර්දනකාරී ව්‍යාපාරයක් එයට එරෙහි ව දියත් කිරීමෙන් පැහැදිලි විය. ඒ ප්‍රතිගාමී බලවේග හා ඔවුන්ගේ දේශීය බැලයන් නිදහස් අධ්‍යාපනය, සිංහල භාෂාව, බෞද්ධ අයිතිවාසිකම් ආදිය දිනා ගැනීම සඳහා පෙරමුණට ආ සියලු ම බලවේග ලත්තැන ම ලොප් කොට දැමීම සඳහා මේ ආක්‍රමණික බලවේග දේශීය වූ සියල්ල කෙරෙහි කෙතරම් දැඩි ආඝාත්මක ද්වේෂයක් තිබුණේ ද යන්න සක්සුදක් සේ පැහැදිලි කළහ.

කෙසේ නමුත් 1948න් පසු දේශීය කළු සුද්දන්ගේ, අනුකාරක පරගැතියන්ගේ ග්‍රහණයෙන් මැකී, මිළින වී යන තම උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා සිංහල බෞද්ධයාත් භික්ෂූන් වහන්සේත් ගෙන ගිය නිහඬ බලවේගය, 1956 වන විට මුහුකුරා ගොස් තිබුණි. ඒ වන විට ගමේ ගොවි මිනිසාටත් සිංහල ගුරුවරයාටත් කුරුඳුවත්තේ ආයම්මලාටත් සීමා කොට තිබූ සිංහල භාෂාව, භික්ෂූන් වහන්සේත් පිරිවෙනත්, සිංහල වෙදමහතාටත් සීමා කොට තිබූ සිංහල සාහිත්‍යය හා කලාවත්, කොක්වේල් පාටිකාර, ටොප් හැට්කාර, බාල් නැටුම්කාර, අනුකාරක කළු සුද්දන් විසින් නොතකා ඉවත ද තිබූ සිංහල බෞද්ධ සංස්කෘතියත් කලඑළි බැසීමේ පරිනත භාවයෙන් සුහුඹුල් බවට පත් ව තිබුණි. ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මේ සියලු බලවේගයන්හි ආවේගාත්මක ශක්තිය තම දේශපාලන අරමුණ හා එක් කොට තම ජයග්‍රහණය සඳහා මෙහෙය වූ යුගපුරුෂයෙක් විය.

එතැන් සිට සිදු වූයේ කුමක් ද ? යට කී ආක්‍රමණික බලවේග තමාගේ පරාජය පිළිගනිමින් අඩුපඩු හකුලා ගෙන සිටීම ද ? නැත ; නැත. තම ආක්‍රමණික ක්‍රියාදාමය තවතවත් සියුම් කරමින් උපක්‍රමශීලී භාවයට පත් කරමින් පනස්හයේ සිංහල බෞද්ධයා ලත් ජයග්‍රහණය සිඳ බිඳ දැමීම සඳහා ක්‍රියාත්මක වීම යි. එහි ප්‍රථම පියවර වූයේ එම ජයග්‍රහණයේ ප්‍රධානතම බලවේගය වූ භික්ෂු සමාජයේ සාමාජිකයකු ලවා ම අගමැති බණ්ඩාරනායක ඝාතනය කළ බවට චෝදනා නැඟීම යි. තමා බණ්ඩාරනායක මහතා ඝාතනය නොකළ බවත් තමා කළ බවට කියා සිටින්නැ යි කියා කී බවත් වැදගත් අවස්ථා දෙකක දී ම සෝමාරාම ප්‍රකාශ කළත් ඒ අවස්ථාවේ සිටි වගකිව යුතු කිසිවෙකු විසින් එසේ කියන්නැ යි තමාට ඉගැන්නුවේ කවුරුන්දැ යි කියා සෝමාරාමගෙන් නොවිමසූ බව මලල්ගොඩ මහතා සිය බණ්ඩාරනායක ඝාතන නඩු විභාගය පිළිබඳ පොතේ දී කියයි. එසේ

ඔහුගෙන් අසා දැන ගැනීමට සිටි වගකිව යුතු සියලු දෙනාට ම එද මුකවාඩම් බැඳ සිටි අයුරෙනුත්, එම නඩුවේ ප්‍රධාන විත්තිකාරියක වූ විමලා විජේවර්ධන ඒ ක්ෂණයකින් ක්‍රිස්තියානිය වැළඳ ගෙන නිදහස ලැබීමෙනුත්, සෝමාරම එල්ලුම්ගහට නියම වූ පසු කිතුසමය වැළඳ ගත් ආකාරයෙනුත්, එහි ප්‍රධාන විත්තිකරුවෙකු වූ බුද්ධරක්ඛිතගේ හදිසි හා අදිසි මරණයෙනුත් 56 පොදුජන ජයග්‍රහණයේ පසුබිමේ මේ ආක්‍රමණිකයන් කවරාකාර වැඩ කොටසක් ඉටු කර ඇද්ද යන්න මනාව පැහැදිලි වේ.

ඒ අතර ම මේ බණ්ඩාරනායක ඝාතනය මෙරට ඉතිහාසය තුළ මහා ම ඛෙදවාචකයක් වූවා පමණක් නො ව අන්තර්ජාතික ජනතාව තුළ මහත් කම්පනයක් ඇති කිරීමට ද සමත් සිද්ධියක් විය. මේ ඝාතනය පසුබිමේ සිටි බලවේග බණ්ඩාරනායක ඝාතනය තුළින් අරමුණු කිහිපයක් ම ඉටුකැර ගැනීමට ඉලක්ක කොට තිබූ බව පෙනේ. ඉන් පළමු වැන්න නම් ඉතිහාසයේ වසර දහස් ගණනක් තිස්සේ දකුණු ඉන්දීය ආක්‍රමණිකයන් විසින් හා වසර සිය ගණනක් තිස්සේ යුරෝපීය ආක්‍රමණිකයන් විසින් මෙරට අල්ලා ගැනීම සඳහා ගෙන ගිය ආක්‍රමණික ක්‍රියාදමය, බණ්ඩාරනායක මහතා විසින් සිදු කළ ජනසතු ව්‍යාපාරයත්, සිංහල රාජ්‍යභාෂාකරණයත්, බුදු දහමට දුන් ප්‍රමුඛස්ථානයත් ආදි හේතු නිසා ඇනහිටීමත් එයට බාධා පැමිණීමත් නිසා සිදු වූ බාධකය ඔහු ඝාතනය කිරීමෙන් ඉවත් කර ගැනීම යි. දෙවැන්න භික්ෂු සමාජයේ සාමාජිකයෙකු ලවා ඔහු ඝාතනය කරවූ බව කියවා ඔහු කෙරෙහි ඉමහත් බලාපොරොත්තු තැබූ සමස්ත පොදු ජනතාව තුළ මුළු භික්ෂු සංහතිය කෙරෙහි ම දැඩි පිළිකුලක්, පළි–ගැනීමක් ඇතිකරවා ඒ ඔස්සේ ඒ වන විට නැඟී ආ ලාංකික භික්ෂු සමාජයේ බලය ලත් තැන ම ලොප් කොට දැමීම යි. මෙරට දේශපාලන බලවේගයේ පෙරමුණ ගැනීමට ඉතිහාසය විසින් මෙරට භික්ෂුවට අත්කර දී තිබූ උරුමයන් සිඳ බිඳ දැමීම යි.

මේ ප්‍රධාන ඉලක්ක ඔස්සේ තවත් දහසක් ලොකු කුඩා අරමුණු ඔවුහු බණ්ඩාරනායක ඝාතනය තුළින් ඉටු කර ගැනීමට සැලසුම් කර තිබුණි. උපකෘත පාසල් රජයට පවරා ගත් අවස්ථාවේ එක්තරා පාදිලිවරයෙකු විසින් කියූ පරිදි අනාගතයට භී විදීමේ ඔවුන්ගේ ක්‍රමය අනුව පණස් හයේ ලත් පහරින් දැඩි ලෙස පාඩම් ඉගෙන ගත් මේ ආක්‍රමණික බලවේග මෙරට සිංහල බෞද්ධ බලය යළි නැඟී සිටිය නොහැකි වන අයුරින් මැඩලීම සඳහා අවශ්‍ය පියවර ගත්හ.

ඒ අනුව කොක්කෙන් බැරි නම් කෙක්කෙන් කීවාක් මෙන් බණ්ඩාර නායක ඝාතනයෙන් පසු මෙරටින් භික්ෂු ශාසනය අතුරුදහන් නො වූ

බැවින් තම අභිමතාර්ථ සාධනය සඳහාත් භික්ෂූන් අතර ඇතිව තිබූ සමගිය සිඳ බිඳ දැමීම සඳහාත් භික්ෂුව පක්ෂ දේශපාලනය වෙත උපක්‍රමශීලී ව නැඹුරු කර වූහ.

අද ලක්දිව තුළ බිහි වී ඇති පක්ෂ දේශපාලන හෙවත් භික්ෂු දේශ පාලනය එය යි. එහි දී ඔවුහු පියවර කිහිපයක් ම අනුගමනය කළහ. ඉන් පළමු වැන්න නොයෙකුත් ආකාරයේ සත්කාර සම්මාන, වන්දන මානන, ගරුසරු, නිලනිවාස, නිල රථ, ගුරුලහු පූජා, විදේශ සංචාර ආදි වංචනික ක්‍රමයන්ගෙන් හෙවත් කුටෝපායයන්ගෙන් තමාට නමා ගත හැකි ඒ ඒ නිකායයන්හි මහානායක, අනුනායක ආදි මහතෙරවරුන් වක්‍ර වූ අල්ලස් දනයෙන් නම්මා ගෙන මුඛවාඩම් බැඳ තැබීම යි. අනෙක් අතට සංඝ සමාජයේ ශාසනික වශයෙන් කිසිදු සුදුසුකමක් හා පිළිගැනීමක් නැති ව සිටි අල්පශ්‍රැත, අල්පඥ, ලාභසත්කාර සිලෝකකාමී, අශාසනික මහට පිළිපන්, විධිමත් ගුරු ඇසුරක් නොලත් සාමණේරයන්ට පවා මහානායක, අනුනායක අර මහාලේකම්, මේ මහාලේකම්, අධ්‍යක්ෂ ජනරාල් ආදි පදවි තනතුරු පුදමින් වාචාලකමත් මුඛරිකමත් එක ම සුදුසුකම ලෙස තකමින් නොයෙකුත් අංකට්ටු පළඳවමින් ඔවුන්ගේ පුවත්පත් ආදි සන්නිවේදන මාධ්‍ය මගින් ශාසනික නමින් හැඳින්වුණු නොයෙකුත් ධානාන්තර ප්‍රදනය කිරීම යි. එසේ ප්‍රදනය කරමින් මෙරට වහල් භාවයට, ආක්‍රමණයට, සිංහල බෞද්ධ බලය යටකර දැමීමට විවිධ වූත්, විචිත්‍ර වූත් උපක්‍රම යෙදීම යි. එසේ ම මේ සියල්ලට එරෙහි වූ සිංහල බෞද්ධකම රැක ගැනීම සඳහා ඇපකැප වූ භික්ෂූන් වහන්සේ පොදු ජනතාව තුළ ඒ පිළිබඳ දැනුවත් කිරීමක්, පිබිදවීමක් ඇති කිරීමට ක්‍රියා කරන විට, අර බලවේග තමා විසින් යට කී ලෙස තනතුරු ප්‍රදනයෙන් ඔසවා තබනු ලැබූ ගැති හා බැල පිරිස් එළියට ගෙන මහා සංඝයාගේ අදහසයැ යි, ලාංකික භික්ෂූන් වහන්සේගේ හඬයැ යි කියමින් ඔවුන් ලවා එම ආක්‍රමණිකයන්ගේ හඬ දෝංකාර නංවනු ලැබූහ. එතෙක් සිංහල ජාතියේත් බුදුසසුනේත් මුරදේවතාවුන් ලෙස ජාතික විමුක්ති අරගලයේ නියාමක බලවේගය වූ පණස් හයේ නැඟී සිටීමේ ප්‍රධාන හා මූලික බලවේගය වූ භික්ෂූන් වහන්සේගෙන් ඇතැම් කොටස් මෙසේ ආත්මාර්ථයට නම්මා, පෞද්ගලික ආරාම, යානවාහන, නිලනිවාස, ආහාරපාන ආදියෙන් සුඛෝපභෝගී දිවියකට නැඹුරු කොට ඒ වරප්‍රසාද තමාට හිමි කර දුන් ඒ ජාතිභ්‍රෂ්ඨ බැලයන් බලයේ රඳවා ගැනීම සඳහා ආත්ම කාමයෙන්, බල කාමයෙන්, සුඛ කාමයෙන් මත් කරවා තැබීමට ඒ සිංහල විරෝධී, බෞද්ධ විරෝධී

ආක්‍රමණිකයෝ ක්‍රම හා විධි යෙදූහ. මේ බලවේග මේ රට තුළ දේශීයත්ව යත්, අනන්‍යතාවත් ආරක්ෂා කර ගැනීමට කවර පක්ෂයක් හෝ සංවිධානයක් සූදනම් වුවහොත් එයට එරෙහි වූ නොයෙකුත් ප්‍රතිසංවිධාන ගොඩ නඟා ඒවා හෙද කොට මහා ජංජාලයක්, එක ම කැඳ හැළියක් බවට පත් කළහ. හතු පිපෙන්නාක් මෙන් බිහි කළ සෑම පක්ෂයකට ම කවර හෝ භික්ෂුවක් මුලසුන් ගැන්වීමට පෙ ළඹූහ. එවිට ඒ භික්ෂුව බුදු දහමටත් මහණකමටත් වඩා පක්ෂයේ පාට මහත් කොට සලකන්නට වෙයි. විනයේ නීතිරීතිවලට වඩා පක්ෂයේ ප්‍රතිපත්ති ලොකු කොට සලකයි.

ඉතිහාසයේ විසර දහස් ගණනක් තිස්සේ මෙරට භික්ෂුව දේශපාලනයට බැස්සේ ඇයි ? මේ රටේ බලයට පැමිණෙන්නා තම ආත්මාර්ථය, සුඛ විහරණය, බලකාමය තෘප්තිමත් කර ගැනීම තම යුතුකම හා වගකීම නොවන බවත් ඒ සඳහා කවර පාවාදීමක් හෝ කිරීමට නොවන බවත් ඔහු විසින් ඉටු කළ යුතු ලෝකශාසන සේවාවක් ඇති බවත්, එය කළ යුත්තේ කෙස් ද යන්න පෙන්වා දීම සඳහාත් බව අපගේ ඉතිහාසය තුළින් පෙන්වා දෙයි. මේ අරමුණට විලෝම වූවන් රාෂ්ට්‍ර පාලනයෙන් ඉවත් කොට අනුලෝම වූවන් ඒ සඳහා පත් කර ගැණීම පිණිස බව පෙන්වා දෙයි. 1948 නිදහස සියතට ගත් දේශීය කළු සුද්දන් කළේ කුමක් ද ? නූතන නිදහස් සටනේ පතාක යෝධයා වූ, ආරම්භක නියමුවා වූ අනගාරික ධර්මපාල තුමා විසින් අප නිදහස ලබා ගැනීමෙන් පසු පුනරුත්ථාපනය කළ යුතුයැ යි පෙන්වා දුන් මඟට සම්පූර්ණයෙන් ම ප්‍රතිවිරෝධී ව දේශීය කළුසුද්දන් ලෙස සිය අධිරාජ්‍යවාදී සංකර ටොප්හැට්කාරයන්ට දරදිය අදිමින් බැලමෙහෙකම් කිරීම යි. අපගේ සිංහලකම, බෞද්ධකම හා අතීත උරුමයන් ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන්ගෙන් කිසිදු පිටිවහලක් නොලැබෙන බව දුටු මෙරට භික්ෂූන් වහන්සේත් සිංහල බෞද්ධ පොදු ජනතාවත් දෙදහස් පන්සියයේ බුද්ධ ජයන්තිය පසුබිම් කොට ගෙන එම වැලලී උරුමයන් හා අයිතීන් ලබා ගැනීම සඳහා ඒකරාශී වූහ. සියලු ආක්‍රමණික බලවේග අභිබවා මේ පොදුජන බලවේගය නැඟී එනු දුටු ප්‍රතිගාමී ආක්‍රමණික බලවේග කළේ කුමක් ද ? භික්ෂූන්ට දේශපාලනය එපායැ යි කියමින් බුදු දහම තිබෙන්නේ රජය තුළ නොව හදවත් තුළයැ යි බෙගල් ඇදබාමින් එම ව්‍යාපාරයේ පෙරමුණ ගත් භික්ෂූන්ට නොයෙකුත් නින්ද අවලාද කියමින් ගමත් පන්සලත් අතර තිබූ සබඳතාව කඩා බිඳ දැමීමට දිරි දැරීම යි.

ඒ අද භික්ෂු දේශපාලනය යි. එහෙත් අද යට කී අයුරින් සියල්ල වෙනස් කොට ඇත. මේ ප්‍රතිගාමී ආක්‍රමණික බලවේග ඇතැම් භික්ෂූන් තම දේශපාලන මෙවලමක් බවට පත් කොට ගෙන ඇත. තමා බලයේ සිටිනතාක් කල් ඔවුන්ගේ ඉසුරුමත් දිවි පෙවෙත රැකෙන බව තහවුරු කරවා ඇත. ඔවුන්ගේ මේ පාවාදීමේ ආත්මාර්ථකාමී බවට එරෙහි ව අවංක ව ජාතික හා ආගමික හැඟිමකින් ක්‍රියා කරන භික්ෂූන් එක්කෝ තම පිළට ඇද ගැනීමට නැතහොත් කවර උපක්‍රමයකින් හෝ වධ ඝාතන ආදියෙන් හෝ විනාශ කොට දැමීමට හෝ මේ ප්‍රතිගාමී බලවේග ක්‍රියා කරති. පෞද්ගලික සුඛෝපභෝගයේ හා වරප්‍රසාද ආදියෙහි ඇලී ගැලී ක්‍රියා කරන ඒ භික්ෂූන් ද තමා පක්ෂපාතකම් දක්වන දේශපාලන පක්ෂයේ අයිතිවාසිකම් රැකීමටත් තහවුරු කිරීමටත් ක්‍රියා කරනු විනා සමස්ත ජාතියට හෝ බුදුසසුනට එරෙහි ව ඒ ප්‍රතිගාමී ආක්‍රමණිකයන් ගෙන ගිය ක්‍රියාකලාපයන්, වැලැක්වීම සඳහා ගත් පියවර කුමක් ද ? පෞද්ගලික ලාභ ප්‍රයෝජන හා සුඛ විහරණ ඉදිරියේ ජාතික හා ශාසනික විලෝපයන් හමුවේ දත කට පියාගෙන සිටියා මිස එක වචන මාත්‍රයකින් හෝ එයට විරෝධයක් පැවාහු ද ? පණස් හයෙන් පාඩම් ඉගෙන ගත් ආක්‍රමණික බලවේග දේශපාලනකරණයට භික්ෂූන් හසු කර ගැනීමේ ප්‍රතිඵලය එය යි. එයින් සිදු වූ හානිය එපමණක් ද ? කිසියම් පක්ෂයකට අයත් පිරිසක් එයට එරෙහි පක්ෂ කෙරෙහි දක්වන ප්‍රතිරෝධය, ද්වේශය, වෛරය, පිළිකුල, නොමනාපය, හා කටුක විවේචන හා වාග් ප්‍රහාරයන් එම පක්ෂයට ගැතිකම් දක්වන භික්ෂූන් කෙරෙහි ද එල්ල වීම යි. එයින් උන්වහන්සේ කෙරෙහි විරෝධාකල්පයක් පොදු ජනතාව අතරත ගොඩ නැඟෙනවා පමණක් නො ව උන්වහන්සේ කෙරෙහි තිබූ ගෞරවනීය තත්ත්වය ද විශ්වාසය ද පිරිහෙලීමට පත් වීම ද සිදු විය. මෙය භික්ෂුවගේ බලයත් ගෞරවයත් සිඳබිඳ දැමීමට මාන බලමින් සිටි අන්‍යාගමික ආක්‍රමණික බලවේගවලට ඉටු කර ගැනීමට අපේක්ෂා කළ දෙයකි. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත් ඔවුහු අනෙක් පැත්තේ පක්ෂයේ භික්ෂූන්ට දෝෂාරෝපනය කරන මුවාවෙන් පුවත්පත් ආදී සන්නිවේදන මාධ්‍යයන් මඟින් හා පොදුජන ස්ථානයන්ට වී මුළු ලාංකික භික්ෂු සංඝතියට ම නින්ද අපහාස පරිභව බිණීමට අවස්ථාවක් කර ගත්හ.

මේ සියලු ජාතික ආගමික පරාභවයන් මෙසේ සිදු වෙද්දී සමස්ත ලාංකික භික්ෂු සමාජය ම මෙවැනි පිළිවෙතක් අනුගමනය කළ බව මෙයින් නොකියැ වෙයි. අතීත හෙළ සංඝ පීතෘන් හෙළ දියත් බුදුසසුනත් සුරැකීම සඳහා ගිය මඟ යමින් මේ සියලු ආක්‍රමණික බලවේග හා බල ලෝභ අතරේ නොසැලී, නොනැමී ක්‍රියා කරමින් තම ජාතිය හා ශාසනික මෙහෙවරෙහි නියැලුණු භික්ෂූහු විශාල පිරිසක් ද සිටිති. එහෙත් උන්වහන්සේගේ

බලයට හා ශක්තියට ඉහළින් අද දේශපාලකයා සිය අණසක පැතිර වීමට තරම් ශක්තිමත් වී ඇති නිසාත් පොදු ජනයා ද පක්ෂ දේශපාලන අන්ත වාදයෙන් මංමුලාව සිටින නිසාත් උන්වහන්සේගේ හඬට නො ඇසෙන කණ් ව සිටිති.

අද පක්ෂ දේශපාලනය විසින් මෙරට භික්ෂු ව්‍යූහයත් එහි චින්තනයත් මේ අයුරින් විකෘති කොට ඇත. තම බලය තහවුරු කර ගැනීම පිණිස දහසක් බොරු පොරොන්දුවලින් ජනතාව රවටීම අද දේශපාලනයේ මූලික ප්‍රතිපත්තිය වී ඇත. තම පාක්ෂිකයාට හැර අන් කිසිවෙකුට යහපතක් වන කිසිවක් ක්‍රියාත්මක නොකිරීම ද ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාවට නඟති. ප්‍රතිපාක්ෂිකයන් කෙරෙහි බැඳගත් දැඩි ආඝාතමක වෛරයකින් උන්ගේ උන්හිටි තැන් පවා සුන්නත් දූලි කිරීමට පොදු ජනතාව පොළඹවන අයුරු පසුගිය දශක කිහිපයේ ම පිළිබිඹු කෙරිණි. ඉතා සුළු කටයුත්තක් සඳහා වුව ද අසහාය බලයක් පැමේ ශක්තියක් ප්‍රදේශයේ මන්ත්‍රීට ආරෝපනය කිරීමෙන් පොදු ජනතාව මන්ත්‍රී වන්දනය වෙත යොමු කරවා ඇත. බොහෝ මන්ත්‍රීහු තම ජයග්‍රහනයත්, බහුතර ඡන්දයත් තමා වෙත ලබා ගැනීම සඳහා මැර සංවිධාන පිහිටුවා ගන්නා තත්ත්වයට පත් වී ඇත. පක්ෂ දේශපාලනය රටේ සියලු ම ආර්ථික හා සාමාජික අර්බුද හා ගැටළු නිවාරණය කරන සර්වරෝග නිවාරකයක් ලෙස හා දේශපාලකයා ඒ සකලවිධ ව්‍යාධි පිළිබඳ නිදනයට පිළියම් දන්නා දිව්‍ය ඍෂිවරයකු ලෙස හැඟෙන ආකාරයේ පිළිගැනීමක් පොදු ජනතාව අතර ඇති කර වූහ. අනාගත සමෘද්ධියක් පිළිබඳ බොරු බේගල් ඇදබාමින් පොදු ජනතාව රවටා තම තමාගේ ඉසත් බඩත් සම්පතුත් වඩා ගත් මොවුහු උන්ගේ ප්‍රතිපත්තිවලින් පොදු ජනතාව අන්ත දිළිඳු භාවයට පත් කොට ඔවුන් මැති ඇමතියන් ඉදිරියේ යදින්නන් බවට පත් කළහ. ඉල්ලන්න ලැබෙනු ඇත යන්න ඔවුන්ගේ ආදර්ශ පාඨය විය. ඡන්ද කාලය වනාහි අහස උසට කරනු ලබන ඉල්ලීම් හා ප්‍රදනයන්ගෙන් පිරුණු එක ම ගාලගෝට්ටියක් වෙයි. ඉහළ ම දීමනාවෙන් හා මහා ම වංචාවෙන් ජනතාව මුලා කර විය හැක්කා ජයග්‍රහණය කරනු ලබයි. ගම්බද ව තිබූ ස්වයං ආර්ථික රටාව සුණුවිසුණු කර දමා ඇත. මන්ත්‍රීතුමා නුදුන්නොත් කිසිවක් නොලැබෙන තත්ත්වයට පත් ව ඇත. මන්ත්‍රී අමනාප වුවහොත් කිසිවෙකුට රැකියා නැති විය. පාරක් තොටක් නැති විය ; කොටින් කියතොත් සියල්ල නැති වන තත්ත්වයක් උදා විය. පරාජිතයාගේ සියල්ල අහිමි විය. සමහර විටෙක ඔහුගේ පමණක් නොව පවුලේ සියලු දෙනාගේ ම ජීවිත පවා අහිමි විය. මේ පක්ෂ දේශපාලනය වසර දහස් ගණනක් තිස්සේ ප්‍රතිගාමී

ආක්‍රමණික බලවේග විසින් මෙරටින් සිංහලකමත්, බෞද්ධකමත් අකාමකා දැමීම සඳහා යෙදූ උපක්‍රමයන් අතර ඉතාමත් පහසු හා ඵලදායි උපක්‍රමය බවට පත් විය.

භික්ෂූන් වහන්සේ වනාහි පඩික්කං පුරවමින් සිටින, ඉංග්‍රීසි නොදන්නා වූ, නූගත් පිරිසක් ලෙසින් ප්‍රසිද්ධියේ කියා පෑ ජේ. ආර්. ජයවර්ධන තමාට දේශපාලන උපදෙස් දීමට නොඑන ලෙස එදා භික්ෂූන්ට කියා සිටියේ ය. එක් පැත්තකින් මෙසේ භික්ෂූන් පරිභාසයට ලක් කරමින් පාලකයාට අවවාද අනුශාසනා කිරීමෙහි ලා උන්වහන්සේ සතු උරුමය ප්‍රතික්ෂේප කළ අතර අනෙක් අතින් දේශපාලන පාක්ෂිකයා හෙවත් මන්ත්‍රී වෙත සියලු ආකාරයේ ම බලය එක්තැන් වෙන ලෙසට කරුණු සැලසූහ. මන්ත්‍රී නිවෙසත් පක්ෂ කාර්යාලයත් ඔවුන්ගේ වන්දනා මධ්‍යස්ථාන බවට පත් කළහ. ඇතැම් විට උප්පැන්න සහතිකයේ සුදුසුකමින් පමණක් මැති ඇමති තනතුරු ලබා ගත් දේශපාලකයා එක ම ප්‍රාඥයා බවට පත් කළහ. ඔහු ඇදබාන ඉච්ඡා බස් හා බේගල් චතුරාර්ය සත්‍යය ලෙස පිළිගැනීමට පොදු ජනතාව පුරුදු පුහුණු කළහ. ජාතිය, ආගම වෙනුවෙන් වැදගත් කරුණක් සාකච්ඡා කිරීමට, තම ගමේ රටේ දියුණුව සඳහා කිසියම් කටයුත්තක් කිරීමට පැයක් හමාරක් වැය කිරීමට කාලය නැති මිනිසාට මන්ත්‍රීගේ ගෙදෙර මිදුලේ, පක්ෂ කාර්යාලයේ මැති ඇමතියන්ගේ රැස්වීමේ කට්ට අව්වේ වේලෙමින්, මහ වැස්සේ තෙමෙමින් වරු ගණන් 'රස්තියාදු වීමට කාලය තිබුන තත්ත්වයට ඔවුන් ව පත් කළහ.

මෙලෙස කරමින් මෙරට ජාතික ආගමික කාර්යයන්හි ලා අනුශාසක යන් වූ භික්ෂූන් වහන්සේ සතු සියලු වගකීම් හා උරුමයන් සියල්ල එක් අතකින් සිඳබිඳ දැමූ අතර අනෙක් අතින් ඒ හා සම්බන්ධයෙන් කිසියම් අර්බුදකාරී තත්ත්වයක් ඇති වුවහොත් එම කරුණ හා සම්බන්ධයෙන් මෙරට මහා සංඝයාගේ අදහස් නොවිමසති යි චෝදනාවක් ඇති වුවහොත් ඔවුන්ගේ අදහස් ම දෝංකාර නැංවීම සඳහා එහෙයියන් සංඛ්‍යාත 'ස්ටෑන්ඩ් බයි' භික්ෂු පිරිසක්ද හදවඩා පසෙක තබා ගත්හ.

තව පැත්තකින් භික්ෂූන් වහන්සේ වනාහි මෙරට ආගමික හා සාංස්කෘතික මෙන් ම දේශපාලනික ඉතිහාසය තුළ සුවිශේෂත්වයකින් යුතු පිරිසක් නො ව අනෙකුත් ආගමික පූජකයන් මෙන් වූ තවත් පූජක පිරිසක් පමණක් ය යන ආකල්පය බහුආගමික හෙවත් සර්වාගමික සංකල්පය මගින් ප්‍රචලිත කර හරින ලදී. එමගින් භික්ෂූන් වහන්සේ සතු ව අමුතු බලයක් හෝ වගකීමක් නොමැති බව ඒත්තු ගන්වන ලදහ.

මේ සියලු විධි හා ක්‍රම මගින් මෙරට භික්ෂූන් වහන්සේ සතු ව ඉතිහාසය තුළින් ගලා ආ සියලු වගකීම් හා බලතල උන්වහන්සේ වෙතින් ඈත් කොට දේශපාලකයා වෙත ඒකරාශී වන ලෙසට කුළුගැන්වෙන ලෙසට කරුණු සැලසූහ. ඇතැම් භික්ෂූහු ද ඔවුන් විසින් තමාට ප්‍රදානය කළ වරප්‍රසාද හා සුඛ විහරණ නිසා දේශපාලකයා පසුපස වැටී ඔහුගේ අනුප්පියභාණියෙකු වී ඔහුට බැලමෙහෙ කරන්නා වූ ගැත්තෝ බවට පත් වූහ. අද ඒ භික්ෂූහු තම පෞද්ගලික ලාභ ප්‍රයෝජන තකා මැති ඇමතියන් පසුපස හඹා දුවති. ජාතික ශාසනික වශයෙන් මෙරට සංඝ සමාජය විසින් ඉටු කළ යුතු ඓතිහාසික කාර්‍ය භාරය පිළිබඳ ව කිසිදු හැඟීමක් තැකීමක් හා අවබෝධයක් නැති ව පාවා දීමේ එක ම ප්‍රවාහයට හසු වී අන්දමන්ද ව ක්‍රියා කරති.

මේ ආත්මාර්ථකාමී දේශපාලනයේ රුදුරු ග්‍රහණය විසින් ශාසනික වශයෙන් සිදු කළ හානිය මෙතෙකැ යි සීමා කළ නොහැක. පසුගිය භීෂණ අවස්ථා දෙකේ දී ම ඒ භීෂණයේ හස්තය දිග හැරුණේ මෙරට සිංහල බෞද්ධ තරුණයන් හා, තරුණ භික්ෂූන් වෙතට වීම එහි කැපී පෙනුන ලක්ෂණයක් වීම අහම්බෙන් සිදු වූවක් නො වේ. 71 සහ 89 භීෂණ අවස්ථාවන්හි දී විශ්වවිද්‍යාල, උසස් පිරිවෙන් ආදියේ ඉගෙනුම ලබමින් සිටි ලක් සසුන් කෙතෙහි සුහුඹුල් පැළ ලෙස නැඟී එමින් සිටි තරුණ භික්ෂූන් වෙත එය දිග හැර ඔවුන්ගෙන් සැහෙන පිරිසක් සාහසික ඝාතනයට ලක් කෙරිණි.

තම සහ මහළු පරපුරේ මහානායක අනුනායක ආදීන් අතර බහුතරය යට කී පක්ෂ දේශපාලනයෙන් මුසපත් වී ආත්මාර්ථ සාධනය සඳහා තම ශාසනික බලය හා උරුමය කැප කරද්දී තරුණ භික්ෂු පරපුරේ බහුතරය තුළ පැවතියේ ප්‍රතිරෝධයකි ; කලකිරීමකි. දේශීය සිංහල බෞද්ධ උරුමයන් අකාමකා දමා ආක්‍රමණය කිරීම පිළිබඳ ව ආවේගවත් හැඟීම් වලින් හා උගත් සිප්සතර මගින් ලත් දැනුමෙන් ප්‍රගතිශීලිත්වය කෙරෙහි නැඹුරුතාවක් දැක්වූ උන්වහන්සේ වෙත යට කී ජාත්‍යන්තර ආක්‍රමණික සංවිධාන තම අවධානය යොමු කළේ ය. ඍජුව ම උන්වහන්සේ මර්දනය කළ නොහැකි වූයෙන් ක්‍රමානුකූල ව ඒ සඳහා උචිත පසුබිමක් සකස් කළහ. 71 සහ 89 නැඟී සිටි තරුණ බලවේග හා සම්බන්ධ උඩගෙඩි දුන් ප්‍රධාන මෙහෙය වීම වූයේ මේ පසුබිමේ සිටි ආක්‍රමණික බලවේගයෝ ය.

මේ කැරළි පසුබිමේ සිටි මෙහෙයුම් බලවේග සිංහල බෞද්ධ තරුණයන් කුප්පවා නැඟී සිටුවා රාජ්‍යතන්ත්‍රය මගින් එක් පැත්තකින් ද

අනෙක් පැත්තෙන් විවිධ ආක්‍රමණික බලවේගයන් මඟින් තවත් පැත්තකින් ද විනාශ කරවා දමූ ආකාරය මේ අවස්ථා දෙකේ දී ම අපි දුටුවෙමු. අලුත් නවයේ නැඟිටීම ගහලයා අතට කවුව දී මෙරට සිංහල බෞද්ධ තරුණයන් ඔහු ඉදිරියට යැවීමේ කාර්යය ඔවුහු සිදු කළහ.

එහි දී පවත්නා තත්ත්වය කෙරෙහි රෝෂයෙන් කෝපයෙන් හා කලකිරීමෙන් සිටි තරුණ භික්ෂූන් ශාසනික මඟින් ඉවතට ගෙන තම වැඩිහිටි සහ පරපුර කෙරෙහි උසි ගන්වා, තර්ජන, ගර්ජන, හිංසන, පීඩන ආදියෙන් පමණක් නො ව සහාසික ඝාතනයෙන් පවා, ප්‍රතිගාමීත්වයටත් ආත්මාර්ථකාමීත්වයටත් ආවැඩූ වැඩිහිටි සහ පරපුර තම අරමුණ කෙරෙහි නම්මා ගැනීමට තරුණ භික්ෂූන් පොළඹවා යොමු කොට තම වැඩිහිටි සහ පරපුර කෙරෙහි ඔවුන් තුළ තිබූ ද්වේශය වෛරය දෙගුණ තෙගුණ කරවූහ. මෙවන් ක්‍රියාකලාපයක් තරුණ භික්ෂූන් ගෙන යද්දී, ඔවුන් මෙවැනි ආකල්පයක් දරද්දී වැඩිහිටි සහ පරපුර කල්පනා කළේ කුමක් ද ? තරුණ භික්ෂූන් වනාහි තමා කෙරෙහි ද්වේශී ආකල්පයක් දරන, තම අවවාද අනුශාසනා නොඅසන හා නුරුස්නා, හිතුවක්කාර පිරිසක් වෙති, යනුවෙනි. මෙයට අඩුවැඩි වූ තවත් හේතුසාධක සමූහයක් ම පදනම් කොට ගෙන මේ දෙපරපුරේ ම භික්ෂූන් අතරත නුරුස්නාසුලු ආසාතාත්මක ආකල්පයක් ඇති කර වීමට මේ බලවේග සමත් වූහ. එය ඇතැම් මහතෙර වරුන් විනාශ කොට දැමීම කෙරෙහි ඇතැම් තරුණ භික්ෂූන් ද ඒ තරුණ භික්ෂූන්ගේ විනාශය දැක තුටුපහටු වීමට ඇතැම් වැඩිහිටි භික්ෂූන් ද මෙහෙය වීමේ ආකල්පය දක්වා මේ ආඝාතය මුහුකුරවා යැවීමට ද මේ බලවේගයෝ සමත් වූහ.

මේ කවර හේතු සාධක නිසා වුව ද එතෙක් මෙරට ලාංකික භික්ෂු පරපුර ආ ගමන් මඟින් උන්වහන්සේ ඉවත් කරවීමට මේ බලවේග සමත් වී ඇත.

මෙසේ ඇතැම් වැඩිහිටි භික්ෂූන් හා මහතෙරවරුන් අන්ත දක්ෂිණාංශික දේශපාලනය ඔස්සේ බුදුසසුනටත් සිංහල ජාතියටත් වඩා ආත්මාර්ථය උසස් ලෙස තකා ක්‍රියා කරද්දී, ඇතැම් තරුණ භික්ෂූහු අතිවාමාංශික දේශපාලනය ඔස්සේ පරාර්ථය අනුව යමින් දහම් මහත්, සසුන් මහත්, බණදහමත් නොතකා ක්‍රියා කරන්නට වූහ. මේ අන්ත දෙකෙහි ම පිහිටි භික්ෂු බලවේග දෙක ම මෙරට ආක්‍රමණික බලවේග විසින් බිහි කරන ලද ඒවා වූ අතර ඒ දෙපක්ෂය නිසා ම සියවස් විසි තුනකට අධික කාලයක් තිස්සේ මෙරට භික්ෂු බලය සිඳබිඳ ලීමට දිරිගත් වලිකෑ උපක්‍රම යෙදූ ආක්‍රමණික බලවේග ඉතා උපරිම මට්ටමින් තම අරමුණ සාද ගැනීම පිණිස ඉවහල් කර ගත්හ.

මේ අතර ඔවුන් විසින් අසූනවයේ බිහි කළ භීෂණය වැනි අවස්ථා ඔවුන් එතෙක් මෑනු උගුල් ගැස්සීමට කදිම අවස්ථා ලෙස උපයෝගි කර ගත්හ. එම ප්‍රතිගාමී ආක්‍රමණික බලවේග විසින් බලයට පත් කළ දේශීය නියෝජිතයන්ගේ ද නොමඳ ආරක්ෂාව රැකවරණය හා වරප්‍රසාද ලත් ඔවුහු භීෂණයේ අඳුර තුළට වී ත්‍රස්තවාදයේ හා රාජ්‍ය මර්දනයේ මුවාවෙන් මෙරට ජනප්‍රියත්වයට පත් වූ මහතෙරවරුන් මෙන් ම රට, දැය, සමය වෙනුවෙන් ඉමහත් සේවාවක් කළ හැකි වී සිටි තරුණ භික්ෂූන් සමූහයක් ම ඝාතනය කොට දැමූහ. හයක් හතරක් නොදත් ඇතැම් ගම්බද කුඩා සාමණේරවරුන් හා තරුණ භික්ෂූන් නොමඟ යවමින් තම වයසක ලොකු හාමුදුරුවන්ට නොදැනෙන සේ ත්‍රස්ත කල්ලිවලට සම්බන්ධ කරවා, විහාරය, බෝධිය, බණමඩුව, පිළිම වහන්සේ වැනි ස්ථාන ආයුධ නිප්පොළවල් ලෙස යොදවා ගම් දනව්වල වෙහෙර විහාර රාජ්‍ය හමුද ලවා ගිනිබත් කොට විනාශ කර වූහ. නිර්නාමික ලිපි මඟින් ඇතැම් වැදගත් දැන උගත් ඇතැම් තරුණ භික්ෂූන්ගේ නම් ගම් ආරක්ෂක හමුදවන්ට යවා ඔවුන් වධකස්ථානයන්හි 'ධර්මචක්‍රයේ' දමා වධ දී විනාශ කර වූහ. මෙරට ආක්‍රමණිකයන් විසින් පහසු ම වෙස් වලා ගැනීම ලෙස යොද ගත් චීවරය තුළට රිංගා භික්ෂු සංහාරයක යෙදීමට මෙරට ආරක්ෂක හමුදවන්ට මඟ සලසා දීමෙන් ම ඔවුන්ගේ අරමුණු කවකරාකාර වී ද යි සිතා ගත හැක.

මෙලෙස භික්ෂු දේශපාලනය මෙරට භික්ෂු සමාජයේ පරිහානිකර පියවරක් ලෙස සංවිධානය කර විනාශය වෙත මෙහෙයවා එතෙක් මෙතෙක් ඔවුන්ට මහත් බාධකයක් ව පැවති ප්‍රධානතම බලවේගය වූ ලාංකික භික්ෂුවගේ බලය හා ශක්තිය සිඳබිඳ දැමීමට පියවර ගත්හ. ශ්‍රී මහා බෝ මළුවත් ශ්‍රී දළදා මන්දිරයත් සිංහල බෞද්ධයන්ගේ ලෙයින් තෙත් කළහ. ඔවුන් ඝාතනය කර වූ සහ කළ සිංහල බෞද්ධ තරුණ තරුණියන්ගේ මළ මිනිවලින් සමනොළින් ගලා හැලෙන සිව්මහා ගංගාවන් ම දූෂණය කර ලූහ. සාහසික ලෙස ඔවුන් විසින් ඝාතනය කළ තරුණ තරුණියන්ගේ මළකඳන් මෙරට චිරප්‍රසිද්ධ විහාරස්ථාන ඉදිරියේ දමා පිළිස්සූ ටයර් සෑ ගොඩ නැ ඟූහ. මරුගෙ සෙන්වන් වැනි විසාලා යි කී ලෙසින් එතෙකින් ලක්බිමින් බුදුසසුනත් සහ පරපුරත් අතුගා දමන්නෙමු යි යන දැඩි සාහසික අධිෂ්ඨානයෙන් භීෂණයේ අඩුපඩු දිග හැරියේ ය.

එහෙයින් වසර 2332කට අධික කාලයක් තිස්සේ මෙරට භික්ෂූන් වහන්සේ ගමන් ගත් මඟ පිළිබඳවත් එහි ජව වේගය ඇතැම් විට අඩපණ වී යාමට හේතුභූත වූ යම් යම් ඓතිහාසික ක්‍රියාදාමයන් පිළිබඳවත් පුළුල් අවබෝධයක් ලාංකික භික්ෂූන් වහන්සේ තුළ තිබිය යුතු ය. නොබෝ

දිනක රූපවාහිණී සාකච්ඡාවකට සහභාගි වූ සිංහල බෞද්ධ හා භික්ෂු විරෝධී බැල කොන්ත්‍රාත්කරුවෙක් මහා ප්‍රහර්ෂයෙන් (ධර්මසේන හිමියන් කියූ පරිදි ; කැනවිල් බල්ලන් සිංහනාද කරන්නට සිතා කැණවිල් හඩම හඩනා සේ) 1994 දේශපාලන ව්‍යාපාරයෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ ලාංකික භික්ෂූන් වහන්සේ දේශපාලනයෙන් ඉවත් වී යාම බව යි. එහෙත් ඒ නිහඬතාව දේශපාලනය කිරීමෙහි ලා ලාංකික භික්ෂූන් වහන්සේ සතු ජාතික උරුමය වෙතින් උන්වහන්සේ ඉවත් වී යාමක් නොවන බවත් පක්ෂ දේශපාලනයේ ගැත්තන් නොවන බවත් භික්ෂුව සතු දේශ පාලන ශක්තිය, ජනතාවට නිවැරදි අවබෝධය ලබා දීමෙහි ලා උන් වහන්සේ සතු ශක්තිය, බලය හා උරුමය නිශේධනය වී යාමක් නොවන් බව මේ තුප්පහි නිවට ආක්‍රමණික බැලයන් විසින් තේරුම් ගත යුතු ය.

---

දෙවියන් වහන්සේ සර්වබලධාරී මැවුම්කරුවෙකු නොවේ. එතුමාට ආත්මය ගලවා ගත නොහැකි ය. හේතුව දෙවියන් වහන්සේ ස්වභාව ධර්මය වන හෙයිනි. තවද දේවදූතයන් මිථ්‍යා ප්‍රබන්ධ වන අතර දෙවියන් ද්‍රව්‍යමය සත්වයන් නොවේ.

බෙනඩික් ස්පිනෝෂා

# සදාචාර පරිහානිය හා අපේ වගකීම

ශාස්ත්‍රපති
කැම්පනේ ගුණරතන හිමි

අපි අනුක්‍රමයෙන් වඩවඩාත් ධනවත් වෙමු. නවීන වෙමු. එහෙත් සංවර්ධනය වෙනුවට නරක අතට වර්ධනයක් සෑම තැනම පවතී. දුප්පත් කම ද පොහොසත්කම ද වර්ධනය වෙමින් පවතී. ඒ අධික වර්ධනයකි. එවිට මධ්‍යම ප්‍රතිපදාව මිස සජීවි ජීවන දර්ශනයක් නොවේ.

ආශ්චර්යවත් ස්වභාව ධර්මය මිනිස් ප්‍රජාව විසින් තම අභිමතය පරිදි හසුරුවා ඇත. ආක්‍රමණයෙන් ව්‍යාකූලත්වයට පත් කළ පරිසරය හා මිනිසා අතර සමතුලිතතාව ගිලිහී යාම බුද්ධ ධර්මයේ පැවැත්ම කෙරෙහි අතුරු බලපෑම් ඇති කරයි.

බලය, ජීවලෝකය මෙයින් ජීවය දෙවැනි තැන ය. බලය පළමු පෙළ පෙරටුවෙන් සිටී. බලය හමුවේ ජීවියා අසරණ ය. එවිට ජීවිතය මුල් කොට ගොඩ නැඟුන ධර්මය සහ ඥාණාලෝකය අතරමං වේ. එය ද ධර්මයට අහිතකර බලපෑමකි.

ආයුෂ වැඩි කර ගන්නා ක්‍රම පිළිබඳ ව අප තව තවත් උපාය මාර්ග සොයමු. සියලු ආකාරවල ආයු වර්ධනයට සහ හැඩ ගැන්වීමට වත්මන් ලොව යුහුසුළු වුවත් ඥාණ වර්ධනයට යුහුසුළු නොවීම බුද්ධ ධර්මයේ පැවැත්මට හිතකර නොවේ.

බලය සහ ස්වීයත්වය සඳහා පවත්නා අරගලය තියුණු ය. කිසියම් කණ්ඩායමක් විසින් ස්වීයත්වය තහවුරු කිරීමේ දැඩි හා කෲර ප්‍රතිපත්ති අනුගමනය කිරීම කරුණා ප්‍රඥාවේ හා සහජීවනයේ ප්‍රතිපදාව සමූල ඝාතනය වීමක් නොවන්නේ ද.

ඉඳුරන් සත්ව ජීවිතයේ තෘප්තිය සහ වින්දනය ලබා දෙන ආයතනයෝ ය. එය වේදනාවකි. නොහොත් විඳීමකි. විඳුනා සුවය ද නොවිඳුනා

සුවය ද ඉඳුරන් තෘප්තිමත් කිරීම සඳකාලික සුවය කරා කෙනෙකු මෙහෙය වන විට බුදුසමය සපයන පිළිතුර වත්මන් සිතුවිලි අතර පසුබැස්මකට ලක්විය හැකි ද?

'බහුජාතික' සමාගම මෙ අළුත්ම වචනයක්. ඒවායෙහි ක්‍රියාකාරිත්ව මෙහෙයවනු ලබන්නේ කවුරුන් විසින්ද? බුද්ධ ධර්මයට අහිතකර බලපෑම මගින් එය මෙහෙයවනු ලැබේ නම් එවැනි සන්ධානවලට අපට අභියෝග කළ හැකි ද?

අපි ඉතිහාසය කරා අවශ්‍ය වූ විටෙක ගමන් කරමු. හෙළයාට දර්ශනික පසුබිමක් වී ය. ඔවුන් තුළ ස්වභාව ධර්මයට අනුකූල වූ ක්‍රම විද්‍යාවක් වී ය. එක් අරමුණක් කරා කේන්ද්‍රිය වූ සංවිධාන රටාවකි, එය.

මේ සංවිධිත වූ ක්‍රම විද්‍යාව තුළට ආගම් පාලන ක්‍රම චාරිත්‍ර ක්‍රම චින්තන සහ භාෂා ජාලයකින් වෙලී ගත්තේ ය. සම්මිශ්‍රණය වී ය. ආර්ථික සහ ආධ්‍යාත්මික සංවර්ධන රටාව ආර්ථිකය වටා පෙළ ගැසෙන්නට විය. බටහිර රිද්මයට ලංකාවේ හද ගැසෙන්නට වී ය.

විද්‍යාව ඒ තමා බටහිර දිගින් අප ආක්‍රමණය කළ නව සිද්ධාන්තය. එය ඔවුන්ගේ ආගම අභිබවා පෙරට ආ විට අප ද එසේ කිරීමට පෙළඹුනේ ය. එහි තිරසර බවක් නොමැති බැව් පෙනෙන්නට වූ කල්හි නැවත ආගම අවශ්‍යය යන නිගමනයට ඔවුන් පැමිණිය ද අපට එසේ කළ නොහැකි වූයේ අවබෝධයකින් තොර ව යට කී විද්‍යාව ග්‍රහණය කර සිටීම නිසා ය.

ඔවුහු ස්වභාව වාදය කරපින්නා ගත් විට අප ද පූජනීය තත්ත්වයෙන් සැලකූ මව් පිය පූජ්‍ය වැනි ගෞරවණීය පිළිගැනීම් අත්හැර දැමී ය.

අපගේ ක්‍රම විද්‍යාවේ පැවති සාමූහික නිෂ්පාදනයට ක්‍රියාදාමය අපි මම බවට පත් වී ය. කිසි ද වෙනස් කළ නොහැකි පරිදි සංස්කෘතිය, ජාත්‍යන්තර සම්බන්ධතා, අනාරක්ෂිත අනාගතය සමාජ අසාධාරණ පරම්පරා පරතරයේ අපේක්ෂා භංගත්වය, පංචකාම සම්පත් උත්සන්න කරවීම් දේශපාලන ව්‍යුහයේ මතිමතාන්තර, මන්දපෝෂණය, දිළිඳු බව සහ නූගත්කම, විෂම ආහාර පරිභෝජනය ජනගහන වර්ධනය ආදී හැම එකකින් ම සංකීර්ණ වූ ජාලයක ලංකාව පැටලී වෙලී සිටීම බුදු දහමේ අනන්‍යතාව සපුරා වැනසීමක් නොවන්නේ ද?

බුද්ධ ධර්මයෙන් මිදී සංවර්ධනය කරා ගමන් ආරම්භ කළ ද සිට අපි ලෝකයට ම ණය වීමු. අද අප රටේ එක පුරවැසියෙක් ලෝකයට රුපියල්

23,000ක ණයකරුවෙක් වී හමාර ය. %10 ක තරම් පිරිසක් විශාල ධනස්කන්ධයක් පරිහරණයට ගැනීමේ හේතුවෙන් 'මම' යන සිද්ධාන්තය යට කී බෙදවාචකයට අප පමුණුවා ඇත.

වියවුල් සහගත සමාජ රටාව සහ ආර්ථික අහේනියේ ප්‍රතිඵල වූයේ සිය දිවි හානි කර ගැනීම් 1965, 13ක්ව පැවති තත්ත්වය 1970 ගණන් වන විට 48 දක්වා වර්ධනය වීම යි. එය අද සිය ගණනින් ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී.

ශීඝ්‍ර සංවර්ධනයේ අතුරු ප්‍රතිඵල අතිශයින් ම අනුවේදනීය ය. ළමා ලිංගික සූරාකෑම් ඇති රටවල් 4කි. තායිලන්තය, පිලිපීනය, තායිවානය අතරට ශ්‍රී ලංකාව ද එක් වීම කෙතරම් අනුවේදනීය සිද්ධියක් ද?

මතුපිටින් පෙනෙන සංවර්ධනයේ ඇතුළු ලෝකය එනම් පාතාල ලෝකය හරහා වේගයෙන් තමා යන කළු දූමාරයෙන් බුදුදහමේ සාරධර්ම නමැති හෙළ බොදු චයඝ්ධර්ම පද්ධතිය ම සම්පූර්ණයෙන් වැසී යන්නට දිගු කලක් ගත නො වේ.

සමලිංගික සේවනය සඳහා අවසර ඉල්ලා පෙලපාලි දක්වීමට තරම් මිනිස් අවශ්‍යතාවන් කොට ප්‍රදර්ශනය කරවන බටහිර ලෝකය සමඟ අප ද අත්වැල් බැඳ සිටිමු.

අප රට තුළ එවැනි අවශ්‍යතාවන් ඉටු කර ගන්නා පිළිවෙල විසිතුරුව නිරුවත් රහපෑම් තුළින් චිත්‍රපටිවලට නඟා ලෝකය පුරා දැන් ව්‍යාප්ත කර හමාර ය.

ද ගෝල්ඩන් බෝයිස් ඔෆ් සිලෝන්
බෝයි පැරඩයිස් ඉන් සිලෝන්
යූ ලයික් ගෝල්ඩන් ලැඩිස්.
මේවා අපේ දුප්පත්කමේ සහ පිරිහුණු සදචාරයේ ජය සංකේත ය.

ලංකාවේ ප්‍රධාන අගනගරය වන කොළඹ සෑම පිරිමි 45 දෙනෙකුට එක් ගණිකාව වශයෙන් වෛශ්‍යාවන් 30,000ක් තරම් සිටීම කෙතරම් සංවර්ධනයක්ද?

මේ තතත්වය සමඟ උතුරේ යුද්ධයේ අතුරු ප්‍රතිඵල සමඟින් අපේ පෞරාණික ශුද්ධ නගර වන අනුරාධපුර, පොළොන්නරු කරා ද දැඩි ලෙස

ව්‍යාප්තව තිබීම පුදුමයක් නො වේ. අනාථ කඳවුරු, අනාරක්ෂිත අනාගතය අනුරාධපුර ශුද්ධ නගරය වටා ද ගණිකා වෘත්තියට බැස ගත් කාන්තාවන් සංඛ්‍යාව 30,000කට වැඩි නොවිය යුතු බව දූනට ගණන් බලා තිබේ.

මෙ එක ද කාන්තාවක සිය කැමැත්තෙන් තම ශරීරය පූජා කිරීමට පෙළඹුනේ යැ යි විශ්වාස කළ හැකි ද? ඇත්තෙන්ම මෙ දිළිඳු බවේ උග්‍රතම ප්‍රතිඵලය වන්නේ ය.

දූනට උතුරේ පවත්නා යුද්ධය ද සුළු කොට නිහඩ වීමට තරම් සරල වූ ගැටලුවක් නො වේ. යුද්ධය යනු පාලනයක් නැති තැන යි. එය දරුණු පිපාසයකි.

බලයෙන් සිදු වන ස්ත්‍රී දූෂණ වර්තමාන යුගයේ යුධ අවියකි. ඒඩ්ස් නමැති මාරාන්තික වෛරසය සිරකරුවන්ගේ ශරීර ගත කොට සතුරු හමුදා පරාජය කිරීමට යොදා ගත් යුධ උපක්‍රමයකැ යි ද සැකයක් පවතී.

යුද්ධයේ අමතක නොවන නමක් දූරු හිට්ලර් ප්‍රකාශ කළේ සෑම පිරිමියෙකුම යුධ සෙබලෙක් විය යුතු ය. ස්ත්‍රීන් ඔවුන් පිනවිය යුතු ය යන පෙළඹවීම යි.

සර්බියානු යුද්ධයේ දී ස්ත්‍රීන් 20,000ක් දූෂණය කර තිබීම මෙයට කදිම සාධකයකි. පලිගැනීමේ අවියක් ලෙස ස්ත්‍රී දූෂණය කිරීම යුද්ධයක දී සාමාන්‍ය සිදු වීමකි. යුධ හමුදා කඳවුරුවල ස්ත්‍රීන් බලයෙන් රඳවා ගෙන සිටින්නේ අනුකම්පා විරහිතව ය. යුද්ධයක දී කැමති අකැමැති තත්ත්වයක් නොබැලීම විශේෂ ලක්ෂණයකි. කාෂ්මීරයේ හින්දු–මුස්ලිම් ගැටුම් ඇති විය. එහි දී ද ඔවුනොවුන් බලයෙන් දූෂණය කරනු ලැබේ. වියට්නාම් යුද්ධයේ දී ඇමරිකානුවෝ වියට්නාම් කාන්තාවන් බලයෙන් දූෂණය කරනු ලැබූහ. වියට්නාමයේ ස්ත්‍රීන් සමාජ රෝග බෝකර ගෙන ඒවා ඇමරිකානුවන්ට බෝකර වී ය. කොරියන්–ජපන් යුද්ධය ද එලෙස ම වී ය. උතුරේ යුද්ධය ද මේ තත්ත්වයේ වෙනසක් තිබිය නොහැකි ය.

87 – 88 අවුරුදුවල ඉන්දීය හමුදා පැමිණි පසු ස්ත්‍රීන් හමුදාවලට අසු නොවන සේ පලා ගියා. ඉන්දීය හමුදා මරාගෙන මැරෙන්නට ගියේ ඒ නිසා ය. ඒඩ්ස් වැනි මාරාන්තික විෂබීජ යුද්ධය හා මුසු වුවහොත් එය ලංකාවෙන් හරි අඩකට මරණය කැඳවන බෙදවාචකයක් වීම වැළැක්විය නොහැකි යි. අපේ නිගමනය ඉතිහාසය විසින් ඔප්පු කර ඇති යුද්ධයේ අතුරු ප්‍රතිඵලය දූනට සැඟ වී සිටියත් රංගන ශාලිකාවට අද හෙට ම ප්‍රවේශ වන බව යි.

අපි දිගින් දිගට ම බටහිර සංස්කෘතිය හෙළා දුටුවෙමු. එහෙත් ලංකාවේ කෙල්ලන්ගේ නිරුවත් සම්භෝග දර්ශන චිත්‍රපටි ගත කොට ඉහළ ම තැන ලබා ගෙන සිටින මෙවන් යුගයක බෞද්ධ සාරධර්ම ගැන කුමක් කියන්න ද.

එරොටික් ආට් ඔෆ් සිලෝන්
පැරඩයිස් සිලෝන්
සෙක්ස් ඒන්ජල්ස් ඉන් සිලෝන්

ලාංකික ජනතාවගේ වයඃසිා රටාව මේ යැ යි ලෝකය පුරා නාමය පැතිරෙද්දී අප හිතන්නේ අපේ පන්සල් ටිකවත් මේ තත්ත්වයෙන් බේරා ගතහොත් එය ද නඡ්යාවශේෂිත සංස්කෘතික ලක්ෂණ සේ ඉතිරි වන බව යි. එහෙත් පන්සල නො ව පරම පූජනීය ශුද්ධ නගර තුළ රහසේ පටිගත කොට ඇත්තේ අන් සියල්ලට ම ඉහළින් අධිකාම ජවනිකා ඇතුළත් සම්භෝග දර්ශන සහිත නිල් චිත්‍රපටි ය.

එයේ ලෝකය පුරා ප්‍රදර්ශනයට යවා ඇති පෞරාණික සිද්ධස්ථානවල රඟන ලද "එරොටික් පැරඩයිස් ඔෆ් ශ්‍රී ලංකා" චිත්‍රපටි පළමු පෙළ විශිෂ්ට සම්මාන හිමි කර ගෙන ඇත. තවත් හමු නොවූ චිත්‍රපට, පොත් පත් සඟරා කෙතෙක් ඇත්ද යනු විමසිය යුත්තකි.

නිල ඇඳුම් ඇඳ පාසල් යන වේලාවේ රහසිගත ස්ථානවල ලිංගික සේවනයේ යෙදෙන අයුරු පටිගත කරන ලද ළමා ලිංගික විකෘති සේවන චිත්‍රපට අපේ මුළු මහත් අධ්‍යාපන පද්ධතිය ද දූෂණය කොට හමාර ය.

අනන්ත සැප සම්පත් නමැති මායාවේ ඇතුළු පැත්ත වන අනන්ත දිළිඳු බවේ සත්‍යය වූ වේදනාවේ දෝංකාරය පැතිරී යන අයුරුයි ඒ.

ලංකාවේ අද බිහි වන දරුවන්ගෙන් 6 ලක්ෂයක් මන්දපෝෂණයෙන් පෙලෙති. උපදින දරුවන්ගෙන් හරි අඩක් ම මේ තත්ත්වයට පත් වේ. ලෝකයේ අන්ත දිළිඳු රටවල් පෙළට ලියන විට ටැන්සානියාව 86, ඉතියෝපියාව 88, ශ්‍රී ලංකාව දිනා ගෙන ඇත්තේ 90 ස්ථානය යි. 1993න් පසු රැකියා අඩුකමින් වඩාත් පීඩා විඳිනුයේ ලාංකික වනිතාව යි.

හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා මහ බැංකුවේ අධිපතිව සිටි වර්ණසේන රාසපුත්‍ර මහතාගේ නායකත්වයෙන් මේ තත්ත්වය විමසා බැලීමට කොමිසමක් පත් කරනු ලැබී ය. එම වාර්තාවේ 11 පිටුවේ

සඳහන් කර ඇත්තේ ලංකාවේ රැකියා නොමැති අයගේ සංඛ්‍යාව ලක්ෂ එකොළහක් වන අතර ළමා සහ මාතෘ පෝෂණ තත්ත්වය එන්න එන්න ම නරක අතට හැරෙමින් පවතින බව යි.

මන්දපෝෂණය දිළිඳු ආර්ථිකයේ අතුරු ප්‍රතිඵල ය. ලෝකයේ ම වේගයෙන් දිළිඳු බවට ඇද හැලෙන රටවල් 5න් පළමු වැන්න ශ්‍රී ලංකාව යි. නැණවතුන් සඳහා වූ තථාගත ධර්මය රඳන්නේ කොහි ද යන අතුරු ප්‍රකාශයට පිළිතුරු අප නිහඬ කරවන්නකි.

මත්කුඩු භාවිතයේ ශීඝ්‍ර සංවර්ධනය කෙතෙක් ද කිවහොත් දිනකට රුපියල් කෝටි එකහමාරක කුඩු වෙළඳාම වන බව 1995.01.13 දිවයින පුවත්පතේ මුල් පිටුවේ පළ විය. මොළය නිසි පරිදි නොවැඩෙන නිදන්ගත මන්දපෝෂණයෙන් එවැනි ම කොටසක් ද එහි අතුරු ප්‍රතිඵල ලෙස සමාජ සහ ඒඩ්ස් වැනි මාරාන්තික රෝග ද විඳිමත් අනුස්මරණ ශක්තියක් නැති කය පමණක් උස් මහත් වූ දිවියක අගයක් නොදන්නා අපරාධකරුවන්ගෙන් ද පිරී ගත් දිවයිනක බුද්ධ ධර්මයක් ඇත. නැත. තිබෙන්නටත් පුළුවන. නොතිබෙන්නටත් පිළිවන.

මුළු ලෝකයේ ම වාණිජ කටයුතු සඳහා ශ්‍රී ලංකාව විවෘතව ඇත. ඉතාලියේ ඇල්වතුරත් ඇත. ඕක් ලීයෙන් තැනූ මිනී පෙට්ටි ද ඇත. දැනට සිංහලකම බෞද්ධකම ටිකක් හෝ රැඳි ඇත්තේ පන්සලේ යැ යි අපි සිතමු. පන්සලට ද පරගැති බව රිංගා තිබේ දැ යි කීමට අපි කිසිවක් නොදනිමු.

හෙළබිම සතු සම්පත් විකුණා අපි මුදල් සොයමු. බටහිරදිගින් විසිතුරු කොට සරසවා පිළිගැන් වූ ගුණ සුවදින් පිරි බොජුන් මේසය වටා අපි අසුන් ගෙන සිටිමු. මේ අනුභවයට මුල් තැන දෙන සංකල්ප ජාලයේ අපි පෙළ ගැසී සිටිමු.

ජන සන්නිවේදන රටාව මුළුමනින් අපේ සාරධර්ම පැහැර ගෙන හමාර ය. අම්මා මට මේවම දෙන්නේ (ක්‍රාෆ්ට් චීස්) අම්මා මට ආදරේ නිසා ය. ඒවා අම්මලාට දරුවන්ට දිය නොහැකි ය. ඒ දරුවාට ආදරේ නැතිකම යි.. අපේ අම්මා බොරු කියලා අපිව රවටනවා., ආදරේ තියෙනවා නම් ඇයි අපට චීස් නොදෙන්නේ. ගොළුවනින් දරුවෙක් මව් කෙරෙහි කලකිරීමක් ඇති නොකරන්නේ ද ? මේවාට එරෙහි විය හැකි බලවේගයක් තිබිය හැක්කේ ද ? අජිනෝමොටෝ නමැති ආහාර රසකරණ ද්‍රව්‍ය සහ ටොෆි, අයිස්ක්‍රීම්, කේක්, බීම වර්ග පාට කරන වර්ණක්

මොලේ සෛල වනසයි. සදාචාර ගතිගුණ නැති කරයි. එහෙත් නැවතත් අප රස බලන මේ විෂවල්ලින් අපේ දරුවන්-ජනතාව මුදා ගත හැක්කේ ද?

රාගය, කාමය, ආශාව කුපිත කරවන ලොවක බවුන්දම් වඩන්නට අනුශාසනා කිරීම කොතරම් හොඳ ද ප්‍රතිඵලය කුමක් වුවත්.

සැබවින් ම මේ ප්‍රවාහය හමුවේ අද පන්සල අකර්මන්‍ය ය. නවීන නිෂ්පාදන මෙවලම්වලින් පන්සල ද පිරී ඇත.

අපි ලොක්කන්ගේ චිත්ත ප්‍රසාදය පිණිස දේශනා පූජා පවත්වමු. තථාගත ධර්මය ශාන්තිකර්මවලට පරිවර්තනය වී ඇත. බෝ සෙවනේ අපි සියලු ග්‍රහ අපල දුරු කර ගැනීමට යාඥා කරමු. යාඥා කළ යුතු ආකාරය අපි නොදනිමු. එය කියා එවන්නේ නක්ෂත්‍රකරු ය. ශාස්ත්‍රකාරයා ය. අංජනම් එළියය ය කට්ටඩියා ය හැකිතරම් කවි සිංදු කෝලම් තාලයකට කියවිය හැකි නම් ග්‍රහ අපල දුරු වී සෙත සැලසේ.

පන්සල කුමක් සඳහා ද? අපේක්ෂා භංගත්වය පිරිහී යන මානසිකත්ව-යට දිළිඳු ආර්ථිකයට සරණක් වන ලෙසට අපි යාඥා කරමු. යාඥාව අවසානයේ අපි ''ආමේන්'' නොකියමු. ඒ වෙනුවට සාධු කියමු.

අද ධර්මය දේශනා කිරීමට අසන්නන් නැත. ලැබුන අවස්ථාවේ වුව ද, කාලයක් නැත. දායකයාගේ ගුණ කීමට ඒ කාලය ගත කිරීමට සිදු වේ. ගුණ නොකියාත් බැරි ය. ඒ අප යැපෙන්නේ ඔවුන්ගෙන් වන නිසා ය. මෙය අපට මහත් ගැටලුවකි.

අප රටේ මහත් ධනස්කන්ධයට උරුමකම් කියන්නෝ තම දරුවන් පිටරටවලට යවා අදත් උගන්වති. එහි දී හුරු කර ගන්නා බටහිර රටාව ඇති එවුන්ට පමණක් මේ රටේ ඉහළ ම තැන් හිමි ය. ඔවුන් කිසිවෙකුටත් මේ රටේ සාරධර්ම අවශ්‍ය නැත. බුදු බණ අවශ්‍ය නැත.

එවැනි පරගැති නොවිය යුත්තේ පසුගිය ''ප්‍රමාද'' නම් සඟරාවේ අපගේ බුදුරජාණන් වහන්සේගේ ගුණ ලියා තිබුනේ—

''ගෞතම කාම බෙලහීනතාවයක් ඇති කෙනෙකු ලෙසත් ආනන්ද කොතරම් ඉල්ලීම් කළත් ගෞතම කාන්තාවන් පැවිදි කිරීමට අකමැති වූ බවත් අන්තිමේ ඕනෑම වයසක කාන්තාවක් එදා පැවිදි වූ

පුරුෂ පක්ෂයේ අයෙකු ඉදිරියේ දණින් වැටෙන ලෙසට කොන්දේසි පනවා පැවිද්ද සඳහා අවසර දුන් බවත් ය.''

පරගැති නිහීනයන් අපගේ ශාස්තෘන් වහන්සේත් ශ්‍රාවකයනුත් පරිභවයට ලක් කිරීම කෙතරම් අනුවේදනීය ද ?

දිළින්දෝ මහා ධනස්කන්ධයක් ගොඩ ගසා ගැනීමේ මානසික පීඩනයේ සිර වී සිටිති. කුමන අපරාධ කර හෝ මුදල් මත තම තත්ත්වය ප්‍රදර්ශනය කිරීමේ ලාමක චේතනාවෙන් තවත් පිරිසක් සටන් වදිති. ද්‍රව්‍ය විකුණා පෝසත් වන්නා ද තම ජාත දරුවන් විකුණන්නෝ ද (මත්කුඩු භාවිතය සඳහා තම දියණිය එක් පියෙක් රු. 40කට විකුණුවේ ය. 95.01.14 ලංකාදීප) අපරාධ මංකොල්ල කණ්ඩායම්වලින් ද මේ දිවයින අඩු නැත.

දනුදු හෙළ කතුන් විදේශ ගතව ගණිකා වත්තියේ ය. එද ගම තුළ විශේෂිත පුද්ගලයෙක් නොවී ය. උගතා වෙනස්ව පෙනුනේ දැනුමෙන් පමණි.

කිසිවකත් තරගයක් නොවී ය. තරගයට ගෙවල දොරවල් නොතැනී ය. යානවාහන බඩුමුට්ටු තරගයට නොගත්තේ ය. අද මිනී පෙට්ටියට ද තරගය යි. එද චාම් සරල දිවි පෙවෙත තෘප්තිමත් වූ එකක් විය. දූන් අතීතය මත හඬා වැලපීම තේරුමක් නැත.

වැඩි වැඩියෙන් ඇතිකම වැඩි වැඩියෙන් සමාජය පිළිගැනීමෙන් වත්මන් සංස්කෘතිකාංගයට සමාජය හුරු වී අවසාන ය. මුළු සමාජ රටාව හරහා ම හමන්නේ ඒ සුළඟ යි. ඒ නිසා පන්සල ද සැඟ වී සිට නැත.

නූතන මිනිසාගේ අනුභව රුචිය ඉහළ ගොස් ය. සැප විඳීමේ ආශාව ලිංගික ආශාව හිනි පෙත්තට ම නැඟ ඇත. තෘප්තිමත් වන දවසක් ද නැත.

හැකිතාක් ලිංගික ආශාවන් සන්තර්පණය කරන්නේ එය දේව වරප්‍රසාදයකි. මේ මගින් පෙනෙන්නේ සමඟ පවත්නා සංස්කෘතික රටාව අතරට අපගේ පිළිතුරු ප්‍රමාණවත් ද, බෞද්ධ වූ සාරධර්ම සංවර වීමේ ප්‍රතිපදාවෙන් බැහැරව ලෞකික සම්පත් පසු පස හඹායෑමේ අපිද කොටස්කරුවන් වී සිටිමු.

අප සාරධර්ම ලෙස සලකනා දෑයෙහි පවත්නේ ආශාවන් සපුරා ගැන්මකි. මේ ඉඳුරා ම තථාගත ධර්මය හා නොසැසඳෙන තැනකි.

බෞද්ධ ඉගැන්වීම් ලෝභය අඩු කරයි. ද්වේශය තුනී කරයි. මෝහය පහ වී යයි. එහෙත් නූතන ලෝකය වැඩි වැඩියෙන් සුඛෝපභෝගී බව සඳහා ආශා උපදවයි. බලය රැක ගැනීමට කුමන හෝ මර්දන පිළිවෙතක් අනුව ද්වේශය වර්ධනය කරයි. විවිධ මාධ්‍ය උපයෝගී කර ගෙන ජනතාව මුලාවට පත් කරයි.

මේ නිසා වර්තමාන චින්තනය රාජ්‍ය තාන්ත්‍රික ව්‍යුහයක නොගැලපේ යැයි සිතීම සහේතුක ද යි සිතා බැලීම වටී.

බෞද්ධ සංවර්ධනය යනු අර්ථ හා උත්තමාර්ථ සාද දෙන පිරිපුන් ඉගැන්වීමකි. එහි තරගයක් නැත. ඉස්මතු වීමට වෙර වැඩීම මානසික දුර්වලතාවකි. රෝගයකි. අකුශලයකි. සමානාත්මතා පදනම් වූ ධර්මය සමගිය ඇති කරවයි. එකමුතු කරයි.

එහෙත් වර්තමාන සමාජ රටාව ඇති නැති උසස් පහත් වර්ගවාදී චින්තන වියවුලක පැටලී ගමන් කරයි. ද්‍රව්‍යාත්මක සංවර්ධනයක පිහිටා අර්ථ ධර්ම සමන්විත ධර්මය පැතිර විය හැක්කේ ද ? මෙය වෙනත් වචනයකින් කිව්හොත් බෞද්ධ විරෝධී සංවිධානයක් ගුණ කථා කළ හැක්කේ ද ? වත්මන් ආර්ථික ව්‍යුහය බුද්ධ ධර්මය සමඟ ගැටෙන්නකි.

මැක්ස් ස්කේල නමැති දර්ශනිකයා ප්‍රකාශ කර ඇත්තේ බටහිර ලෝකයා හඳුන්වා දී ඇති සංවර්ධනය ඒකාන්තයෙන් ම ඒකපාර්ශ්වික සංවිධානයකි. එවන් සමාජය අනර්ත්ථයට වැටීම වැලැක්විය නොහැකි ය.

''කුඩා නම් ලස්සනයි'' නම් ග්‍රන්ථය ලියූ එස්. සුමාකර් පවසා ඇත්තේ මහා පරිමාණයේ තත්ත්වයන් ම වඩා බුදු දහමේ පෙන්වා දෙන කුඩා ප්‍රමාණයේ සංවර්ධනය අතිවිශිෂ්ට බව ය.

යන්ත්‍රසූත්‍ර තාක්ෂණ විද්‍යාව නව නිපැයුම් නමැති මහා පරිමාණයේ දැවැන්ත ක්‍රියාමාර්ග තුළින් වැනසී යන පරිසරය සමඟින් බුදුසමය සංවර්ධනය නොවන්නේ ද ?

බුදු දහමින් පෙන්වා දෙන නිවැරදි කථා, නිවැරදි ක්‍රියා, නිවැරදි ඇසුර, ආධ්‍යාත්මික ශක්තිය, චිත්ත සමාධිය, විධිමත් අනුස්මරණ ශක්තිය, ලොව පවතින අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණ, මිනිස්කමේ උත්තරීතර හැදියාව ප්‍රදර්ශනය කිරීම වැනි ගුණාත්මක දහම් මූළමනින් ම අප අතහැර දමා ගොස් ය.

පළමු පෙළ කරා ධාවනය වන පිපාසය සංසිඳුවිය නොහැක්කේ ද ? එසේ නම් බුදු දහම මෙහෙයවනු ලබන පසුබිම සදෙස් ද නිදෙස් දැ යි පැවසීමට දේශකයා කැමති නැත.

මා විඳිනා සුවය වෙන අයෙකු විඳිනු දැකීමට කැමති නැත. නැතහොත් තමන්ගේ තැනට වෙන අයකු පැමිණීම නුරුස්සන්නේ ඇයි? අවහිර කරනුයේ ධර්මයේ පදනම මත සිට ද? තමා අන්‍යයන්ගේ තෘප්තිය කෙරෙහි ප්‍රසාදයට පත් නොවීම බුදුසමයේ ඉගැන්වීම සමඟ නොගැටෙන්නේ ද?

මහායාන ඉගැන්වීම් අනුව බෝසත් තුමා පරාර්ථ සේවය සඳහා නිර්වාණාවබෝධය ද ප්‍රතික්ෂේප කරයි.

සතර බඹ විහරණය, සතර සංග්‍රහ වස්තු සහ අරි අටඟිමග තුළින් සංකීර්ණ වූ සමාජ ප්‍රවාහයෙන් මිදී පිරිසිදු විය යුත්තේ ය. අනුශාසනා කළ යුත්තේ ය. අද ලොව ගමන් කරනුයේ ධර්මයට ප්‍රතිවිරුද්ධ වූ දෙසට ය. ඒ බව නොබියව ලොවට හෙළි කළ යුතු ය.

භික්ෂුත්වය ද විද්වත් බව ද පූජනීයත්වයට වඩා විද්වත් බව පිළිගත් සමාජ රටාවකට අපි අවතීර්ණ ව සිටිමු. අපි අප සමඟ ගැටෙමු. පන්සලට අවශ්‍ය ශිෂ්‍යයා පිරිවෙණෙන් නොහැදෙයි. භික්ෂුත්වය ද සමාජ රැල්ලේ පාපය යි. බුදුසමය ගැටෙන සියලුම සිද්ධාන්ත පළමු කොට හඳුනා ගනිමු.

තෙරක් නොපෙනෙන ආගමික තර්ජන අපේක්ෂා භංගත්වය, සාරධර්ම පිරිහීම නවීකරණය වීම බහුල වූ සුඛෝපභෝගී බව තුළ පන්සලත් අපත් දූෂිත සමාජය හරහා හමා යන කළු දුමාරයෙන් ම වැසී යමින් පවතී.

සමාජය යනු මඟින් අපේ මඟ තෝරා ගැනීමට යුහුසුළු වීම කාලීන අවශ්‍යතාවක් වන්නේ ය.

විෂම සමාජ රටාව බුදුසමය සමඟින් වන ගැටීම වලක්වා අපි වරද නිවැරදි කර ගනිමු.

---

බුද්ධ ධර්මය පිළිගැනීම නිසා මට ඇති වූ වාසිය ද සැනසීම ද පිළිසරණ ද බොහෝයි. මගේ මරණයෙන් මත්තෙහි ද එය මගේ සිහිටට හා සැනසීමට හේතු වනු ඇතැයි මම තරයේ දැන සිටිමි.

— ස්විස් ජාතික සී. බී. ස්ටුවුස් තුමා

# නවක සඟ පරපුරට බලපාන ප්‍රධාන ආගමික ගැටලු හා අභියෝග කීපයක්

මාහාචාර්ය
**විමල විජේසූරිය**

බුදු සසුනේ නාමයෙන් අද ක්‍රියාත්මක වන්නේ ධර්මයත් සංඝ ශාසනයත් දෙක පමණි. ඉනුත් අනාගත සසුන් කෙත බැබලවීමට සිටිනුයේ නවක, තරුණ, භික්ෂු පරම්පරාව බව විශේෂයෙන් වර්තමාන මහාස්ථවිර සංඝ පරම්පරාවේ අවධානයට ලක්වී නැති සේ ය. ඇතොත් ඒ මඳ වශයෙනි. බුදු සසුන් වැඩ වැඩීමේ දී ගමින් ගම නගරයෙන් නගරය පුරා නව විහාරාරාමයන්, චෛත්‍යය, බෝධිය, ප්‍රතිමා ගෘහ, ධර්මශාලා, ලැගුම් ගේ, දනශාලාදි වශයෙන් ඉතා විසිතුරු ලෙස නොඩ නැඟීමෙන් පමණක් සසුන් දියුණුව අපේක්ෂා කිරීම අද අපේ සිරිත ය.

මේ බාහිර රටාව, දර්ශනය, අන්‍යාගම්වලට ද ඇත. යුරෝපයේ හා යෝනක රටවල සුවිසල් දේව මන්දිර, ප්‍රතිමා, චිත්‍ර කැටයම් හා විවිධ අලංකරණවලින් අනූන ව ඇත. ඒවා එදත් අදත් ගොඩ නැගෙන නමුත් ආගමික හරය එමඟින් දියුණු හෝ ප්‍රදර්ශනය නොවේ. ඒ නිසා අප අවධානය යොමු විය යුත්තේ මේ විද්‍යාත්මක බුද්ධිමය(යුගයට වැදගත් වන, නූතන බුද්ධිමත් සමාජයන් අවදි කළ හැකි ධර්ම විනයාගත ප්‍රබල ගුණාංග ලෝකයට හඳුන්වා දිය හැකි නූතන ධර්ම ප්‍රචාරක මාධ්‍යයන්ට ය. ඒවා දියුණු කිරිමත් ඒවා ව්‍යාප්ත කිරීමත් යන අංශවලට ය.

1980 අග ලොව බුද්ධිමත්, විද්‍යා ප්‍රගතියෙන් හා මානව ගුණාංගවලින් ඉතා ඉදිරියට ගිය එද බටහිර ජර්මනියේ අගනුවර වූ මියුනික් නගරයේ විසූ මට එහි මහ පල්ලියේ මහ පූජකතුමාගේ මව් වූ ගෙහිමි කාන්තාව (බුර්කට

මැතිණිය) කීවේ, එය මුළුමනින් කතෝලික නගරයක් බව යි. නත්තල් දින මා ද කැඳවා ගෙන ''ඔලිම්පියා සෙන්ට්‍රම්'' මහ පල්ලියට ගිය මට දක්නට ලැබුණේ දෙසියකටත් අඩු මහළු හා ළමා පිරිසක් පමණි. ''මුන්වන්'' මහා විශ්වවිද්‍යාලයේ ඉන්දු අයිරාණීය භාෂා සාහිත්‍යය අංශයට ගිය ද ම මට දක්නට ලැබුණේ, එහි ප්‍රධාන මහාචාර්ය ''ඩීටර් සිංලොප්'' මහතා බෞද්ධ මාතෘකාවක් යටතේ එදින සවස පවත්වන විශේෂ දේශනයක දැන්වීම ය. එහි ආගම නූගත් අයට ම සීමා වූ සේ ය.

ලොව ඉතා කීර්තිමත් (ආතර් සී. ක්ලාක් ආදි) විද්‍යා ලේඛකයන්, මහා බුද්ධිමතුන් බුදු දහමට යෙදූ වචන අන් කිසිදු ආගමකට යොද නැත. බුදු දහම වැනි න්‍යායික, යථාර්ථවාදී, විචාරශීලී, මාර්ගදර්ශී, කලානුරූපී සනාතන දහමක් තවදුරටත් රැක ගැනීමට නම්, මැනවින් ධර්ම විනය හා ලෝක භාෂා හා නූතන විෂයයන් හදළ, ශ්‍රද්ධා භක්තියෙන් හා ධර්ම විනයානුකූල ශික්ෂණයෙන් පිරිපුන් තරුණ පැවිදි පිරිස් බිහි කිරීමට වැඩි අවධානයක් දැක්විය යුතු ය. බුදු දහම වැනි බුද්ධිමය ආචාර ධර්මීය හරයන්, අගයන්ගෙන් පිරි ශ්‍රෙෂ්ඨතම, ප්‍රබලතම මානව දයාදය වූ ස්ථවිරවාදී මූල බුද්ධ ධර්මයේ ධර්ම ග්‍රන්ථ (පෙළ, අටුවා, ටීකාදිය හා පරිවාර ග්‍රන්ථ මාලාව වඩාත් හොඳට රැක ගත්තේ ශ්‍රී ලංකාව යි. එය ලොවට දීමට ක්‍රිය කළ, කරන පුරෝගාමීන් (රිස් ඩේවිඩ්ස්, රාස්ක්මුක්, රාස්ක්, ඥානතිලෝක හිමි, ගයිගර් ආදීන්) ලොවට ඉදිරිපත් කළේත් ශ්‍රී ලංකාව යි. අද වුව ද අවංක ව කාර්යය ඉටු කළ, කරන සිල්වත් ධර්මධරයින් අතර මහා තෙරවරු අතිවයෝවෘද්ධ හෝ, අභාවප්‍රාප්ත ය. ඒ තැන් ගන්නා තරුණ පරපුරක් වත්මන් මූලික උසස් අධ්‍යාපන ආයතනවලින් බිහි වී නැත. බිහි කරන අධ්‍යාපන ප්‍රතිපත්තියක් අද බෞද්ධ අධ්‍යාපන ආයතන වල ක්‍රියාත්මක වේ ද ?

මැතක ලොවට බිහි වීමට සිටි දක්ෂ තරුණ පැවිදි පිරිසක් පල්ලියේ ග්‍රහණයට අසු කොට, ගිහියන් කරවා ජෝන් පෝල් පාප් මහා පූජක තැනට ආ වැඩීමටත්, බුදු සසුනත්, බෞද්ධ ඉතිහාසයත් ගරහන කතෝලික (තම්බයිය ආදී) දෙමළ මීසදිටුවන්ගේ පොත් ඇගැයූ සැටි ද රාජ්‍ය හා නිල නොවන මාධ්‍යවලින් අපි දිටිමු. බෞද්ධ විරෝධී අන්‍යාගමික විජාතික බලවේග අද බෞද්ධ ලංකාවේ සිහසුන් පත්ව ඇත.

මේ තරුණ භික්ෂු පිරිස අන්‍යාගමික බලවේග ග්‍රහණයට අසු කර ගත්තේ ඔවුන් ප්‍රදර්ශනය කළ විවිධ දක්ෂතා දැකීමෙන් පසු ව ය. එබඳු ම සරසවි ඇදුරන් පිරිසක් අතරින් සමහරුන් විශේෂයෙන් තරුණ පිරිස්

සිංහල බෞද්ධ විරෝධී කටයුතු සඳහා විවිධ මූල්‍යාධාර, විදේශ පාඨමාලා හැදෑරීමේ අවස්ථා පමණක් නොව ධනවත් අබෞද්ධ රටවල සුඛෝපභෝගී, කාමභෝගී වරප්‍රසාද හා (සරසවි) නිවාඩු කාලවල දී විදේශ චාරිකා, නිවාඩු ගත කිරීමේ පහසුකම් ලබා දෙමින් ඔවුන් ලවා තමන් උපන් රටට, ජාතියට, ඉතිහාසයට, භාෂාවට, ජාතික මහා වීරවරයන්ට මතු නොව, ලොව පුරා සිංහල බෞද්ධයාටත්, සිංහල දීපයටත් වෛර කර වීමට, අපකීර්තිමත් ප්‍රචාරයන් කර වීමට සිංහල බෞද්ධ සතුරන් අගය කිරීමට හා සාධාරණීයකරණයට මේ සරසවි ඇදුරන්, මහ ඇදුරන් බළල් අත් හෝ දඩ බල්ලන් මෙන් විලි බිය නැති කොට යොද ගෙන අසත්‍ය අමූලික අපාඛ්‍යාන ලොව පුරා ව්‍යාප්ත කරමින් ඇත. ඔවුන් පල්ලි බලවේග හා මාක්ස්වාදී විදේශ බලකඳවුරු වාද බලවේගයන් විසින් ග්‍රහණය කොට ඇත. ඒ අයුරින් ම විශිෂ්ට අනාගතයක් ඇති තරුණ දක්ෂ භික්ෂු පිරිස් ද කුලියට ගෙන ඇත.

මෑතක විදේශ බලවේග විසින් රාජ්‍ය නායක නායිකාවන් පවා ග්‍රහණය කොට ඔවුන්ගේ අධ්‍යාත්මයන් හා හදවත් සිංහල බෞද්ධ විරෝධී, මිථ්‍යා දෘෂ්ටික නායක පූජක පූජාදියට හා ස්වජාතික මානව උරුමයන්ට විරුද්ධ ව මහා පාවාදීම් කිරීමට පොළඹවා ඇත. මේ වංචනික දේශපාලන පක්ෂ නායක නායිකාවන් කතා කරන්නේ ක්‍රියා කරන්නේ තමන්ට නායකත්වය හා සුර සැප ලබා දී බලයට පත් කළ සිංහල බෞද්ධ බහුතරයේ ප්‍රශ්න ගැන හෝ ඔවුන්ට අහිමි වී ඇති පාරම්පරික ප්‍රජාතන්ත්‍රිය (සිංහල බෞද්ධ) මිනිස් අයිතීන්, උරුමයන් ගැන නොවේ. රාජ්‍ය විරෝධී, ත්‍රස්තවාදී සුළුජාතික, සුළුආගමික ජන කොටස්වල නැති අයිතීන් උරුමයන් ගැන ය. රට වනසන මිනිමරු දේශපාලන හා ආගමික බලවේග තෘප්තිමත් කොට ඔවුන්ගේ වහලුන් වීමට මිස සැබෑ නායකයන් මෙන් තම ජනතාවට දෙන පොරොන්දු ඉටු කිරීමට නොවේ. මෙය බුදු සසුනේ අනාගතය භාර නවක පිරිස් නොමඟ යවන්නකි.

### රාජානුග්‍රහය හා නායකත්වය

බුදු සසුනේ බැබලීම, ආරක්ෂාව හා ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය හේතු සාධකයන් අතර බෞද්ධ රටේ බෞද්ධ අයිතීන්, උරුමයන් ඉත සිතින් අවංකව රකින පෝෂණය කළ, කරන රාජානුග්‍රහය කෙතරම් අවශ්‍ය ද යන්න ඉතිහාසයෙන් පෙනේ. දෙවනපෑතිස්, දුටුගැමුණු යුග හා සමීපාතීතයේ කීර්ති ශ්‍රී රාජසිංහ (සෙංකඩගලපුර) යුගයත් මේ කාලවල පාලක යින්ට තිසි මඟ පෙන් වූ සඟරුවන හා සංඝ නායකත්වයත් ඒ සාරථකත්වයට මුල් විය.

විදේශ ආක්‍රමණ හා බෞද්ධ රටේ මිසදිටු නායකත්වයන් රට තුළ යාමය, සමෘද්ධිය, විනාශ කිරීමට මුල් වූ අතර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රධාන උරුමය වූ ජනතාවට අත්‍යවශ්‍ය අධ්‍යාත්ම ශික්ෂණය හා සාහිත්‍ය, කලා ආදී මහා සංස්කෘතික අභ්‍යුදය ලබා දෙන ආගමට විශේෂයෙන් බෞද්ධ රටේ බුදු දහමට හානි කිරීම එදත් අදත් මෙ සතුරු බලවේගවල ක්‍රියාකාරිත්වය විය. රජු හින්දුවෙකු වුවත් ශ්‍රී සරණංකර සඟ රජුන්ගේ සදශ්‍රය මත භක්තිමත් බෞද්ධයෙකු වූ, කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාත් සහරජුනුත් ශ්‍රී ලංකාව පුරා කාලීන චිත්‍රකලා වාස්තු විද්‍යා ලක්ෂණ සුරක්ෂිත කරමින් වෙහෙර විහාර, බුදුගෙවල් සහිත නව විහාරාරාම ධර්මග්‍රන්ථ හා ධර්මධර, ශීල වෘද්ධ තරුණ භික්ෂු පිරිස් ඇති කොට, ඒ ඒ ප්‍රදේශවලට යවා ධර්ම විනය ඥනය හා පොතපත ද ධර්මවිනයානුකූල පිළිවෙත් ද වර්ධනය කොට අන්තයට පිරිහිණු බුදු සසුන පණ ගැන්වීම අදට ද මහත් ආදර්ශයකි.

මුංකොටුවේරාළ ලියූ මොරතොට වත, සංඝරාජ වත, සහ මහාවංස යෙන් ද කන්දඋඩරටත්, වගේගොඩ සන්දෙස නම් වූ පාළි කාව්‍යයෙන් ලන්දේසි වෙළෙඳ පිළිවෙත ක්‍රියාත්මක වූ පහතරටත් සිදු වූ ශාසන මහා පරිහානිය නිරූපනය වී ඇත.

මෙකල ශාසන භාරධාරී සිල්වත් ගණින්නැහෙලා (උපසපන් නොවූ) පිරිසක් හැරුණු විට සෙස්සෝ විහාරගම්වල අඹුදරුවන් පෝෂණය කරමින් උඩරට නිලමේවරුන්ගේත් පහතරට ඕලන්ද නිලධාරීන්ගේත් දසයන් මෙන් බොහෝ විට සේවා කටයුතු කළ බව හා කිකිළි බිජු, සත්ව මාංශ සැපයූ තත්ත්වයේ පරිහානියේ අගාධයෙහි සසුනත් විශේෂයෙන් පැවිද්දත් පැවති බව ප්‍රකාශ වේ.

**අත්තානමේව පඨමං**

මේ සියලු විස්තරවලින් ප්‍රකාශ වන්නේ පැවිදි ජීවිතය ධර්ම විනය ඥනයෙන් හා ප්‍රතිපදවෙන් තොර වීම නිසාත්, ඒ වන තුරු නිසි රාජ්‍යානුග්‍රහයක් නොලැබීම නිසාත් මේ මහා පරිහානි තත්ත්වය උද වූ බව යි. මෙය නිසි පරිදි වටහා ගත් සඟ රජු මුලින් කළේ තමන් වහන්සේ ම ඉතා දුෂ්කර අන්දමින් ධර්ම විනය භාෂා සාහිත්‍ය ඥනය වර්ධනය කර ගැනීමත්, සිල්වත් පිරිස් යන නමට උචිත පරිදි විනයානුකූලව ජීවිත ගත කිරීමත් ඒ අනුව ක්‍රියා කරන ආදර්ශවත් අනුගාමික පිරිසක් ඇති කොට දිවයින පුරා ව්‍යාප්ත කිරීමත් ය. ශ්‍යාම දේශයෙන් උපසම්පදව ලබා ගෙන ඒම සඳහා රජුගේත් ඕලන්දයන්ගේත් සහයෝගයෙන් සංඝ දූත පිරිස් කිහිපයක් ම

රාජ නියෝජිතයන් ද සමඟ එකඟවීමෙන් ගත් නොපසුබට උත්සාහය නිසා යළිත් වරක් ලක්බිම බුදු සසුන පුනර්ජීවනයට පත් කළ හැකි විය. විහාරාරාම ගොඩ නැංවීම හා ප්‍රතිසංස්කරණය, ''නියම කත්දේ'' පිරුවන ඇතුළු භික්ෂු අධ්‍යාපන ආයතන පිහිටුවීම, දුර්ලභ පොතපත සොයා පිටපත් සුලභ කර වීම, පාරම්පරික අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රම අභාවයට යමින් තිබුණු යුගයක බාලාවතාර ආදිය අස්වාගෙන වැඩිදියුණු කර තැබීම, පහතරට, සබරගමුව ආදි සෙසු පළාත්වලට ද තම උගත් සිල්වත් සිසු හිමිවරුන් යවා ඒ ප්‍රදේශවල සසුන් වැඩ වැඩීම, ධර්ම විනය භාෂා සාහිත්‍යධර මහ වියත් ගෝල පරපුරක් බිහි කර තැබීම හා ලංකාව පුරා උඩරට චිත්‍ර, මූර්ති, වාස්තු විද්‍යා ක්‍රම අනුව ගොඩ නැඟූ බුදුගෙවල්, චෛත්‍ය සහිත විහාරාරාම ක්‍රමය හා උඩරට ශ්‍යාම නිකායික සඟ පිරිස් ද, ව්‍යාප්ත කර සසුන් වැඩ වැඩීමත් මේ ශාසන පුනරුත්ථාපන මහා ව්‍යාපාරයේ කැපී පෙනෙන අංග ලක්ෂණ විය.

මේ අනුව ධර්ම පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට මුලින් ම ඒ පිළිබඳ ශ්‍රද්ධා භක්තිය හෙවත් අචල විශ්වාසයක් තමා තුළ ම වර්ධනය කර ගත යුතු වේ. අනතුරුව ධර්මයත් විනයත් ක්‍රමවත් ව, සම්පූර්ණ ව හදළ යුතු වේ. ධර්ම විනය සම්බන්ධ ස්ථවිරවාද, මහායාන ආදි සම්ප්‍රදයයන් ඇතත් අපේ පාළි පිටකයන්හි අන්තර්ගත දැනුම හා ශික්ෂණය ආචාර්‍යවාදනුකූලව, විමංසන බුද්ධියෙන් පළමුව ග්‍රහණය කර ගැනීමෙන් තමාත් ලෝකයත් පිළිබඳ සාංසාරික බැඳීම් ලිහිල් කර ගැනීමේ පුරුද්ද ලැබේ. තමාට යථාභූතඥාණ දස්සනය හෙවත් සැම විට ම සංස්සාර පරිනාම ස්වභාය සියල්ලෙහි පෙනේ.

බුද්ධ පරිනිර්වානයෙන් පසු ධර්මයත් සංඝයාත් පමණක් ශේෂව ඇති අදට බුදුසසුන සඵල කර ගැනීමේ සාර්ථක ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ උපා මං නැවත සොයා බැලිය යුතු ය. අභාවයට ගොස් ඇති හෝ අභාවයට යමින් ඇති අතිදූර්වල දැ පවා පුනර්ජීවනයට පත් කර ගැනීමේ ශක්තිය නවීන විද්‍යාවට — විද්‍යාත්මක ගවේෂණයන්ට ඇත. එසේ ම බුදු දහමට ද ඵල ජනනය සිදු කළ හැකි විය යුතු ය.

බුද්ධ දේශිත ධර්ම විනය කොටස් කිසිදු අඩුවක් නැතිව තිබිය දී එහි ඉගැන්වීම්, උපදෙස්, පරාර්ථගාමිනී ප්‍රතිපදව ඉතාම පැහැදිලිව, පරිපූර්ණව තේරුම් ගත හැකිව තිබිය දී සාර්ථක ප්‍රතිඵල නොලැබෙන්නේ එය

ක්‍රියාත්මක කිරීමේත්, ක්‍රියාත්මක කරන්නන්ගේත් අනුදෙනෝගය — නොසැලකිල්ල ක්‍රම විලංඝනාදිය ද නිසා බව පිළිගත නොහැකි ද ? නැතහොත් පිළිවෙත් මග කමටහන් මග අමතක වීමෙන් ද ?

අන්තිම ආයෂී ශ්‍රාවකයන් වහන්සේ ශ්‍රී ලංකාවේ වුව ද පස්වන සියවසේ (මහානාම රජු ද බුදුගොස් මාහිමියන් විසින් හෙළටුවා පාළියට නැගී), විසුදුමග වැනි නිවන් මග පැහැදිලිව පෙන්වන යුගය තෙක් ම ජීවමානව වැඩ සිටි බවට නිසි සාධක ඇත. මලියදේව මහරහතන් වහන්සේ කැලණිපුර රජමහ වෙහෙර වැඩ සිටි බවත්, උන්වහන්සේ හැටනමක් අර්හත්වයට පත් කළ බවත් ලේඛනගත හෙයින් උන්වහන්සේට පසුවත් එම රහතන් වහන්සේලා වැඩසිටි බව හැඟේ. කෙසේ හෝ මාර්ගඵල ලාභයන්, භික්ෂුණී ශාසනයත් අනුරාධපුර යුගයේ ස්වර්ණමය කාලසීමාවක් වූ, ශ්‍රේෂ්ඨ ශෛලමය කලා නිර්මාන බිහි වූ 8 – 10 වන සියවස් 'තෙක් වත් පැවති බව අනුමාන කළ හැකි ය. අනුරපුර අග තෙක් අඛණ්ඩව, අපිදුව පැවත ආ මහණ උපසම්පද ආදි සංඝ ශාසනය පවා මෙරට නැතිව යාම නිසා ප්‍රථම වරට රාමඤ්ඤ දේශයට (පාත බුරුමයට) දූතයන් යවා එවකට සිටි බුරුම පාලකයා වූ අනුරුද්ධ රජු මගින් උපසම්පදවත්, ත්‍රිපිටකධාරි භික්ෂූන් වහන්සේත් ගෙන්වා සසුන් වැඩ වැඩූයේ පොලොන්නරුවේ (11 ශ.ව.) මුල් ම රජු වන මහා විජයබාහු මහරජතුමා ය. මහාවංසයෙහි ;

''උපසම්පද කම්මස්ස – ගණ පූරක භික්ඛුණං
අප්පහොනක භාවෙන – සාසනට්ඨිති මානසො'' (58.04)

''තතො ආණපයිත්වාන – පිටකත්තය පාරගෙ..........
පබ්බජ්ජා උපසම්පත්ති – කාරයිත්වා අනෙකසො'' (58.4.8)

යනුවෙන් එ බව පැවසිණ.

මේ අයුරින් ප්‍රව්‍රජ්ජා, උපසම්පද පවා මෙරටින් නැති වී යාමට හේතු වූයේ, විදේශ ආක්‍රමණය යි. 8 – 10 සියවස්වල අනුරපුර පැවති ශාසනයේ බැබලීම ඉතාම ඉහළින් පැවති නමුත් එය මෙතරම් පිරිහී ගියේ රාජ්‍ය පාලනයේ සුක්කානම අබෞද්ධ, අසිංහල, මිසදිටු, ධනලෝභී විදේශ මංකොල්ලකාර ආක්‍රමණිකයන් අතට පත් වීම නිසා බව නිසැක ය. ඔවුන් බෞද්ධ විහාරාරාමවලින් භික්ෂූන් වහන්සේ පලවා හැර ඒවා විනාශ කොට එහි තැන්පත් ධනය පැහැරගෙන යාමත් ඉන්පසු නඩත්තු නොකිරීමත් නිසා සමෘද්ධිමත් අනුරාධපුරය මහාවංසය කියන අන්දමට යකුන් කා දමූ මළ කඳක් බවට පත් විය. පැවිදි උපසම්පද ධර්ම විනය අධ්‍යාපනය හා

ධර්මග්‍රන්ථ ආදී සියල්ල ම මුළුමනින් වාගේ විනාශ විය. ඉන්පසු සිංහල බෞද්ධ හා පාරම්පරික, ජාතිදේශ වාත්සල්‍යය හා වගකීම ඇගයූ මහා විජයබාහු රජතුමා තම අප්‍රතිහත ධෛර්යයෙන් රට නිදහස් කොට සසුන් වැඩ වැඩී ය. පැවිදි උපසම්පදා, ධර්ම ග්‍රන්ථ හා ධර්මවිනය ඥානය හා විනයානුකූල ශික්ෂණය ද නැවත පිහිටු වීමෙන් 12 වන සියවසේ ධර්මවිනය ධර දිඹුලාගල මහාකාශ්‍යප, ටීකාචාර්ය ශ්‍රී ශාරිපුත්‍ර, මහා ව්‍යාකරණඥ මොග්ගල්ලායන ආදී අතිප්‍රබල ශාසන භාරධාරී ශීලවෘද්ධ, තපෝවෘද්ධ, බහුශ්‍රැත, ග්‍රන්ථකාරක, මහසඟ නව පරපුරක් බිහිකර දීමට මහවිජයබා රජුට හැකි විය.

එහෙත් සමහර පිරිස් නිසා මහා පරාක්‍රමබාහු යුගය වන විට ද යළිත් ශාසන පරිහානි ලක්ෂණ පහළ වූ බව මහාවංශයෙහි එයි :

''සංඝ ගාමෙසු සංඝස්ස පුත්තදරාදි පොසනෙ'' (76.03)

මහා විජයබාහු සංඝ සංශෝධනයෙන් අවුරුදු හතළිහක් යාමට පෙර නැවතත් විහාරගම්වල සමහර භික්ෂූන් පවුල් පංසල් වීමට තරම් ම දුෂ්ප්‍රතිපත්ති ව්‍යාප්ත වූ බව පෙනේ. මෙයට හේතුව දෙවන ගජබා රජු කේරලයට ගොස් පත්තිනි දේවාල කැප කිරීම්වල යෙදුණු (දෙමළ සිලප්පදිකාරම් ග්‍රන්ථය), මාංකනෙයි, තඹර්විල, කහඳූලියාව ආදී සෙල්ලිපි අනුව හින්දු භක්තියට බර පාලකයෙකු වූ නිසා ශාසනාරක්ෂාව සඳහා රාජානුග්‍රහ නොලැබීම විය හැකි ය. අනතුරුව මාඝ යුගයේ දී ද ශාසන පරිහානියට මේ තත්ත්වය ම හේතු වන්නට ඇත. මේ රජවරුන් අබෞද්ධ වූ නිසා ශාසනාරක්ෂාව ඇණහිටි බවත්, සුදුසු බෞද්ධ පාලනයක් පැවිණි විට යළිත් ශාසන දියුණුව සිදු වන බවත් මෙසේ ඓතිහාසික ය. යළිත් බෞද්ධ මහෝපාසක දඹදෙණියේ පණ්ඩිත දෙවන පරාක්‍රමබාහු යුගයේ දී දඹදෙණියෙන් ශාසනාභිවෘද්ධිය ඇරඹිණි.

වර්තමාන බුදු සසුනටත්, නවක තරුණ භික්ෂු පරපුරටත් මේ සෑම අවස්ථාවක දී මෙන් විවිධ ගැටළු අභියෝග සඳහා මුහුණ දීමට සිදු වූයේත්, වන්නේත් ඉහත දක්වූ හේතු සාධකවල ම අනිටු ප්‍රතිඵල විසිනි යි යන්තමින් පැහැදිලි විය යුතු ය. වර්තමානයත්, අනාගතයත් ගොඩ නැඟෙන්නේ අතීතයේ පැවති හේතු සාධක මත ය. එසේ ම, වර්තමාන ප්‍රශ්න තේරුම් ගත යුත්තේ අතීතයේ සිදු වූ ඒ සමාන සිදුවීම් විශ්ලේෂණය කර බැලීමෙනි.

එදා වැඩ සිටි සංඝ නේතෘන් මූලිකත්වය දුන්නේ ධර්ම විනය ඥානය නිසි පරිදි ලද හැකි සංඝ හෝ පිරිවෙන් අධ්‍යාපනයටත් වනවාස–ආරඤ්ඤ

වාසයන්හි සිදු වූ පරිදි බණ භාවනා වැඩීමටත් ය. එහෙත් වර්තමාන පිරිවෙන් අධ්‍යාපනය හා උසස් (සරසවි) අධ්‍යාපනය අද සංවිධානය කොට ඇත්තේ ඒ අරමුණු සපුරා ගැනීම සඳහා නොව, පෙර මෙන් විෂය විශාරදත්වය සඳහා ද නොව, හුදෙක් විෂයයන් මතුපිටින් බලා, ඒ අනුව ලබා දෙන වෘත්තීය සහතික සඳහා ය. වර්තමාන පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිපත්තිය පෙර මෙන් නවක භික්ෂු පරම්පරාවට අංග සම්පූර්ණ (අටුවා ටීකා ආදි ආචාර්යවාදයන් ආශ්‍රිත) සාම්ප්‍රදායික අධ්‍යාපනයක් — ආගමික අධ්‍යාපනයක්, හෙවත් ධර්ම විනය ඥානයක් ලබා නොදෙයි. එය වැඩි වශයෙන් ආගමික පරමාර්ථවලින් නවක භික්ෂූන් වහන්සේ ඈත් කරවන, ගෘහස්ථ ජීවන රටාවට අනුකූල වෘත්තීය සහතික ලබා දෙන ශික්ෂණයක් වී ඇත. ඒ නිසාත් වත්මන් රජයන් ආගමික පරමාර්ථ මුදුන් පමණුවනු සඳහා පිරිවෙන් වර්ග කොට, උසස් අධ්‍යාපනය සඳහා බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය උපාධි හා පශ්චාත් උපාධි පාලි බෞද්ධ විශ්වවිද්‍යාලයන් හා විශ්ව විද්‍යාලයානුබද්ධ පිරිවෙන් ආයතන බිහි කළත් එයින් මූලික ප්‍රශ්නය විසඳී නැත. භික්ෂු අධ්‍යාපන පරමාර්ථ පිළිබඳ ගැටළු සඳහා ඒවා සාර්ථක විසඳුම් වී නැත. ධර්ම විනය ඥානය හා ශික්ෂණය ලබා දෙන පිරිපුන් ආගමික අධ්‍යාපනයකි, අවශ්‍ය.

වර්තමාන ලංකාවත්, බුරුමය, සියම් රට වැනි අනෙක් බෞද්ධ රටකුත් සසඳන විට, මේ වෙනස හොඳට කැපී පෙනේ. ඒ රටවල නම් අදත් රාජානුග්‍රහ යටතේ පරිපූර්ණ ධර්ම විනය ඥානයක් හා ශික්ෂණයක් නවක භික්ෂු පරපුරට ලබා දෙන ආයතන හා පරීක්ෂණ ද ඇත. ඒ රටවල ත්‍රිපිටක අධ්‍යාපනය සඳහා රජයේ උසස් ම වරප්‍රසාද පිදෙයි ; ගරු සම්මාන ලැබේ. බුද්ධ ශාසන ඇමතිවරයාත් අමාත්‍යාංශයත් ඉතා ම ක්‍රියාකාරී ය.

ලංකාවේ බුදු සසුනට සැබෑ භක්ත්‍යාදරයකින් මෙතෙක් යමක් සිදු වී නම්, ඒ ශ්‍රීමත් බණ්ඩාරනායක යුගයේ පමණි. ත්‍රිපිටක පරිවර්තනය, පෙළ සහ අනුවාදයන් සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ප්‍රකාශයට පත් කිරීමේ හා බෞද්ධ හා සිංහල විශ්ව කෝෂ දෙකක් ඉංග්‍රීසි සිංහල මාධ්‍ය වලින් කාණ්ඩ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ උත්සාහයත් ඉතා අගය කළ යුතු වෙයි. එවැන්නක් නැවත ඇරඹී නැත.

බුරුම, සියම වැනි බෞද්ධ රටවලත් බෞද්ධ නොවන ඉන්දියාව, මහා බ්‍රිතාන්‍ය වැනි රටවලත් ප්‍රකාශයට පත් කොට ඇති ත්‍රිපිටක ජයන්ති ග්‍රන්ථ මාලාව හා වෙනත් බෞද්ධ ග්‍රන්ථ හා ලංකාවේ ත්‍රිපිටක මුද්‍රණය සසඳන විට ලංකා මුද්‍රණය කොතරම් අශෝභන ද, බාල කොළවල

නොසැලකිලිමත් ව මුද්‍රිත වූ පොත් කාණ්ඩවල නිකම්ම පිටකවර යොද සකසා තිබීම කොතරම් නිගරු ද, බාල ද, නොසැලකිලිමත් ද යන්න අපට පවසන්නේ ශ්‍රී ලංකාව වැනි උතුම් බෞද්ධ රටක බුදු සසුනට දක්වන කුඩම්මාගේ සැලකිල්ල යි.

මෙවැනි තත්ත්වයක් යටතේ නිදහසට පෙර චාමස් ආදි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් සමහරකු පාළි, බෞද්ධ ග්‍රන්ථ සංස්කරණය හා මුද්‍රණය සඳහා දක්වූ මහත් ගරු සැලකිල්ල නිදහස ලැබූ පසු බලයට පත් වූ මිෂනාරි (බෞද්ධ විරෝධී) පාසල්වල අධ්‍යාපනය ලැබූ බෞද්ධ වේශයෙන් පෙනී සිටින සිංහල නායක නායිකාවන් විසින් කිසි සේත් නොදක්වා ඇති බව කනගාටුවෙන් වුව ද ප්‍රකාශ කළ යුතු ය.

අද නවක තරුණ ආධුනික භික්ෂු ඡාත්‍රවරයන්ට අධ්‍යාපනය ලබා දෙන ආයතනය පිරුවන යි. එයට රජය ශිෂ්‍යාධාර නමින් ගෙවන ඉතා සුළු මුදල පවා ජයවර්ධන උතුමාගේ පාලන කාලයේ නතර කොට පමා කොට දුඞ් හිරිහැරයකට ලක් කළ අතර අධ්‍යාපනය මුදලට විකුණමින්, ජාතියට, මව් බිමට, මව් බසට, ඉතිහාසයට, බෞද්ධ සංස්කෘතියට, මහා වීරවරයන්ට නිගරු කිරීමේ, ද්වේෂ කරවීමේ බටහිරගැති තුප්පහි පල්ලි අධ්‍යාපන ක්‍රමයට එය මුදලට විකුණන පල්ලි පාසල්වලට රජයේ ගුරුවරුන් ලබන සියලු වරප්‍රසාද ප්‍රදනය කළ අන්දම ද අපට අමතක කළ නොහැකි ය. ගරු ඤාණසීහ මහ නා හිමියන් යටත් විජිත යුගයේ කිතුනු සුදු පාලකයින් අහිමි කොට තිබූ බුදු සසුන ලැබූ, එයට හිමි මූලික වරප්‍රසාද කීපය වත් යළි ලබා දෙන්නැ යි නිදහස් ලංකාවේ (මිෂනාරි අධ්‍යාපනය ලැබූ) රාෂ්ට්‍ර නායක යෙකුගෙන් ඉල්ලූ විට ලැබුණේ "ආංඩුව සරණං ගච්ඡාමි" කියන වන්දන ඓතිහාසික පිළිතුරකි. එහෙත් එතුමා මේ බෞද්ධ රටේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා වැඩ බැලූ සිංහල බෞද්ධයා තනතුරින් එළවා ලෝක අපකීර්තිමත් ක්‍රිස්තු බලවේග ප්‍රචාරකයකු වූ හොවුස් නම් බෙල්ජියම් ජාතික කතෝලික සුද්දකු පත් කළේ මිෂනාරි අධ්‍යාපන වෙළෙඳුන් තෘප්තිමත් නොකිරීමට ද ?

75%ක බහුතරයේ මානුෂික උරුමය, ප්‍රධානතම මානව හිමිකම වූ ස්වකීය ආගම ධර්මය පවත්වා ගෙන යාමට, ආරක්ෂා හෝ වැඩි දියුණු කර ගැනීමට අද ඇප කැප වී සිටින්නේ තරුණ නවක සඟ පරපුර යි. උන්වහන්සේලාට අද සමාජයේ හිමි විය යුතු තැන තව ම හිමි කර දී නැත. එම පිරිසට ගැළපෙන සුදුසු ධර්මවිනයානුකූල අධ්‍යාපන ක්‍රමයක් හෝ ඒ සඳහා පහසුකම් හෝ සැලසී නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදු

සසුන රක්ෂණය පෝෂණය කිරීමට රජය බැඳී ඇතත්, සුදු පාලකයින් සරසවි පැවිදි සිසුන්ට භික්ෂු නිවාස පවා සාද උදව් කළ නමුත් ඉතාම බුද්ධිමත් අනාගත ශාසනභාරධාරි තරුණ භික්ෂූන් වහන්සේලාට සරසවිවල අධ්‍යාපනය ලබා ගැනීමේ දී කැප සරුප් නිවාසයක් වත් සලසා දී නැත. බොහෝ සේ නොමඟ යවනසුලු නවාතැන් පොළවල් පෞද්ගලිකව සොයා යාමට මඟ සලසා ඇත. එබැවින් බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙහය විය යුත්තේ අනාගත ශාසනභාරධාරි තරුණ සඟ පරපුර නිසි පරිදි රැක දීම යි.

---

ලොව සියළු ආගම් සමානයැ යි කියමින් බුද්ධ ධර්මය හැල්ලු කිරීමට අන්‍ය ආගමිකයෝ උත්සාහ දරති. තථාගත ධර්මය ලොව බිහිවූ අන් කවර ආගමකටවත් සමාන නැත.

බෞද්ධ අධ්‍යාත්මිකව ජීවන මාර්ගයට මගේ ප්‍රශංසාව හිමි වන අතර අන් කවර නූතන විධිමත් දර්ශනයකටත් වඩා එය විශිෂ්ටතර ය.

— ආචාර්ය ග්‍රැහැම් හෝව්

# බෞද්ධ ආරාමික ජීවිතයෙහි ගුරු සිසු සබඳතා සහ එහි නව ප්‍රවනතා

ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**මාහල්ලේ විපුලතිස්ස හිමි**

ගුරු සිසු සබඳතාව පිළිබඳ බෞද්ධ අර්ථය විමසා බැලීමේ දී එය දෙආකාරයක විග්‍රහයකට ලක් කළ හැකි බව කිව යුතු ය. එනම් ගෘහස්ථ හා ආරාමික වශයෙනි. සිගාලෝවාද වැනි සූත්‍රයන්හි දී කරුණු දක්වා ඇත්තේ (පැවිදි ජීවිතයටත් අදාළ කර ගත හැකි වුව ද) විශේෂයෙන් ගෘහස්ථ ජීවිතයට අදාළ වන පරිද්දෙනි. එහෙත් අප මෙහි දී සලකා බලන්නේ පැවිදි හෙවත් භික්ෂු ජීවිතය හා සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක විය යුතු යැ යි පෙන්වා වදාරා ඇති පරිද්දෙනි. භික්ෂු සංස්ථාව වනාහි ලෝකෝත්තර ජීවිතයට කැප වූ විශාල සංස්ථාගත ආයතනයකි. එහි සාමාජිකයන් උනුන් කෙරෙහි දැක්විය යුතු විශේෂ ආකල්පයන් ඇත. ''ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවන් කෙරෙහි හිතවත්කමක් දක් වූ ගෝත්‍රයක පහළ වූ බුදුරජාණන් වහන්සේ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් වැද්ද ගත්තා විය හැක. සංඝයා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවලට අනුකූල ව වැඩී යා යුතු යැ යි අදහස් කළ උන්වහන්සේ ඒ අදහස්වලට රුකුල් වන පරිදි විනය ශික්ෂාපද පැනවූහ.'' එහෙයින් බෞද්ධ සංඝ සංවිධානය හා සම්බන්ධ සබඳතාවන් කේන්ද්‍ර ගත වී ඇති ගුරු සිසු සබඳතාව ද ඒ පදනම යටතේ දිගුකාලීන පැවැත්මක් යටතේ අන්‍යෝන්‍ය ගෞරවය හා සුහදතාව සුරැකෙන පරිදි මෙන් ම සමගිය හා සමාදානය හා එහි සංරක්ෂණයත් චිරස්ථායි බවත් සැකසෙන අයුරින් ගොඩ නඟා ඇත. වර්තමාන ව්‍යවහාරයෙහි ගුරු ශිෂ්‍ය ලෙසින් සම්මතයටත් ව්‍යවහාරයටත් පත් ව ඇති නමුත් මේ සබඳතාවන් ආරම්භයෙහි දී විභින්න වූ ආයතන දෙකක් ඔස්සේ විග්‍රහයට ලක් වී තිබූ බව සඳහන් කළ යුතු ය. එනම්, 1. උපාධ්‍යාය හා සද්ධි විහාරික ; 2. ආචාර්ය්‍ය හා අන්තේවාසික වශයෙනි. මෙහි සසුන්ගත වූ හා උපසපන් බව ලද නවක පැවිද්ද ආචාර්ය්‍ය භාවයට පත් වන්නේ උපාධ්‍යායයන් වහන්සේගේ අභාවයෙන් පමණක් බව භික්ෂු විනය පෙන්වා දෙයි. එහෙත් අද අගමුල මාරු වී ඇති බැවින් මේ දෙආකාර සබඳතාව ම ගුරු–ශිෂ්‍ය සංකල්පය තුළට අන්තර්ග්‍රහණය කොට විමසා බලමු.

බෞද්ධ ආරාමික ජීවිතයෙහි හා අධ්‍යාපන ක්‍රියාවලියෙහි උපාධ්‍යාය (පා : උපජ්ඣාය) හා ආචාර්ය (පා : ආචරිය) තනතුරු බුදු රජුන්ගේ ධර්ම ප්‍රචාරක කටයුතු විමධ්‍ය ගත කළ මුල් අවස්ථාවේ දී ම පිහිටුවන ලද තනතුරු දෙකකි. එයින් ප්‍රථමයෙන් පත් කරන ලද්දේ උපාධ්‍යාය තනතුර වූ අතර, උපාධ්‍යායයන් වහන්සේගේ අභාවයෙන් අසංවර, අසංයත භාවයට පත් වන්නට වූ සද්ධිවිහාරිකයන් රැක බලා ගැනිමට හා ඔවුනට මග පෙන්වීම සඳහා ආචාර්යවරයකු පත් කරන ලදි.

මේ අනුව භික්ෂු ශාසනයෙහි අද උපාධ්‍යාය තනතුර වියැකී ගොස් ආචාර්ය තනතුර ප්‍රමුඛස්ථානයට පැමිණ ඇත ද සඟ සසුනේ ආරම්භයේ දී ප්‍රමුඛස්ථානයක් හිමි ව පැවතියේ හා විශිෂ්ටත්වයට පත් ව තිබුණේ උපාධ්‍යායයන් වහන්සේ ම බව පෙනී යයි. "වජ්ජාවජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායෝ" යි නිර්වචන හෙයින් තම අතවැසියන්ගේ කුඩුමහත් දෝෂයන් නැවත නැවතත් විමසා බලා කරුණාවෙන් අවවාද දෙන හෙයින් උපාධ්‍යාය යැ යි කියනු ලැබේ. පැවිදි හා උපසපන් බව ලද නවකයන් උපාධ්‍යායවරයකුගේ නිශ්‍රය නැති ව, අවවාද අනුශාසනා නොලැබ, අනාකල්ප සම්පන්න ව, නොසරුප් සේ හැසිරීම හේතුවෙන් උපාධ්‍යායයන් වහන්සේගේ ඇසුරෙහි වසන ලෙස අනුදන වදාරණ ලද්දේ ය. "පබ්බජ්ජාය උපජ්ඣායෝ සෙට්ඨො" යි වදාළ බැවින් පැවිදි උපසම්පද දෙක්හි උපාධ්‍යායයන් වහන්සේ ශ්‍රේෂ්ඨ වෙති. උපාධ්‍යායයන් වහන්සේ විසින් සද්ධි විහාරිකයන් ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මවා ලිය හැකි වූ උභතො විභංග, ඛන්ධකාදියෙහි නිපුණ වූ තෙර කෙනෙකුන් ම උපාධ්‍යාය බවට සුදුසු වෙති.

උපාධ්‍යාය තනතුර සමාරම්භ කිරීම සඳහා හේතුසාධක වූ පසුබිම පිළිබඳ ව විමසා බැලීමේ දී ඉතා පැහැදිලි ව පෙනෙන කරුණු කිහිපයක් ම ඇත. ඒවා අතර ;

1. ගිහි සමාජය තුළ දී පුද්ගලයා තුළ පැවති ගොරෝසු වූ ඇතැම් ගිහි ප්‍රතිපත්ති හා කායික වාචසික ප්‍රාකෘතික බාහිර ආකල්පයන් (දුන්නිවත්ථා, දුප්පාරුතා, අනාකප්ප සම්පන්නා.........භත්තග්ගේ පි උච්චාසද්ද මහා සද්ද.........) සංවර හා සංයත භාවයට පත් කොට භික්ෂු ආකල්පයන්ට අනුලෝමික වන සේ ඔහු හැඩ ගැස්වීම.
2. ආධ්‍යාත්මික භික්ෂු පරමාදර්ශයන් පිළිබඳ ව බුදු රජුන් අපේක්ෂිත ගැඹුරු අවබෝධයන් නවක පැවිද්දන් තුළ ප්‍රගුණ කරවීම.
3. තම සංඝ සමාජය තත්කාලීන භාරතීය අන්‍ය තාපස සංස්ථාවන් ගෙන් අනන්‍යතාවකින් යුතු සංවිධානයක් ලෙස සංස්ථාපනය කිරීමෙහි ලා වගකීමෙන් යුතු නියාමකයන් පිරිසක් ඇති කිරීම.

ආදි කරුණු සැලකිය හැක. කෙසේ නමුත් ආරම්භයෙහි සිට 'මහා නායකත්ව' සංකල්පයෙන් තොර වූ බෞද්ධ සංඝ සංවිධානය ස්ථාවර චිරස්ථායී සංස්ථාවක් බවට පත් කිරීමෙහි ලා බුදුරජුන් ගත් ඉතා වැදගත් හා ඵලදායී පියවරක් ලෙස මේ උපාධ්‍යාය තනතුර පිහිටුවීමේ කාර්ය සැලකිය හැක. මෙය කෙතරම් ගෞරවීය හා වගකිව යුතු තනතුරක් ලෙස පවත්වා ගෙන යාමට බුදුරජුන් අපේක්ෂා කළේ ද යන්න එම තනතුර දැරීමට කවර සුදුසුකම් තිබිය යුතු ද යි පැහැදිලි කර ඇති අවස්ථාවන්ගෙන් මනාව පෙනී යයි. උපාධ්‍යාය තනතුර දැරීමට නම් තම ශිෂ්‍යයන් හෙවත් සද්ධිවිහාරිකයන් ත්‍රිශික්ෂාවෙහි හික්මවිය හැකි උභතොවිභංග, ඛන්ධක ආදියෙහි මනා ප්‍රගුණතාවක් තිබිය යුතු යැ යි දක්වා ලීමෙන් ම පැහැදිලි වේ.

එසේ නොමැති ව තමා අනුන් විසින් අවවාද දිය යුත්තෙක් ව, අනුශාසනා ලැබිය යුත්තෙක් ව (අඤ්ඤෙහි ඔවදියො, අඤ්ඤෙහි අනුසාසියෙෝ) සිටිමින් එවැනි තනතුරක් නොගත යුතු බව පෙන්වා දුන්හ.

අද ව්‍යවහාරයෙහි ශිෂ්‍ය යන්න භාවිත වුව ද උපාධ්‍යාය (පා : උපජ්ඣාය) වරයා හා සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඒ සඳහා යෙදී ඇත්තේ 'සමග වසන්නා' යන අර්ථය ඇති 'සද්ධි විහාරික' යන වචනය යි. මෙම සද්ධි විහාරිකයාත් උපාධ්‍යායවරයාත් අතර ශාසනික වශයෙන් පැවැත්විය යුතු ගැඹුරු සබඳතාව කවරාකාර එකක් ද යන්න ''මහණෙනි, උපාධ්‍යාය තෙමේ සද්ධිවිහාරිකයා කෙරෙහි පුතු සිත (පුත්ත චිත්තං) ඉපදවිය යුතු ය'' යි යනුවෙන් හා සද්ධිවිහාරික තෙමේ උපාධ්‍යායවරයා කෙරෙහි 'පිය සිත' (පිතු චිත්තං) ඉපදවිය යුතුයැ යි දක්වා ලීමෙන් පිළිබිඹු වේ.

මෙලෙස උපාධ්‍යාය සද්ධිවිහාරිකයන් අතර 'පිය පුතු' සංකල්පය ජනිත කර ගත යුතු ය යනුවෙන් බුදුරජුන් පෙන්වා දීමෙන් අපේක්ෂා කළ අරමුණු කිහිපයක් ම ඇත. ඉන් ප්‍රමුඛස්ථානය ගන්නකි, මව්-පිය සහෝදර ආදි කවර තරමක හෝ ඥාති සමූහයක් අතහැර සසුන්ගත වූ ඇතැම් විට ළදරුවෙක් වැනි ළාබාල කෙනෙකුට ඇති වන ආධ්‍යාත්මික හුදෙකලා බව අනාරක්ෂිත බව පිළිබඳ හැඟීම් මඟහරවා ගැනීම යි. ඔවුනොවුන් තුළ මෙත් කරුණා ආදි ගුණදහම් පදනම් කොට ගත් පරාර්ත්ථ සාධනීය ආකල්ප යන් ජනිත කර වීම වැනි තවත් බොහෝ අනුසස් ඒ තුළින් විකාශනය වී යාම යි. ගැටුම්වලින් තොර, පරම්පරා ගැටුම් හා අර්බුදවලින් තොර, එකිනෙකා කෙරෙහි මෛත්‍රී ආකල්පයෙන් බැඳුණු සංස්ථාගත ආයතනයක් බවට සංඝ සමාජය පත්කර ලීම සඳහා මේ පිය පුතු ආකල්පය කෙසේ ඉවහල් වේ ද යන්න ඒ දෙපාර්ශ්වයන් එම ආකල්පය තුළින් ගොඩ නඟා ගත යුතු මානසික පරිසරය කවරාකාර විය යුතු ද යන්න මේ ගුරු-ශිෂ්‍ය

දෙකොටස ''(ඔවුනොවුන් තුළ) අධිමාත්‍ර වූ ප්‍රේමයක් තිබිය යුතු ය; අධිමාත්‍ර ප්‍රසාදයක් තිබිය යුතු ය; අධිමාත්‍ර හිරියක් (ලජ්ජාවක්) තිබිය යුතු ය; අධිමාත්‍ර ගෞරවයක් තිබිය යුතු ය; අධිමාත්‍ර ගරු භාවනාවක් තිබිය යුතු ය,'' යනුවෙන් දක්වා ඇති විශේෂ ලක්ෂණයන්ගෙන් පැහැදිලි වේ. එහෙත් මේ ප්‍රේමය ගෙහසිත බන්ධනයෙන් බැඳුණු ආකාරයේ එකක් නොවිය යුතු බව සැලකිය යුතු ය.

සංඝ සමාජය තුළට පුද්ගලයෙකු ඇතුළත් වීමේ දී ඔහුගේ ආරාමික ආචාර ධර්මයන් හා ආරාමික ජීවන රටාවත් භික්ෂු ආකල්පත් ත්‍රිශික්ෂා පූරණය සඳහා මඟ පෙන්වීම වැනි සංවර්ධනාත්මක ක්‍රියාදාමයෙහි උපදේශකයෙකු නියාමකයෙකු ලෙස ක්‍රියා කරන උපාධ්‍යායයන් වහන්සේ ඒ නවකයා එම අරමුණු සාධා ගැනීමෙහි ලා තිබූ අත්වැල කැඩී ගිය විට ඔහු සසුන් මඟ අතර මං නොවීම සඳහා අවශ්‍ය පියවර බුදු රජුන් විසින් ගන්නා ලද්දේ ආචාර්‍යවරයෙකු පත් කිරීමෙනි. තම උපාධ්‍යායයන් වහන්සේගේ අභාවයෙන් ඒ සද්ධි විහාරිකයා ආචාර්‍ය (පාලි: ආචරිය) වරයෙකු වෙත අන්තේවාසිකයෙක් ලෙසින් විසිය යුතු ය. ආචාර්යයන් වහන්සේ වෙත වසන ඒ ශිෂ්‍යයා විනයෙහි හඳුන්වා ඇත්තේ 'අන්තේවාසික' යන නාමයෙනි. එහි අර්ථය සමීපයෙහි නැතහොත් ඇසුරෙහි වසන්නා යනු යි.

පසුකාලීන අටුවා ටීකා ආදියෙහි දී මේ අන්තේවාසිකයා විවිධ වර්ගීකරණයන්ට ලක් කොට ඇත. ඒ අනුව,

1. පබ්බජ්ජන්තේවාසික
2. උපසම්පදන්තේවාසික
3. නිස්සයන්තේවාසික
4. ධම්මන්තේවාසික

ආදී වශයෙන් බෙද දක්වා ඇත. මේ ආකාරයේ සියලු විග්‍රහයන් හා අර්ථ කථනයන් විපරිනාමය වෙමින් ගොස් අද දවසේ ඇති ගුරු-ශිෂ්‍ය සංකල්පය තුළට එහි අර්ථය කේන්ද්‍ර ගත වී ඇත.

බෞද්ධ විනයානුගත මේ ශාසනික ව්‍යවහාරය අද පබ්බජ්ජා හා උපසම්පද වැනි විනය කටයුතු හා සම්බන්ධ අවස්ථා කිහිපයකට පමණක් සීමා වී ඇත. මහණ කිරීමේ දී සිවුරු පටිය කරේ බැඳීම සරණ සිල්හි පිහිටුවීම වැනි මූලික කටයුතු කිහිපයකට පමණක් උපාධ්‍යායවරයෙකු උපයෝගි කර ගන්නා අතර උපසම්පදාවේ දී නවක උපසම්පන්න භික්ෂුව

විසින් ''උපජ්ඣායො මෙ භන්තේ හෝහි'' කීම මාත්‍රයට පමණක් සීමා වීමෙන් එම උපධ්‍යාය කටයුත්ත නිමා වෙයි. ඒ උපාධ්‍යාය සද්ධි විහාරික තනතුරේ සියලු කටයුතු හා සබඳතා එයින් ම නිමාවට ද පත් වෙයි.

ඉතිහාසයෙහි සියවස් දෙකහමාරකට අධික කාලයක් තුළ අද වන විට අවප්‍රමාණ වෙමින් හා සරළ වෙමින් ආ ආචාර්ය උපාධ්‍යාය තනතුරු මුල් අවධියෙහි බෞද්ධ භික්ෂු ආකල්පයන් තුළ ශාසනික අරමුණු ඉටු වන අයුරින් හැඩගැස්වීමෙහි ලා උසුලන ලද්දේ ඉතා වගකිව යුතු ගරුගාම්භිර වූ ගෞරවණීය භූමිකාවකි. උපසපන්බව ලත් නවක භික්ෂුව ආරාමික ජීවිතය හා සම්බන්ධ සදචාරයන් හා පර්යාප්ති ප්‍රතිපත්ති මෙන් ම ප්‍රතිවේධ යන් පිළිබඳ ප්‍රාගුණ්‍යයක් ලබා ස්වයංවිනයක් මගින් නැඟී සිටීමේ ශක්‍යතාව ලබන තෙක් මේ උපාධ්‍යායයන් වහන්සේ හෝ ආචාර්‍යයන් වහන්සේ ඇසුරෙහි අනිවාර්‍ය පුහුණුවක් ශික්ෂණයක් ලැබිය යුතු ය. එය හඳුන්වා ඇත්තේ නිස සමාදන් වීම වශයෙනි. උපාධ්‍යායයන් වහන්සේ හෝ ආචාර්‍යයන් වහන්සේ වෙත නිස සමාදන් වන සද්ධි විහාරිකයා හෝ අන්තේවාසිකයා පැවිදි ජීවිතය අවශ්‍ය මූලික ආචාර ධර්මයන් පිළිබඳ මනා පරිචයක් ලබන තෙක් උන්වහන්සේ වෙත විසිය යුතු අතර ඒ සඳහා නියමිත කාලය වසර පහක් වෙයි. එම පස් වසර තුළ ඒ ප්‍රාගුණ්‍යය ලබා ගත නොහැකි වුවහොත් දහ වසක් පසළොස් වසක් හෝ අවසාන වශයෙන් ජීවිතාන්තය තෙක් හෝ ඒ අධ්‍යයන ක්‍රියාවලිය පවත්වා ගෙන යා යුතු ය.

බෞද්ධ භික්ෂු විනයෙහි එන මේ උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචාර්ය–අන්තේවාසික වශයෙන් දක්වා ඇති ගුරු–සිසු සබඳතාව ඉතා ප්‍රබල හා සාධනීය ගුණාත්මක ලක්ෂණයන්ගෙන් යුතු ආචාරධර්ම පද්ධතියක් ලෙස ගොඩ නැඟී ඇති, ශාසනික තනතුරු දෙකකි. එහි දී සංඝ සංස්ථාවේ ස්ථාවරත්වයත් චිරස්ථායී බවත් මේ යුගද්වයන් හා සම්බන්ධ පුද්ගලයන් සිව් කොට්ඨාශය අතර පැවැත් විය යුතු අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් සම්භාරයත් කවරාකාර ද යි යන්න මහාවග්ග පාලියේ මහාඛන්ධකයේ දී පැහැදිලි කොට දක්වයි. ඒ අනුව බුදු දහමෙහි අවධාරණය කරන සමානාත්මතා සංකල්පය මත ඔවුනොවුන් සඳහා වූ මේ ආචාර ධර්ම පද්ධති ගොඩ නැඟී ඇති බව කිව යුතු ය. එහි දී ආචාර ධර්මාත්මක වශයෙන් එක් අයෙක් අනෙක් තැනැත්තා කෙරෙහි කවරාකාර හෝ ආධිපත්‍යයක්, ඒකාධිකාරී ආකල්පයක්, මහේශාඛ්‍ය භාවයක් දැරීම අවශ්‍ය නොවන බව අවධාරණය කොට දක්වති.

ඒ අනුව උපාධ්‍යායවරයා පිළිබඳ ව සද්ධි විහාරිකයා සම්මාවත්තනයෙහි (යහපත් පැවැත්මෙහි) යෙදිය යුතුවාක් මෙන් ම පෙරළා උපාධ්‍යායවරයා ද සද්ධි විහාරිකයා පිළිබඳ ව ද සම්මාවත්තනයෙහි යෙදිය යුතු ය. (සද්ධි

විහරිකේන භික්ඛවේ, උපජ්ඣායම්හි සම්මා වත්ති තබ්බං.......... උපජ්ඣායෙන භික්ඛවේ සද්ධි විහාරිකම්හි සම්මාවත්ති තබ්බං). ආචාර්ය-අන්තේවාසික යුගල විසින් ද අන්‍යොන්‍ය වශයෙන් මෙ සම්මා වත්තනය පැවැත්විය යුතු බව ද එලෙස ම දක්වති. මෙ සම්මා වත්තනය විග්‍රහ කිරීමේ දී ය බුදුරජුන් මෙ සිව් පාර්ශ්වයන් විසින් ඉටු කළ යුතු යුතුකම් කවරේ ද යන්න පැහැදිලි කර දක්වන්නේ. මෙලෙස මෙ සිව් පාර්ශ්වයන් ම ඔවුනොවුන්ට උද්දේශ, පරිපුච්ඡා ආදීයෙන් සංග්‍රහ කිරීමෙන් අනුග්‍රහ කිරීමෙන් (සංගහෙ තබ්බො, අනුග්ගහෙ තබ්බො, උද්දේසෙන, පරිපුච්ඡාය) සුහදශීලි මෛත්‍රි සහගත ආකල්පයකින් ක්‍රියා කළ යුතු බව අවධාරණය කර දක්වති.

බුදුරජුන් විසින් සංඝ සංස්ථාව ගොඩ නඟන ලද්දේ ප්‍රජාතාන්ත්‍රික මූලික සිද්ධාන්තයන් පදනම් කොට ගෙන බව යට සඳහන් කරන ලදී. බුදුරජුන්ගේ ඒ ප්‍රජාතන්ත්‍රවාදය අද ලෝකයේ ක්‍රියාත්මක වන එංගලන්තයෙන් ආ වෙස්ට්මිනිස්ටර් ක්‍රමයේ සියයට පණස්එකේ ප්‍රජාතන්ත්‍රවාදයක් නො ව සියයට සියයේ පරිපූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය යි. ඒ අනුව කවර ආයතනයක හෝ පුද්ගලයෙකුගේ **හෝ** අධිකාරී බලතලයකට තවත් ආයතනයක් හෝ පුද්ගලයෙක් යටත් කරන දසත්වයට පත් කරන ආකාරයේ විනය නීතියක් හෝ රීතියක් හෝ ප්‍රඥප්තියක් හෝ අනුමත නොකළහ. ඒ අනුව මේ උපාධ්‍යාය සද්ධිවිහාරික හෝ ආචාර්ය-අන්තේවාසික හෝ සබඳතා කිසිදු ආකාරයක අධිකාරී බල ප්‍රදානයකින් විශේෂත්වයට හෝ විශිෂ්ටත්වයට හෝ පත් නොකළ අතර සාපේක්ෂක වූ ආචාර ධර්ම පද්ධතියක් මත ඒ ඒ පාර්ශ්වයන් සාධාර්මික ආකාරයෙන් අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම් පිළිබඳ පූර්ණ ප්‍රායෝගික අවබෝධයකින් ක්‍රියා කළ යුතු ආයතනයක් ලෙස හඳුන්වා දුන්හ.

මහා වග්ග පාලියේ දී බුදුරජුන් පෙන්වා දෙන සද්ධිවිහාරිකයා විසින් තම උපාධ්‍යායවරයා වෙතත්, අන්තේවාසිකයා විසින් තම ආචාර්යවරයා වෙතත් දැක්විය යුතු ලෙස හඳුන්වා දී ඇති සකල විධ වතාවතක් ම ශාසනානුලෝමී වෘද්ධාපචායානුගත වන්දනමානනාදි විශේෂිත ගෞරව සමාචාරයන් හැර අනෙකුත් සියලු කුඩුමහත් වතාවතක් ම සෙවීම්, බැලීම, විමසීම් ආදී සියල්ලක් ම උපජ්ඣාය-ආචාර්යවරයන් විසින්ද සද්ධිවිහාරික-අන්තේවාසිකයන් වෙත ද ඒ ආකාරයෙන් ම දැක්විය යුතු යැ යි නියම කොට ඇත. මේ සියලු පාර්ශ්වයන් හා සම්බන්ධ සියලු විග්‍රහයක් ම අවසන් කරන්නේ තෙල සතරාකාර පුද්ගලයන්ගෙන් කවරෙක් වුව ගිලන් වී නම් දිවි ඇතිතෙක් හෝ නිරෝගි බව අපේක්ෂා කරමින් අනෙක් තැනැත්තාට උපස්ථාන කළ යුතු බවට (සචේ..........ගිලානො හෝති යාව ජීවං උපට්ඨාා තබ්බා) නියම කරමිනි.

බුදුරජුන් මේ සතරාකාර වත් ඉදිරිපත් කරමින් පෙන්වා වදාළේ මෙවැනි ආචාර ධර්ම පද්ධතියක් තුළ සම්මාවත්තනයක් හෙවත් යහපත් පැවැත්මක් යුතු ව ක්‍රියා කරන්නේ නම්, ඔවුනොවුන් ගෞරව සහිතව, සමාන පැවතුම් සහිතව, සමාන බෙදහද ගැනීම් සහිතව (එවං තේ සගාරවා සප්පතිස්සවා සභාග වුත්තිනො විහරිස්සන්ති) වසන්නාහු නම් මේ සසුනෙහි වැඩීමට, නැඟීමට, මහත් බවට, (වුද්ධිං විරුළ්හිං, වෙපුල්ලං) පත්වන බව යි. මෙහි දී බුදුරජුන් ඒ සතර පාර්ශ්වයන් හා සම්බන්ධයෙන් ම යෙදූ සගාරවා, සප්පතිස්සවා, සභාග වුත්තිනො යන විශේෂණයන් මගින් මේ ශාසනික සබඳතා කවරාකාරයෙන් අන්‍යොන්‍ය ගෞරවයත්, සුහදතාවත් සුරකෙමින් දීර්ඝකාලීන පදනමක් මත ගොඩ නඟා ඇද්ද යන්න ඉතා පැහැදිලි වේ.

මේ ගුරු–සිසු සබඳතාව බුදුරජුන් විසින් ද මහා පරිනිබ්බාණ සූත්‍රය වැනි තන්හි දීත් ආනන්ද මහතෙරුන් වැනි මුල්කාලීන ශ්‍රාවකයන් වහන්සේලා විසින් ගොපක මොග්ගල්ලාන සූත්‍රය වැනි ස්ථානයන්හි දීත් පෙන්වා දී ඇති පරිදි, කිසිදු පුද්ගල නායකත්වයකින් තොර වූ බෞද්ධ සංඝ සංවිධානය සියවස් විසිපහකට අධික කාලාන්තරයක් මුළුල්ලේ අඛණ්ඩවම එහි මූලික ථෙරවාදී සාම්ප්‍රදායික ස්වරූපයෙන් පවත්වා ගෙන ඒමට හේතු සාධකව පැවති ප්‍රබලතම මෙහෙය වීම වූයේ සංස්ථාපිත වූ මේ ගුරු–සිසු ආචාර ධර්ම පද්ධතිය බව නොවළහා කිව යුතු ය.

බෞද්ධ සංඝ සමාජය ශාසන ඉතිහාසයෙහි යම් පරිහානිකර තත්ත්වයකට පත් ව එහි මූලික පරමාර්ථයන්ගෙන් ඈත් ව ආපදාපන්න වූවා නම් ඒ මෙහි සඳහන් උපාධ්‍යාය සද්ධි විහාරික හා ආචරිය අන්තේවාසික යන සිව් කොට්ඨාශයන් අතර පැවති ගරු ගාම්භීර වූ ශාසනික සබඳතාව ලිහිල් ව යාම නිසා සිදු වූවක් බව ථෙරවාදී බෞද්ධ ඉතිහාසය විමසා බැලීමේ දී පෙනී යයි. එවැනි සෑම අවස්ථාවක දී ම මේ ආයතනයන් අතර පැවතිය යුතු සහසම්බන්ධතාවන් යළි ගොඩ නංවාලීම හා තම තමා ආයත්ත තෙල ආයතනයන් සතු යුතුකම් හා වගකීම් තලයන්හි පිහිටිය යුතු බවට ශාසනාභ්‍යුදයකාමී රාජරාජ මහාමාත්‍යාදීන් පවා අවධාරණය කර සිටි අයුරු මෙරට ශාසන ඉතිහාසයෙන් ද පැහැදිලි වේ.

ලක්දිව ශාසන ඉතිහාසයෙහි පරිහානිකර අවස්ථාවක් වූ පොළොන්නරු යුගයෙහි එම පරිහානියෙන් මෙරට මුදවා ගත් මහපැරකුම්බාවන් විසින් සිය ශාසන ශෝධනය පිළිබඳ කරුණු පැහැදිලි කරන්නා වූ ගල්විහාර කතිකාවතෙහි :

''..........මාවිසින් මහෝත්සාහයෙන් සාධිත වූ මේ සංඝ සාමග්‍රිය පස්වා දහසක් අභින්න වැ පවත්නා පරිද්දෙන් මතුවන සංඝයා ද අප්‍රමාද වැ ග්‍රන්ථ විදර්ශනා ධුර ද්වයෙහි යෙදී අල්පේච්ඡතාදී ගුණයෙන් යුක්ත වැ

වසනා පරිද්දෙන්.........ගණ දෙවු තෙරවරුන් විසින් තම තමා නිසා වන අන්තේවාසික සද්ධි විහාරිකයන් අතුරෙහි නිසදෙන්නට නිසයෙන් මිදෙන්නට යෝග්‍ය ව වසන්නවුන් පමා නොවියැ දී''

යනුවෙන් හා එවැනි ම ශාසනික මෙහෙයක් සිදු කළ දඹදෙණි පැරකුම්බාවන් විසින් සිය කතිකා වතෙහි :

''උපජ්ඣාය මූලිකා පබ්බජ්ජා ව උපසම්පද ව උපජ්ඣායෝ තත්ප ඉස්සරෝ න ආචරියෝ යනුවෙන් තමහට භාර බැවින් අප්‍රමාද ව උන්. ආභිසමාචාරිකාදියෙහි විශේෂයෙන් යොදු හෙරණ සිඛ පුහුණු කරවා අස්වා හෙරණ සිඛෙහි කී පරිද්දෙන් හික්මවා ග්‍රන්ථ විදර්ශනා ධූරයෙහි අප්‍රමාද කොට වස්වා බුදුසසුන රක්නා ලෙස වර්ධනය කටයුතු.''

ඇ විසින් කරනු ලබන ප්‍රකාශනය සහ කෝට්ටේ යුගයේ සවැනි පැරකුම්බා විසින් :

''.........උතුම් බුදු සසුන පස්වා දහසක් පවත්නා සේ ප්‍රතිපත්ති මහා ප්‍රකාරයෙන් පරික්ෂේප කොටැ මේ ව්‍යවස්ථා කිරීමෙහි ස්වකීය සද්ධි විහාරික අන්තේවාසිකයන්ට අණවා ලිය යුතුයි''

ආදී ලෙසිනුත් ; හා ඉන් පසු කළ සියලු ශාසනික සංශෝධන හා ප්‍රතිසංස් කරණ කාර්යයන්හි දී ම මේ උපාධ්‍යාය–ආචාර්ය ආයතනයන් සතු භූමිකාවන් හා වගකීම් යළි යළිත් ඉදිරියෙහි තබමින් අනාගත ශාසනික පැවැත්ම කෙරෙහි මේ සංස්ථාවන් සතු කාර්‍යභාරය වටහා දෙමින් සංඝ සමාජය තුළ ඒ ඒ ධූරයන් දරන්නවුන් තුළ තම තමා සතු භාරධූර වගකීම ප්‍රායෝගී ව ක්‍රියාවට නංවන ලෙස බලකර තිබීමෙන් මේ ශාසනික ධූරාවලීන් සංඝ සමාජය තුළ කවරාකාර කේන්ද්‍රීය ස්ථානයක් දරන්නේ ද යන්න පෙන්වා දෙයි. සංඝ සමාජයේ සංරක්ෂණය හා චිරස්ථිතිය සඳහා ඇති කරන ලද මෙවැනි තනතුරු හා ඒවා දරන්නවුන් නික්බිත්තධූර වූ විට ත්‍රිවිධ ශාසනය මැ අනතුරට භාජන වන අයුරු බුදුරජුන් නැවත නැවතත් අවධාරණයෙන් පෙන්වා දී ඇති හෙයිනි. ලක්දිව ශාසන ඉතිහාසයෙහි සංඝ සමාජය ඉමහත් පරිහානියට පත් ව තිබූ නුවර යුගයෙන් පසු ඇති වූ ශාසනික පුනර්ජීවන සමයේ දී ඒ සඳහා ගුරු–සිසු සබඳතාව කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පැහැදිලි කරමින් මහනුවර අභිනව කතිකාවතෙහි :

''උපාධ්‍යායයන් වහන්සේ විසින් යථෝක්ත ප්‍රව්‍රජිතයා පිළිබඳ කටයුතු තමහට භාර බැවින් ඔහු ආභිසමාචාරිකාදී වත් පිළිවෙතෙහි යොදු හෙරණ සිඛ අර්ථ ප්‍රගුණ කරවා ශ්‍රමණ ධර්මයෙහි අප්‍රමාද වන ලෙස අනුශාසනා කිරීමෙන් මතු බුදු සසුන රක්නා ලෙස වර්ධනය කටයුතු''

යනුවෙන් සඳහන් කරනු පරිදි ශාසනයේ සහ සංඝ සමාජයේ චිර පැවැත්ම හා ස්ථාවරත්වය සඳහා මෙම සබඳතාවන් අනිවාර්යයෙන් යථාර්ථවත් ලෙස ප්‍රායෝගික ව ක්‍රියාවට නැඟිය යුතු ය යන්න තත්කාලීන ශාසන භාරධාරී මහතෙරවරුන් හා ශාසනාමාත්‍යක රාජරාජමහාමාත්‍යාදීන් පවා අවබෝධ කර ගෙන සිටි අයුරු පැහැදිලි වේ.

සංඝ සමාජයේ පාරිශුද්ධය මෙන් ම සංරක්ෂණය හා චිරස්ථිතිය සඳහා එවන් බලයක් හා වගකීමක් ඇති මේ උපාධ්‍යාය ආචාර්ය සංස්ථාවන් කැඩී බිඳී විසිරී බල රහිත වී යා නොදී ආරක්ෂා කර ගැනීම සඳහා ඒ ඒ යුගයන්හි විසූ ශාසනභාරධාරී මහතෙරවරුන් හා රාජරාජමහාමාත්‍යාදි බලධාරීන් නිසි පියවර ගත් අයුරු මෙරට ශාසන වංශකථාව පිළිබඳ ඉතිහාසයෙහි සටහන් වන සංගායනා, ශාසනශෝධන, විහාර හා ශාසනික කතිකාවත් ආදි ව්‍යාපාර තුළින් මනාව පිළිබිඹු වේ.

මෙසේ ථෙරවාදී මූලික බෞද්ධ සම්ප්‍රදායානුගත ශාසනික නය විමසීමේ දී ඉතා පැහැදිලි ව පෙනෙන කරුණක් නම් සංඝ සමාජයේ උච්චාවචයන් හෝ ; අප්‍රතිපත්ති–දුශ්ප්‍රතිපත්තිතාව හෝ ; පාරිශුද්ධය-ක්ලිශ්ඨත්වය හෝ ; අන්තිම වශයෙන් මිලින වී වියැකී යාම හෝ ; සුපුෂ්පිත වැ කායයීක් ෂම වීම හෝ සිදු කිරීමෙහි ලා මේ උපාධ්‍යාය සද්ධි විහාරික හා ආචාර්ය අන්තේවාසික (වශයෙන් දක්වා ඇති) ගුරු–සිසු සබඳතාවේ නැඟීම හෝ වැටීම ඉතා ප්‍රබල වගකිව යුතු කායයී භාරයක් ඉටු කරන බව මේ අනුව සක්සුදක් සේ ඉතා පැහැදිලි වේ.

ශාසන ඉතිහාසගත වාර්තා විමසා බැලීමේ දී ඉතා පැහැදිලි ව පෙනෙන කරුණක් නම් බුදුරජුන් ජීවමාන සමයේ සිට භාරතය තුළත් අනුබුදු මිහිඳු මාහිමියන් ලක්දිවට බුදු දහම හා සහ සසුන ගෙන ආ දිනයේ සිට නුවර යුගය දක්වාත් උච්චාවච වෙමින් මේ උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචරිය–අන්තේවාසික සබඳතාවන් වෙන වෙන ම පැහැදිලි වන සේ තම තමා අයත් භූමිකාවන් තුළ ප්‍රායෝගි ව අර්ථවත් අයුරින් ක්‍රියාත්මක වෙමින් ආ බව යි.

එහෙත් පසළොස් වන සියවසේ සිට පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන යුරෝපීය බලවේග විසින් කරනු ලැබූ ආක්‍රමණික ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් විසින් මෙරට තුළ ක්‍රියාත්මක කළ ආර්ථික, දේශපාලන, සාමාජික හා ආගමික මෙන් ම සංස්කෘතික හා නෛතික ක්‍රියාදමයේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ අපේක්ෂාව හා ඉලක්කයන් වූ පරිදි ම බෞද්ධ සම්ප්‍රදායානුගත මේ ශාසනික ආයතනයන් තුළ ද නොයෙකුත් උඩුයටිකුරු වීමේ ප්‍රවනතාවන් ඇති විය.

එහි එක් ප්‍රතිඵලයක් ලෙසින් රෝම-ලන්දේසි නීතිය හා ඔවුන් විසින් බිහි කළ විහාර දේවාලගම පනත වැනි නිතිරීතින් ක්‍රියාත්මක වීමෙ ප්‍රතිඵලයක් වශයෙන් ත්‍රිවිධ ශාසනාය නිර්මල ව පවත්වා ගෙන යාමෙ නියාමක බලවේගයන් වූ උපාධ්‍යාය හා ආචාර්ය ආයතනයන් වෙත ධර්මය විසින් සමාරෝපිත ව තිබූ අනන්‍යාත්මක වගකීම් සමූදයෙන් ඒ ආයතන ගිලිහී යන්නට විය. එක් අතෙකින් උපාධ්‍යාය හා ආචාර්ය ආයතනයන් වෙත තම සද්ධිවිහාරික හා අන්තේවාසිකයන් හැඩගැස්වීමෙහි ලා සතු ව පැවති සකලවිධ වගකීම් සම්භාරයක් ම තෙල බටහිර නිතිරීති විසින් නිශ්ක්‍රිය කර ඇති අතර අනෙක් අතට ඔවුන්ගේ නිතිරීති විසින් බිහි කළ විහාරාධිපති තනතුර විසින් යට කී සියලුම ශාසනික ආයතනයන් ගුරු-ශිෂ්‍ය නම් වූ එක ම ආයතනයක් බවට සමීකරණය කර ඇත. එහි දී එම තනතුර හා සම්බන්ධයෙන් ඔවුන් විසින් ම අර්ථකථනය කළ ශිෂ්‍යානු-ශිෂ්‍ය නම් නව නිතිමය සංකල්පයක් සංඝ සමාජය වෙත ආරෝපිත කරමින්, සංඝ සමාජයේ අරමුණු හා පරමාර්ථ සාධනයෙහි ලා නියාමක බලවේගය ලෙස බුදුරජුන් විසින් සංස්ථාපිත උපාධ්‍යාය-සද්ධිවිහාරික හා ආචරිය-අන්තේවාසික සංස්ථාවන් යුරෝපීයයන්ගේ භෞතිකවාදී ලෞකික අරමුණු සාධනය හා සම්බන්ධයෙන් නව මඟකට යොමු කොට නීතිගත කර ඇත.

එය තම ආධිපත්‍යය ලක්දිව ස්ථාපිත කිරීම සඳහා ඇති එක ම බාධකය ලෙස ඉංග්‍රීසින් ඇතුළු කතෝලික හා ක්‍රිස්තියානි පල්ලිය දුටු බෞද්ධ භික්ෂු පරපුර ආයතනික වශයෙන් ම වඳ කර දැමීම සඳහා — විසුරුවා හැරීම සඳහා ගත් උපක්‍රමික පියවරකි. ඔවුන්ගේ ඒ අභිලාෂයන් හා අරමුණු අද ඉතා සාර්ථක අන්දමින් ඉටු වී හා ඉටු වෙමින් පවතී. ඔවුන් විසින් අභිනවයෙන් පිහිටුවන ලද විහාරාධිපති තනතුර නමැති මිරිඟුව විසින් බුදුසසුනේ හා සඟ පරපුරේ හරය වෙතින් එහි සාමාජිකයන් බැහැර කර ඇත. මේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර නමැති මිරිඟුව ඔස්සේ හඹා යමින් වේලේ මෙන් ම අවේලේ නීතිඥයන් උසාවි කඩපිල් ගානේ දිවීමට සලස්වා එහි අගමුල සෙවීමට තහවුරු කර ගැනීමට පොළඹවා ඇත. නිර්වාණගාමිනී ප්‍රතිපදාවේ යෙදෙමින් නිශ්ශරණාධ්‍යාශයෙන් අත්තහිත පරහිත සාධනයෙහි ලා ක්‍රියා කිරීමෙහි සුවපහසුව සඳහා සැදැහැවත් උවසු-උවැසියන් විසින් සිව්දිගින් වඩින සංඝයාට (චතුදිග සඟස) පුදන ලද ආරාම හා ඒවා සතු කෙත්වත් ඉඩකඩම් ආදී ශාසනික භෞතික සම්පත් තත් විහාරාධිපති පදවියට පවරා උන්වහන්සේ සසුන් මඟින්, සසුන් බරින් ඉවත් කොට ගිහි මඟින් ගිහි වග හා සසුන් වග සමඟ සණ්ඩුසරුවල් කරමින් තඩුහබ කියමින් ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර නමැති අක්මුල් නැති වැඩ පිළිවෙලක පටලවා ඇත. නිශ්ශරණාධ්‍යාශයෙන් අත්තහිත පරහිත සාධනයෙහි යෙදවිය යුතු හා යෙදවිය හැකි වටිනා ජීවිතයක් නාස්ති වී යාමට සලස්වා ඇත.

මෙරට ආක්‍රමණය කළ කුරුස බලය විසින් මෙහෙය වූ ඉංග්‍රීසි පාලකයන් විසින් බිහි කළ ඊමකී නීතිරීති නිසා ඒ ශාසනික ගරු ධානාන්තර යන්හි ප්‍රායෝගික අර්ථවත් භාවය වියැකී ගොස් ආර්ථික ආධිපත්‍යය පදනම් කොට ගත් විහාරාධිපති තනතුර ඔස්සේ බිහි වූ යම් යම් නායක පදවි තානාන්තර ඇත ද ඒ කිසිවක් මේ උපාධ්‍යාය හා ආචාර්ය සංකල්පය විසින් පමණ සංඝ සමාජයේ පාරිශුද්ධියත් සංරක්ෂණයත්, චිරස්ථිතියත් සඳහා කිසිදු මෙහෙයක් ඉටු නොකරයි.

එහි ප්‍රතිඵල වශයෙන් උපාධ්‍යාය හා ආචාර්ය තනතුරු පිහිටුවීමට පෙර සංඝ සමාජයේ නවකයන් තුළ දක්නට ලැබුණු ආකාරයේ ම ස්වේච්ඡාචාර, දුන්නිවත්ථ, දුප්පාරුත, අනාකප්පසම්පන්න ; බාල, තරුණ පිරිස් හා බුඩ්ඪ පබ්බජිත පිරිස් නාගර, ගම්, දනව් පමණක් නො ව දේශ දේශාන්තරයන්හි පවා සිසාරා සංචරණය කරනු දක්නට ලැබේ. ශ්‍රද්ධාවන්ත උපාසක–උපාසිකාවෝ උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති. අන්‍ය ආණ්ටික, අන්‍ය රුචික, අන්‍යාගමික, බෞද්ධ විරෝධී, භික්ෂු විරෝධී, ආක්‍රමණික, බලවේග වැනි ආයතන හා පුද්ගලයෝ මහ සිනායෙන් සිනාසෙති. ශාසනමාමක සැදැහැවත් උවසු–උවැසියෝ ළෙහි අත් ගසා වන්නා වූ ශාසන හානිය දැක සොවිති. තෙමේ ම චීවරධාරී වැ බුදුන් ද පැවිද්ද ලද්දේ කා වෙතින් දැ යි වහසිබස් බෙනෙමින් විනය වර්ධන හෙවත් විභජ්ජවාදී නම් වූ බෞද්ධ විරෝධී බැල සංවිධානයන්හි ගැත්තෝ සසුන කෙලෙසීමේ යෙදී සිටිති. වෛර ලකුණු, හංවඩු, පච්ච කොටා ගත් මැරයෝ සිවුරුධර වැ කඩු, කිනිසි, පිස්තෝල ගෙන දෙමංසල්, තුංමංසල්, කොවේ මාවේ හැසිරෙමින් භයානක අපරාධ මංපැහැරීම් මිනිස් ඝාතන කරමින් දවල් මිගෙල් ඊ. දනියෙල් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී ලජ්ජී බික්මහ සඟනට අවලාද, නින්ද, අපහාස ලබා දෙති. දේශපාලන පක්ෂ ගැත්තන් වී පක්ෂ ප්‍රතිපත්ති පැවිදි විනයටත් වඩා ඉහළ සේ සලකමින් සන්නිවේදන මාධ්‍යයන්වලින් හා දේශපාලන පක්ෂ විසින් දෙන ලද මහානායක අනුනායක ආදි පදවි තානාන්තර සම්මාන ලබමින් සසුන් උණුසුමට වඩා රාජ උණුසුම ප්‍රිය කරමින් නිමක් කොනක් නැති, ධර්ම විරෝධී, විනය විරෝධී, ආචාර ධර්ම විරෝධී, ශාසන විරෝධී ක්‍රියාවන් කරති ; කියති.

ආචාර්ය උපාධ්‍යායයන් විසින් ප්‍රගුණ කර විය යුතු ශාසනික ප්‍රතිපදවන් නොදත්කමින් හා එවැනි ආයතනයකට වගකීමකට බැඳී නැති බැවින් මෙන් ම අවිනය අසංවරය ම සහජාශය කර ගෙන ඇති බැවින් ඒ ගැන සෙවීමට, බැලීමට, විමසීමට, වගකීමකට බිය සැක ඇති කර ගැනීමට සහසම්බන්ධිත තැනක් නැති වගකීමෙන් බැඳී ඇති ආයතනයක් නැතිකමින්

ස්වෙච්ඡාචාරී ව නොසරුප් ඇවතුම් පැවතුම් ඇති වැ වෙසෙති. ආක්‍රමණික කුමන්ත්‍රණකරුවන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව නම් වූ උගුලට අසුව නොවියත්, අසංවර, අසංයත, නවක පැවිද්දන් නිස්සය විසීම ආදි ශාසනික වශයෙන් ශික්ෂණයක් නොලැබ වෙහෙර විහාර ආදි දේපලවල උරුම් කරුවන් වී සසුන් මහත් බණදහමත් නොදන, නොදක ඒ සඳහා උපදෙස් අනුශාසනා දිය යුත්තෙක් නො ලැබ තමාත් තමා ධරා ඇති අරිය වංශාගත උරුමයේ සංකේතය වූ චීවරයත් පිළිබඳ හැඟීමක්, තැකීමක් නොදන්නා කමත් නිසා ම තමාට ම සිදු කර ගන්නා වූ හා අනුන්ටත් සිදු කරන්නා වූ හානිය අපමණ ය.

ඒ හැරෙන්නට මෙම උපාධ්‍යාය–ආචාර්ය සංකල්පය විසින් මූර්තිමත් කළ ශාසනික නියාමකවරුන් නොලැබ යාම නිසා සංඝ සමාජයටත් එහි සාමාජිකයන්ටත් සිදු වී ඇති හානිය, විනාශය, අපකාරය අපමණ ය.

අද ලක්දිව සංඝ සමාජය තුළ බුදුරජුන් දක්වා වදළ ආකාරයේ උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචරිය අන්තේවාසික ගුරු–සිසු සබඳතාවක් තුළ ම ක්‍රියාත්මක නොවීම නිසා මේ දෙපාර්ශ්වයන්ටත් ඒ නිසා ම බුදු සසුනටත් සිදු වෙමින් පවත්නා ඉමහත් හානිය පිළිබඳ මනා වැටහීමක් ඒ ඒ නිකායික මහානායක ආදි වශයෙන් වූ විචිත්‍ර වූ ආකාරයෙන් බෙදී විසිරී ඇති අභිධාන නාමධාරී ව සිටිනා වගකිව යුතු මහතෙරපාණන් වහන්සේලා අවබෝධ කර ගත යුතු ය.

ඒ සඳහා දැක්විය හැකි හේතු සාධක හා ප්‍රතිඵල බොහෝ වෙති. එක් පැත්තකින් තම ගෝලබාලයන් දනඋගත් ව්‍යක්තයන් බවට පත් වෙද්දී ඇදුරු උවැදුරු තෙරවරු නොවියත් ව සසුන් මඟ හා දහම් මඟ නොදන්නා අය බවට පත් වී ඇති අවස්ථා පහළ වෙමින් පවතී. තවත් පැත්තකින් උපජ්ඣාය සද්ධිවිහාරික හා ආචරිය අන්තේවාසික වත්පිළිවෙත් නොදත්කම නිසා දන ගත්ත ද ඒවා පිළිබඳ නොසලකාහැරීම නිසා හෝ ඒවා ප්‍රායෝගික ලෙස ක්‍රියාවට නොනැඟීම නිසා තමා පිළිබඳ ව ඇති කර ගත් අතිඅසමානාත්මතා ආකල්පයක් නිසා හෝ මන්මත් වීම නිසා හෝ වෙනත් කිසියම් මානසික ඌනතාවක් නිසා හෝ ආචාර්යවරයා බොහෝ සෙයින් ශිෂ්‍යයා වෙතින් දුරස්ථ ආකල්පයක සිටී. ඒ හේතුවෙන් ම ගුරු සන්තානයෙහි 'පුත්‍ර' ආකල්පය ජනිත කර නොගැනීම නිසා ශිෂ්‍ය සන්තානයෙහි 'පිතු' සංකල්පය තුළින් ජනිත තෙතමනය නැති වී යයි. එසේම :

සද්ධිවිහාරික අන්තේවාසික ආකල්පයන් යථාර්ථවත් පරිදි ක්‍රියාත්මක වීමට අවශ්‍ය පසුබිම යෙදීමට උපාධ්‍යාය හා ආචාර්ය ආයතනයන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ එම අභිධානයන්ගෙන් හැඳින්වුණු ආයතන

යන්ගේ නූතන ව්‍යවහාරය වූ ගුරුවරයා නූතන නීතිරීති විසින් තහවුරු කර ඇති විහාරාධිපති තනතුර ඔස්සේ ලබන ආර්ථික ස්වාධීනත්වය වැනි යම් යම් ලෞකික හේතු සාධක නිසා ඇතැම් විට ශ්‍රද්ධා දෙයා විනිපාතය කරමින් හා අප්‍රතිපත්ති, දුෂ්ප්‍රතිපත්ති කෙරෙහි යොමු වීමෙන් තම ශිෂ්‍යයන් වෙත සාවද්‍ය පූර්වාදර්ශයන් දීම හා එ නිසා ම ගුරුවරයාට ඇති විය යුතු ගෞරවාන්විත භාවය නැති වී යාම ;

කිසියම් දුර්විනීත, අප්‍රතිපත්ති හා දුෂ්ප්‍රතිපත්ති ආපන්න ශිෂ්‍යයෙකු පැවිදි බිමෙන් හෝ තමා වෙතින් ශාසනික හානියක් නොකෙරෙනු පිණිස වැනි සාධාර්මික හේතුවක් පිණිස ඉවත් කිරීමට පවත්නා නීතිරීති හා සමාජමය පිළිගැනීම් විසින් ඉඩ නොලැබීම හා එම මාර්ගයන් ඔස්සේ ම යමින් සසුන තුළ ම රැඳී සිටීමට හා ඒ දුර්මාර්ගයන්හි ම තව තවත් ඈතට ගමන් කිරීමට දොරටු විවෘත ව තිබීම ;

එසේ ම භික්ෂු ප්‍රතිරූපය කෙලෙසා එය මෙරටින් ඉවත් කිරීම සඳහා සහ තම ආත්මාර්ථකාමී අරමුණු සාධා ගැනීම පිණිස එවැනි භික්ෂූන් ඉවහල් කර ගැනීමට දේශීය හා විදේශීය ආක්‍රමණික බලවේගවලට ඉඩ ප්‍රස්ථා ලැබීම ;

එවැනි ආයතන හා පුද්ගලයන් බෞද්ධ විරෝධී හා ශාසන විරෝධී ක්‍රියාවන් සිදු කිරීම සඳහා චිවරය ඉවහල් කර ගන්නා අවස්ථාවල දී ඔවුන්ගේ පැවිද්ද හා චීවරධාරිත්වය පිළිබඳ ව සොයා බැලීමට හෝ ආචාර්ය උපාධ්‍යායයන් විමසා බැලීමට හෝ නීතිමය අතින් පියවර ගැනීමට පිළිවෙලක් නොතිබීම ;

එවැනි බලවේගයන්ට අසු වී ඇති පැවිද්දන් වෙතොත් ඔවුන්ගේ ආචාර්ය උපාධ්‍යායවරුන් වෙත යොමු කොට උන්වහන්සේලා මගින් නිස සමාදන් කරවීම් ආදිය මගින් ආයති සංවරයෙහි පිහිටුවීමට මහක් නොවීම මෙන් ම එවැනි කාර්යයන් සඳහා අවශ්‍ය නීතිරීති සම්පාදනයෙහි ලා මෙරට බටහිර ගැති කුරුස ගළග්‍රහණයට හසුවූ පාලකයන් 1815 සිට මේ දක්වා නිසි පියවර ගැනීමට නොපෙළඹ වීම නිසා ඒ ආක්‍රමණිකයන්ගේ අරමුණු ඉටු වෙමින් පැවතීම ;

එසේ ම ශාසන භාරධාරී සංඝ පීතෘන් වහන්සේලා සංඝ පරිනායකයන් වහන්සේලා තම සංස්ථාගත ආයතනයේ චිර පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන මේ උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචාර්ය අන්තේවාසික යන ශාසනික ගුරු–සිසු සබඳතාව වර්තමාන සමාජ සංවිධානයට අනුගත වන සේ සකස් කොට පාලකයන් ලවා ව්‍යවස්ථාගත කිරීමට අවශ්‍ය කිසිදු පියවරක්

නොගෙන ශාසනය ගැන නොතකා දේපල ගැන පමණක් සොයා බලමින් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරා ඩිරිඟුව පසුපස පමණක් හඹා යමින් තම ශාසන භාරධාරිත්වය නොතකා හැරීම ;

එමගින් සසුන් විල කෙළෙසීමට කවර පිවර ධාරියෙකුට වුව ද ඉඩකඩ සලස්වා ලීම ; කිසිදු ආකාරයක නිස සමාදන් වීම නිස මුක්ත වීම ආදි ශාසනික ගරු කාර්යයක් තුළින් ලබා ගත යුතු සංඝ සම්මතය නොලැබූ, අප්‍රතිපන්න, දුෂ්ප්‍රතිපන්න, අසංවර, අසංයත, ස්වේච්ඡාචාරි, ආත්මම්භරිත, ආත්මාර්ථසාධක, අසමාහිත, විබ්භන්ත චිත්ත, ප්‍රාකතින්ද්‍රියික, ඒළමූග, දුස්ප්‍රාඥ, ධනේෂි, බලේෂි, ප්‍රත්‍යගෙධි, ලාභ සිලෝකකාමී, සසුන් උණුසුම වත් නොලත්, ගුරු ඇසුරින් සුශික්ෂිත නො වූ අනාචාර අගෝචර සම්පන්න වූ, වරදෙහි බිය නොදක්නාසුලු වූ, ශ්‍රමණ ප්‍රතිඥත වූ, අශ්‍රමණයන් පවා මේ රට තුළ පමණක් නොව මුහුදෙන් එතෙරටත් පිනා ගොස් ඇතැම් විට ශාසන විලෝපී ක්‍රියාවන් පවා කොට, යෙං, මාර්ක්, ඩොලර්, පවුම් පොදි බැඳ මෙරටට විත් චිර රාත්‍රඥ, මහා ප්‍රාඥ, කුශාග්‍ර බුද්ධිමත්, යතිපතීන් වහන්සේලා පසෙක සිටිය දී කොසොල් රජුගේ සිහිනයන් සැබෑ කරමින් මහ තැන්වලින් සංඝනායක, අනුනායක, මෙරට පදවි පමණක් නො ව දේශදේශාන්තරවලටත් සංඝනායකකම් ලබා ගනිමින් සසුන කෙළෙසීමේ බමුණු කුළයක් බිහි කොට වැජඹෙමින් සසුන් තෙක පුරන් කිරීමට ඉඩකඩ සලසා ලීම ;

පක්ෂ දේශපාලනය වැනි කාලීන නොසරුප් ව්‍යාපාරයන්ට බැස ස්වේච්ඡාචාරී ව නොයෙකුත් ආක්‍රමණික සංවිධානයන්හි බැලයන් බවට පත් වී ඔවුන්ගේ ශාසන විරෝධී, ජාති විරෝධී, දේශ විරෝධී, භික්ෂු නියෝජිතත්වය සම්පාදනය කරමින් මෙරට මහා සංඝයාගේ අදහස ලෙසින් ඔවුන්ගේ ඒකපාක්ෂික මාධ්‍යයන් ඔස්සේ ජාතිමාමක, ශාසනමාමක, දේශ මාමක, සුපේශල ශික්ෂාකාමී මහා සංඝයාගේත් පොදු මහා බෞද්ධ ජනතාව ගේත් සිත් සතන් ධර්ම සංවේගයටත් කම්පනයටත් පත් කරවන ආකාරයේ වගකීම් රහිත ප්‍රකාශන නිවේදන නිකුත් කිරීමට හා අසද්ධාර්මික හා අසත්පථගාමී පියවරවල් ගැනීමට හැකියාව ඇති වල්බූරු නිදහස ප්‍රයෝජන යට ගැනීමට අවස්ථාවන් සලසා දීම වැනි ආදීනව සමූහයක් සඳහා අද මෙරට සහ සසුනට මුහුණ දීමට සිදු වී ඇත්තේ ශාසනානුලෝමික වූ මේ උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචරිය–අන්තේවාසික සබඳතාව මත පදනම් වූ ගුරු–සිසු සබඳතාව දුරස්ථ වීමේ ප්‍රතිවිපාකයක් ලෙස මිස අන් කරුණක් නිසා නොවන බව එහි ඉතිහාසය විමසා බලන විට පැහැදිලි වේ.

මේ සඳහා පතින පිළවුනට ඉණිමං බඳින්නාක් මෙන් ගුරු ඇසුරෙන් වෙන් වූ ස්වේච්ඡාචාරී නවක මධ්‍යම භික්ෂු සාමණේරවරුන්ට තම උපාධ්‍යාය ආචාර්යවරයන්ගෙන් වෙන් වී ස්වාධීන වීමට අතහිත දෙමින්

තම ආක්‍රමණකාරී ශාසන විරෝධී ක්‍රියාදාමය සඳහා ඒ අය ඉත්තන් කර ගැනීමට සැදී පැහැදී ඇති දෙස්විදෙස් ආයතන හා පුද්ගලයන්ගෙන් මේ දේශය එදත් අදත් නොසිස් හෙයින් මේ ශාසනික සබඳතාව කැඩී යාම ඔවුනට ද කම්පනයක් සසල බවක් ජනිත කිරීමට හේතු සාධක ද නො වේ.

මේ ශාසනික ආයතනයන් සතු වගකීම හා එහි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳ නිසි දැනුමක්, අවබෝධයක්, පරිචයක්, ප්‍රගුණතාවක් නැති ආචාර්යවරුන් නිසා ද තමා සතු කාර්යභාරයේ වගකීමක් නොදත්කම නිසා ම සසුන් බඹසරින් ඉවත් වන, ගුරු–සිසු සබඳතාව පිළිබඳ සාවද්‍ය අත්දැකීම් නිසා ද කළකිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් සසුන් මඟ අතැර යන අගනා ශාසනික දයාද වූ භික්ෂු සාමණේරවරු ද නැත්තේ නො වේ.

අද ශාසනික ක්ෂේත්‍රයෙහි නාමමාත්‍ර ලෙසින් ඇති උපාධ්‍යාය තනතුර හා බැඳී පවත්නා වගකීමක් හෝ ශාසනික මෙහෙවරක් හෝ නැති අතර ඒ සියල්ල බොහෝ විට තම දේපල උරුමය සඳහා අනුප්‍රාප්තිකයෙකු සූදානම් කර තැබීමේ කාර්යභාරයට පමණක් සීමා වන ආචාර්ය හෙවත් ගුරු නමින් හඳුන්වනු ලබන භික්ෂූන් වහන්සේ කෙරෙහි පමණක් කේන්ද්‍ර ගත වී ඇත. ඇතැම් විට එම ආචාර්ය අන්තේවාසිකයෝ බෞද්ධ ධර්මවිනයානුගත ගුරු ශිෂ්‍ය ආචාර ධර්ම නොහඳුනති, පිතෘ–පුත්‍ර සංකල්පයෙහි ගුරු අරුත් නොදනිති. එහෙයින් ම මේ බ්‍රහ්මචර්ය ශාසනය තුළ වෘද්ධියට, විරූළ්හියට, වෙපුල්ලත්වයට පත් නොවෙති.

එහෙයින් අද අප විසින් කළ යුතු ප්‍රධානතම ශාසනික කාර්යභාරය වී ඇත්තේ බුදුරජුන් විසින් සංඝ සමාජයේ සංරක්ෂණයත්, පාරිශුද්ධියත්, චිරස්ථායි බවත් සඳහා පනවා වදාළ මෙම උපාධ්‍යාය–සද්ධිවිහාරික හා ආචාර්ය–අන්තේවාසික සංස්ථාවන් හෙවත් ආයතනයන් යාවත්කාලීන ලෙස අර්ථවත් ව පුනරුත්ථාපනයට පත් කොට පශ්චිම ජනතාව සඳහා බුදුරජුන් දර්ශිත පරමාදර්ශී සංඝ සමාජ සංකල්පය ප්‍රායෝගික සජීවී ආයතනයක් ලෙස සංස්ථාපිත කිරීම යි.

**ආශ්‍රිත ග්‍රන්ථ:**


1. දීඝනිකාය
2. මජ්ඣිම නිකාය
3. මහාවග්ගපාලි
4. චුල්ලවග්ගපාලි
5. සමන්තපාසාදිකා

6. ලක්දිව බුදු සමයෙහි ඉතිහාසය — වල්පොල රාහුල හිමි
7. සහිබණ සමන්නෝසනා — යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම හිමි
8. විහාර නීති විත්තිය — ප්‍රින්ස් ගුණසේකර
9. සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය – ඒ. වි. සුරවීර
10. සිංහල විශ්වකෝෂය
11. Monastic Buddhism – N. Dutt
12. Democracy in Early Buddhist Sangha – De Gokuldas
13. Fundamentals of Buddhist Ethics – Gunapala Dharmasiri
14. The Cultural Heritage of India – N. Dutt
15. Buddhist Ethics – H. Saddhatissa

---

බෞද්ධ හෝ වේවා අබෞද්ධ හෝ වේවා ලෝකයේ සියළු ආගම් ක්‍රම මා විසින් පරීක්ෂා කොට බලන ලදී. ඒ කිසි එකක් බුදුරජාණන් වහන්සේගේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගය අලංකාරත්වයෙන් හා අවබෝධයෙන් පසුබැස්ස විය හැකි කිසිවක් මට හමු නොවී ය. එකී මාර්ගයට අනුව මගේ ජීවිතය හැඩගස්වා ගැනීමට මම කැමැත්තෙමි.

—ආචාර්‍ය රිස් ඩේවිඩ්ස්

කුංෆු

අයැදුම : සිවලි වික්‍රමාරච්චි මාස්ටර්
අදහස හා පබැඳුම : කැම්පනේ ගුණරතන හිමි

**කුංෆු** කිමෙක්ද, ඒ
ඇත්තෙන්ම අළුත් සංකල්පනාවක්ද නැත.
ක්‍රියාකාරකමක්ද ඒත් නැත.
කුමක්ද එසේ නම් කුංෆු ?
වචනවලට හැරවිය නොහැකි ක්‍රියාකාරකමක්.
ජීවමාන එක්තැන් කිරීමක්.
කයට සිත – සිතට කය.
සිතන්න මොහොතක් බුදු සිරුර ගැන
විස්මිත නිර්මානයක්.
කරුණා ප්‍රඥාවේ මූර්තිය.
විශ්වඥාණයේ එකමුතුව
කායබල හා ඥාණබල දහය බැගින්වූ ශක්තියකින් ඉක්මවූ මිනිස් ස්වභාවයේ අග්‍රගන්‍ය ඵලය.
සංඛාරාධානයේ මතුවූ සුපුෂ්පිතය.
පාරමී ගුවනෙහි පැයූ හිරු
පවසන්නේ කුමක්දැයි ඔබ නැවතත් සිතනු ඇත.
එහෙත් එපමණින් ඉක්මන් නොවිය යුතුය ගත් අවධානය
නැවත නැවතත් සියුම් ලෙස තියුණු ලෙස ගැඹුරින් සූක්ෂ්ම සේ
පෘථිවිය දෙසට, සිරුර දෙසට, මනස දෙසට
එක්තැන් කළ යුතුය සියල්ල
ගොනු කළ යුතුය තනි සිරුරක් තුළට
විසිරී ගිය ශක්තිය.
අවධානයට නොගත් ශක්තිය.
නොදක්නා දැක්මක් නොඇසුන හඬක්

නොලැබූ ස්පර්ශයක්, නොවිඳි රසක් ආඝ්‍රානයක්.
නැතිවිය නොහැකිය එවන් දේ විශ්වය තුළ
කලාකරුවෙක් බුදු සිරුරෙහි දිටි මුද්‍රා
ප්‍රකාශ කළේ මුද්‍රාවෙන් බුදු සිරුර හැසිරවූ ඉරියව්
සුවිශේෂ අවස්ථා කායික ක්‍රියාවලියේ.
එහෙත් කායික ක්‍රියාවලියකට නොහැකිය එවන් වජ්‍රමයවූ මුද්‍රාවන්ගොනු කිරීමට
සැබවින්ම ඥාණය බුද්ධිය විසින් පහළ කළ මුද්‍රාවක් එය
මතුවේ ගැටළුවක් තමන්ටම
ගෞතම බුදුරදුන් කුංජු නමැති වචනයේ අර්ථය ක්‍රියාත්මක කළේද
පිළිතුර, ඔව් හෝ නැත කිව නොහැක්කේය.
ප්‍රයෝගිකත්වයේ අරමුණු විවිධාකාර වන බැවිනි.
කී දේ පැහැදිලි විය යුතුය, දූන්.
එක් ජීවිතයකදී පුහුණු කළ හැකි දේ සීමා සහිත විය හැකිය.
එහෙත් හුරු කරන ලද සංසාර පුරුදු නොතක්න්නේද පුදුමයි මිනිසෙක් විශ්මිත
නිර්මානය කළ ඒ විස්මිත ඵලය කුමන හේතුකාරක පාදක කර ගත්තේද
මේ අධිමානසික ශක්තියකින්ම අවබෝධ කටයුතු තැනකි.
ධර්මමය පිළිතුරක් අපේක්ෂිත ප්‍රශ්නයකි.
අපි මොංගහාතකට දසපරාමී යැයි කියමු.
දස පාරමී ශක්තිය එක් කළ නොහැකිද සිරුරක් තුළට
පිළිතුර අපහසුය කල්ගතවේ. යන්න විය හැකිය. ඒ සියලු දහම් වේගවත්ව රැඳවිය හැකිනම් කායික හා මානසික ක්‍රියාවලිය තුළ
මිනිසෙකු බිහි නොකරන්නේද විශ්මිත,
දහම් පරමාර්ථ සත්‍ය ගම්‍ය වන පරිදි නොවේ.
කෙසේ වුවත් ඔබට සිතුවිලි පහළ විය.
ඒ සිතුවිලි මතුවීම සුළඟේ පාවී ගියාසේයි.
සිතුවිල්ලක් යනු සාමාන්‍ය දෙයක්.
ක්‍රියාකාරකම්ද එසේයි.
සියලු ආකාරවල සිතුවිලි හා වයසීා එක් න්‍යෂ්ටියකට ගතහොත් ලැබෙන පිළිතුර කුමක් විය හැකිද ?
එය සමථයක් නැත්හොත් සමාධිගත තත්ත්වයක් නොවිය හැකිද
ඒ කුංජු සමීපවීමකි.
බුදුදහමේ වාර්තාවී තිබුනා ප්‍රශ්නයක් නන්ද කුමරුට
කෙසේද මා ජනපද කල්‍යාණිය සමග එක්වන්නේ.
තවත් ප්‍රශ්නයක්, බුදුරදුන්ගේ පැත්තෙන්

කෙසේද නන්ද කුමරුන් තුළ පරමාර්ථ සත්‍ය අවබෝධය පිණිස මෙහෙය වනුයේ.

දුටුවා, නන්ද කුමරු වැදිරියක්
සිහි කළා, වැදිරියගේ ඡායාව
දුටුවා දෙවඟනක්.
තුලනය වූවා ඒ සිත තුළ ජීවි ලෝකයේ පරස්පර විරෝධතා
ප්‍රතිඵලය වෙනස් කළා සිතුවිලි.
යථාර්ථය සාක්ෂාත්කරණය කරා
රාගය විරාගයට.
අසීමිත චින්තන ග්‍රාහිත්වයේ දුබලබව දුටුවා නන්ද කුමරු
සම්මත සීමාවන් ඉක්ම පවත්නා යථාර්ථය කරා මෙහෙයුවා සිත
එහෙත් ගවේශකයෙකු පර්යේෂකයෙකු අනුශාසකයෙකු ඝීවාද රසනීරස බව, නැත.

එසේ නම් නන්ද කුමරුගේ චයඝීා පද්ධතිය තුළ සැඟවුනා යථාර්ථය කුමක්ද? එක්තැන් කළ විසිරී ගිය සිතුවිලි ධාරාව
අප එය ගවේශනය කරමු.
පිළිතුර ලබා ගත් පසු වැටහේවි යම් අදහසක්.
බලමු එය කුංජු විය හැකිද කියා.
මනස හැදීම නැතහොත් රැඳවීම සිත විකෘත කිරීම ආරාමික භික්ෂු ජීවිතයේ ප්‍රායෝගික පුහුණු කිරීම් අංගයක්.
දුෂ්කර වතාවතක්.
නිවැරදි මාර්ගෝපදේශකත්වය සහ පූර්වකායික පෙළගැස්මට අනුරූපවන තුරු විසිරී ගිය සිතුවිලි එක් අරමුණකටත් එම අරමුණෙහි සිට සියුම් ලෙස විසුරුවා හැරිය හැකි තියුණු ඉන්ද්‍රීය දක්මක් ගොඩ නඟා ගන්නා තුරු
ආරාමික භික්ෂු චයඝීාධර්ම පද්ධතියේ කේන්ද්‍රියගත වූ එක් අරමුණක් සාක්ෂාත් කර ගැනීම පිණිස මෙහෙයවූ ක්‍රියාකාරකම් සමූහය කිසි ලෙසකින් හෝ අත්හැර දැමීමක් අමතක වීමක් උදාසීන බවක් සමග නොගැටී සිටීමට පොහොසත් විය යුතු දැඩි අවධානයක්.
මේ භික්ෂුත්වය පුරා දිවෙන චරණයයි.
එහෙත් ථෙරවාදී සමය තුළ ඒ කුංජු නොවේ.
වචනාර්ථ විග්‍රහ සහ බාහිරවූ දැනුම සමග සසඳනවිට ආත්මාරක්ෂක සටන්ක්‍රම යනු වදන් පෙළකි.
එහෙත් භික්ෂුව සහ සටන්ක්‍රම කිසි ලෙසකින්වත් අන්‍යොන්‍ය වශයෙන් පාරිභාෂිතයට නොයෙදේ.
මෙහි සටන්ක්‍රම යනු සංකල්ප මාත්‍රයකි.
සියලු සතුන් වෙත පවත්නා නිසර්ග අනුවර්තන හැකියාව ගැන සිතමු, මොහොතක්.

පරිසරයේ වර්ණයට ස්වභාවයට අරමුණට
අනුවර්තනය වීමෙ හැකියාව ඒ හැම සත්වග තුළ පවතී. මෙ යකස් වන පරිසරයේ සමතුලිතතාව කුංඃපු විය නොහැකිද මිනිසාට.
ස්වභාවිකත්වයෙන් මිදී ඉන්ද්‍රිය පද්ධතිය පෝෂණය කිරීම හුරතල් කිරීම, සැතප වීම ආදී ප්‍රමාණාත්මක කාර්‍ය භාරයක් තුළ සැබවින්ම කුංඃපු නැත.
භික්ෂු ජීවිතය හරහා දිවෙන පරමාර්ථ සාක්ෂාත්කරණයේ මෙහෙයුමකුංඃපු නොවන්නේ නොවේ.
කායිකත්වය ඉක්මවූ මානසික නැඹුරුවක් නොවන්නේද, එය
ආත්මාරක්ෂාව යනු මතුවන සම්බාධකවලින් නිදහස් වීමේ උපායමාර්ග යන නිර්වචනය දෙන වචනයකි.
සත්ව ලෝකයම සහජ පරිසරමය ආරක්ෂාවන්ගෙන් සහ උපක්‍රමවලින් ලබා ගන්නට වෙර වඩන නිදහස් අයිතිය සඳහා නොයෙදෙන්නේද?
ආරක්ෂාව යනු පූර්ණ ජීවිතයක් පුරා විහිදී ඇති ක්‍රියාකාරකම් ගොනුවූ න්‍යෂ්ටියයි. එහෙත්,
කිසියම් භාණ්ඩයක ක්‍රියාකාරිත්වය හැසිරීමේ හුරුව පුහුණුව මත ප්‍රතිඵල තීරණය කෙරේ
පිහිය තියුණුය ; මුවහත්ය.
එයින් කළ හැකි දේ බොහෝය.
පාන් කැපීමට පිහියට හැකිය.
නොහැකිද සතෙකුගේ ගෙල සිඳීමට එයට.
ගෙල සිඳීම එකකි
පාන් කැපීම අනෙකකි.
දෙකම සිදු කළේ එකම පිහියයි
පිහියේ කාර්යය ඉටු කළේය. ඒත් හුදෙකලාව නොවේ.
හසුරුවන්නා අත ක්‍රියාකාරිත්වය වී ය.
අන්‍යොන්‍ය වශයෙන් ගැලපුමේ න්‍යායයෙන් මිදුන කල්හි ප්‍රතිඵල විනාශ කාරී විය.
ඒත් ඒ අරමුණින් බැහැරවූ දුෂ්කෘතයකි.
සමාධි නම් වූ චෛතසික බැම්ම විසිරී යාමේ දර්ශනයකි.
කාන්තාව මුළුමහත් ප්‍රජාවගෙන්ම හරිඅඩකටත් වැඩිය,
බහුල ආවේගයන්ගෙන් පිරි ලොවක.
ආධිපත්‍යය සඳහාත් ප්‍රකෝප කරවන මානසික උත්තේජනයන්ගෙන් පිරි ලොවක අමරමං විය නොහැකිද යට කී නිරුදක කාන්තාරයේ ඇය.
අත්‍යන්තයෙන්ම දුරු කරවිය යුතුය කය හා මනස රිද්මයකට
අභියෝග හමුවේ නොසැලී සිටීමට

සංකීර්ණ ගැටළු පද්ධතියේ ජයග්‍රහනය පතා
ස්වීයත්වය හා අනම්‍ය ඍජු පැවැත්ම සඳහා
වත්මන් ලොව තුළ සැනසිල්ලක් මුඛ්‍ය ජීවිතයේ තෘප්තියකරා කාන්තාවට කුංෆු කියා නොදෙන්නේ නොවේ.
ඇය ජීවිතය තුළ යථාර්ථය දකිනු ඇත, කුංෆු තුළින්.
ලොව කිසිදු තැනක බිහිසුණු පැවතුම් කිසිවක් සිදු විය යුතු නොවේ.
මුවහත් දැලිපිහිය සූක්ෂමවූ ක්‍රියා සඳහාම යෙදිය යුත්තේද දැඩිශික්ෂණයකින් මය.
එහෙත් වරදවා ගත් විට අන්තරායද එතැනමය.
විෂ සහිත ඝෝර සර්පයෙකු අල්වා ගත යුත්තෙකු නිවැරදිලෙස උපාය සහ දැනුම එක්තැන්වූ පිළිවෙතක් අනුව යා යුත්තේය.
නැතහොත් පෙරළා විපත කැඳවන අයුරු තථාගත බුද්ධ භාෂිතයේ එන සුලභ උපමාවකි.
එහෙයින් මැනවින් ප්‍රගුණ කරනලද නිෂ්ඨාවකට නොපත් හා ආරූඪ කරගත් ආකල්ප නමැති දුර්වල කුංෆු උපදේශය මගින් මෙහෙයවූ අභ්‍යාස ඇතියේ දුග්ගහීත වූයේම අනර්ථ පිණිස අවැඩ පිණිස දුක් පිණිස නොපවත්නේද ?
සැබවින්ම ඒ කුංෆු නොවේ.
ප්‍රාණ නමින් ගැනෙන ජීවිතයේ ක්‍රියාකාරිත්වය උපරිමලෙස ප්‍රයෝජනයට ගත හැකි පරිදි වර්ධනය කිරීම සකසා ගැනීම මුවහත් කිරීම උදාසීනත්ව යෙන් තොර ක්‍රියාශීලී බව සියලු කාර්යයන්ගේ උපරිම ඵලය කරා ළඟා වීමේ ප්‍රවේශය නොවන්නේද?
ඉගෙනීම, ක්‍රීඩාව, අභියෝග ජයග්‍රහනයට සාර්ථකව මුහුණදීමේ ප්‍රවනතාවන් සමග කුංෆු දිවියේ අරුත ඔබ තෘප්තිමත් කරවයි.
කායික හා මානසික පවිත්‍රත්වය කරා හසුරුවා ගත් මිනිස් සිරුර නොවන්නේ දායාද මහඟු දයාදය.
බවුන් වැඩීමේදී සමථයට පත් කය මනසින් ජාතවූ වජ්‍රමය හුරුව ආරාමික භික්ෂු ජීවිතය තුළින් නිපන් යථාර්ථ සාක්ෂාත්කරණයේ මහයි.
පැහැදිලියි ගමන් මඟ
ඒත් කුමක්ද සුවිශේෂත්වය
වඩාත් වේගවත් බව
ඉක්මන් බව
කායික චෛතසික ඉක්මන් සමාධියක් සඳහා ළඟා වීමට කෙටි මඟ කුංෆු
භික්ෂු ජීවිතය සත්‍ය කරා ළඟා කළ කාර්යක්ෂම ප්‍රායෝගිකත්වය.
හිස් මුදුනේ සිට දෙපතුල දක්වා වේගවත් මිනිසෙකු නිපදවයි.
අළුත්.
ඉගෙනීම ක්‍රීඩාව පමුණුවයි ඔහු අන්තයට ජයග්‍රහනයේ

ක්ෂණිකවූ තීරණ,
ක්ෂණිකවූ ප්‍රතිඵල, කුංෆු.
සත්‍යය පසුපස පමණි සිටියේ
සාධාරණත්වය කොතැනද එහිය නිවැරදි චින්තනය
අපරාධ පසුපස සැබවින්ම කුංෆු නැත.
නොඉක්මවූ ලෞකිකත්වය සමග එය සෘජු ගමන් මහකය.
ගුරුවරයා කුංෆු සැබවින්ම ධර්මයේ ප්‍රතිමූර්තියයි.
නොවදී ඔහු රංගන ශාලිකාවකට.
රඟන්නට වෙස්වලා
ප්‍රකෘතියේ වේගවත් හික්මීම
හදයි එවන් ලෝකයක්
අයුක්තියට අසාධාරණයට පාපයට අවනත නොවූ
අපරාධයෙන් දූෂිතවූ ජලය මුසු නොවේ ඒ මනසට
නෙලුම් පත ජලබිඳු පිළිනොගන්නා සේ.
වේගවත් විය තෝරා ගැනීම සත්‍යය
අසත්‍යය නොපැටලේ නිස්සාර වන හෙයින්
දියෙන් කිරි පමණක් තෝරන හසකු සේ
එතැනයි කුංෆු
කසල ගොඩින්ම නැගි පියුම සේ.
එනිසයි බිහි කළේ භික්ෂු යතිවරයන් දිගු ප්‍රායෝගික පුහුණුවකින්.
අද්දැකීමකින් සංවරයකින්
කායික මානසික පවිත්‍රත්වය සඳහාම ශුද්ධවූ භූමියක් තුළින්
ජනිත කළේ පුහුණු වූයේ සංවර්ධනයේ අග්‍ර ඵලය පිණිසමය.
වේගවත්වූ අභ්‍යාසය ජනිත වන්නට පසුබිම ශාරීරික හිංසාවද
සිදුවීම අරුමයක් නොව භීෂණයෙන් පිරුණු ලොවක
එහෙත් උපත මුළු ලොවටම සදයි සෙත
පිවිසීම අනර්ථකර නොවේ.
ලබන්නට උපතක්
රිද්මයකට, වේගවත්, සමාධිගත කායඍක්ෂම
බොදුමහෙහි ලෞකිකත්වය හරහා
අයැදුම කුංෆු.

---

දෙවියන් අහස පොළොව මවන ලද බව කීවිට දෙවියන් වහන්සේ මවන ලද්දේ කවරෙකු විසින් ද යන ප්‍රශ්නය මතුවී අවුල් ජාලයක් බවට පත්වේ.

—ජෝන් වෝල්ටර්

# විහාරස්ථාන කළමනාකරණය

ශාස්ත්‍රපති, පණ්ඩිත
**කෑලිගම විජිතනන්ද ස්ථවිර**

**අප** තථාගතයන් වහන්සේ ධරමාන සමයෙහි, ආරාමික වශයෙන් උසස් කළමනාකාරිත්වයක් පැවති බව පෙනේ. බුදුසමය ලැබීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ ආරාමික කළමනාකරණය වඩාත් විධිමත් වූ බව මිහින්තලේ පුවරු ලිපිය වැනි සාධක අනුව සිතාගත හැකි ය. අතීතයේ එක ආරාමයක භික්ෂූන් වහන්සේ දහ දෙළොස් නමකට වුව ද ගැටුමකින් තොරව විසීමට හැකි වීම වූකලී කළමනාකාරිත්වයේ මහිමය කියාපාන නිදසුන් අතර වෙයි. භික්ෂූන් වහන්සේගේ වයඹ රටාවේ උසස් ගුණාංග වූයේ චාම් සරල පැවැත්ම, සමානාත්මතාව, අල්පේච්ඡතාව, ඉන්ද්‍රිය සංවරය, කුශාග්‍රබුද්ධිය, චිරරාත්‍රඥතාව, වියත්බව, එඩිතරබව, හා විධිමත් සංවිධානය යි. ශ්‍රද්ධා – ප්‍රඥ යන ගුණාංග පදනම් කොටගත් භික්ෂූන් වහන්සේ මෙකී සාරධර්ම, ශාසනානුලෝමිකව ප්‍රගුණ කළ අතර උන්වහන්සේ හා ඇසුරට පත් ගිහි උපාසකවරුන් නිසා, ගිහි සමාජයේ ද සාරධර්ම බවට ඒ ගුණාංග පත් විය.

ධර්මයේ ආභාසය නිසා ගිහි සමාජය සාරධර්මවලින් කොතරම් පෝෂණය වූයේ දැයි කියතොත් බෞද්ධ සමාජයේ බොහෝ වැඩිහිටියෝ විනයානුකූල ව තම දරුවන් හික්මවීමට පවා දැන සිටියහ. ගුණ – නැණ දෙකින් මෙන් ම ආර්ථික වශයෙන් ද පෝෂිත දේශයක් වශයෙන් ශ්‍රී ලංකාව කීර්තිමත් වූයේ මේ පසුබිම නිසා ය.

ආක්‍රමණිකයන් වශයෙන් මෙන් ම සංක්‍රමණිකයන් වශයෙන් ද මෙරටට පැමිණි විදේශිකයන්ගේ හඩු ගති දේශපාලන ආධිපත්‍යය සමග පැතිරී යාමත් ශාසන අනුග්‍රාහකයන් ක්‍රමයෙන් නැති වී යාමත් නිසා වර්තමානය වන විට භික්ෂූන් වහන්සේට ශාසනික ප්‍රතිපදාව ක්‍රියාත්මක ජීවිතය හා සම්බන්ධ කර ගැනීමට දුෂ්කරතා පැන නැඟී තිබේ. ගුණාත්මක

වශයෙනුත්, සංඛ්‍යාත්මක වශයෙනුත් භික්ෂු සමාජයේ පරිහානිය, ගිහි සමාජයේ පරිහානිය වේගවත් වීමට තුඩු දී ඇති බව තේරුම් ගැනීමට අපහසු නැතැයි සිතමි. අද වන විට ආර්ථික, සාමාජික හා සදචාරාත්මක වශයෙන් අප රට වැටී ඇති තත්ත්වය අතිශයින් සංවේගජනක ය. මේ පරිහානි තත්ත්වය ආරම්භ වූයේ අද ඊයේ නොවේ. මෙවන් පරිහානිය පෙරනිමිති දුටු අනගාරික ධර්මපාල තුමා, පියදාස සිරිසේන මහතා වැනි ශාසන මාමක ජාති හිතෛෂීන් සත් මාර්ගයට රට යොමු කිරීම සඳහා මහත් වූ වෑයමක් දරන ලද නමුත් ඒ ක්‍රියාමාර්ගවලින් කලක් පවතින අන්දමේ ඉෂ්ටඵල ජාතියට හිමි කර දීමට නොහැකි වූයේ, සමාජ දූෂිතයන්ගේ උපායමාර්ග තේරුම් ගෙන ඒවා මැඩලීමට තරම්, ශක්තියක් අපට නොලැබුණේ අපගේ ම විවිධ දුර්වලතා නිසා බව අකමැත්තෙන් වුව ද පිළිගත යුතුව ඇත. මේ නිසා අප නොමඟට ඇද හෙලූ දේශීය හා විදේශීය බලවේගවලට දෙස් නඟන් අතර ම, අපේ දුර්වලතා තේරුම් ගෙන ඒ දුර්වලතා මඟහරවා ගැනීමේ අවබෝධය හා අධිෂ්ඨානය ද අප තුළ ඇති කර ගත යුතු ය. පරසිරිතින් හා පරගැති බවින් වැසී ගොස් ඇති, අපගේ සක් මාර්ගය හෙළිපෙහෙළි කොට, අනාගත පරපුර ඒ මඟට යොමු කිරීම වර්තමාන ශාසනභාරධාරී මහාසංඝයා වහන්සේගේ පුළුල් වගකීමක් බව අවධාරණය විය යුතු ය. මේ සඳහා අනුශාසනාව මෙන් ම ආදර්ශය ද අත්‍යවශ්‍ය ය. විහාරාධිපතීන් වහන්සේ ආදර්ශවත් නියමුවා බවට ද, විහාරස්ථානය ආදර්ශවත් කේන්ද්‍රස්ථානය බවට ද, පත් වන්නේ නම් අප වැටී ඇති සංවේගජනක පරිහානි තත්ත්වයෙන් ගොඩ ඒමට බලවත් රුකුලක් වනු නොඅනුමාන යි. විහාරස්ථාන කළමනාකරණයක අවශ්‍යතාව ඇති වන්නේ මේ ක්‍රියා මාර්ගය සඳහා ය.

විහාරස්ථාන කළමනාකරණය අතින් ඉතා විශිෂ්ට ගණයේ විහාරාධිපතීන් වහන්සේ අප අතර සිටිති. එහෙත් සීමිත විහාරස්ථාන සංඛ්‍යාවකට පමණක් බලපා ඇති ඒ ක්‍රියාවලිය හැම විහාරස්ථානයක් නැතහොත් විහාරස්ථාන ඉතා වැඩි සංඛ්‍යාවක් වෙත ගෙන යාම අපගේ උත්සාහය යි. විහාරස්ථාන කළමනාකරණය සම්බන්ධයෙන් මෙබඳු ලුහුඬු සටහනක් ඉදිරිපත් කිරීමට අදහස් කළේ ඒ හේතුවෙන් බව ඉතා නිහතමානිවත්, ශාසනමාමකවත් මෙහි ලා සිහිපත් කරමි.

### විහාරාධිපති තනතුර හා විහාරාධිපති භූමිකාව

භික්ෂූන් වහන්සේ විහාරාධිපති තනතුරට පත් වීමේ විවිධ සම්ප්‍රදාය අප අතර පවතී. කවර සම්ප්‍රදායයක් අනුව පත් වුවද, හුදු තනතුරට වඩා මෙහි දී වැදගත් වන්නේ විහාරාධිපති භූමිකාව යි. ඉතා සැකෙවින්

කියතොත් භූමිකාව යනුවෙන් අදහස් කරන්නේ හුදෙක් තනතුරු දැරීම පමණක් නොව, ඒ තනතුරේ සජීවී ක්‍රියාකාරීත්වය යි. තනතුරක් හෝ පදවියක් වශයෙන් ගත් විට විහාරාධිපතිකම එකක් වුව ද, භූමිකා රැසක් ඊට අන්තර්ගත විය හැකි ය. විටෙක ආයතනයේ ප්‍රධාන විධායකයා වශයෙන් ද, දහම් පාසලේ හෝ නම ශිෂ්‍යයින්ගේ හෝ පාසලක ගුරුවරයා වශයෙන් ද, ආයතනය සතු චංචල නිශ්චල දේපල පාලකයා වශයෙන් ද, දායක දායිකාවන්ගේ අනුශාසකයා වශයෙන් ද, විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු, උත්සව සංවිධානය ආදී කටයුතු සම්බන්ධ ප්‍රධාන උපදේශකයා හෝ සංවිධායකයා වශයෙන් ද, ක්‍රියා කිරීමට විහාරාධිපතීන් වහන්සේ නමකට සිදු වේ. මෙසේ විහාරාධිපති තනතුර හා බැඳුණු භූමිකාවල ක්‍රියාකාරීත්වයෙන් අරමුණු ඉටු කර ගැනීමට නම්, මනා කළමනාකරණයක් තිබීම අවශ්‍ය ය.

අප ''විහාරාධිපති'' යන තනතුර දැරුව ද, නිසැකයෙන් ම විහාරස්ථානයේ ප්‍රමුඛතාව හිමි විය යුත්තේ තථාගතයන් වහන්සේට ය. ධර්මය පවතින තාක් තමන් වහන්සේ වැඩ ඉන්නා සේ සැලකෙන බව ද, ධර්මය දැකීමෙන් තමන් වහන්සේ දැකිය හැකි බව ද, තථාගතයන් වහන්සේ විසින් වදරා තිබේ. තමන් වහන්සේගේ ඇවෑමෙන් නායකත්වය ලැබිය යුත්තෙකු නම් නොකිරීමට හේතුව ද මේ අදහස විය හැකි ය.

තමන්ගේ පරිභෝජනය සඳහා යොදගත හැකි ස්වල්ප දෙයක් හැර කිසිදු විහාරාධිපතින්වහන්සේ නමක් සතු පෞද්ගලික දේපලක් තිබිය නොහැකි ය. විහාරස්ථානයත් ඒ සතු චංචල නිශ්චල දේපලත් අයත් වන්නේ සංඝ සංස්ථාවට ය. සෑම දේපලකම ප්‍රධාන හිමිකරු තථාගතයන් වහන්සේ වුවත්, උන්වහන්සේගේ අනුශාසනාව හා කැමැත්ත අනුව ඒවා සංඝ සංස්ථාවේ අයිතියට පැවරී ඇත. මේ කරුණ පිළිබඳව මනා අවබෝධයකින් ක්‍රියා නොකළහොත්, සාවද්‍ය පරිහරණයේ වගකීම තමන් වෙත පැවරෙනු නොවැලැක්විය හැකි ය. පොදු දේපලක් සාවද්‍ය ලෙස පරිහරණය කිරීම විනය විරෝධී ක්‍රියාවක් වන්නා සේ ම නීති විරෝධී ක්‍රියාවක් ද විය හැකි ය. එබැවින් පරිභෝජනය, පරිත්‍යාගය හා ආයෝජනය යනාදී කවර පියවරක් සම්බන්ධයෙන් වුව ද විහාර සන්තක දේපල පරිහරණයේ දී මනා ශික්ෂණයක් ඇති කර ගැනීම විහාරාධිපති තනතුරේ විශිෂ්ට ලක්ෂණයක් සේ සැලකිය හැකි ය.

විහාරස්ථානය සම්බන්ධ කෙටිකාලීන වුත්, දීර්ඝකාලීන වුත් කටයුතු ඇරඹිය යුත්තේ ශාසනික වැදගත්කමක් දරණ අරමුණු ඇති ව ය. අරමුණට අනුව සැලැස්ම ද, ඒ සැලැස්මට අනුව අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියා

පිළිවෙලක් ද තිබිය යුතු ය. මෙහි කළමනාකරණය වශයෙන් හැඳින් වෙන්නේ ඒ ක්‍රියා පිළිවෙල යි. විහාරාධිපති භූමිකාවට අදාළ ව කළමනා කරණය අංග ෂට්පයකට වර්ග කර දැක්විය හැකි ය.

1. ගැටුම් කළමනාකරණය
2. අධ්‍යාපන කළමනාකරණය
3. සම්පත් කළමනාකරණය
4. කාලය කළමනාකරණය
5. පිරිස් කළමනාකරණය
6. කාර්ය කළමනාකරණය වශයෙනි.

**ගැටුම් කළමනාකරණය**

ලෝකයේ ජීවත් වන ඕනෑම පුද්ගලයෙකුට ගැටුම් එළඹිය හැකි ය. ගැටුම් ප්‍රධාන වශයෙන් දෙවර්ගයකි.

1. අභ්‍යන්තර ගැටුම්
2. බැහිර ගැටුම් යනුවෙනි.

අභ්‍යන්තර ගැටුම් වශයෙන් සැලකෙන්නේ චිත්ත සන්තානයේ ඇති විය හැකි චෛතසික සට්ටන ය. මේවා ධර්මයට අනුව විතර්ක වශයෙන් ද හැඳින්විය හැකි ය. අභ්‍යන්තර ගැටුමක් ඇති වූ විට එය සමනය කර ගැනීමේ මාර්ග දෙකකි. එකක් නම්, තමා තුළ ඇති වී තිබෙන ගැටුමක් ඊට තුඩුදුන් හේතුත්, ඉන් අත්විය හැකි අනිටු විපාකත්, යෝනිසෝමනසිකාර මෙන් මැදහත්ව විමසා බලා ඉන් මිදීමේ මාර්ගයට අවතීර්ණ වීම යි.

මේ සඳහා සතතාධ්‍යාසයෙන් පුරුදු කරන ලද ධර්මඥානය ඇතිව සිටීම බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. දෙවන මඟ නම්, තමන්ට වඩා ගුණයෙන් හා නුවණින් හෙබි කල්‍යාණ මිත්‍රයෙකු හමු වී තම අභ්‍යන්තරයේ පවත්නා ගැටුම නොවළහා ඔහුට හෙළිදරව් කොට, ගැටුම සමථයකට පත් වන අන්දමේ උපදෙස් ලබා ගැනීම හා ඒ උපදෙස් අනුව ක්‍රියා කිරීම යි. මේ සම්බන්ධයෙන් හොඳම කල්‍යාණ මිත්‍රයා බුදුරජාණන් වහන්සේ ය. යම් යම් ගැටුම් සම්බන්ධයෙන් තත්කාලීන ශ්‍රාවකයන්ට උන්වහන්සේ විසින් කර ඇති අනුශාසනා ගුරු කොට ගැනීම සැනසිල්ල ළඟා කර ගැනීමට නිවැරදි

මාර්ගය වේ. ඒ අතර ම ගැටුම් ඇති වූ අවස්ථාවල දී අතීතයේ විසූ යම් යම් නායකයන් ගත් පියවර ද දැන් සිටීම බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි ය. එබඳු පුද්ගලයන් සමහරෙක් නම් මහෞෂධ පඬිතුමා, බුද්ධදාස රජතුමා, මහා විජයබාහු රජතුමා, ඒබ්‍රහම් ලින්කන්, ඩිස්රායෙලි යන අය ය.

2. බාහිර ගැටුම් වශයෙන් මෙහි දක්වෙන්නේ බාහිර පුද්ගලයින් හා බලවේග නිසා ඇති විය හැකි ගැටුම් ය. එබඳු ගැටුම් සමථ කර ගැනීමට ද ඉහත ක්‍රියා මාර්ග ම අනුගමනය කළ හැකි ය. ඊට අමතර ව ගැටුම් ඇති කරන පුද්ගලයන් හා සාකච්ඡා කර අදහස් හුවමාරු කර ගැනීම ද ඵලදායි ක්‍රියාමාර්ගයකි. මේ ක්‍රියාමාර්ගයෙන් ගැටුම් ඇති වීමේ ඉඩකඩ මඟහැරී ගිය අවස්ථා කීපයක් ඉතිහාසයේ දක්වේ. ගැටුම් විසඳීමට යොදන ක්‍රියා මාර්ගවලටත් වඩා වැදගත් වන්නේ ගැටුම ඇති විය හැකි අවස්ථා අවම වන සේ දූරදර්ශී ව තම වගකීම් සම්භාරය ඉටු කිරීම යි.

**2. අධ්‍යාපන කළමනාකරණය**

මෙය ද අංග දෙකකට බෙදා දැක්විය හැකි යි.

(1) තමාගේ අධ්‍යාපනය
(2) විහාරස්ථානයේ නේවාසික සෙස්සන්ගේ අධ්‍යාපනය

(1) තමන් කවර තරමේ උසස් විභාග සමත් වී සිටිය ද අධ්‍යයන කටයුතු අවසන් කළ සේ සිතීම මුළාවකි. ඉගෙනීම යනු නිවන් අවබෝධ කරන තුරු නිරත විය යුතු අඛණ්ඩ ක්‍රියාවලියකි. අධ්‍යාපනඥයන් එය දක්වන්නේ මව්කුසේ සිට මරණය දක්වා කෙරෙන අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙසිනි. එහෙත් ධර්මානුකූල හැඳින්වීම ඊට වඩා අතිශයින් දීර්ඝ කාලයක් ආවරණය කරයි. ධර්ම දනය මෙන් ම කාලීන ප්‍රශ්න සම්බන්ධයෙන් ද තම වගකීම ය. එනම් භූමිකාවට අයත් කාර්යභාරය ඉතා නිවැරදිව ඉටු කිරීමට අවශ්‍ය ආර්ථික, සාමාජික, දැනුමක් ඇති කර ගැනීම, දෛනික කාර්යයක් සේ සැලකීම වැදගත් ය. විවේක ඇති හැම විට ම පොත පතකියවීම කරුණු රැස් කිරීම, වියතුන් හා සාකච්ඡා පැවැත්වීම, ඉදිකිරීම් කටයුතු ආදිය නිරීක්ෂණය වැනි ක්‍රියාමාර්ගවලින් තම භූමිකාවට සම්බන්ධ දැනුම සංවර්ධනය කර ගත හැකි ය.

අධ්‍යාපනයේ අනිත් කරුණ නම්, තම ශිෂ්‍යයන්ගේ හා සබ්‍රම්සරුන්ගේ බුද්ධිය හා කුසලතා වර්ධනයට උපදෙස් දීම හා මඟ පෙන්වීම යි. අතීතයේ විසූ භික්ෂූන් වහන්සේ ඉටු කර ඇති මහත් කාර්යභාරයත්, ඒ සඳහා

උන්වහන්සේ තුළ පැවති විශිෂ්ට ඥානය හා කුසලතාත් අනුව සලකන විට, අපගේ පරිහානිය තේරුම ගැනීම අපහසු නැත. පහසුකම් නොතිබුණු කාලවල දී අපේ සංඝ පිතෘන් ඉටු කර ඇති කාර්‍යභාරය, විශ්මයජනක ය. අනෙක් අතට පහසුකම් බහුල ව ඇති අද වන විට භික්ෂූන් වහන්සේ දැනුමෙන්, ආකල්පවලින් හා කුසලතා අතින් වැටී ඇත්තේ කවර තරමේ පහත් මට්ටමකට ද යන්න අප විසින් ගැඹුරින් සිතා බැලිය යුතුව ඇත.

මේ සංවේගජනකත්වයෙන් ගොඩ ඒම සඳහා අනාගත පරපුරට වත් මඟ පාද දීම අප වෙත පැවරී ඇති මහත් වගකීමකි. දශක පහ-හයකට පෙර ක්‍රියාත්මක වූ පංසල් අධ්‍යාපන ක්‍රමය ගුරු කොට ගෙන අප ශිෂ්‍යයන් සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය ය.

### 3. සම්පත් කළමනාකරණය

සම්පත් ප්‍රධාන වශයෙන් අංශ දෙකකට වර්ග කළ හැකි ය.

(1) මානව සම්පත්

(2) භෞතික සම්පත් වශයෙනි.

(1) තම ශිෂ්‍යයන්, සබ්‍රම්සරුන්, දයක-දයිකාවන් හා විහාරස්ථානයේ යම් යම් කාර්‍යවල නිරත අය වෙතොත් ඔවුහු ද පළමු කොටසට ඇතුළත් වෙති. ඔවුන්ගේ සහජ හැකියාවන්, රුචි අරුචිකම් ශිල්පීය කුසලතා ධර්ම ශාස්ත්‍රියඥානය ආදී විශේෂතා හඳුනා ගෙන ඊට අනුකූල වගකීම් පැවරීම, එළදයී පියවරක් වනු ඇත. පවරන ලද කාර්යය මැනවින් ඉටු වන්නේ ද යි වරින් වර අධීක්ෂණයත් අවශ්‍ය උපදෙස් වරින් වර සැපයීමත්, කාර්යය අවසානයේ ස්තුති කිරීම, පින් අනුමෝදන් කිරීම, තුටුපඬුරු දීම වැනි ශුභ ප්‍රතිචාරයන් දැක්වීමත් කාර්ය සාධනයටත් ගුණ නුවණ වර්ධනයටත් හේතු විය හැකි ය.

(2) මුදල්, ද්‍රව්‍ය හා උපකරණ භෞතික සම්පත් සේ සැලකේ. හැම සම්පතක් ම උපරිම ප්‍රයෝජන ලැබෙන සේ පරිහරණය, නඩත්තුව හා ආරක්ෂාව සම්පත් කළමනාකරණයේ දී අත්‍යවශ්‍ය පියවර ය. සම්පත් නාස්තිය, බොහෝවිට විහාරස්ථානවල සිදු වේ. සම්පත් පරිහරණය

සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේ විනයෙහි දී ඇති උපදෙස් අවධාන යෙන් යුතුව හැදෑරීම විපුල ඵලදයී පියවරක් වනු ඇතැයි සිතමි.

### 4. කාලය කළමනාකරණය

ගතවන එක මොහොතකුදු අපට නැවත ළඟා කර ගත නොහැකි ය. එබැවින් ඉතා ස්වල්ප කාලයක් නමුත් නිකරුණේ ගත වීමට ඉඩ නොදී ප්‍රයෝජනවත් පරිදි යොද ගැනීම පෙරටත් වඩා අද අවශ්‍ය වී තිබේ. මේ සඳහා එදිනෙද කටයුතු සම්බන්ධයෙන් සැලසුම් ඇති කර ගැනීම ඉතා ප්‍රයෝජනවත් විය හැකි ය. විනාඩි ගණනකින් කළ හැකි කාර්යයක් සඳහා පැය ගණනක් ගත කිරීමට සිදු වුවහොත්, එය නිසැකයෙන් ම කාලය නාස්ති කිරීමකි.

### 5. පිරිස් කළමනාකරණය

මෙහි දී විහාරස්ථානයට එදිනෙද පැමිණෙන්නන්, ආගන්තුකව පැමිණෙන්නන්, විහාරස්ථානයේ නේවාසිකයන් හා ඔවුන් ඇසුරු කරන පුද්ගලයන්, තමන් විසින් දුරින් ඇසුරු කළ යුතු පුද්ගලයන් හා ළඟ ඇසුරට ගත යුතු පුද්ගලයන්, යම් යම් අවස්ථාවල දී දැනුම් දිය යුතු හා සාකච්ඡා කළ යුතු පුද්ගලයන් ද මැනවින් අවබෝධ කර ගැනීමට විහාරාධිපති කෙනෙකුට අතිශයින් ප්‍රයෝජනවත් විය හැකි ය. විශේෂයෙන් විහාරස්ථානය අවට ප්‍රජාව ගැන ඇති කර ගන්නා අවබෝධය කාර්‍ය සාධනයටත් ආරක්ෂාවටත් ප්‍රයෝජනවත් වේ. එසේ ම කීප දෙනෙකුගෙන් කළ හැකි කිසියම් කාර්යකට බොහෝ දෙනෙකු යෙදවීම ද දුර්වලතාවකි. භික්ෂූන් වහන්සේ හතර–පස් නමක් විසින් ඉටු කළ හැකි පාංශුකූලයක් වැනි කටයුත්තකට බොහෝ දෙනෙකුන් පැමිණ වීම භික්ෂු සමාජය හැල්ලුවට පත් කිරීමක් නොවන්නේ ද යි සිතා බැලිය යුතුව ඇත.

### 6. කාර්ය කළමනාකරණය

තමන් ම සිදු කළ යුතු තමන්ගේ වගකීම යටතේ සිදු කළ යුතු හා තමන් ම වගකීමක් දැරීමට සිදු විය හැකි කාර්යය ද වෙන් වෙන් ව හඳුනා ගැනීම කාර්ය කළමනාකරණයේ වැදගත් ලක්ෂණයකි. එසේ ම ප්‍රමුඛතාව දිය යුතු කාර්ය මොනවා ද, කල් ගත වී ඉටු කළත් හානියක් නොවන කාර්ය මොනවා ද යි තීරණය කිරීම ද අවශ්‍ය ය. විශේෂයෙන් විහාරස්ථානයේ

නේවාසික හැම කෙනෙකුට ම කිසියම් කාර්ය භාරයක් පැවරීමත්, ඒ පැවරුම අරමුණට හා සැලැස්මට අනුව ඉටු වේ ද යි වරින්වර අධීක්ෂණයත් අවශ්‍ය ය. හැම කාරයයක් ම ශාසනික ප්‍රතිපදාවට අනුකූලව ඉටු විය යුතු දෙස් සලකා ක්‍රියා කිරීම විශිෂ්ට පියවරකි.

---

දෙවියන් සර්වබලධාරී නම් සෑම මනුෂ්‍ය ක්‍රියාවක්ම හැම මනුෂ්‍ය සිතුවිල්ලක්ම හැම මනුෂ්‍ය හැඟීමක්ම සහ අභිලාෂයක්ම ඇතුළු සියළු සිදුවීම් දෙවියන් වහන්සේගේ කාර්‍යයන් ය. එවැනි සර්වබලධාරී දෙවියෙකු ඉදිරියේ සිතුවිලි ක්‍රියාකාරකම් පිළිබඳව මිනිසා වගකිව යුතු යැයි කිව හැක්කේ කෙසේද?

—මහා චින්තක චාල්ස් අයින්ස්ටීන්

# මූලික බුදු සමයෙන් පිළිබිඹුවන භික්ෂූන් වහන්සේ ගුරුවරුන් ලෙස පුහුණු කළ අයුරු

මහාචාර්ය,
**හෙන්රි වීරසිංහ**

ථේරවාදී බෞද්ධ න්‍යායට අනුව සසර දුක් කෙළවර කරනු සඳහා නොවරදින මාර්ග තුනක් දැකිය හැකි ය. ඒ තුන් වැදෑරුම් විමුක්ති මාර්ගය මූලික බුදු සමයේ හඳුන්වා දෙන්නේ රහත් මාර්ගය පච්චේක බුද්ධ මාර්ගය හා සම්මා සම්බුද්ධ මාර්ගය යනුවෙනි.

පොදු විමුක්ති මඟ ලෙසින් ප්‍රකට රහතන් වහන්සේගේ තත්ත්වය (සියලු කෙලෙස් සම්පූර්ණයෙන් ම ප්‍රහීන කරන ලද පූජාවට සුදුසු යන අදහසින් යුත්) සම්මා සම්බුදු කෙනෙකුගෙන් බණ අසා ම පසක් කර ගත යුතු බව මූලික බුදු සමයේ සඳහන් වේ. මඟ පෙන්වීමකින් තොරව ඒ උදර තත්ත්වය පසක් කර ගත නොහැකි බව එයින් පැහැදිලි ය. පච්චේක බුද්ධ නොහොත් පෞද්ගලික බුදු පදවිය ස්වකීය දැනුම, ස්වකීය අභිලාශය සහ ස්වකීය ප්‍රයත්නය පාදක කොට සාක්ෂාත් කර ගත හැක්කක් බවට පැහැදිලිව ම දක්වා තිබේ. එහෙත් පසේ බුදුවරු බණ නොකියති. දැනුම ඇතත් සමාජයේ සෙසු ජනීජනයන්ට දහම් දෙසා විමුක්ති මාර්ගය සාක්ෂාත්කරණයට ඔවුන්ට සහාය විය නොහැකි ය. උන්වහන්සේලා තුළ සන්නිවේදන කුසලතාව නොමැති නිසා සමාජ ශුභසිද්ධියට දායක විය නොහැකි බව මූලික බුදු සමයේ එන මූලාශ්‍රවල සඳහන් වෙයි. මේ විමුක්ති මාර්ග අතුරින් උසස් ම තත්ත්වය හොබවන බුදු පදවිය (බුද්ධ තත්ත්වය — සියල්ල දත් බව හඟවන සර්වඥතා ඥානය ලැබූ තැනැත්තා) තමාත් කෙලෙස් පිරිනිවීමෙන් සැනසී සමාජයේ සෙසු ජනීජනයාත් විමුක්තියට යොමු කර වීමේ උදර ම තත්ත්වය යි. සම්මා සම්බුදුවරු ලෝකයේ ශ්‍රේෂ්ඨ ම ගුරුවරු ය.

උසස් ම දැනුම, උසස් ම ආකල්ප හා උසස් ම කුසලතාවලින් සමුපේත සම්මා සම්බුද්ධවරුන් ලෝකයේ පහළ වන්නේ දැඩි ග්‍රීෂ්ම සමයක පහළ වන මහා මේඝයක් ලෙසිනි. ලෝකයේ සියල්ලන්ගේ ම හිත සුව පිණිස පහළ වන බුදුවරු පූර්ණකාලීන ශ්‍රේෂ්ඨ ගුරුවරු වෙති.

සම්මා සම්බෝධිය ලබා තෙමසකින් පසු බරණැස මිගදය නම් වූ ස්ථානයේ පළමු වන ධර්ම දේශනය පැවැත්වූ බව ඓතිහාසික සිද්ධියකි. විමුක්ති මඟ සොයමින් කාලාන්තරයක් තිස්සේ වෙහෙස ගනිමින් සිටි ඒ පස්වග තවුසන්ට — (වප්ප, භද්දිය, මහානාම, අස්සජි සහ කොණ්ඩඤ්ඤ) පළමු වන බණ දෙසුවේ ඇසළ මස පුණු පොහෝ දිනයෙහි ය. දම්සක් පැවැතුම් සූත්‍රය හා අනාත්ත ලක්ඛණ සූත්‍රය දෙසා ඒ පිරිස සාර්ථක ශිෂ්‍යයින් බවට පත් කළ බුදුරජාණන් වහන්සේ සමාජ ශුභසිද්ධිය පිණිස තමන් වහන්සේ විසින් දැන වදාළ ධර්මය දෙසනු සඳහා සංවිධානශීලි වූහ.

ග්‍රීෂ්ම, හේමන්ත හා වස්සාන යන සෘතු තුනට ගැලපෙන තුන්මහ ප්‍රායක ඉතා සුව පහසුවෙන් වාසය කළ යසකුල පුත්‍රයා සසර පිළිබඳ කලකිරී ඉසිපතනයට ගොස් දහම් අසා පැහැදී සසුන්ගත වීම උදාර සංඝ සංවිධානයකට අඩිතාලම දැමුවාක් වැන්න. යසකුල පුත්‍රයාගේ සුපණසක් මිත්‍රයින් ද යසකුල පුත්‍රයා ගිය මඟ යමින් සසුන් ගත වීම නිසා බුදුරජාණන් වහන්සේට යහපත් ශිෂ්‍ය පරම්පරාවක් බුදු පදවිය ලැබී වැඩි කල් යන්නට මත්තෙන් ලැබුණු බව ඓතිහාසික සිද්ධියකි.

ඇසළ මස මුල් සතිය පසුවන විට ලෝකයේ රහතන් වහන්සේලා සැට නමක් පහළ වූහ. ඇසළ මස සිට මාස තුනක් භාරතයට වස්කාලය වූයෙන් එම මාස තුනක පමණ කාලය මෙම රහතන් වහන්සේලා ධර්ම දූත මෙහෙවරට පුහුණු කිරීම සිදු වූ බව විනය පිටකයෙන් ගම්‍ය වේ. ගැඹුරු අළුත් දහමක් දෙසනු සඳහා ඊට සියලු ආකාරයෙන් ම සුදුසු ගුරු පිරිසක් බිහි කිරීම පහසු කාර්යයක් නොවේ. එසේ ම විවිධ මාදිලියේ ආගමික දෘෂ්ටීන්ගෙන් සමන්විත වූත් විවිධ ආගමික ගුරුවරුන්ගෙන් සැදුම් ලද්ද වූත් ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතයෙහි ධර්මදූත මෙහෙවරෙහි යෙදෙන ගුරුවරුන්ට මුහුණ දෙන්නට සිදු වූ ගැහැට අපමණ ය. ඒ නිසා මුල් ම බෞද්ධ ගුරු පරපුර ක්‍රමානුකූලව පුහුණු කරවීම මූලික අවශ්‍යතාවක් වන්නට ඇති බව සිතා ගත හැකි ය.

මුල් ම යුගයේ භික්ෂු ජීවිතය අතිශය දුෂ්කර වූවක් විය. නවාතැන් පහසුකම්, ආහාර පහසුකම්, චීවර පහසුකම්, බෙහෙත් හා වෛද්‍ය පහසුකම්

සපයා ගැනීම පහසු කාර්යයක් නොවී ය. සියලු ආකාරයෙන් ම නිකෙලෙස් වූත්, අල්පේච්ච වූත්, පූර්ණ නිදහස හා පූර්ණ ආධ්‍යාත්මික විමුක්තිය එක ම පරමාර්ථය කර ගත් භික්ෂුව පොදු සමාජයේ පරිත්‍යාග ආධාරයෙන් යැපෙන්නක් විය. (පරපටිබද්ධා හි මෙ ජීවිතන්ති පබ්බජිතෙන අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං). විමුක්තිගාමී එවැනි ජීවිතයක් ගත කිරීමට බැඳුණු භික්ෂුව ස්වාර්ථය හා පරාර්ථය එක ලෙස ම සලකන්නෙකු විය යුතු විය. දානමානාදියෙන් සැලකුම් ලබන භික්ෂුව (භික්ඛං ඉක්ඛතී ති භික්ඛ) (වි. මග්ග) ගිහි සමාජය යහමඟට යොමු කර වන ප්‍රබල ම කාරකය විය. මේ නිසා භික්ෂුව යහපත් සුපෙසල, විනය සම්පන්න, නැණවත් ගුරුවරයෙකු ලෙස මනා පුහුණුවක් ලැබීම අනිවාර්ය අවශ්‍යතාවක් විය. වර්තමානයෙහිද එම උදාර සම්ප්‍රදායය නොසැලී, නොබිඳී පවතින ආකාරය ලෝකයේ කිනම් බෞද්ධ රටක වුව ද දැකිය හැකි ආධ්‍යාත්මික ලක්ෂණයකි.

මුල් ම ගුරුවරු පුහුණු කර වීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් අනුගමනය කරන ලද ප්‍රතිපදාව පිළිබඳ බොහෝ තොරතුරු විනය හා සූත්‍ර පිටකවල බහුල වශයෙන් දැකිය හැකි ය. භික්ෂුව අතිශයින් ම ප්‍රසන්න අයෙකු වීම ප්‍රධාන කරුණ ලෙස සැලකූ බුදුරජාණන් වහන්සේ ඔහු විසින් පිළිපැදිය යුතු මූලික කරුණුවල ස්වභාවය මූලික බුදු සමයේ එන පැරණි ම ගණයෙහි ලා සැලකෙන සූත්‍රයෙක මෙසේ සඳහන් වෙයි :—

> "මහණෙනි, (ආධුනික) භික්ෂුවක විසින් පිළිපැදිය යුතු මූලික කරුණු කවරේදැයි පවසමි. ඒවා මැනවින් අසා දරව් (මූලික වශයෙන් ම) යහපත කෙරෙහි ම නම්‍ය වූ සිතැති නුවණැති පැවිද්ද විසින් නිබඳව නිරන්තරයෙන් ම ඒ උදාර පැවිදිකමට ගැලපෙන ඉරියව්වෙන් සමන්විත විය යුතු ය."

> "කිසි විටෙකත් භික්ෂුව නොකල්හි බැහැරට නොයා යුතු ය. නියම කල්හි ම පිඩු පිණිස හැසිරිය යුතු ය. නොකල්හි වීදි සංචාරයේ යෙදෙන්නා වූ අය කෙලෙස් මලෙන් බැඳෙන හෙයිනි. මේ නිසා බුදුවරු කිසි විටෙකත් නොකල්හි වීදි සංචාරය නොකරති."

> "රූප, ශබ්ද, ගන්ධ, රස සහ පහස (පොට්ඨබ්බ) යන ද්වාරාරම්බණයෝ මිනිස් සිත මෝහනය කරති. එබැවින් එම අරමුණු කෙරෙහි ඇල්ම දුරු කොට නිවැරදි කලට ආහාර පිණිස (වීදියෙහි) හැසිරිය යුතු ය."

''යම විටක ශ්‍රාවකයෙකු සමග හෝ අන් භික්ෂුවක සමග හෝ සල්ලාප යෙහි යෙදෙන්නේ නම් ප්‍රව්‍යිත වූ ධර්මය ම ඉලක්ක කොට කථා කළ යුතු ය. කිසි විටෙකත් මුසා හෝ අනුන් ‍ෙහලා දකින ඇ හෝ නොබිණිය යුතු ය.''

''ඇතැමහු බොහෝ විට වාද විවාදවලට යෙදෙති. එවැනි අල්ප බුද්ධිකයින් නොපසසමු. එසේ දෙඩමලු සල්ලාපයෙහි යෙදෙන්නන්ගේ සිත රාගයෙන් කැළඹේ.''

''පිණ්ඩාලෝප, විහාර, සෙනසුන්, ජලය, සිවුරු පාදුකා ආදිය මැනවින් ධර්මය අසා ඒවායේ ආදීනව මෙනෙහි කොට ම සේවය කළ යුතු ය.'

''මේ අයුරින් ආහාර, සේනාසන, ජලය, තුන් සිවුරු සහ පාවහන් ආදිය නෙළුම් පතක දිය මෙන් ම ඇලීම් බැඳීම්වලින් තොරව සේවනය කළ යුතු ම ය.''

භික්ෂුව දකින්නට අතිශයින් ම ප්‍රසන්න අයෙකු විය යුතු ය. දකුම්කලු කයකින්, ප්‍රසන්න අයුරු හැඳගත් තුන් සිවුරින් මෙන් ම මනා ඉරියව් පැවැත්මෙහි ද සන්සිඳුණු ඉඳුරන් (සන්තින්ද්‍රියාව) ගෙන් ද යුතු වූ ධර්මධර, විනයධර ශික්ෂාකාමී භික්ෂුව ව්‍යක්ත සන්නිවේදකයෙකු ද විය යුතු ය

ව්‍යක්ත සන්නිවේදකයෙකු තුළ තිබිය යුතු ප්‍රධාන ලක්ෂණයක් නම් දක්ෂ ලෙස ස්වකීය කටහඬ පාලනය කිරීම යි. එසේ මනා ලෙස කටහඬ පාලනය කරන විට ස්වකීය සන්නිවේදන විලාශය චිත්තාකර්ෂණීය වේ. මේ බවට වැදගත් සාක්ෂියක් බුදුරජාණන් වහන්සේ තුළ විද්‍යාමාන වූ අටවැදෑරුම් කටහඬින් මොනවට ප්‍රකට වේ. (1) පැහැදිලි බව (විස්සට්ඨ) ; (2) වහා අවබෝධ වනසුලු බව (විඤ්ඤෙය්‍යා) ; (3) මිහිරි බව (මංජු) ; (4) ඇසීමට ප්‍රිය බව (ස්වනීය) ; (5) අනුපිළිවෙලින් ගැඹුරු වන බව (බින්දු) ; (6) නොකැඩෙන බව (අවිසරි) ; (7) ගැඹුරු බව (ගම්භීරො) ; (8) මැනවින් පැතිර යන බව (නින්නාද) ආදිය ඒ අටවැදෑරුම් කටහඬ විලාශය යි. ශ්‍රාවකයින් පාඩම කෙරේ. අවධානයෙන් බැඳ තබා ගැනීමට බුදු රජාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ ශ්‍රව්‍යාධාරකයක් ලෙස කටහඬ උපයෝගි කර ගැනීමෙන් ගම්‍ය වන්නේ දේශකයා තම කටහඬ මැනවින් පුරුදු පුහුණු

කර ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බව ය. වර්තමාන භික්ෂු පරපුර වුව ද මෙම පැරණි සම්ප්‍රදයය බණ දෙසන විටත් පිරිත් සජ්ඣායනා කරන විටත් ඉතා වගකීමෙන් යුතුව භාවිත කරන බව පැහැදිලි කරුණකි.

ආදර්ශවත් බව භික්ෂුව තුළ නිබඳව නිරන්තරයෙන් ම ප්‍රකටව තිබිය යුතු තවත් ලක්ෂණයක් බව මූලික බුදු සමය විවරණය කරයි. ස්වකීය විවරණය උසස් ම ගුණයේ දෘෂ්‍යාධාරකයක් ලෙස බුදුරජාණන් වහන්සේ පරිහරණය කළ බව උන්වහන්සේගේ උදාර චරණ විලාශයේ කැපී පෙනුණු යථාකාරී තථාවාදී–යථාවාදී තථාකාරී ගුණය (කියන දේ කරන, කරන දේ කියන ගුණය) ස්ඵුට කරයි. මේ නිසා ම උන්වහන්සේ විශිෂ්ට ගුරුවරයෙකු ලෙස දඹදිව දසත කීර්ති කදම්බ පැතුරුණු බව ප්‍රකට කරුණකි.

මේ අනුව සලකන විට මුල්ම යුගයේ පහළ වූ භික්ෂූන්වහන්සේ ශ්‍රේෂ්ඨ ගුරුවරුන් ලෙස ප්‍රකට වූහ. සැරියුත්, මුගලන්, පුණ්ණමන්තානි පුත්තවැනි මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ මුල් ම යුගයේ දක්ෂතම ශිෂ්‍යයෝ වූහ.

මූලික බුදු සමය පිළිබිඹු කරන බුද්ධ ගුරු භූමිකාවේ අන්තර්ගතය දැඩි ලෙස භෞතිකමය දර්ශනයෙන් වෙළී පැටලී පවතින වර්තමාන සමාජයේ වෙසෙන භික්ෂූන් වහන්සේට ස්වකීය ගුරු කාර්යය ඵලදයී ලෙස මෙහෙය වීම සඳහා ලැබිය හැකි මාර්ගෝපදේශ අපමණ බව මේ අනුව නිගමනය කළ හැකි ය.

පාදක සටහන්

1. තෙන ඛො පන සමයෙන ඡලොකේ අරහන්තො හොන්ති. වි 1.14

2. තෙන ඛො පන සමයෙන සත්ත ලොකෙ අරහන්තො හොන්ති. වි 1.14

3. තෙන ඛො පන සමයෙන එක සට්ඨී ලොකෙ අරහන්තො හොන්ති වි 1.20

4. වි 1.137 – 156

5. සු.නි. 385 592

6. දී.නි. 11.211 - 227

---

දෙව් මිනිස් කිසිවෙකුගේ පිහිට ලැබෙන තුරු බලා නොසිට තමාගේ සංසාර විමුක්තිය තමා ම සිදු කර ගත යුතු බැව් ලොවට ප්‍රකාශ කර වදළ එකම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේයි.

—ආචාර්ය ක්‍රිස්ටියන් එෆ්. මෙල්බ්

# අද භික්ෂුව සතු ජාතික මෙහෙවර

මහාචාර්ය
බෙල්ලන්විල විමලරතන හිමි

"තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චා ජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉතිපටිසඤ්චික්ඛති. සම්බාධො ඝරාවාසො රජොපථො, අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡා දෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති."

මෙය සූත්‍රපිටකයෙහි බොහෝ සූත්‍රාන්තවල දක්නට ලැබෙන පාඨයකි, පැවිද්ද සහ එහි ස්වරූපය, එහි ඇති වටිනාකම එම පාඨයෙන් ප්‍රකාශ වෙයි. බුදු බණ අසන කවර හෝ කුලයකට අයත් පුද්ගලයෙක් තථාගතයන් වහන්සේ කෙරෙහි සැදැහැයෙන් යුතුව මෙසේ සිතයි. "ගෘහවාසය සම්බාධ සහිත ය. රජස් පථයකි. පැවිද්ද අභ්‍යවකාශය බඳු ය. ගිහිගෙයි වසමින් ඒකාන්ත පරිපූර්ණ ඒකාන්ත පාරිශුද්ධ බ්‍රහ්මචාරියෙහි හැසිරීම අපහසු ය. එබැවින් මම කෙස් රැවුළු කපා කසාවත් හැඳ අනගාරිකව පැවිදි වන්නෙම් නම් මැනවි." යනු පාඨයෙන් ප්‍රකාශ වෙයි.

එහි සඳහන් පරිදි පැවිද්ද නම් ගෘහත්‍යාගය යි. එහි ස්වරූපය කෙස් රැවුළු කැපීම, කහවත් හැඳීම සහ ගිහිගෙයින් බැහැර වීම යි. ගිහිගෙය හැර දමන්නේ එය සම්බාධ සහිත නිසාත් කිලිටිකම් වැඩි නිසාත් ය. එහි වසමින් පිරිපුන් පිරිසිදු බඹසර හැසිරීම අපහසු ය. පැවිද්ද අභ්‍යවකාශය බඳු ය. එහි සම්බාධක නැත. එවැනි නිදහස් පැවැත්මක් ඇති විට බඹසර හැසිරීම පහසු ය. බඹසර වාසයට අපහසු නිසා ගිහිගෙය හැර දැමීමත්, බඹසර වාසයට පහසු වීම නිසා අනගාරිය බව ලැබීමත් පබ්බජ්ජාව නමින් හඳුනා ගත හැකි ය.

මෙහි දී අපේ අවධානයට ලක්විය යුතු ප්‍රධාන කරුණ නම් බඹසර (බ්‍රහ්මචාරිය) යන්න යි. බ්‍රහ්මචාරිය පදයට පෙළ අටුවා ග්‍රන්ථයන්හි

දක්නට ලැබෙන අර්ථකථන සමූහයක් ඇත. ඒ සියල්ලක් ම පාහේ සංකලනය කොට ගුරුළුගෝමී පඬිවරයා මෙසේ සඳහන් කරයි :—

"බ්‍රහ්මචරිය ශබ්දයෙන් වනාහි සකල ශාසනය ද දන ද පරිචර්යා ද ශික්ෂාපද ද බ්‍රහ්මවිහාර ද ධර්මදේශනා ද මෛථුන විරති ද ස්වදර සන්තොෂ ද ආර්ය මාර්ග ද අධ්‍යාශ ද වීර්ය ද කියනු ලැබේ."

බුදුදහමෙහි ඉගැන්වෙන සාර ධර්ම සමුදය සංගෘහිත මෙම අර්ථකථනයට අනුව බ්‍රහ්මචර්යාව නම් සපුන්මග අනුසරණය කිරීම යි. එය පරිපූරණය කිරීම සඳහා පබ්බජ්ජාව හෙවත් ගෘහත්‍යාගය සුකර, නිරාබාධක ස්ථානයක් වෙයි. ගෘහවාසය සාරධර්ම සම්පාදනයට අස්ථානයක් බව ඉන් අවධාරණය නොවෙයි. කවර නම් විමුක්තිකාමියකු විසින් නමුත් සපුරාලිය යුතු සාරධර්ම පරිපූරණය පැවිද්ද විසින් ද අනිවාර්ය වෙයි. ඒ සඳහා පැවිද්ද අභ්‍යවකාශය මෙන් නිරාබාධක තැනක් වීම පමණක් විශේෂිත ය. එහෙයින් පැවිද්ද ආර්ය ශීලයෙන්, සමාධියෙන්, ඉන්ද්‍රිය සංවරයෙන්, ස්මෘති සම්ප්‍රඥන යෙන් යුක්තව විවික්ත සේනාසන භාජනයෙහි යෙදෙයි. එහි ආශ්‍රවක්ෂය සඳහා සිත නතු කොට යථාභූතය ක්ෂාක්ෂාත් කරයි.

පුද්ගල විමුක්තිය සඳහා ආයතනයක් වූ පැවිද්ද ඒ තත්ත්වය ඉක්මවා යන පරමාර්ථ රාශියකින් බැඳී ඇති බව පැවිද්දකුගේ ක්‍රියාකාරිත්වය දෙස බැලීමෙන් පෙනී යයි. පුද්ගල විමුක්තිය සඳහා පබ්බජ්ජාවට යොමු වන භික්ෂුව අවදියෙන් පුබුදුවෙන් හා විමසීමෙන් ජීවිතය සකසා ගත යුතු ය. භික්ෂූන්ගේ නිරන්තර ප්‍රත්‍යවේක්ෂාවට භාජනය විය යුතු කරුණු දහයක් දසධම්ම සූත්‍රයෙහි අන්තර්ගත ය. භික්ෂු ජීවිතය මෙරමා වෙත බැඳුණු එකකැ යි නිරන්තර සිහිකටයුතු බව ඉන් එකකි. භික්ෂු ජීවිතය පුද්ගලික මෙන් ම පොදු ජීවිතයක් බව අවධාරණයෙන් සැලකිය යුතු බව මෙයින් සිතා ගත හැකි ය. එවිට එය අත්තහිත වත්නාක් මෙන් ම පරහිත වත්නාක් ද විය යුතු ය. පරාර්ථය බුදුදහමේ අත්තිවාරම යි. ථාමයෙන්, දර්ශනයෙන් හා පෞරුෂයෙන් යුත් මාගේ හුදකලා භවතරණයෙන් කවර ප්‍රයෝජනයක් ද ? කියා පරාර්ථවත් වීම බෝසත් දහමක කොට ගැනීමෙන් ඔවුහු ලෝකය වෙනුවෙන් වෙර දරති ; පැරුම්දම් පුරති ; කැප වෙති. අත්තහිත සාධනය පරහිත සාධනය සඳහා යොමු කිරීම පරමාර්ථ කොට ගත්නි මේ පරමාදර්ශය භික්ෂූන් වහන්සේ වෙතින් ප්‍රකාශ විය යුතු බව ගෞතම ශාස්තෲන් වහන්සේ භික්ෂු ශාසනය ආරම්භ වූ තැන් පටන් ම පිළිගත් කරුණකි. භික්ෂූන් සැට නමක් වීමත් සමඟ ම බහුජන හිතසුව පිණිස චාරිකාචරණයෙහි යෙදෙන සේ අනුදන වදළේ එහෙයිනි. එයින් භික්ෂු ජීවිතය පොදු එකක් බව පැහැදිලි වෙයි. පොදු ජීවිතයක් ඇති උන් වහන්සේගෙන් සිදු කළ හැකි පරාර්ථය අතිවිශාල ය.

බුදුදහමේ ඉගැන්වෙන පරාර්ථය පටු සීමාවකින් බැහැර වූවකි. එහි පෘථුල ක්ෂේත්‍රය අවධාරණය කරන්නට යාමෙන් මහායානිකයන් ත්‍රිබොධි සංකල්පය පවා බැහැර කරමින් තනි බුද්ධ සංකල්පය පමණක් තහවුරු කිරීමට ප්‍රයත්න දරා ඇති බව සමහර විචාරකයන්ගේ මතය යි. එබැවින් පරාර්ථ සාධනයෙහි ලා භික්ෂුවට පැවරෙන වගකීම යන්තමින් තක්සේරු කළ නොහැකි ය. චාරිකා චරණය සඳහා අනුඥා ලත් භික්ෂූන් වහන්සේ එද–මෙද අතර ලොකසංග්‍රහයෙහි නිරත වූ අන්දම විමර්ශනය කිරීමෙන් පෙනී යන්නේ එය ආධ්‍යාත්මික, භෞතික දෙපක්ෂයෙන් ම ලෝකයට අභිවෘද්ධිකාරක වූ බව යි. විදර්ශනා ධුරයෙහි වේවා ග්‍රන්ථධුරයෙහි වේවා නියැලි භික්ෂූන් වහන්සේ ඓහලෞකික පාරලෞකික වශයෙන් මිනිසාට හිතකර දේ යමක් නම් එහි සමාදන් කරවීමටත් අහිතකර දේ යමක් නම් ඉන් වැළැක්වීමටත් උත්සුක වූහ. එමගින් සිදු කළ හැකි පරහිතය අසීමිත ය. එහෙයින් ම මිනිසාට අත්‍යවශ්‍ය පුද්ගලයෙකු වූ භික්ෂූන් වහන්සේට කුලදේවත්වය මෙන් ම ප්‍රජානායකත්වය ද හිමි විය.

මහින්දගමනයෙන් මෙරට ප්‍රතිෂ්ඨාපනය වූ ලාංකේය භික්ෂු සමාජය ජනජීවිතයෙන් වෙන් කළ නොහැකි අංගයක් විය. මහාවිහාරය කේන්ද්‍ර කොට ගෙන උපතේ පටන් මිය යන තුරු මිනිසාගේ අධ්‍යාපනය, ජීවනය සකස් වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මෙහෙයවමින් පරලොව ජීවිතය ද සුවපත් කර ගත හැකි ක්‍රියාමාර්ගවලට යොමු කර වූයේ භික්ෂූන් වහන්සේ ය. ශාසනිකත්වය කිසිසේත් ලඝු කොට නොගනිමින් සාමයික, සාමාජික, සංස්කෘතික හැම අංශයකින් ම ජනතාවට හිත වැඩ සැලසූ භික්ෂූන් වහන්සේ ඔවුන්ගේ ජීවිත ආධ්‍යාත්මික පක්ෂයෙන් පමණක් නොව භෞතික වශයෙන් ද ප්‍රභූත්වයට පත් කරන ප්‍රධාන සාධකය ලෙසින් පිළිගන්නා ලදි. මේ රට යටත් කිරීමට, අත්පත් කොට ගැනීමට තැත් කළ විජාතිකයන්, විදේශිකයන් ඒ සඳහා පහර දිය යුතු සුණු විසුණු කළ යුතු මර්මස්ථානය ලෙසින් දුටුවේ ද මේ වෙන් නොකළ හැකි ගිහි–පැවිදි සම්බන්ධතාව යි. සංස්කෘතික, සාමාජික, සාමයික වශයෙන් ලංකාව මහත් අගාධයකට ඇද දැමීමට තරම් ප්‍රබල වූ මේ සංක්ෂිප්ත පුවත පිළිබඳ ශෝචනීය කථාන්තරය ගැඹුරින් බුද්ධිමත්ව විමර්ශනය කොට පිළියම් යෙදිය යුතු කාලසීමාවේ අවසන් කොටසට අප අවතීර්ණව සිටින බව තරයේ සිහිකටයුතු බව පෙනේ.

එම සංවේගාත්මක පුවත ගිහි–පැවිදි දෙගොල්ලන්ගේ අවධානයට යොමු කරවමින් මහාචාර්ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමිපාණන් 'ආගම හා සමාජය' නම් ග්‍රන්ථයෙහි තැබූ සටහනක් මගේ මතකයට නැඟෙයි.

> ''විදේශික ජාතීන් පෙරදිග ගති, බෞද්ධ ගුණධර්ම, ආගමික පිළිවෙත් අවුල් වී යන තැනට බුද්ධාගමේ හා සිංහල ජාතියේ සම්බන්ධය ලිහිල් වී යන අතට කටයුතු කළහ. ආගම ආත්මාර්ථය සලස්වා ගන්නා

උපකරණයක් ලෙස සලකන බෞද්ධයන්, බුද්ධාගමේ ගරු කොට සලකන කරුණාව, ප්‍රඥාව, සාමය, සේවය, පරෝපකාරය කෙබඳු දැයි නොදන්නා සිංහලයන් අද ලංකාවේ සිටින්නේ එහි ආදීනව වශයෙනි. එහෙයින් බෞද්ධයන්ට, සිංහලයන්ට, ලාංකිකයන්ට ආගම පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැන්මට, ලබා ගෙන ලෝකයාගේ යහපත සඳහා ක්‍රියා කිරීමට දැන් අවස්ථාවයි.''

ඉතිහාසයේ මෙබඳු සෑම අවස්ථාවක දී ම එහි වගකීම භාර ගෙන ඇත්තේ භික්ෂූන් වහන්සේ ය. එම පුරෝගාමී මෙහෙවරෙහි නියැලීමට භික්ෂූන් වහන්සේට ඇති උරුමය නැති කිරීමට කිසිවෙකුටත් නුපුළුවන. ලාභාපේක්ෂාවෙන් තොරව හුදු පරාර්ථය සඳහා වන එම ප්‍රජා නායකත්වය භික්ෂූන්ගෙන් ගිලිහී යාමට ඉඩ තැබීම පොදු පරිහානිය සඳහා ම හේතු වන්නකි.

ඉතිහාසයේ දී මෙන් භික්ෂූන් වහන්සේ ජනජීවිතයට අත්‍යවශ්‍ය වන් නාක් කල් දෙපක්ෂයෙහි සම්බන්ධය, ශක්තිය හා අභිවෘද්ධියට අභියෝගයක් නොමැත. එහෙයින් කාලීනව පන්සල උපරිම මට්ටමින් ජනජීවිතය සරුසාර කරලීම පිණිස අධ්‍යාත්මික – බාහිර දෙපැත්තෙන් සහාය පළ කිරීමේ නියාමක මධ්‍යස්ථානයක් විය යුතු බව පෙනේ. ඒ සඳහා භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය, සංවිධානය හා ශාසනික ශික්ෂණය කාලානුරූපී අයුරින් සකස් කර ගැනීම අනිවාර්ය බව පිළිගත යුතු ය.

එවැනි සංවිධානාත්මක වැඩ පිළිවෙලකින් බොහෝ ඈත් වීම නිසා භික්ෂූන් වහන්සේ වෙත පැවති සමාජානුයෝගී ආවශ්‍යකත්වය සෑහෙන තරමින් බිඳ වැටෙමින් පවත්නා බව අප අමතක නොකළ යුතු ය. ඒ හේතුවෙන් අප රට විරාගත අනන්‍යතාවෙන් මඟහරවා ස්වකීය අභිප්‍රායානුකූලව ගීල ගැනීමට මාන බලන අදෘශ්‍යමාන බලවේග රාශියක් රට තුළ ක්‍රියාත්මක වෙමින් පවත්නා බව නොරහසකි. අද රටේ පවත්නා අවාසනාවන්ත, ශෝචනීය තත්ත්වය කෙරෙහි ද මේ අදිසි අත්වලින් ලැබෙන තල්ලුව කිසිසේත් අවතක්සේරු කළ නොහැකි ය.

ඉතිහාසය ගැන කථා කිරීමෙන් පලක් නැත. එය කාලයෙන් වැසී ගිය තත්ත්වයක් පමණකි. එයින් ගත හැක්කේ ආදර්ශයක් පමණකි. ඒ සඳහාත් අද ජීවත් වන අප අවදියෙන් සිටිය යුතු ය. අද පවත්නා තත්ත්වය මත මෙහෙට ඇති විය හැකි දේ ගැන ප්‍රවේශමෙන් අවධානය යොමු කළ යුතු ය. භික්ෂූන් වහන්සේගේ ශක්තියට සමච්චල් කරන්නන් හමුවේ අපේ නිහඬතාවක් ඇතොත් අප බැඳී සිටින ජනතාවට කළ යුතු සංග්‍රහය ඉටු කළ හැකි නොවේ. ඒ නිසා මේ රට වෙනුවෙන් මෙහි වෙසෙන මිනිසුන් වෙනුවෙන් එදා මෙන් අදත් හිතකාමී බලවේගය භික්ෂූන් වහන්සේ බව දැක්වීමට අප විසින් අප වෙනුවෙන් සංවිධානය වීම අද අප මුහුණ දී සිටින ප්‍රධාන වූත් අනිවාර්ය වූත් වගකීම බව සිතමි.

# පිරිවෙන් අධ්‍යාපනය සහ නූතන අභියෝග

අධ්‍යාපනපති
**අමුනුගොඩ ඉන්දරතන හිමි**

**ශ්‍රී** ලංකාවේ සම්මත කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් පිළිබඳව අසන්නට නොලැබේ. සැලසුම් ගත අර්ථ ක්‍රම පවතින රටවල මෙය බහුලව දක්නට ලැබෙන්නකි. එයට හේතුව වන්නේ එම රටවල අධ්‍යාපනය ද ආර්ථික සැලසුමේ එක් අංශයක් වීම ය. අධ්‍යාපනය නිතරම අර්ථ ක්‍රමය සමඟ එකට ගමන් කරන නිසා ය. එම රටවල අධ්‍යාපන ප්‍රතිපත්ති තීරණය කරන්නේ ද ආර්ථික ප්‍රතිපත්ති මත පිහිටා ය. එබැවින් අධ්‍යාපනය නිසා ඇති වන ඇතැම් ගැටළුවලට එම රටවලට මුහුණ පෑමට සිදු නොවේ. එසේ ම අධ්‍යාපනය ආර්ථික ප්‍රගතියට හැමතින් ම උපකාරී වේ. මේ නිසා අධ්‍යාපනය ආර්ථික දේහය තුළ පහසුවෙන් ජීර්ණය කර ගත හැකි තත්ත්වයක් එහි පවතියි. මේ දෙක ම උපයෝගී කොට සමාජ සැලසුම් සංවිධානය කර ඇත. මේ නිසා විධිමත් සමාජ ක්‍රමයක් ගොඩ නඟා ගැනීමට ද එය උපකාරී වේ. සමාජය කොතරම් සංකීර්ණ වුව ද ඒ නිසා ඇති වන බොහෝ ගැටළු නිරාකරණය කර ගැනීම ද පහසු වී ඇත.

සැලසුම් ගත නොවූ අර්ථ ක්‍රම පවතින රටවල ද බොහෝ විට අධ්‍යාපනික වශයෙන් ජාතික ප්‍රතිපත්තියක් තීරණය කොට ඇත. එවැනි ඇතැම් රටවල කවර දේශපාලන පෙරළියක් සිදු වුව ද සම්මත පොදු අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනස් නොවේ. මේ නිසා විධිමත් අධ්‍යාපන ක්‍රමයක් අඛණ්ඩව පවත්වා ගෙන යමින් ජාතියේ ප්‍රබුද්ධතාවක් ඇති කිරීමට හැකියාව ලැබී ඇත. එවැනි එක් රටකි, ඇමරිකාව. එහි ජාතික අධ්‍යාපන මණ්ඩලය අධ්‍යාපනය පිළිබඳ ඉතා වැදගත් ප්‍රතිපත්ති තීරණ ගනී. ඒ අනුව ශ්‍රේෂ්ඨ ප්‍රජාතාන්ත්‍රික පුරවැසියෙකු බිහි කිරීමේ ප්‍රතිපත්තිය දිගට ම පවත්වා ගෙන යයි. ඒ නිසා කවර දේශපාලන වෙනසක් වුව ද එම ප්‍රතිපත්තිය මත අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වෙයි. රුසියාව සැලසුම් ගත අර්ථ ක්‍රම පවතින රටවලට නිදසුනකි. මෙම රටවල් දියුණු ජාතියක් ගොඩ නැඟීමේ කාර්යය සඵල කර ගෙන ඇත්තේ මෙම තත්ත්වය නිසා ය.

අප රටට නවමත් ස්ථිර ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් පිළිබඳ නිශ්චයකට එළඹීමට හැකියාව ලැබී නැති බව පෙනේ. එබැවින් මෙහි දී පිරිවෙන් අධ්‍යාපනයේ මුඛ්‍යාර්ථ ජාතික පරමාර්ථ හා තුලනය කිරීම තරමක් අසීරු කරුණක් වී තිබේ. එහෙත් පවත්නා තත්ත්වය යටතේ ඒ පිළිබඳ කිසියම් විනිශ්චයකට එළඹිය හැකි ද යනු විමසා බැලිය යුතුව පවතියි.

ශ්‍රී ලංකාවේ ද වරින් වර ප්‍රතිපත්තිමය තීරණ ගෙන ඇති බව ද දක්නට ලැබේ. එහෙත් ඒවා අධ්‍යාපනයට අදළ යම් යම් කරුණු සම්බන්ධයෙනි. එසේ වුව ද ප්‍රතිපත්තිමය තීරණ වශයෙන් සම්මත කොට ප්‍රසිද්ධ නොකළ ද ඒ ඒ පාලන කාලවල දී යම් යම් ප්‍රතිපත්ති මත අධ්‍යාපනය මෙහෙය වූ බවත් තීරණ ගනු ලැබූ බවත් ඒවා ක්‍රියාවට නංවන ලද බවත් මෑත භාගයේ අධ්‍යාපන ඉතිහාසය පරීක්ෂා කර බලන විට පෙනී යයි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිසම සඳහන් කරන පරිදි කොමිසම වෙත පුන පුනා ලැබුණු පැමිණිලි අතර,

> ''(අ) ක්‍රමය අඩාල කරන හා ශිෂ්‍යයන්ගේ බලාපොරොත්තු නැති කිරීමට හේතු වන, පරිදි වරින් වර බලයට එන ආණ්ඩු අතර පමණක් නොව වරින් වර බලයට එන අමාත්‍යවරුන් අතර පවා අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අඛණ්ඩතාවක් නොමැති වීම''

එක් පැමිණිල්ලකි. අප්‍රකටව වුව ද ඒවා ඒ අනුවම වරින් වර වෙනස් වෙමින් පැමිණ ඇති බව අද අපට දක්නට ඇති කරුණකි. මෙසේ සලකා බැලීමේ දී අද පවතින ප්‍රතිපත්තිය පිළිබඳව ද කිසියම් ඉඟියක් ලබා ගත හැකි වනු ඇත.

දැනට මෙරට අධ්‍යාපනය වෙනස්කම්වලට භාජනය වෙමින් පවතියි. මේ වන විට අධ්‍යාපනය, සංවර්ධනය සඳහා යොද ගැනීමේ ආයාසයක් ඇති බව දක්නට ලැබේ. අද ජාත්‍යන්තර වශයෙන් පිළිගෙන ඇති ප්‍රතිපත්ති යකි මෙය. විශේෂයෙන් තුන්වන ලෝකයට අවශ්‍ය වූ ප්‍රතිපත්තියකි. ආර්ථික දරිද්‍රතාවෙන් පෙළෙන මෙම රටවලට ඉන් ගොඩ ඒමට සෑම සම්පතක් ම උපයෝගී කර ගත යුතුව පවතියි. අධ්‍යාපනය මිනිස් බල සම්පත සපයා දෙන මාධ්‍යයකි. එබැවින් එය ජාතික අවශ්‍යතා ඉටු කර ලීමේ ප්‍රධාන නියමුවෙකු බවට පත් වී තිබේ. එහෙත් එහි දී සංවර්ධනය වන රටවලට මුහුණ පෑමට සිදු වී ඇති ගැටළු රාශියක් ඇතත් ඒ පිළිබඳ සාකච්ඡා කිරීම මෙහි දී අදළ නොවේ.

සංවර්ධනය යන්නට අධ්‍යාත්මික යන වචනය ද ඇතුළත් ලෙස සැලකේ. එනම් භෞතික වර්ධනය පමණක් නොව අධ්‍යාත්මික වර්ධනය ද අවශ්‍ය ය. ජාතියක් රටක් පූර්ණ සංවර්ධනයක් කරා ගෙන යා හැකි වන්නේ එවිට ය. සංවර්ධනය පිළිබඳව පිළිගන්නා මතය වී ඇත්තේ මෙය යි. මෙය මෙහි දී අපට වැදගත් වන කරුණකි.

1943 දී නිදහස් අධ්‍යාපනය ආරම්භ වීමත් සමග ම පිරිවෙන් අධ්‍යාපනයට ද ව්‍යවස්ථාපිත පදනමක අවශ්‍යතාව සපුරාලමින් 1931 දී සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා විසින් ආධාර ලබන පාසල් පනත ඉදිරිපත් කරන ලද අතර පිරිවෙන් ද ඒ යටතට පත් විය. එහෙත් පිරිවෙන්වලට අදාළව නීති පහක් පමණක් ගැසට් නිවේදනයක් මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසිණි.

1959 දී එවකට මහජන රජයේ අධ්‍යාපන ඇමති ඩබ්ලිව්. දහනායක මහතා ''මග්නාකාර්ටා'' හෙවත් ''අතිඋතුම් නීති පනතක්'' ලෙස සලකා ව්‍යවස්ථා 36කින් සමන්විත පිරිවෙන් ව්‍යවස්ථා මාලාවක් ඉදිරිපත් කළේ ය.

එතෙක් ඉදිරිපත් වූ පනත් මගින් පිරිවෙන් අධ්‍යාපනයේ මුඛ්‍යාර්ථ ඉදිරිපත් කිරීමක් දක්නට නොලැබුනහ් විවිධ විෂයයන් ඇතුළත් විෂය මාලාවක් ඉදිරිපත් කරන ලදී.

1971 පිරිවෙන් අධ්‍යාපන විශේෂ කමිටු වාර්තාව පිරිවෙන් අධ්‍යාපනයට සම්බන්ධ කරුණු අටක් ද 1979 අංක 64 දරණ පිරිවෙන් පනතින් අරමුණු හා පරමාර්ථ ද ඇතුළත්ව පිරිවෙන් නව වර්ග කිරීමකට ද භාජනය වූ අතර මේ දෙක අතර ඇති සම විෂමතා ද සලකා බැලීම සුදුසු ය.

මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයේ කවදත් පැවති ජාතික උරුමයකි, පිරිවෙන. එහෙත් අද එහි පවතින රටාව අනුව මුළු රටේ ම අධ්‍යාපන ව්‍යුහය භාරව ක්‍රියා කිරීමට සවිමත් නොවන බව ද පිළිගත යුතුව ඇති කරුණකි. එසේ වුව ද එයට අයත් භූමිකාවක් ඇත. එය කවරේ ද යනු කරුණු සොයා බලා පරීක්ෂා කිරීම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් කරුවන්ගේ යුතුකමකි. මෙතෙක් එය නිශ්චය වූ බවක් දක්නට නැත. අද පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් ද රජය සැලකිය යුතු මුදලක් වැය කරන නිසා එම ජාතික උරුමය රැක ගන්නා අතර ම එය වඩා ඵලදායිතාවක් ඇති වන පරිදි ජාතික සංවර්ධනයට අදාළ කර ගත යුතුව ඇත. ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුව පවතී.

''පිරිවෙන'' යන වචනය ඇසෙන පමණින් ම අද බොහෝ දෙනා ''භික්ෂූන් වහන්සේ'' යන වචනය ද ඊට අනුරූපව යොද ගන්නා බව ප්‍රකට ය. පනතේ පැහැදිලි කිරීමෙන් පසු දූන් එහි පැරණි අයිතිය වූ ''ගිහි'' පිරිස පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව සනාථ වී ඇත. ප්‍රායෝගික වශයෙන් සලකා බලන විට විභාග වෙනුවෙන් උගන්නා ගිහි සිසුන් පිරිවෙන්වල අදත් දක්නට හැකි ය. ඔවුන්ගේ ප්‍රතිඵල ගැන ද ජනතාව තෘප්ත වී සිටිති.

පිරිවෙන් අධ්‍යාපනය ඉතිහාසය විසින් සනාථ කරනු ලැබ ඇති පරිදි ආධ්‍යාත්මික සංවර්ධනයට ප්‍රමුඛත්වයක් ලබා දී ඇත්තකි. එහෙත් නූතන විද්‍යාත්මක ලෝකයට අවශ්‍ය පරිදි එහි ඇතැම් අංග සංශෝධනය විය යුතුව පවතියි.

සැකවින් සලකතොත් පිරිවෙන් අධ්‍යාපනයේ මුඛ්‍යාර්ථය වන්නේ ද ධාර්මික සමාජයක් ගොඩ නැංවීම ය. ගිහි–පැවිදි දෙපක්ෂයට ම දෙනු ලබන ශික්ෂිත අධ්‍යාපනය තුළින් එය සිදු කළ හැකි බව කාලයා විසින් ද සනාථ කරනු ලැබ ඇත. පූජ්‍යස්ථානයක් ඇසුරු කොට ගෙන එය ක්‍රියාත්මක වීම නිසා එම කාර්යය ඉටු කිරීම වඩාත් පහසු වී තිබේ.

අතීතයේ දී මෙන් ම අද ද ජාතික නායකයන් වැඩි ප්‍රමාණයක් බිහි කර දී ඇත්තේ පිරිවෙන මගින් බව කරුණු විමසා බලන විට පෙනී යයි. යටත් පිරිසෙයින් පිරිවෙන් අධ්‍යාපනයේ ඇසුර වත් නොලැබූ විට දේශීයත්වය වටහා ගැනීමට පවා නොහැකි තත්ත්වයක් පවතින බව පෙනේ.

මෙහි දී ගිහියනට හා පැවිද්දනට එක ම අධ්‍යාපනයක් දීම පිළිබඳව පැන නැඟුණ ජනතා විරෝධය ගැන ද සලකා බැලිය යුතුව තිබේ. ගිහි ජීවිතයේ හා පැවිදි ජීවිතයේ අරමුණු හා පරමාර්ථවල වෙනස්කම් ඇති බව සත්‍යයකි. ඊට අනුරූප ලෙස එම අධ්‍යාපන ක්‍රමය ද සකස් විය යුතුව පවතියි. දනට පවතින ''විද්‍යායතන පිරිවෙන'' සංකල්පය එම අවශ්‍යතාව සලකා බලා ගොඩ නගා ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ දනට ක්‍රියාත්මක වන විද්‍යායතන පිරිවෙන්වල අධිකාරීන්ට නිසි අවබෝධයක් ලබා දුන හොත් ඒ මගින් ගිහි ජනතාවගේ අධ්‍යාපන ප්‍රගතියට වැදගත්, සේවයක් සැලසිය හැකි වනු ඇතැයි බලාපොරොත්තු තැබිය හැකි ය.

අනෙක් අතට ''මහා පිරිවෙන් සංකල්පය'' ගොඩ නගා ඇත්තේ පැවිදි සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා දීම සඳහා ය. ගිහි–පැවිදි පිරිස් බහුලව එකට ඉගෙනුම ලැබීමේ දී ඇති විය හැකි ඇතැම් ගැටළු නිරාකරණය කිරීම

මෙහි අරමුණ වී ඇති බව පැහැදිලි ය. මෑත භාගයේ දී ලැබූ විවිධ අත්දැකීම් මේ සඳහා පසුබිම් වන්නට ඇතැයි සැලකිය හැකි ය. ''ප්‍රාචීන භාෂා අධ්‍යාපනය'' මහ පිරිවෙන සංකල්පය තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂා කළ බව පෙනේ. එය ද බලාපොරොත්තු තැබිය හැකි දෙයකි.

''මූලික පිරිවෙන'' සංකල්පය ගොඩ නැඟී ඇත්තේ මූලිකව ම සාමණේර භික්ෂූන් ප්‍රතිපත්ති ගරුක පිරිසක් ලෙස හද ගැනීමට බව පෙනේ. එහෙත් මෙය පිරිවෙන් අධ්‍යාපන විශේෂ කමිටු වාර්තාවෙන් යෝජිත ක්‍රමය නොවන බව ද සැලකිය යුතු ය. එම වාර්තාව පෙන්වා දී ඇත්තේ සාමණේර පුහුණුව සඳහා වර්ෂ දෙකකට සීමිත සාමණේර පිරිවෙනකුත් 6, 7, 8 ශ්‍රේණි සඳහා කණිෂ්ඨ පිරිවෙනකුත් ය.

එක් අතකින් සලකන විට එම වාර්තාවේ යෝජිත එම පිරිවෙන් දෙකට වඩා මූලික පිරිවෙන නමින් එක ම ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීම වඩා වැදගත් කොට සැලකිය හැකි ය. අනෙක් අතට එසේ පිරිවෙන් දෙකක් වශයෙන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගික ගැටළු පැන නඟින බැවින් එය අසීරු දෙයකි.

වාර්තාවෙන් හා පනතෙන් එක ලෙස ම අපේක්ෂා කර ඇත්තේ හුදෙක් සාමණේරවරුන් හොඳින් පුහුණු කර ගැනීම ය. එය උචිත සංකල්පයක් ලෙස සැලකීමට කරුණු තිබේ.

බාල අවධියේ වෙසෙන අලුත පැවිදි වූ සාමණේර භික්ෂූන් වහන්සේ පැවිද්ද පිළිබඳව හෝ ජීවිතය පිළිබඳව ලැබූ අල්ප අත්දැකීම්වලින් යුක්ත ය. එබැවින් එම පිරිසට විධිමත් ප්‍රාථමික අධ්‍යාපනයක් දිය යුතු ය. අරමුණු හා පරමාර්ථ සාර්ථක ලෙස සඵල කර ගත හැකි වන්නේ එවිට ය. එය පැවිදි ජීවිතයට ශක්තිමත් පදනමක් වැටෙන ආකාරයෙන් සකස් වී තිබිය යුතු ය. විෂය මාලාව හා වෙනත් අංග සාකල්‍යයෙන් ම ඊට අනුරූප විය යුතු ය.

මෙම අධ්‍යාපන ආයතන මගින් බිහි කරනු ලබන පුද්ගලයන් ධර්මශාස්ත්‍රීය උගතුන් වශයෙන් පමණක් නොව ජාතික දේහයට අවශ්‍ය නායකයින් වැනි තවත් මානව සම්පත් ය. මෙම සම්පත් සියල්ල හුදෙක් පාසලට පමණක් සැපයීම කළ නොහැකි බව කිව යුතු ය. පාසල සමාජ

යෙන් වෙන්ව පවතින ඒකීය ආයතනයකි එහෙත් පිරිවෙන ආගම හා සමාජය සමඟ ඉතා සමීප සම්බන්ධතාවක් ඇතිව පවතින්නකි. එබැවින් එය සමාජමය ආයතනයකි.

ආගම සමාජ උපපද්ධතියකි. අධ්‍යාපනය ද එසේ ය. මෙයින් පැහැදිලි වන්නේ උපපද්ධතීන් දෙකක ඒකරාශී වීමක් පිරිවෙන තුළින් සිදු වන බව යි. එබැවින් එය ශක්තිමත් බැම්මකි. සමාජ ප්‍රගතියට බෙහෙවින් එය ඉවහල් කර ගත හැකි වන්නේ එහෙයිනි.

ශ්‍රී ලංකාව 80%ක් පමණ ගම්බද ජනතාවගෙන් යුත් සමාජ ක්‍රමයක් පවතින රටකි. කොතෙක් අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත කළ ද ඒ සියල්ල මෑතේ බොහෝ විට නගරයට සීමා වන බව මෙතෙක් කරන ලද පර්යේෂණ වලින් පෙනී ගොස් ඇත. මෙසේ සලකන විට දිනෙන් දින දියුණු වන නාගරික පාඨශාලා පද්ධතියෙන් පොදු ජනතාවට — ගැමි සිසුන්ට ප්‍රයෝජන යක් ගැනීමට ඇති ඉඩකඩ සීමිත ය.

එහෙත් පිරිවෙන් අධ්‍යාපනය ගම්බද පෙදෙස් ඇසුරු කරමින් වඩාත් ක්‍රියාත්මක වීම නිසා ඔවුනට එයින් ඵල නෙලා ගැනීමට ඇති ඉඩකඩ වැඩි වේ. එසේ ම ඔවුන් දැහැමි ලෙස ශික්ෂිතව හැඩ ගැසීමට ද එය මහත් වන්නේ සමාජ සම්බන්ධතා සමඟ ආගමික සම්බන්ධතා ද පාසලට වඩා එයට බලපාන බැවිනි. පාසලට මෙම තත්ත්වය උද කර ගැනීමට නොහැකි වන බාධක වන කරුණු රාශියක් විද්‍යමානව පවතී.

මේ අනුව සලකා බලන විට පිරිවෙන් අධ්‍යාපනය පොදු ජන අධ්‍යාපන යක් වශයෙන් ද හැඳින්විය හැකි ය. ඉන් බිහි වන සමාජය ඒ නිසා දැහැමි සමාජයකි. ජාතික පරමාර්ථය දැහැමි සමාජයක් ගොඩ නැංවීම නම් ඒ සඳහා උපයෝගී කර ගත යුතු තවත් මාධ්‍යයකි, පිරිවෙන් අධ්‍යාපනය. එබැවින් එය ජාතික අධ්‍යාපනයේ අංශයක් වශයෙන් සලකා එයට හිමි භූමිකාව කුමක්ද යි පරීක්ෂා කර බලා නිශ්චය කළ යුතුව පවතී. එවිට සමාජ සංරක්ෂණයට සහ ශුභසිද්ධියට මහත් පිටුබලයක් අත්වනු දැකිය හැකි ය.

අද ලෝකය මෙන් ම දැනුම ප්‍රසාරණය වීම ද ඉතා වේගයෙන් සිදු වන්නකි. මේ නිසා කවර දැයක් වුව ද ''පැරණි'' බවට පත් වන ස්වභාවයක් පෙන්වයි. මේ තත්ත්වය වටහා ගත් හැම කෙනෙකු ම අවදිව සිට අලුත් වන්නට උත්සාහ දරණ බව පෙනේ. පුද්ගලයෙකු වශයෙන් පමණක්

නොව රටක්, ජාතියක් වශයෙන් ද අද තත්ත්වය එය යි. එබැවින් හැම විට ම දියුණු රටවල් මෙම තත්ත්වයට මුහුණ දිය හැකි ආකාරයෙන් කටයුතු සම්පාදනය කරයි. ඒ නිසා ය, ඔවුනට තම ශක්තිය, බලය තහවුරු කර ගැනීමට හැකි වී ඇත්තේ.

මෙම තත්ත්වය උදා කරලීමෙහි ලා මූලික වන අයෝමය බලවතා ලෙස පෙනී යන්නේ විද්‍යාව යි. ඒ සමග වූ තාක්ෂණය යි. මොහොතින් මොහොත නව දැනුම්, නිපැයුම් මඟින් ලෝකය තුළ පමණක් නොව මුළු මහත් විශ්වය තුළ ම පෙරළියක් සිදු වෙමින් පවතී. මේ නිසා විද්‍යාවේ තාක්ෂණයෙන් තොරව ජීවත් විය නොහැකි තරමට පරිවර්තනය වී ඇත. සමාජ රටාව, මානව චින්තනය, සංස්කෘතිය ආදි සියල්ල පරිවර්තනයට භාජනය වෙමින් පවතී. මේ නිසා මානව ශිෂ්ටාචාරයේ පැවැත්ම පිළිබඳව ඇතැම් උගත්තු බිය පළ කරති.

මෙම තත්ත්වයෙන් ශ්‍රී ලාංකික සමාජයට පමණක් වෙනස් විය නොහැකි ය. සංඝ සමාජයට ද එසේ ය. එය ද සමාජ උපපද්ධතියක් වන බැවිනි. එසේ නම් මෙය වූ කලී අද අප ඉදිරියේ ඇති ප්‍රබල ම අභියෝගය යි. මෙම අභියෝගයන්ට මුහුණ දීමට නම් හැම දෙනාට ම විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අල්ප වූ හෝ දැනුමක් ලබා ගත යුතුව පවතියි. එය ඇත්තෙන්ම අද පාසල් ශිෂ්‍යයාට ලබා ගත හැකි අයුරින් එම විෂයමාලා සම්පාදනය වී තිබේ. මූලික පිරිවෙනේ සමාන්තර ශ්‍රේණිවල ඉගෙනුම ලබන පැවිදි ශිෂ්‍යයාට එය උචිත ලෙස තිබේදැ යි නියමිත විෂය නිර්දේශය පරීක්ෂා කර බලන විට නිගමනය කිරීම අසීරු ය. පැවිදි ජීවිතයට යෝග්‍ය එහෙත් පුද්ගලයෙකු වශයෙන් අවශ්‍යයෙන් ම ලබා ගත යුතු මූලික විද්‍යා ඥානය ඔවුනට ද නොඅඩුව ලැබීමට ඉඩ සැලසිය යුතු ය. එසේ නොවුන හොත් ඔහු සමාජයට මුහුණ පෑමේ දී විවිධ ගැටළු පැන නඟී.

විද්‍යාවේ හා තාක්ෂණයේ මේ ප්‍රගතිය සෑම අංශයක් කරා ම පැතිර ගොස් ඇත. ඒ හැම අංශයක් ම මිනිස් ජීවිතය හා තදින් බැඳී පවතියි. එබැවින් ඒවායේ බලපෑම් නොවැලැක්විය හැකි ය. එසේ ම ජීවිතවලට එයින් වන යහපත මෙන් ම අයහපත ද දත යුතු ය. එසේ නොවූ විට ජීවිතය පවත්වා ගැනීම ද අපහසු වේ. නිදසුනක් ලෙස විදුලිය ගත හැකි ය. මෙය වැඩදයක මෙන් ම අවැඩදයක ද වේ. එහි තාක්ෂණය අද ජීවත් වන හැම දෙනෙකු විසින් ම යම් පමණට දැන ගෙන සිටිය යුතු ම ය. පැවිදි ශිෂ්‍යයාට වුව ද මෙවැනි මූලික දැනුම ලබා දිය යුතු ය. මූලික පිරිවෙන්

විෂය මාලාවේ සාමාන්‍ය විද්‍යාව යනුවෙන් විෂයයක් නියම කර ඇත. එහෙත් එහි ''සාමාන්‍ය'' යන වචනය යෙදීම පවා දෝෂ සහිත ය. එයින් ශිෂ්‍යයා තුළ පහළ වන සංකල්පය ද අනුචිත ය. කෙළින් ම විද්‍යාව යන වචනය යෙදීමෙ වරදක් නොපෙනේ. විෂය නිර්දේශය විට වඩා පුළුල් කළ යුතුව තිබේ. අවශ්‍ය මූලික දැනුම ප්‍රමාණවත් ලෙස ලැබෙන ආකාරයකි.

ලොව විශාලම පෙරළිය මෙසේ සිදු වී ඇත්තේ විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව නිසා ය. ඒ අතර ඒ නිසා ම නවත් බලවේග අභිනවයෙන් පැන නැඟී ඇත. විද්‍යාව අද ආගමට තර්ජනයක් වී ඇත. එහෙත් එබඳු තර්ජන වූ ආගම තමාට ඇති අභියෝගයට කෙසේ මුහුණ දිය යුතු ද යි විමසා බලා අවශ්‍ය පරිදි සංශෝධන සහිතව එම දහම ලෝකයට අලුත් ම මුහුණුවරකින් ඉදිරිපත් කරයි. ඔවුන්ගේ ධර්මදූත කටයුතුවලට ඒවා උපයෝගී කර ගනී. එබැවින් ඔවුන් අද ඉතා සියුම් ක්‍රම උපයෝගී කොට ගෙන එම අභියෝග ජය ගනිමින් තම ආගම ලොව පුරා උපක්‍රම මාර්ගයෙන් පතුරුවති. ශ්‍රී ලංකාවේ ද තත්ත්වය එබඳු ය. මෙතෙක් කිසි පර්යේෂණයක් කර නැතත්, ශීඝ්‍රයෙන් බෞද්ධාගම පිරිහී ගෙන යන බවට කරුණු පෙන්විය හැකි ය. මෙය සිදු කරනු ලබන්නේ විවිධ උපක්‍රම මඟින් වුව ද ඒවා තේරුම් ගැනීමට තරම් හැකියාවක් සංඝ සමාජයට පමණක් නොව ඇතැම් විට ගිහි සමාජයට ද නැති බව පෙනේ. ඒ බව දිනපතා එම උපක්‍රමවලට හසුවන ගිහියන් පමණක් නොව පැවිද්දන් ගැන ද සලකා බලන විට මැනැවින් පැහැදිලි වෙයි. මෙසේ ශීඝ්‍රයෙන් බෞද්ධයන් සංඛ්‍යාත්මක මෙන් ම ගුණාත්මක වශයෙන් ද පරිහානියට පත් වෙමින් පවතියි.

මෙබඳු දේ තේරුම් ගත හැකි සමාජ විඥානයක් ඇති වන ආකාරයෙන් අධ්‍යාපනය සකස් විය යුතු ය. දැනට ක්‍රියාත්මක වන විෂය මාලාව වුව ද එම තත්ත්වය ඉටු කරන බවක් නොපෙනේ. බුද්ධ ධර්මයේ එන කරුණු පවා අබෞද්ධ පූජකවරුන් ඉගෙන ඒවා විකෘති කොට පොතපත ලියා ඒවා ලොව පුරා ප්‍රචාරය කරති. මෙරට නූගත් ජන කොටස් අතර ඒවා වැරදි ලෙස විග්‍රහ කර පතුරුවා හරිති. ඒ සමඟ ම ඔවුන්ගේ ධර්මය ගැන ද කරුණු කියා දෙති. ඒවා විද්‍යාවට සම්බන්ධ කර පෙන්වති. එහෙත් අද වැඩිහිටි ඇතැම් භික්ෂූන්ට පවා මේවා තේරුම් ගැනීමට නොහැකි ව ඇත. ඒ ඔවුන් ලබා ඇති අධ්‍යාපනයේ වරදිනි. නවක භික්ෂුවට ඊටත් වඩා ශක්තිමත් පදනමක් වැටී නොතිබුණොත් ඔවුනට ඒ තරමේ වත් ශක්තියක් ලැබේ ද යනු සැක සහිත ය. අද ඇතැම් පැවිදි සිසුන් විවිධ උපක්‍රම නිසා ඒවාට ඇදී යන ආකාරය දෙස බලන විට ඒ බව පෙනී යයි.

ඇතැම් අබෞද්ධ පූජකයෝ මැනවින් පාළි භාෂාවෙන් කථා කරති. සංස්කෘතයෙන් කතා කිරීමට සමත්තු ද සිටිති. දේවවාදී ආගම්වලට අයත් වූ මොවුහු නුදුරු අනාගතයේ දී භික්ෂූන් වහන්සේට ද බුද්ධ ධර්මය ඉගැන්වීමට ඉදිරිපත් වනු ඇත. දනටමත් ඔව්හු යුරෝපයේ විශ්වවිද්‍යාල වල බෞද්ධ දර්ශනය පිළිබඳ දේශන පවත්වති. බෞද්ධ දර්ශනය පිළිබඳ ජාත්‍යන්තර උගතුන් ලෙස පෙනී සිටින ඇතැම් එම අන්‍යාගමික පූජකවරු බෞද්ධ දර්ශනයේ හරය විකෘති කළ අවස්ථා ඇත. විවිධ ආගම් හා දර්ශන පිළිබඳ අධ්‍යයනය කිරීමට ඔවුන්ට හැම පහසුවක් ම එම ආගමික ආයතන වලින් ලබා දී ඇත.

එහෙත් සංඝ සමාජයේ සැබෑ තත්ත්වය පරීක්ෂා කර බලන විට කෙබඳු ද ? ඇත්තේ එහි අනෙක් පැත්ත ය. හේතුව කුමක් විය හැකි ද ? ප්‍රාථමික වශයෙන් මෙන් ම පශ්චාත් ප්‍රාථමික හා උසස් අධ්‍යාපනයේ දී ද ඔවුනට ලැබෙන්නේ එම අභියෝග කවරේ දැ යි තේරුම් කර ගෙන ඒවාට පිළියම් යෙදිය හැකි පිරිසක් බිහි වන ලෙස සැලසුම් කරන ලද විධිමත් අධ්‍යාපනයක් නොවේ. අවුරුදු අටක් පාලි භාෂාව ඉගෙනීමෙන් පසුවත් පාලියෙන් වචන කීපයක් එකතු කොට ව්‍යවහාර කිරීමට අසමත් නම් එම අධ්‍යාපනයේ ඵලදයිතාව කෙබඳු ද යනු විමසීමට ලක් කළ යුතු ය. ඒවා මළ භාෂා ලෙස සලකා ඉගෙන නොගන්නේ කවර හෙයින් ද යනු ගැඹුරින් සලකා බැලිය යුතු ය. බුදු දහම ඉගෙනීමට පසුබටතාවක් ඇද්ද යනුත් විමසා බැලිය යුතු ය.

විවිධ භාෂා ශාස්ත්‍ර ඉගෙනීමට විවිධ නවීන පහසු ක්‍රම අද නිපදවා ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ පාලි, සංස්කෘත තවමත් උගන්වන්නේ අවුරුදු 2500කට පෙර ක්‍රමයට යි. අද ලෝකය එයට සූදනම් නැත. සන්නිවේදන මාර්ග යෙන් විවිධ සොයා ගැනීම් ගැන දැන ගන්නා ශිෂ්‍යයා වඩා ඵලදයි ඉගෙනුම කට වඩා පහසුවෙන් හා ඉක්මණින් ලබා ගැනීමට පෙළඹීම ස්වභාවික ය. එහෙත් ඒ ගැන සොයා බලා අධ්‍යයනය කර ඊට පිළියම් යෙදීමට තරම් මෙතෙක් කිසිම පියවරක් ගෙන නැත. මේ නිසා නවක භික්ෂුවගේ නොමඟ යාම වැලැක්විය නොහැකි කරුණක් වී ඇත.

මෙයින් පෙනී යන්නේ ආගමික් තරගයක් ද ඒ සමඟ පතුරුවා විෂයයන් පිළිබඳ ඇති ආර්ථික හා සාමාජික අගයයන් සම්බන්ධ වූ අභියෝගවලට ද මුහුණ දීමට සිදු වී ඇති ආකාරය යි. අද වාණිජත්වය මුළු ලොව ම ගිල ගෙන ඇත. එබැවින් සාරධර්මවලට වඩා ආර්ථික අගයට ප්‍රමුඛත්වය

ලැබී තිබේ. නවක භික්ෂුව පවා ඒ අතට ඇදී යන්නට පටන් ගෙන ඇත. මෙය බලාපොරොත්තු විය යුත්තකි. එහෙත් එයට බුද්ධිමත් ලෙස පිළියම් යෙදිය යුතු ය. එම ඇල්ල වටහා ගෙනයි පිළියම් යෙදිය යුත්තේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාවේ එන පහත දැක්වෙන අදහස ද සැලකිල්ලට ගැනීම මෙහි දී වැදගත් ය.

> "විශ්වවිද්‍යාල ඇතුළුව සියලු අධ්‍යාපන ආයතනවල විෂයමාලා සැලසුම්ගත ආකාරයට සමීක්ෂණයට හා සංශෝධනයට යටත් කළ යුතු ය. වෙනත් අධ්‍යාපන ආයතන හා සේවා යෝජකයන්ගේ ආභාෂය නිසා ක්‍රියාකාරී විෂයමාලාව ප්‍රගති සමාලෝචනය හා සමීක්ෂණය කිරීමටත්, අවශ්‍ය දැනුම් සම්භාරයන් හඳුනා ගැනීමටත්, වෙනස් වන අවශ්‍යතා හඳුනා ගැනීමටත්, හැකි වන පරිදි නියමිත පිළිවෙලකට එක් රැස්වන විෂයකමිටු සෑම ආයතනයකට ම තිබිය යුතු ය."

විවිධ නාස්තිවාදී දේශපාලන හා ආර්ථික අදහස් ලොව පුරා පැතිරෙමින් පවතී. මෙම විෂම අදහස් ගලා ආ විට ඊට ඔරොත්තු දෙන ශක්තියක් තමා ලැබූ අධ්‍යාපනය තුළින් ගොඩ නඟා ගෙන නැති පුද්ගලයා ඊට වහල් වන බව පැහැදිලි ය. 1971 දී තරුණ භික්ෂූන් ක්‍රියා කළ ආකාරයත් දැන් ඔවුන් පවසන අදහසුත් විමසා බලන විට ප්‍රාථමික අධ්‍යාපනය ක්‍රම නිසි වගකීම ඉටු නොකිරීම නිසා එවැනි ශෝචනීය දේ සිදු වූ බව එක්තරා ප්‍රමාණයකට හෝ පිළිගැනීමට සිදු වී ඇත. බුදුසමයේ එන විවිධ ඉගැන්වීම් මෙන් ම ආචාර සමාචාර වත්පිළිවෙත් ගැන ද ඔවුන් දෙන විෂම අදහස් ගැන තුලනාත්මකව සිතන්නට තරම් ශක්තියක් ලැබෙන පරිදි විෂය මාලාව සැකසී තිබිය යුතු ය.

චින්තන ප්‍රවාහය ලොව පුරා අලුතින් හඹා යාමේ ප්‍රතිඵල වශයෙන් ආකල්පමය වෙනස්කම් ද සිදු වෙමින් පවතියි. අද තරුණ පරපුර තුළ ඇති සිතුම් පැතුම් හා ආකල්ප දෙස බලන විට මෙය පැහැදිලි ය. යල් පැන ගිය මිථ්‍යා විශ්වාසවල හැමදා රඳවා ගෙන සිටිය යුතු නැත. එහෙත් බෞද්ධ දර්ශනික අදහස් මත ගොඩ නැඟුණු සමාජ විද්‍යාත්මක අගයක් ඇති බෞද්ධ චාරිත්‍ර, කෙනෙකු පරිභවයට ලක් කරන විට ඒ තර්ක බිඳ දැමීමට තරම් ශක්තිමත් බුද්ධියක්, දැනුමක් මෙන් ම ආකල්ප සමෘද්ධියක් ද හැදෙන වැඩෙන භික්ෂූන් වහන්සේ තුළ ඇති කර තිබිය යුතු ය. මෙය ද අද ඇති තවත් අභියෝගයකි.

මෙම අභියෝගවලට මුහුණ දීමේ ශක්තිය ලබා දිය යුත්තේ ප්‍රාථමික අධ්‍යාපනයෙනි. කවර හෙයින්ද යත් ? භික්ෂූන් වහන්සේ කෙනෙකු වශයෙන් මූලික පදනම වැටෙන අවස්ථාව බැවිනි.

දැනට ක්‍රියාත්මකව පවතින මූලික පිරිවෙන් විෂය මාලාව දෙස බලන විට එක වර ම පෙනී යන කරුණකි, එය ගතානුගතික ස්වභාවයක් ගැනීම. එයින් අදහස් වන්නේ පැවිදි බිමට එන ශිෂ්‍යයා යම් ප්‍රමාණයක පාඨශාලීය අධ්‍යාපනයට හුරුවක් ලබා ය, පැමිණෙන්නේ. ඔහු පැවිදි වන්නේ සංසාරික පුරුද්දත් ශ්‍රද්ධා භක්තියත් නිසයි. ටික කලක් යන විට කටුක බවක් දැනෙන අධ්‍යාපන ක්‍රමයට වැටෙන ඔහුට සියල්ල එපා වෙයි. එතැන් සිට ඔහු මානසිකව පරාජිතයෙක් වෙයි. ලජ්ජාව නිසා පැවිද්දේ සිටිය ද, මානසිකව පීඩා විඳී.

භාෂා ඉගැන්වීම සඳහා නූතන ක්‍රම ශිල්ප කිසිත් අනුගත ආකාරයක් විෂයමාලාව තුළින් නොපෙන්වයි. ධර්මය ගැන ද අර්ථවත් අවබෝධයක් ඇති කරන ආකාරයෙන් සැකැසී ඇති බවක් දක්නට නැත. සාමණේර භික්ෂුව තුළ ඇති විය යුතු ශ්‍රද්ධාදී ගුණාංග වැඩෙන ආකාරයක් සැකැසී නැත.

පුද්ගල සංවර්ධනය සමඟ මානසික සෞඛ්‍යය ද රැක ගනිමින් භික්ෂු ජීවිතයේ හරය පිළිබඳ නිසි අවබෝධයක් ක්‍රමයෙන් ගොඩ නැඟෙන ආකාරයට සැකැසුණු පිළිවෙලක් විෂය මාලාව තුළ දක්නට නැත.

ග්‍රන්ථ නියම කිරීම විෂයමාලා සම්පාදනයක් නොවේ. එය ද උපයෝගී වෙතත් අපේක්ෂා විය යුත්තේ අවශ්‍ය ප්‍රජානන, ආවේදන හා මනෝචාලක ගොඩ නැඟෙන ආකාරයට ක්‍රමබද්ධ වැඩපිළිවෙලකි. එවැනි ස්වරූපයක් මෙම විෂයමාලාව පරීක්ෂා කර බලන විට දක්නට නොලැබේ. මෙය හුදෙක් ග්‍රන්ථ ලේඛනයකට සමාන අනුවිස්තරයක් පමණි. මෙවැනි නිර්දේශයක් ගුරුවරයා ද තම තමාට රිසි පරිදි එය කිරීමෙන් ශිෂ්‍යයා පමණක් නොව ගුරුවරයා ද අතරමං වේ. පාසල් විෂය නිර්දේශ සමඟ සසඳා බැලීමේ දී මෙය වඩාත් මැනවින් පැහැදිලි වේ.

මේ අනුව ක්‍රියාත්මකව පවතින නූතන පිරිවෙන් විෂය මාලාව එකී අවශ්‍යතාවලට විසඳුම් ලබා දෙන ස්වරූපයක් නොදක්වන බව පෙනී යයි. එහෙයින් එය සංශෝධනය විය යුතු තත්ත්වයක පවතී.

## ආශ්‍රිත ලේඛන

1. පිරිවෙන් අධ්‍යාපන විශේෂ කමිටු වාර්තාව — සැසි වාර්තාව, 1971

2. පිරිවෙන් පනත—අංක 64—1979

3. නව මූලික පිරිවෙන් විෂය මාලාව, අධ්‍යාපන අමාත්‍යාංශය

4. පාසල් විෂය නිර්දේශය—6, 7, 8, අධ්‍යාපන අමාත්‍යාංශය

5. මහජන රජය සහ පිරිවෙන් අධ්‍යාපනය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 1959

6. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව, 1992 මැයි, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

7. තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව — 1990 මාර්තු ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

---

මම ක්‍රිස්තුස් වහන්සේ අදහන්නෙක්මි. එසේ වූ නමුත් ඇත්ත කිව යුතු ය. අද ලොව ඇති ලබ්ධි අතුරින් ගෞතම බුදුන් වහන්සේගේ ධර්මය සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ ය.

— හියු ප්‍රයිස් හියුස් තුමා

# බුදු සිරිත කෙලෙසීමේ මහා කුමන්ත්‍රණය

බුද්ධපුත්‍ර

වසර දහස් ගණනක් තිස්සේ ද්‍රවිඩ හා හින්දු ආක්‍රමණිකයන් විසින් හා සියවස් පහක පමණ කාලයක සිට කතෝලික හා විවිධ ක්‍රිස්තියානි කුරුස ආක්‍රමණිකයන් විසින් මෙරටින් බුදු සසුන අකාමකා දැමීම සඳහා විවිධ වූත් විචිත්‍ර වූත් ඕලාරික වූත් සියුම් වූත් නොයෙකුත් ආක්‍රමණික උපක්‍රමයන් යොදා ගත් හා යොදා ගනිමින් තිබෙන අයුරු ඉතිහාසයෙන් මෙන් ම වර්තමානයෙන් ද පෙන්නුම් කර දෙයි.

එහි දී ඔවුන් විසින් ඉලක්ක කොට පහර දෙන මූලික අංශයන් වී ඇත්තේ බුදුන්, දහම් හා සඟුන් යන ත්‍රිවිධ රත්නය යි. එයිනුත් බුද්ධ රූපය හා බුද්ධ චරිතය ප්‍රමුඛස්ථානයක් ගනී. මෙය දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද මේ ආක්‍රමණික සංවිධාන විසින් සංවිධානාත්මක ස්වරූපයකින් සිදු කරන්නක් බව එය ක්‍රියාවට නැගෙන අයුරින් පැහැදිලි වේ. එහි දී එක් පැත්තකින් බුද්ධ රූපය නොයෙකුත් පහත් වෙළඳ සලකුණු වශයෙන් යොදා ගන්නා අතර තවත් පැත්තකින් බුද්ධ චරිතය හා බෝසත් චරිතය සම්බන්ධයෙන් නොයෙකුත් ශාස්ත්‍රීය විවේචනයන්ගේ මුවාවෙන් අසන කියවන අය තුළ උන්වහන්සේ කෙරෙහි පහත් අශ්ශීල ආකල්පයක් ඇති වන ආකාරයෙන් බුදු රජුන්ගේ ලෝකෝත්තර බුදු ගුණයන් අකාමකා දමා උන්වහන්සේ ද නූතන නවකථා, කෙටිකථා ආදියේ එන කෙලෙස්බර මිනිසෙකු ලෙසින් නිරූපනය වන ආකාරයෙන් බස යොදා ගනිමින් ලිවීම, කිවීම කරනා අයුරු ද දක්නට ඇත.

එයින් ඔවුන් අපේක්ෂා කරන්නේ මේ රටේ පොදු ජනතාව වසර දහස් ගණනක් තිස්සේ අලෞකික ආධ්‍යාත්මික ගෞරව පූර්වක ශ්‍රද්ධා භක්තියෙන් වන්දන මානනය කරමින් මහත් ගරු සත්කාරයෙන් හා සම්මානනයෙන් පරම පූජනීයත්වයෙන් වැඳුම් පිදුම් කරමින් තම විමුක්ති මාර්ගය හෙළි කර දුන් මාර්ගෝපදේශකයාණන් ලෙසින් ජනිත කොට ගෙන තිබූ පිළිගැනීම විශ්වාසය සිඳබිඳ දමා ඔවුන් තුළ තිබූ ශ්‍රද්ධා භක්තිය දිය කොට හැරීම යි.

වර්තමානයේ ඉතා ඕලාරික හා නින්දිත අයුරින් හා ආක්‍රමණික ස්වරූපයෙන් මෙ කාර්‍ය සඳහා ම අරඹා ඇති ආයතනයක් ලෙස කොළඹ 5, නාවල පාරේ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය හැඳින්විය හැක. චාර්ල්ස් අබේසේකර හා ජයදේව උයන්ගොඩ ආදීන්ගේ සංස්කාරකත්ව යෙන් පළ කෙරෙන ප්‍රවාද නම් වූ සඟරාව ඒ සඳහා පෙරමුණ ගෙන සිටින අතර මේ කොන්තරාත්තුව භාර ගෙන ක්‍රියා කරන රංජිත් පෙරේරා එම ද්විමාසිකයේ සෑම කලාපයක දී පාහේ ම බෞද්ධ සාහිත්‍යයේ එන කිසියම් කරුණක් මාතෘකා ලෙස ගෙන එමගින් බුදුන්වහන්සේටත් උන්වහන්සේගේ ධර්මයටත් සසර පතා ගෙන ආ වෛරයක් පිරිමසන්නාක් මෙන් නවනින්ද බිණිමින් ඒක පාක්ෂික අසත්‍ය අභූත විවේචනයන් කරමින් එම කරුණු පිළිබඳ හයක් හතරක් නොදන්නා වූ බොළඳ ජනතාව නොමග යවන ආකාරයේ ශ්‍රද්ධාවත් බෞද්ධ ජනතාවගේ සිත්පිත් සංවේගයට පත් කරන ආකාරයේ විවේචනයන් කරමින් මෙරට විවේචන කලාව ද ගණිකා වෘත්ති යෙහි යොදවයි.

තමා ඒ දහම පිළිගත්ත ද නොගත්ත ද කවරෙකුගේ හෝ ආක්‍රමණික බැලමෙහෙවරක යෙදී සිටිය ද නොසිටිය ද මානව අයිතිවාසිකම් පිළිබඳ මහ උජාරුවට ඔවුන්ගේ ම මාධ්‍ය මගින් ගෝරනාඩු කරන මේ යුගයේ නොව මීට පෙර නොදියුණු යැ යි සම්මත වූ කෝපි කාලයේ පවා කිසියම් පිරිසක් විසින් තම ශාස්තෘවරයා ලෙස ගෞරව සම්භාවනාවෙන් සලකනු ලබන සහ ධාර්මික උදර චරිතයක් පිරිහෙළා අවමානයට ලක් කිරීමේ පහත් හීනමානික ආත්මලාභී චේතනාවට වසඟ වී මේ ක්‍රියාදාමය හැර වෙනත් අරමුණක් නොමැති ව ලිවීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබූ පමණින් ඉවක් බවක් නොමැතිව අවමානයට ලක් කරමින් ආත්ම තෘප්තියක් හෝ ආත්ම ලාභයක් ලැබීම ශිෂ්ට ලෝකය අනුමත කරන්නක් නොවේ.

බුදුරජාණන් වහන්සේ වනාහි අතීතයේ මෙන් ම වර්තමානයේ දී කෝටි ප්‍රකෝටි ජනකායකගේ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයාණ කෙනෙකි. උන්වහන්සේට ගෞරවාදර වන්දනමානන පූදපූජා පැවැත්වීමටත් උන්වහන්සේ දෙසූ මඟ නිවැරදිව දැන අනුගමනය කිරීමටත් උන්වහන්සේගේ ශ්‍රාවක ශ්‍රාවිකාවනට නිදහස ඇත. උන්වහන්සේගේ ධර්ම මාර්ගය අනුව යන අපි පමණක් නොව ෂොපන් හොවර් වැනි විශ්ව කීර්තියට පත් මහා දර්ශනිකයෝ පවා බුදුරජුන් තුළ පැවති විතරාගී ගුණය දහමේ ඇති ස්වාක්ඛාත ආදී ගුණ හා ආර්‍ය මහා සංඝ රත්නයේ සුපටිපන්න ආදී ගුණ ඉතා උසස් ලෙස පිළිගෙන ඇත. එහෙත් බුදු සිරිත කෙලෙසා තම පහත් අභිමතාර්ථයන් ඉටු කර ගැනීමට තතනන මේ දෘෂ්ටි විපරීතතාවෙන් පෙළෙන තම මිථ්‍යා ඝෝෂාව මෙරට තුළ පතුරුවා හැරීමට ඇති එක ම බාධාව බුදු දහමත් සහ සසුනත් බව දැක ඒවා අකාමකා දැමීම එක ම අරමුණ

ලෙස ගනිමින් බුදු දහම කණපිට පෙරලමින් තමන්ගේ අල්පඥතාවත්, බෞද්ධ විරෝධයත් පළ කරමින් බුදුරජුන් සරාගී, කාම ඊෂ්‍යාවෙන් පෙළුණ ඔවුන්ගේ කසිකබල් නවකථාවලින් වීරයන් ලෙස මවා පෙන්නූ නෂ්ටකාමයෙන් පීඩාවට පත් විකෘති කාමාසාවන්ගෙන් යුතු මහා සල්ලාල යෙකු කුපාඩියෙකු ලෙසින් ප්‍රවාද සවන කලාපයේ දී රංජිත් පෙරේරා නමැති නරුමයා හඳුන්වා දෙයි. භික්ෂුණී ශාසනය පිහිටුවීමේ දී බුදුරජුන් පනවා වදාළ සප්ත අපරිහානි ධර්මයන්හි ගම්භීරාර්ථ නොදකින නොදනෙන මේ පාපේච්ඡයා බුදුරජුන් පුරුෂාධිපත්‍යය සඳහා බණ දෙසූ කාම ඊෂ්‍යාවෙන් පෙළෙන්නෙකු ලෙස නින්ද්‍ා අපහාසයට ලක් කරයි. ජාතක කථාවන්හි එන ගැඹුරු මනෝ විශ්ලේෂණාත්මක ඉගැන්වීම් ආත්මාර්ථ සාධනය සඳහා ම විකෘති අර්ථකථනයන්ට භාජනය කරයි.

අනෙකුත් භාෂාවන්හි කෙසේ වෙතත් සිංහල භාෂාවෙහි බුදුරජුන් හැඳින්වීම සඳහා විවිධ වූත් විචිත්‍ර වූත් අභිධානයන් හා විශේෂණ නාමයන් සමුදයක් වසර දහස් ගණනක් තිස්සේ මෙරට පොත පත ලියූ ලේඛකයන් විසින් භාවිත කොට ඇත. ඒ සියල්ල නොතකා උන්වහන්සේගේ උදාර වූ ගෞරවනීයත්වය නොතකන මේ ලේඛකයා තම ලිපිලේඛන පුරා පුනරුක්ත ලෙස යොදමින් බුදුරජුන් සඳහා 'ගෞතම', 'ගෞතම බුද්ධ', 'සිද්ධාර්ථ', 'ඔහු', කළේය, කිය ආදී වශයෙන් බුදුරජුන් ද ගමේ ගොඩේ ජෙමයියාගේ, සිමයියාගේ ගාණට දමලා හෙලා ලිය යි. කියයි. බුදුරජුන්ට පමණක් නොව මේ ප්‍රවාද ආයතනයෙන් බිහි කරන කිසිදු ලිපියක පොතක පතක රචකයන්ට බුදුන්, රහතුන් පමණක් නොව, මෙරට ගෞරවණීයත්වයට පත් වූ උදාර ශාසනික හා ශාස්ත්‍රීය සේවයන්හි නිරතව සිටින හා සිටි කවර තරාතිරමක වුව ද මහ තෙරවරුන් පවා නම් කරන්නේ නිකම්ම නිකං 'බුද්ධ ඝෝෂ', 'සෝරත', 'රාහුල' ආදී වශයෙන් මෙරට වසර දහස් ගණනක් තිස්සේ පැවති ශාසනික ව්‍යවහාරයන් හා සම්ප්‍රදයයන් දැන දැන ම නොතකට්ා් තම අඳබාල ගෝලබාලයන්ගේ තත්ත්වයට හෙළමිනි. ගණේ ගිල්ල යකාට පිළිමය කජ්ජක් දැ යි කීවා සේ බුදුරජුන් ජෙමයියාගේ තත්ත්වයට පිරිහෙළූ මිනිසාට පෘථග්ජන භික්ෂුවක් ගැන එසේ ලිවීම අරුම පුදුම විය යුත්තක් නොවේ.

රංජිත් පෙරේරා නමැත්තාගේ ලිපි කියැවීමේ දී අපට පැහැදිලි ව පෙනෙන කරුණක් නම් ඔහු බුදුසසුන කෙළෙසීමේ කොන්තරාත්තුවක් කවරෙකුගෙන් හෝ භාර ගෙන ඇති බව යි. බුද්ධ චරිතය බුද්ධ ධර්මය භික්ෂූන් වහන්සේ පමණක් නොව බෞද්ධයන් ඉමහත් සැදැහැයකින් අසන කියවන කරණීය මෙත්ත සූත්‍රය වැනි පිරිත් ධර්මයන් පවා ඉතා අමිහිරි අප්‍රසන්න දේ ලෙස සලකන ඔහු සෙත් පිරිත් හැඳින්වීම සඳහා ''ග්‍රිගොරියන් වාන්ට්'' යන උපහාසාත්මක යෙදුමක් ද භාවිත කරමින් තමා

තුළ ඇති වූ ඒ රෝපයත් ක්‍රෝධයත් ප්‍රකට කරයි. බෞද්ධ වූ සියල්ල කෙරෙහි දැඩි වෛරී හා ආසාත්මක ආකල්පයකින් ලියන කියන මොහු බුදුරජුන්ගේ ගෝත්‍ර නාමය වූ 'ගෞතම' යන්නෝ නිරුක්තිය පවා සොයා ගත් මහා අසිරිමතෙක් ලෙසින්, එයින් කියැවෙන්නේ රහාණා යන්න බවද කියමින් බුදුන් කෙරෙහි ඔහු තුළ පැවැති ඒ ද්වේෂය පළ කරයි.

තම දේවවාදී අන්ධ විශ්වාසයන් සුණුවිසුණු කිරිම සඳහා එද බමුණන්ට එරෙහි බුදුරජුන් ඉදිරිපත් කළ තියුණු විවේචනයන්හෙන් පසුබා ගිය බමුණු කුලය අද මෙන් ම එද ද බුදු දහමට එරෙහි ව අවි මුගුරු ගත්හ. ක්‍රි.ව. 8 – 9 සියවස්වල දී බුදු දහමට එරෙහි දැඩි ආසාත්මක වෛරයකින් ක්‍රියා කළ සංකර වැනි බමුණෝ ''අතිශයේන ගෞං ගෞතම:'' යනුවෙන් (ගෞතම යනු මහ ම ගොනා යන්න යි) කියමින් උන්වහන්සේට නින්ද අපහාස කළහ. මේ රංජිත් පෙරේරා නමැත්තා ඊට සියවස් දෙළසකට පමණ පසු තමා පෙනී සිටින බමුණු කුලයේ අරමුණු ඉටු කර දීම සඳහා යළිත් ඒ අර්ථ කථනය බුදුරජුන් සඳහා ඉදිරිපත් කරමින් තම ඇතුළත ඇති වෛරය එළි දක්වයි. හරකා භාරතීය හින්දු කාරයාගේ පරම පූජනීය සතෙකි. එහෙයින් බුදුරජුන් වැනි උසස් පුද්ගලයන්ව හැඳින්වීම සඳහා ගව අර්ථය දෙන විශේෂණ යොදමින් ශ්‍රේෂ්ඨත්වයට පත් කළහ. එහෙයින් බුදුරජුන් සඳහා 'ගො' යන්න 'ගෞ' යන්න පමණක් නොව උසභ, උසභරාජ (ගොන්රජා) වැනි විශේෂණ ද බුදුරජුන් සඳහා පමණක් නොව අද කාලයේ පවා ශ්‍රේෂ්ඨ පුද්ගලයන් හැඳින්වීම සඳහා භාතිරය සමාජයේ පමණක් නොව ලක්දිව ද සිදු කෙරෙන බව රංජිත් පෙරේරා වැන්නවුන් දැන ගත යුතු ය.

රංජිත් පෙරේරාගේ කල්ලිය අපි පෞද්ගලිකව නොහඳුනමු. එහෙත් ඔහුගේ හා ඔවුන්ගේ පරමාර්ථ හා ප්‍රතිපත්ති ඔවුන් ලියන කියන දෙයින් එද සිට ම හඳුනා ගෙන සිටිමු. මේ නඩයේ අය මෙරට ජාතික වශයෙන් පමණක් නො ව ජාත්‍යන්තර වශයෙන් ද බුදු දහම කෙරෙහි දැඩි ආසාතයක්, වෛරයක්, ද්වේෂයක් ඇති ව සිටින්නන් වන අතර විවිධ වූ උපාය මාර්ග යොදමින් බුදු දහමත් බුදු සසුනත් ලෝකයෙන් තුරන් කිරීම සඳහා තම ස්වාමිවරුන් වෙනුවෙන් තම දැනඋගත්කම් බැලමෙහෙවරෙහි යොදවන බව ඇපකැප කරන බව ඔවුන්ගේ බෞද්ධ විරෝධී ක්‍රියාමාර්ගයන් පෙන්වා දෙයි.

මේ බෞද්ධ විරෝධී ආක්‍රමණික ක්‍රියාදමයේ ප්‍රමුඛස්ථානයක් ගන්නා වතිකානු කතෝලික පල්ලියේ නායක පාප්තුමා විසින් තම අනුගාමිකයන් හා නවකයන් තුළ බුදු දහම කෙරෙහි ඉමහත් අප්‍රසන්නතාවක් ඇති කර විම සඳහා ''බුදු දහම අසුභවාදී දර්ශනයකි'' යනුවෙන් කළා වූ ප්‍රකාශයේ අරමුණ ද එය යි. එපමණක් නො ව ඇතැම් කතෝලික හා ක්‍රිස්තියානි

රටවල හා සංවිධානවල වෙසහනත් හා නළඟනත් ලවා බුදුරුව විවිධ ආලිංගන ඉරියවුවලින් වැළඳ ගන්නට සලස්වා අශ්ලීල වූ ඡායාරූප ගෙන උන්ගේ පුවත්පත් සහරා ආදියේ ප්‍රසිද්ධ කර ප්‍රචාරය කිරීමේ අරමුණ ද එය මිස වෙනෙකක් නො වේ. උන්ගේ වැසිකිලි බාල්දි, අත්පිස්නා, පසුපිස්නා ආදී පහත් වෙළඳ භාණ්ඩ ආදියේ වෙළඳ සලකුණක් ලෙස බුදු රුව යොද ගනිමින් ද උන්ගේ ජර්මනිය වැනි ඇතැම් රටවල් අවන්හල්, සුරාසැල්, වෙස්ට් වර්ග, කෑම බීම ආදියට ද බුදුරජුන්ගේ නම් ගොත් යොද ගනිමින් ද ආදී වශයෙන් සංවිධාන ජාලයක් මඟින් තම එක ම හතුරා පසමිතුරා ලෙස සලක්මින් බුදු දහම තම මිථ්‍යාවාදයෙන් ලොව වසා දැමීම සඳහා ඇති එක ම බාධකය ලෙස හඟිමින් එය අවතක්සේරුවට නින්ද පරිභවයට ලක් කිරීමට සන්නාහ සන්නද්ධ වී ක්‍රියා කරනු පෙනේ. පසුගිය ද ඔවුන්ගේ නියෝජිතවරියක වන යුරෝපීය කාන්තාවක් ඓතිහාසික රන්ගිරි දඹුලු රජමහ විහාරයේ පිළිම වහන්සේ නමකගේ ඔඩොක්කුවේ හිඳ ඡායාරූප ගෙන ප්‍රසිද්ධ කළේ ඇයට ඉඳ ගැනීමට වෙනත් තැනක් නොතිබුණු නිසා නො වේ. අර තම බෞද්ධ විරෝධී ආක්‍රමණික සංවිධානයන්හි ස්වාමිවරුන්ගේ අභිමතාර්ථයන් ඉටු කර දීම සඳහා ය.

එපමණක් නො ව ''පෙදෙන් බුදු සිරිත'' යන ඓතිහාසික පුරාණෝක්තිය ''පෙදෙන් කිතු සිරිත'' යනුවෙන් පෙරලා ලියමින් බුද්ධ චරිතයේ හා බුද්ධ සමයේ බොහෝ සිදු වීම් මේ රටේ කතෝලික හා ක්‍රිස්තියානි සංවිධාන විසින් කිතු සිරිතට ආරෝපණය කරමින් මරියාවන්ට නිබ්බුත පද කියවමින් එක් පැත්තකින් මෙසේ බුද්ධ චරිතය හා බුද්ධ රූපය කෙළෙසා දමමින්. අනෙක් පැත්තෙන් ඒවායේ තිබූ සියලු උදර ලක්ෂණයන් කිතු සිරිතට හා කිතු රූපයට ආරෝපණය කරමින් බුද්ධ චරිතය හා බුද්ධ රූපය දූෂණය කරති. එසේ ම ඔවුන්ගේ බයිබල් දේශනා ලෙස බුදු දහමේ එන ඉගැන්වීම් හා ධර්මානුගත පාරිභාෂික යෙදුම් ඉදිරිපත් කරමින් බුදු දහම දූෂණය කරති. භික්ෂූන් වහන්සේ සඳහා චිරසම්භාවිත ඓතිහාසික සාම්ප්‍රදායික ගරු නාමයන් කතෝලික හා ක්‍රිස්තියානි පූජකවරුන් සඳහා භාවිත කරමින් ඒ එක්කම භික්ෂූන් වහන්සේ සඳහා සම්භාවිත ගරු නාමයන් කපා කොටා මකා හරිමින් උන්වහන්සේ ගමේ ගොඩේ ජෙමයියාගේ තත්ත්වයට හෙලා දමමින් සංඝයාගේ ගෞරවණීයත්වය අවප්‍රමාණ කොට පිරිහෙලා දමති.

මෙසේ උන්ගේ දහම මේ බිමේ පතුරුවා තහවුරුව පවත්වා ගැනීම සඳහා වසර දහස් ගණනක් තිස්සේ මෙරට සිංහල බෞද්ධයාගේ ජනහද ස්පන්දනය හා එක් වී පැවැති තුනුරුවන් පිළිබඳ ගෞරවණීය තත්ත්වය අකාමකා දැමීම සඳහාත්. උන්ගේ දහම හා පූජකයන් උසස් තැනට නංවා ලීම සඳහාත් තුනුරුවන් පිළිබඳ හීන මනෝභාවයන් ජනිත කරවීම සඳහාත් මෙරට ජාත්‍යන්තර ආක්‍රමණික බලවේගයන්ගේ නියෝජිතයන්ගෙන්

මෙරට ගුවන්විදුලිය හා රූපවාහිණිය ඇතුළු විද්‍යුත් මාධ්‍යයන් මෙන් ම ජාතික යැ යි කියා ගන්නා මෙන් ම විකල්ප යැ යි කියා ගන්නා පුවත්පත් සඟරා ආදි විවිධ මාධ්‍යයන් ඔස්සේ ගෙන යන මෙ බෞද්ධ විරෝධි ආක්‍රමණික ක්‍රියාදාමය තේරුම් ගෙන එයට එරෙහි ව දැඩි විරෝධය ප්‍රකාශ කර සිටිම මෙරට සකල බෞද්ධ පොදු ජනතාවගේත් භික්ෂූන් වහන්සේ ගේත් පරම යුතුකම වේ. එසේ ම බුදු දහම රක්ෂණය, පෝෂණය කිරීමට නීත්‍යනුකූල ව බැඳී සිටින රජයේත් ඒ සඳහා ම ඇප කැප වී සිටින බුද්ධ ශාසන අමාත්‍යාංශය, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා සංස්කෘතික අමාත්‍යාංශය වැනි කී නොකී සෑම සංස්ථාපිත ආයතනයක ම වගකීම හා යුතුකම ද වන බව එක් අතකින් මතක් කර දෙන අතර මෙ රටේ වසර දහස් ගණනක් තිස්සේ සිංහල බෞද්ධයා රක්ෂණය පෝෂණය පමණක් නො ව ගෝපණය කර ද කර ගෙන ආවා වූ ද වසර දහස් ගණනක් තිස්සේ ඔවුන්ගේ සංස්කෘතික උරුමයන් හා ජීවන ප්‍රතිපදාවන් පෝෂණය කළා වූ ද බුදු දහමත් බුදු සසුනත් කෙළෙසීමේ නීච නින්දිත හා සාහසික ආක්‍රමණික ක්‍රියාදාමය අත්හැර නවතා දමන ලෙස මේ ආක්‍රමණික බලවේගයන්ට අප තරයේ අභියෝගාත්මක ව ප්‍රකාශ කර සිටිමු.

---

බුද්ධ ධර්මය අන් සියළු ආගම්වලට වඩා මිලේච්ඡත්වයෙන් දුරින් ම දුර ලන පල්ලි ක්‍රමයට අනුව කවරදක වත් කඩුවට ආශිර්වාද නොකරන ස්වකීය පෞරාණික ආගම අදහද්දීම වැළඳ ගැනීමට කිසිම අවහිරයක් නැති ආගම්කැයි මට වැටහේ.

—රුසියන් දාර්ශනික ඩී. සී. අවුස්පෙන්ස්කි

# බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය රැකෙන්නේත්, බුද්ධ ශාසනය සුරක්ෂිත වී පෝෂණය වන්නේත් ඒකීය රාජ්‍යයක් තුළ පමණි

නීතිඥ, සතිස්චන්ද්‍ර ධර්මසිරි

## 1. ප්‍රමුඛස්ථානයේ වත්මන් තත්ත්වය :

**ලොව** ථෙරවාදී බුදු දහමත් එයට ආරක්ෂාව හා ක්‍රියාන්විත පදනම සැපයෙන බුද්ධ ශාසනයත්, බුද්ධ පරිනිර්වාණයේ සිට මේ දක්වා අඛණ්ඩව පිහිටියා වූ අපේ රට ශ්‍රී ලංකාව තවමත් ඒකීය රටක් ව පවතී. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 වන පරිච්ඡේදයේ මේ බව ප්‍රකාශිතව ම පිළිගෙන ඇත. එහි පළමුවන වගන්තියෙන් ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන ජනරජයක් වශයෙන් ද, 2 වන වගන්තියෙන් එකී ජනරජය ඒකීය රාජ්‍යයක් බව ද පිළිගෙන ඇත. ආණ්ඩුක්‍රම නීතියේ මෙම එක් එක් වචන සඳහා නියමිත අර්ථයන් ඇති අතර එම අර්ථයන්ට හානියක් වන අයුරින් ඒවාට පුද්ගල අර්ථ යෙදීමට හෝ පුද්ගලීකරණය කිරීමට නොහැකි බව අප පළමුවෙන් ම වටහා ගත යුතු ය.

ව්‍යවස්ථාවේ 4 වන වගන්තියෙන් කියවෙන්නේ, ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වීමේ දී ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක විය යුත්තේ ජනතාව විසින් තෝරා පත් කරනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයකින් ඍජුව ම ජනතාව විසින් බව යි.

ජනතාවගේ පරමාධිපත්‍ය වන ව්‍යවස්ථා පැනවීමේ බලය පාර්ලිමේන්තුව විසින් අත්නොහල යුතු බවත්, කිසිම ආකාරයකින් අන්සතු නොකළ යුතු බවත්, කවර වූ හෝ ව්‍යවස්ථාදයක බලයක් ඇති කිසිම අධිකාරයක් පාර්ලිමේන්තුව විසින් නොපිහිටුවිය යුතු බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76(1) ප්‍රකාශිතව ම පිළිගෙන ඇත.

(බලන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 වන පරිච්ඡේදය සහ 76 (1) වගන්තිය).

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැති බ්‍රිතාන්‍යයේ වුව ද ඒකීය රටක් වශයෙන් ආණ්ඩුක්‍රම නීතිය තුළ පිළිගැනෙන්නේ ව්‍යවස්ථාදායක බලය නැතහොත් රටේ නීති සම්පාදනය කිරීමේ බලය එක් පාර්ලිමේන්තුවක් තුළම පැවරී ඇති නිසා ය. 74%ක් පමණ බෞද්ධාගමිකයන් ද 26%ක් පමණ අන්‍යාගමිකයන් ද රටේ මුළු භූමිය තුළ ම විසිරී ඇති (1983ට පෙර යාපන අර්ධද්වීපයේ පවා) අපේ රටේ ප්‍රධාන ආගම බුද්ධාගම බවත්, අනෙකුත් ආගම් ද ඒ සමඟ ආරක්ෂා කරන බවත් දැක්වෙන පැහැදිලි නීතියක් සම්පාදනය කර ගැනීමට හැකියාව ඇති වූයේ ඉහතින් සඳහන් කරන ලද ඒකීය භාවය නිසා ය. මෙය වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයේ 9 වන වගන්තියෙන් නීතිගත කර ඇත්තේ මෙසේ ය :

**II වන පරිච්ඡේදය — බුද්ධාගම**

(9) "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් සහ 14 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය."

මෙම වගන්තියෙන් බුද්ධාගමට ලබා දී ඇති නීතිමය ආවරණය ගැන බෞද්ධ ගිහියන් පමණක් නොව, බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ද තවමත් හරි අවබෝධයක් නොමැති බව බෙහෙවින් පැහැදිලි වන්නේ උන්වහන්සේලා මේ සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාරයේ ස්වභාවය නිසා ය.

එහෙත් මෙම වගන්තියේ නීතිමය බරපතල බවත් ප්‍රබල බවත් මැනවින් වටහා ගෙන ඇත්තේ බෞද්ධයන් නොව අන්‍යාගමිකයන් බව ඔවුන් මෙම වගන්තිය කෙරෙහි දක්වා ඇති ප්‍රතිචාරයේ ස්වභාවයෙන් පැහැදිලි වේ. විශේෂයෙන් මෙහි දී මුල දී කතෝලික පල්ලිය ප්‍රමුඛව සිටි අතර ඊට වඩා දැන් පෙරටවිත් ඇත්තේ ආගම්වාදී ක්‍රිස්තියානි නිකායන් හා සංවිධානයන් රාශියක් ම පසුගිය දශක 2 තුළ මෙම වගන්තිය කෙරෙහි වූ ක්‍රිස්තියානි ප්‍රතිචාරයෙන් පෙනේ.

මෙම වගන්තියේ නීතිමය බලයට අභියෝග කරමින් වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ දණ්ඩනීය වරද සිදු කරමින් මෙරට බහු ආගමික රටක් බවට නීතිමය ක්ෂේත්‍රයේ පිළිගැනීම සඳහා ද රාජ්‍ය තන්ත්‍රය තුළ ක්‍රියාත්මක කරවීම සඳහා ද, ඔවුන්ගේ

**1. සංවිධාන කටයුතු**

(තම කිසිදු ලබ්ධිකයන් නොමැති තැන්වල පවා පල්ලි ඉදි කිරීම, බෞද්ධයන් බුද්ධාගමෙන් ඉවත් කිරීම මූලික පරමාර්ථය කර ගත් ළදරු පාසල්, වැඩිහිටි නිවාස හා වෙනත් අනාථ නිවාසයන් පවත්වා ගෙන යාම, හා වෙනත් සුභසාධක කටයුතු.)

## 2. ප්‍රචාරක කටයුතු

සියලුම ජනමාධ්‍යයන්ට තුළට බෞද්ධ බලය සහ ඌරුව නිශේධ කිරීම, වෙරිටාස් වැනි අසීමිත ආගම්වාදී ප්‍රචාරක මාධ්‍යයන් රට තුළ ක්‍රියාත්මක කර වීම, පුවත්පත්, සඟරා හා වෙනත් ශ්‍රව්‍ය–දෘශ්‍ය මාධ්‍යයන් උපයෝගී කර ගැනීම — කර ගෙන යති.

එතැනින් නතර නොවූ අන්‍යාගමික ආගම්වාදී පූජකයන් සහ පුද්ගලයන් තමන් ජාත්‍යන්තරව ලබා ගන්නා කුලියට හිලව් වශයෙන් බුද්ධාගම ඓතිහාසිකව මේ රටේ දරන ප්‍රමුඛස්ථානය සුන් කිරීම සඳහා නිබඳව ම කටයුතු කරති. ප්‍රචාරක පැත්තෙන් මෙය බුදුරජාණන් වහන්සේගේ චරිතය කෙළෙසීම, සර්වඥ තත්ත්වය කෙළසීමෙන් උන්වහන්සේ සාමාන්‍ය පෘථග්ජනයෙකු බවට පත් කිරීම, එමගින් උන්වහන්සේ වන්දනීය තත්ත්වයට නුසුදුස්සකු බව වක්‍රාකාරව ප්‍රකාශ කිරීම. (බලන්න, පල්ලියේ කළුසල්ලිවලින් එළිදකින 'ප්‍රවාද' 1994 පෙබරවාරි, මාර්තු) මෙයින් නොනවතින ඔවුහු බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය ස්ථාපිත වන නීති සකස් කිරීමේ මූලික ආයතනය වන පාර්ලිමේන්තුවේ නීති පැනවීමේ බලය ද නිශේධ කිරීම සඳහා ඉදිරියට ගොස් ඇත. බුද්ධාගම රකින නීතිය නොව, අඩුම ගණනේ තමා දරා සිටින බුද්ධ චීවරයේ ගරුත්වය වත් රැක ගැනීමට වත් කටයුතු නොකර බුද්ධ ශාසනයට වින කළ බටහිර දේශපාලන මාතවාදයන්හි ඇති ඊනියා මානව හිමිකම් හෝ වාමාංශික දේශපාලනයේ එල්බෙමින් වත්මන් භික්ෂූන් වහන්සේලා (වැඩි දෙනෙක්) ප්‍රදර්ශනය කරන්නේ බුදුදහමේ අන්තර්ගත නිදහස් සාධාරණත්වයට වඩා බඩේ බිජු තබා ගෙන කටයුතු කරන කුහකත්වය යි.

බුද්ධාගමේ ප්‍රමුඛත්වයත් අනෙකුත් ආගම්වලට ද දී ඇති නීතිමය රැකවරණය ද හරිහැටි අවබෝධ කර නොගෙන ඉහත කී ඊනියා නිදහස්කාමී බෞද්ධ ගිහියන් හා භික්ෂූන් වහන්සේලා බුද්ධාගමට පමණක් ප්‍රමුඛස්ථානය ගැන කතා කරන අය ආගම්වාදී හෝ ජාතිවාදී ය යි හංවඩු ගැසීමට ද පසුබට නොවෙති. එයින් එම අය ප්‍රදර්ශනය කරන්නේ මේ රටේ ඉතිහාසය, සංස්කෘතිය හා නීතිය පිළිබඳව තමාගේ අල්ප වූ දැනුම යි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉහත සඳහන් 9 වන වගන්තිය ප්‍රකාරව—

1. ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගම ප්‍රමුඛස්ථානය **(Foremost place)** පිරිනමා ඇත. බුද්ධාගම **(Buddhism)** යනු පරියාප්ති ය යි.

2. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි සහ 14 ව්‍යවස්ථාවේ (1) වන ව්‍යවස්ථාවෙන් (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

එනම් රජය ඉහත කී වගන්ති දෙකෙන් අන්‍ය ආගම්වල අයිතිවාසිකම් රැකීමට බැඳී සිටී. එනම් :

**10 වන ව්‍යවස්ථාව (වගන්තිය)**

''සෑම තැනැත්තෙකුටම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.''

**14 (1) (ඉ)**

''සෑම පුරවැසියෙකුටම එකලාව හෝ අන් අය සමඟ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන් ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස''

රජය ඉහත සඳහන් ආකාරයට අනෙක් ආගම්වලට ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර දෙමින් බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කළ යුත්තේ ය.

බුද්ධ ශාසනය යනු ප්‍රතිපත්තිය සහ ප්‍රතිවේදය යි. එනම් ආර්‍ය අෂ්ටාංගික මාර්ගය යි. එනම් නිවන් පසක් කර ගැනීම සඳහා වූ ශාසනික ආයතනය යි. මෙයට භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වනක් පිරිස ද ඔවුන්ගේ පැවැත්මට උපකාරී වන සියල්ල ද විහාරාරාම හා පූජනීය ස්ථාන ද බෞද්ධසාරධර්මවලින් හෙබි මුළු මහත් බෞද්ධ සමාජය ද ඇතුළත් වේ. රජය සුරක්ෂිත කොට පෝෂණය කළ යුත්තේ මෙම අතිවිශාල විෂයගත බුද්ධ ශාසනය යි.

සමහර ඊනියා බෞද්ධ නීතිවේදීන්ගේ ද, සම්මේලනවල ද බුදු දහමට මේ රටේ හිමි ඓතිහාසික ප්‍රමුඛස්ථානය ගැන නිසි අවබෝධයක් නැති භික්ෂූන් වහන්සේලාගේ ද මතය වූයේ මෙම වගන්තිය නිෂ්ක්‍රිය එකක් බවත්, මෙයින් කිසිම ප්‍රයෝජනයක් ගත නොහැකි බවත් ය. රජය හෝ රජයට අනුබද්ධව කටයුතු කරන ආයතනවල ක්‍රිස්තියානි ලොක්කන්ගේ මතය මෙම හිමිවරුන්ගේ මතය වීම පසුගිය කාලයේ මෙරට සාමාන්‍ය සිරිතක්ව තිබුණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ ඇති නීතිමය තත්ත්වය 1994 අප්‍රේල් 26 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් තිදෙනකු විසින් පසුගිය රජය විසින් නීතිගත කිරීමට ගෙන ආ පුරාවිද්‍යා පනත

සංශෝධන කෙටුම්පත ප්‍රතික්ෂේප කරමින් ප්‍රකාශයට පත් කරන ලද එස්.ඩී. 1994 දරණ නඩුවේ දී තීරණය කරන ලදී. එකී කෙටුම්පතේ වගන්ති 12 සහ 14 මගින් විහාරාධිපතීන් වහන්සේලාගේ බලතල රජය විසින් අත්පත් කර ගැනීමට යාම 9 වන වගන්තියෙන් බුද්ධාගමට හිමි කර දී ඇති ප්‍රමුඛස්ථානය ලොප් වීමක් බවත්, බුද්ධ ශාසනය සුරක්ෂිත කර පෝෂණය කිරීමට රජයේ ඇති අනුල්ලංඝනීය වගකීම පැහැර හැරීමක් බවත්, බුද්ධාගමට වඩා බුද්ධ ශාසනය විශාල විෂය පථයක් බවත් පෙන්වා දෙන ලදී.

> We agree that the proposed New Section 32 A (1) vests the Minister with wide and unguided powers and that the effect of the proposed new Section 32A (2) and Section 40 (e) would be to interfere with the rights presently exercised by Buddhist temporalities and hence clauses 12 and 14 of the Bill would be inconsistent with Article 9 of the Constitution which requires the State to give the Buddihism the foremost place and to protect and foster the Buddha Sasana. The expression "Buddha Sasana" is wider than "Buddhism" and includes the entire establishment together with objects and places of religious practices and worship of Buddhists. the making of an order the proposed new section 32A (1) and the imposition of the kind of Coutrol and regulation imposed by virtue of the proposed new Section 32A (2) would be inconsistent with the duty to protect and fo foster the Buddha Sasana."

මෙම නඩු තීන්දුවෙන් මේ සම්බන්ධ නීතිමය කරුණු කිහිප විටක් ම පැහදිලි කෙරුණි. එනම් බුද්ධාගමට නීතියෙන් දී ඇති ප්‍රමුඛ බව එලෙස ම රැකිය යුතු බව හා බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීමක් බව එහෙයින් එම වගන්තියට අනනුකූල හෝ ඒ හා ගැටෙන පනතක් පැනවීමට නම් පාර්ලිමේන්තුවේ 2/3 ඡන්දයෙන් පමණක් කළ නොහැකි බවත්, ඒ සඳහා ජනමත විචාරණයක් අවශ්‍ය බවයි. මේ අනුවම මෙම වගන්තියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 වගන්තියේ පමණක් නොව 83 වන වගන්තියේ රැකවරණය ද ලැබේ.

මෙම 83 සහ 84 යන වගන්ති දෙකෙන් ම රැකවරණය ලබන විශේෂ විෂයයන් ඇත්තේ කිහිපයකි. ඒවා නම් ;

වගන්ති :

1. රජය, 2. ඒකීය රජයක් බව, 3. ජනතාවගේ පරමාධිපත්‍ය, 6 ජාතික කොඩිය, 7. ජාතික ගීය, 8. ජාතික දිනය, 9. බුද්ධාගම, 10. මූලික අයිතිවාසිකම්, 11. වදහිංසාවලින් මිදීම.

මේ අනුව අනෙකුත් ආගම් සම්බන්ධයෙන් කියැවෙන 14(1)(ඉ) වගන්තියට වඩා 9 වන වගන්තිය ප්‍රබල වේ.

මෙම වගන්තිවලින් බුද්ධ ශාසනයට සහ බුද්ධාගමට තිබෙන නීතිමය ප්‍රමුඛස්ථානය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා කිසිදු උද්ඝෝෂණයක් බෞද්ධ ගිහි–පැවිදි දෙපක්ෂයෙන් ම ඉදිරිපත් නො වී ය. බුද්ධාගමේ නාමයෙන් පෙනී සිටින දේශපාලන පක්ෂ පවා මෙම යුතුකම පැහැර හැර තිබුණි. මෙයට ප්‍රධාන හේතුව මේ සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේලාට ඇති අනවබෝධයත්, බුද්ධ ශාසනයේ රැකවරණයට වඩා තමා හිතවත් රජයට පක්ෂපාතී වීම ප්‍රයෝජනවත් බව සිතීම නිසාත් විය හැකි ය.

මේ සම්බන්ධයෙන් මෑත යුගයේ දී යම් කිසි ප්‍රයත්නයක් දරනු ලැබුවේ දහම් දැනුම පදනම මඟින් පමණි. මෙය හුදු සටන් පාඨයක් පමණක් නොව බුද්ධාගමට මේ රටේ හිමි ප්‍රමුඛස්ථානය අද නැති වී ගොස් ඇත්තේ කෙසේද ? එකී ප්‍රමුඛස්ථානය යළි ඇති කිරීම සඳහා කළ යුතු ක්‍රියාමාර්ගයන් මොනවා ද යන්නත් පරීක්ෂා කර බලා බුද්ධ ශාසනය සම්බන්ධ රජයේ වගකීම ක්‍රියාත්මක කරවන්නේ කෙසේ ද ? යන්න පිළිබඳව බෞද්ධ ජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම යි. මේ සම්බන්ධයෙන් ආරම්භ කරන ලද ප්‍රධාන ව්‍යාපාරය වූයේ 1994 දී වෙසක් මස දීප ව්‍යාප්තව ආරම්භ කරන ලද "බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය ක්‍රියාත්මක කරවීමේ අත්සන් දශලක්ෂයේ බෞද්ධ පෙත්සම යි." ඉන් පසුව මේ රටේ ඇති වුන මැතිවරණ කරච්චලය නිසා මෙම ව්‍යාපාරය තාවකාලිකව නතර කිරීමට සිදු විය.

මේ සඳහා අත්සන් 15,000ක් පමණ ලබා දීමට පුද්ගලිකව ම කටයුතු කළ අස්ගිරි මහානාහිමිපාණන් වහන්සේ කෘතවේදිව සිහිපත් කළ යුතු ය. නව රජය බලයට පත්වීමෙන් පසුව මෙම කාර්යය තාවකාලිකව නතර කරනු ලද්දේ මෙම රජය පසුගිය රජයට වඩා සංස්කෘතික හා ආගමික ක්ෂේත්‍රයේ යම් ප්‍රගතියක් හෝ වෙනස්කමක් පෙන්නුම් කරති යි යන බලාපොරොත්තුව මත ය.

දැනට මෙම පෙත්සමේ අත්සන් ලක්ෂයක් පමණ එකතු වී ඇති අතර එය භාර දී සාකච්ඡා කිරීම සඳහා ගරු ජනාධිපතිනියගෙන් දිනයක් හා වේලාවක් ඉල්ලා සිටින ලදි. මෙම පෙත්සම භාර ගෙන අවශ්‍ය කටයුතු

සාකච්ඡා කරන ලෙසත් මෙම අවස්ථාවට තමන් වහන්සේලාට පෞද්ගලිකව ම පැමිණීමට අපහසු වීම ගැන කණගාටු වන බවත් දන්වා මල්වතු අස්ගිරි මහ නාහිමිපාණන් වහන්සේලා විසින් ගරු ජනාපතිනිය වෙත පුද්ගලිකව ලිපි භාර දෙන ලදී. මෙම පෙත්සම භාර ගැනීම සඳහා ඒ වෙනුවෙන් පැමිණෙන නියෝජිත පිරිසගේ නාම ලේඛනය ද පෙත්සමේ පිටපතක් ද එවන ලෙස ජනාධිපති ලේකම් විසින් 1995.05.09 වැනි දින අප වෙත දන්වන ලදී. එකී අවශ්‍යතාවන් සපුරා ලීමෙන් පසුව ද ඒ සඳහා දිනයක් අප වෙත තවමත් නොලැබුණි. එහි ව්‍යංගාර්ථ තේරුම වන්නේ එම පෙත්සමේ සඳහන් කරුණු ගැන අඩුම වශයෙන් සාකච්ඡා කිරීම සඳහා වත් රජය සූදානම් නැති බව යි. 74%ක් බෞද්ධයන් වසන මෙ රටෙහි මෙය ඉතා බරපතල තත්ත්වයක් බව අපේ භික්ෂූන් වහන්සේලා තේරුම් ගත යුතු ය. බෞද්ධ සංස්කෘතිය හා බුද්ධාගම සම්බන්ධයෙන් මෙම රජය පසුගිය යූ.එන්.පී. රජයේ තුප්පහි (දේශීය නොවන) ප්‍රතිපත්තියටත් එහා ගොස් බුද්ධ ශාසනයේ පැවැත්මට තර්ජනයක් වන මාක්ස්වාදී හා ක්‍රිස්තියානි චින්තනය ඔස්සේ කටයුතු කිරීමේ ඇති භයානකකම අපේ ස්වාමීන් වහන්සේලා අවබෝධ කර ගත යුතු ය. මෙවැනි සමයක් දෘෂ්ටියක් උන් වහන්සේලාට පිහිටීමට නම් බුදුන් වහන්සේ දේශනා කළ පරිදි තමා ගැති වී ඇති දෘෂ්ටියෙන් මිදී තමන් පැළඳ සිටින නිල්, රතු, කොළ පැහැති කණ්නාඩි වලින් බැහැරව බුද්ධ ශාසනය තම එක ම ධජය වශයෙන් සලකා කටයුතු කළ යුතුව ඇත. මෙම උද්ඝෝෂණය අප විසින් ඉදිරියට ගෙන යා යුතු හෙයින් එකී පෙත්සමේ ඇති කරුණු මෙසේ ඉදිරිපත් කර සිටිමි. මෙම කරුණු සියල්ලම කියවා බලා ඉවතලනවා වෙනුවට මෙය එකින් එක අධ්‍යයනය කර පරීක්ෂා කර යම් ක්‍රියාත්මක වැඩ පිළිවෙලකට අවතීර්ණ වීම වැදගත් වේ.

**අත්සන් දශ ලක්ෂයේ බෞද්ධ මහා පෙත්සම**

1. බෞද්ධාගමිකයන් මුදල් බලයෙන් අන්‍ය ආගම්වලට හැරවීම තහනම් කිරීම සහ එවැනි සියලු මිෂනාරි කටයුතු තහනම් කිරීමේ පනතක් පැනවීම.
2. කිසිම අන්‍ය ලබ්ධිකයෙකු නොමැති බෞද්ධ ගම්වල ක්‍රිස්තියානි හෝ අන්‍යාගමික පල්ලි ගොඩ නැඟීම තහනම් කිරීම.
3. ළදරු පාසල්වල කුඩා දරුවන්ට ඔවුන්ගේ දෙමාපියන් අදහන ආගමට පිටස්තර වූ ආගමක් ඇදහීමට බල කිරීම හෝ ඉගැන්වීම තහනම් කිරීම සහ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ අවසරය හෝ අධීක්ෂණය නොමැතිව අනාථ ළමා නිවාසයන් ඇරඹීම හෝ පවත්වා ගෙන යාම තහනම් කිරීම.

4. සිවුරු, පාත්‍ර, වටඅතු පරිහරණය කළ හැක්කේ භික්ෂූන්ට පමණක් බවට නීතියෙන් තහවුරු කිරීම.

5. බෞද්ධයන්ගේ ආගමික දිනය වන පුර පසළොස්වක් පොහෝ දින රූපවාහිනියෙන් විකාශනය කරන ටෙලි වෘත්තාන්ත, චිත්‍රපට සහ ලොතරැයි වැඩසටහන් නතර කිරීම.

6. බොදු මනස කාමයෙන් විකෘති කරන පහත් ගනයේ ටෙලි වෘත්තාන්ත ප්‍රචාරක දැන්වීම් සහ වැඩසටහන් රූපවාහිනියෙන් (රජයේ සහ අනෙකුත්) ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම.

7. පූජනීය බෞද්ධ කලාකෘතීන් දූෂණය වන ආකාරයෙන් අන්‍ය ආගමික නායකයන්ට ආරෝපණ කිරීම සහ කැටයම් කිරීම හා ඇඹීම සහ ඇඳීම ඇතුළුව බෞද්ධ කලාකෘතීන් ද පූජනීය සහ පෞරාණික නගර ද පුරාවස්තු ද විනාශ කිරීම හෝ විකෘති කිරීම තහනම් කිරීමත් බෞද්ධ පූජනීය වස්තූන් සහ පූජනීය නගර අපගේ ජීවමාන ඉතිහාසයෙන් වියුක්ත වූ සිහිවටන හෝ ස්මාරක (monuments) සේ සලකා ජාත්‍යන්තර අන්‍යාගමික සමාගම්වල පාලනයට යටත් කිරීමේ කුමන්ත්‍රණ වහා නතර කිරීමට පියවර ගැනීම.

8. හිමිපාණෝ, නාහිමිපාණෝ, මාහිමිපාණෝ යන බුද්ධ ශාසනයේ ආගමික ආයතනවලට පමණක් හිමි ආයතන නාමයන් අන්‍යාගමිකයන් සඳහා යෙදවීම තහනම් කිරීම.

9. බුද්ධ ශාසන අමාත්‍යාංශය හා අනෙක් බෞද්ධ ආයතනවලට බෞද්ධයන් පමණක් පත් කිරීම නීතිගත කිරීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවලට පටහැනිව ක්‍රියාත්මක කෙරෙන සර්ව ආගමික සංකල්පය නමැති ප්‍රෝඩාව තහනම් කිරීම.

10. බස්රථවල ඉදිරි අසුන් පූජ්‍ය පක්ෂයට වෙන් කර තැබීමේ පුරාණ චාරිත්‍රය කඩ කරන අයට දඬුවම් කිරීම ඇතුළු භික්ෂූන් වහන්සේලාට වර්තමානයේ මුහුණ දීමට සිදු වී ඇති අනෙකුත් ගැටලු ද නිරාකරණය කිරීම.

11. දහම් පාසල් අධ්‍යාපනය මනාව සංවිධානය කිරීම සහ සිසු දරුවන්ට සහ ගුරුවරුන්ට සහභාගි වීමට හැකි වන පරිද්දෙන් ඉරිදා සහ පෝය දිනවල කෙරෙන පුද්ගලික ටියුෂන් පන්ති නොපැවැත්වීමට කටයුතු කිරීම.

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවට අනුකූල හෝ/හා එය හෑල්ලුවට ලක් කෙරෙන සියලුම ක්‍රියාවන් හෝ නොකර හැරීම් පරීක්ෂාවට ලක් කිරීමේ හා බුද්ධාගමට හිමි නීතිමය ප්‍රමුඛස්ථානය තහවුරු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලැති බෞද්ධ කොමිෂන් සභාවක් රජය මඟින් පත් කිරීම.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය**

ඉහත සඳහන් නීතිය මේ රටේ ක්‍රියාත්මක නොවීම නිසා රටේ ඇති වී ඇති අවුල් සහගත තත්ත්වය නිරවුල්කිරීම සඳහාත් වසර දෙදහස්පන්සියයක් තුළ මේ රටේ බුද්ධාගමට හිමි ප්‍රමුඛ තැන රැක ගැනීම සහ ජාතික ආගම වශයෙන් බුද්ධාගම් හා ශාසනය ආරක්ෂා කිරීම සඳහාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පහත සඳහන් සංශෝධන ඇති කරන ලෙස 1994.10.06 දතමින් යුතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය වෙත දන්වා යැවීම්.

**යෝජිත සංශෝධන**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාවට අමතරව මෙම උප වගන්තිය එකතු කිරීමෙන් — 9(1) "ඉහත කී ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා රජයට හා රාජ්‍ය නිලධාරීන්ට ද ආයතනවලට උපදෙස් දීම සඳහා ඉහත කී ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට පටහැනි ක්‍රියාවන් හෝ නොකර හැරීම නැවැත්වීම හා එසේ කරන්නවුන්ට දඬුවම් දීම සඳහා පූර්ණ බලැති බෞද්ධ කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය. එකී කොමිෂන් සභාවට වැටුප් දීමනා සහ අනෙකුත් වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර, එකී කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට පමණක් වගකිව යුතු ය.

9(2) තමාට පැවරෙන කාර්යභාරය පිළිබඳව අනු නීති හා රෙගුලාසි සකස් කිරීමටත් වෙනත් ආයතන පවත්වා ගෙන යාමට වෙනත් පනත් පැනවීම සම්බන්ධව රජයට නිර්දේශ කිරීමත්, කොමිෂන් සභාවට බලතල හිමි වේ.

9(3) වයස අවුරුදු 18 අඩු බෞද්ධ බාලයෙකුගේ ආගම ඔහුගේ දෙමාපියන්ගේ හෝ භාරකරුගේ කැමැත්ත නොමැතිව වෙනස් කිරීමට තුඩු දෙන ආකාරයෙන් කටයුතු කිරීම නොකළ යුතු ය.

**යෝජිත සංශෝධන 2**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ) වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තියේ කියැවෙන අයුරින් එය සංශෝධනය කිරීම.

**14(1)(ඉ)**

"එකලාව හෝ තම ආගමික ප්‍රජාවේ අන් අය හා සමඟ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීම පිළිගැනීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් 9 වන ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන වලට හානියක් නොවන අයුරින් ප්‍රකාශ කිරීමේ නිදහස.

මෙම යෝජනා භාර ගත් බවත්, මෙම නියෝජන ගැන වැඩිදුර කරුණු සාකච්ඡා කිරීම සඳහා දිනයක් අපට ලබා දෙන බවත් දන්වා එකී මණ්ඩලයේ ලේකම්ගෙන් ලිපියක් ලැබුණි. එකී මණ්ඩලය තම යුතුකම පැහැර හරින ලදී. මෙම යෝජනාවල ඇති වැදගත්කම සැලකූ ලක්ෂ්මන් ජයකොඩි මහතා ඒවා ව්‍යවස්ථා සම්පාදන ඇමතිවරයාට යොමු කළ බව 94.11.14 දතමින් යුතුව අප වෙත දන්වා එවන ලදී. මෙම යෝජනාවල ඇති වැදගත්කම අවධාරණය කරමින් ගරු දියවඩන නිළමේ තුමා ද එකී මණ්ඩලය වෙත ලිපියක් යවා තිබුණි. ජී. ඇල්. පීරිස් මහතා මහනුවර ගිය අවස්ථාවේ අස්ගිරි මහා නාහිමියන් වහන්සේ මෙම යෝජනාවල පිටපත් පෞද්ගලිකව භාර දී මේ අනුව කටයුතු කරන ලෙස ජී. ඇල්. පීරිස් මහතාට දන්වා ඇත. එහෙත් මේ කිසිවකින් වත් අත්වූ ප්‍රතිඵලයක් නැත.

මෙම රජය රටේ පවතින බෞද්ධ සංස්කෘතිය හා බුද්ධාගම සම්බන්ධයෙන් අනුගමනය කරන්නේ වංක ප්‍රතිපත්තියක් බවත් හොරා පොලිස් සෙල්ලමක් බවත් අප විසින් අවබෝධ කර ගත යුතු ය. අපේ ස්වාමීන් වහන්සේලා මේ දරා සිටින බුද්ධ චීවරයට ගරු කරමින් එහි ගරුත්වය රකිමින් බුද්ධ ශාසනය සම්බන්ධයෙන් රජයේ ක්‍රියාකලාපය ගැන විචාරශීලිව කල්පනා කළ යුතුව ඇත. තම පෞද්ගලික ජීවිතය අතහැර දමා තමන් ඇතුළු වී ඇති හා මුළු ජීවිත කාලය ම ගත කිරීමට තීරණය කර ඇති බුද්ධ ශාසනයේ පැවැත්ම වෙනුවෙන් එවැනි විචාර බුද්ධියක් ඇති කර ගැනීමට තරම් බුද්ධියක් සහ ප්‍රඥාවක් පහළ කර ගැනීම අද භික්ෂූන් වහන්සේට ඇති ප්‍රධාන කාර්යභාරයක් වේ.

තම හිතවතුන්ට රජයෙන් ලබා දිය හැකි යම් යම් දේ නැතහොත් ස්වාමීන් වහන්සේ රජයෙන් බලාපොරොත්තු වන යම් ලැබීම් හෝ විහාරස්ථානයට අවශ්‍ය ලැබීම් ආදී සියල්ලත්, භික්ෂූන් වහන්සේලා හැමදමත් දේශපාලන සෙක්කුවට බැඳ තබන දේශපාලනඥයන්ගේ රීතියාබස්වලට නොරැවටී තමා කැප කළ ජීවිතය සුරකින ශාසනයේ චිර පැවැත්ම වෙනුවෙන් කල්පනා කිරීමට කාලය පැමිණ ඇත.

බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය හා බුද්ධ ශාසනය පෝෂණය කිරීම මෙම රජය ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නවා නම් මෙම රජයේ නායක නායිකාවන් මෙම කාර්යය තමා විසින් ඉටු කරන බව ක්‍රියාවෙන් පෙන්නුම් කළ යුතු ය. පසුගිය යූ.එන්.පි. රජයෙන් බුද්ධාගමට ලත් කෙනෙහිලිකම් නවතන බව ක්‍රියාවෙන් පෙන්නුම් කළ යුතු ය. 1956 බණ්ඩාරනායක මහතා මෙන් අවංකව එම කාර්යයේ නිරත විය යුතු ය.

එහෙත් මෙම රජය අද කරන්නේ කුමක්ද ? පසුගිය රජය විසින් යූ.එන්.පී.කාරයන්ට දී තිබූ සුරාසැල් බලපත්‍ර තම හෙන්චයියන්ට දීමට අවශ්‍ය වූ විට රජය රූපවාහිනියෙන් ප්‍රකාශ කළේ බුද්ධාගම රැක ගැනීම සඳහා සුරාසැල් බලපත්‍ර අවලංගු කරන බවත්, එහෙත් ඒවා දෙගුණ කරමින් සෑම නගරයක්, ගමක් පාසා සුරාසැල් විවෘත කර ඇත. පළමුවැනි වතාවට කතරගම පූජා නගරයේ පවා සුරාසැලක් ඉදිකිරීමේ පාප කර්මය මෙම රජයට හිමි වේ.

ජනතාව සුරාවට හුරු කිරීම ක්‍රිස්තියානි ප්‍රතිපත්තියකි. එය කෙසේ වත් බෞද්ධ ප්‍රතිපත්තියක් නොවේ. සුරාවේ හා මත්වීමේ ආදීනව බුදු බණේ පමණක් නොව අපට සියැසින් ම දක්නට ලැබේ. මෙම කටයුතු වලට එරෙහි වන බෞද්ධ භික්ෂූන්ට රජයේ සුරා ප්‍රතිපත්තියෙන් ප්‍රයෝජන ලබන අය කරන තර්ජන දිවයිනේ නන්දෙසින් ඇසේ. හිමිවරුන්ගේ මාරාන්තික උපවාස නොතකා සුරාසැල්, මස්කඩ ශීඝ්‍රයෙන් විවෘත කරති. මහා නාහිමිවරුන්ගේ උපදෙස් අනුව කටයුතු කරන බව රජයේ මැති, ඇමතිවරු විශේෂයෙන් පීරිස් ඇමතිවරයා පුන පුනා කියයි.

රටේ හා ජනතාවගේ සුරක්ෂිතභාවය සඳහා කොටි ත්‍රස්තවාදය තහනම් කර මුලින්ම එම සංවිධානයෙන් රට මුදා ගන්නා ලෙසත්, දේශපාලන යෝජනා ඉන් පසුව ඉදිරිපත් කරන ලෙසත් මහා නාහිමිවරුන් නිල වශයෙන් රජයට කරන ලද උපදේශය රජය නිර්ලජ්ජි ලෙස ප්‍රතික්ෂේප කර ඇත.

බුද්ධාගමේ තත්ත්වය අවබෝධ කිරීම සඳහා බෞද්ධ කොමිෂන් සභාවක් පත් කරන ලෙස කරන ලද ඉල්ලීමට රජය කන් නොදෙයි. බෞද්ධ උත්තරීතර මණ්ඩලය රජය විසින් පාවිච්චි කරන්නේ උපදේශක මණ්ඩලයක් මෙන් නොව තමාගේ බළල් අතක් වශයෙනි. බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් රජයේ කුමන සේවයක නිරත වුව ද කුමන සම්බන්ධතාවක හිටිය ද යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තමන් ඇතුළත් නිකායේ කාරක සංඝ සභාව හෝ මහා නාහිමියන් වහන්සේ විසින් ගන්නා ලද තීරණයක් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

දේශපාලන යෝජනා ඉවත් කර ගන්නා ලෙස මහ නාහිමිවරුන් වහන්සේලාගේ ද මල්වතු අස්ගිරි කාරක සංඝ සභා දෙකේ ද නිල තීරණයට පයින් ගසමින් රජය පුද්ගලිකව භික්ෂූන් වහන්සේලා තම අත්තනෝමතික මතයට නතු කර ගැනීමට කටයුතු කරයි. රජය හා රජයේ පිටුපස සිටින ක්‍රිස්තියානි න්‍යායාචාර්යවරුන් මෙමඟින් උත්සාහ කරන්නේ මේ රටේ සංඝ භේදයක් ඇති කිරීමට ය. සංඝ භේදය බුදුන්ගේ ශ්‍රී දේහයෙන් ලේ සෙලවීම වැනි වූ ආනන්තර්‍ය පාපකර්මයක් වේ.

මෙ වෙනුවෙන් තවමත් ස්ථිර තීරණයක් ගෙන නොමැති සියලු භික්ෂූන් වහන්සේලා තමන් වහන්සේලාගේ විහාරස්ථානයේ බුදු පිළිම වහන්සේ අභියසට වැඩම කර මෛත්‍රී භාවනාව කර සිත එකඟ කර ගෙන බුදුන් වහන්සේ දෙස සෘජුව බලා මේ ගැන තීරණයක් ගත යුතුව ඇත. එය උන්වහන්සේගේ පර්යාප්තිය ප්‍රතිපත්තිය සහ ප්‍රතිවේදයට එකඟව ගත යුත්තක් වේ. ඊනියා දේශපාලන බලපෑමට යට වී තම ශාස්තෘන් වහන්සේටත්, උන්වහන්සේගේ ධර්මයටත් විරුද්ධ විය හැකි ද ? එය තම හෘදය සාක්ෂියට එකඟ ද ?

**රජයේ යෝජනා, කලාපීය සංගමය සහ බුද්ධාගමේ ප්‍රමුඛස්ථානය**

මෙ රට දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ රජයේ බලාධිකාරයට අභියෝග කරමින් කතෝලික හා ක්‍රිස්තියානි ආගමික සංවිධානවල ද පූර්ණ අනුග්‍රහය ඇතිව උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන දෙමළ ජාතිවාදී සන්නද්ධ කැරල්ලට විසඳුම යැ යි කියමින් රජය දෙමළ ජාතිවාදී පක්ෂවල බලපෑමට යට වී දේශපාලන යෝජනාවලියක් ඉදිරිපත් කර ඇත

රජය ඉදිරිපත් කර ඇති යෝජනාවලට අනුව අප රට එක්සත් හා ස්වෛරී ජනරජයක් බව කියැවේ. එක්සත් යන වචනයේ අර්ථයෙන් ම ඒකීයව ඇති රට කොටස්වලට කඩා නැවත එක්සත් කිරීමක් පෙන්නුම් කෙරේ. එහි අර්ථය දැනට ඒකීයව පවතින නැතහොත් පසුගිය වසර දෙදහස් පන්සිය තුළ ම එක්සේසත් ඒකඡත්‍ර වශයෙන් එක ම බලාධිකාරයක් (රජු හෝ රජය) යටතේ පැවැති අප රට තුළ බලාධිකාරයන් සමූහයක් ස්ථාපිත කිරීම යි.

මේවා ඉදිරිපත් කරන්නේ බහුවිධ සමාජයක ව්‍යවස්ථාපිත පදනම තහවුරු කිරීමට බව එකී යෝජනාවල දැක්වේ. වර්තමානයේ ලෝකයේ ඇති සෑම රජයක් ම කරන්නේ බහුවිධ සමාජයක ව්‍යවස්ථාපිත අයිතිය තහවුරු කිරීම මිස වෙනත් දෙයක් නොවේ. මෙහි දී ඕනෑම රටක් අනුගමනය කරන ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත ඒ ඒ රටේ ජීවත් වන ජාතියේ විවිධාකාර බෙදී යාම සැලකිල්ලට ගෙන කටයුතු කෙරේ: එහෙත් මෙම යෝජනාවලින්ගේ සැකැස්ම බලන විට රටේ ගම්‍යමානව ඉපනෙන බහුවිධ සමාජ සැකැස්ම මුළුමනින් ම අමතක කිරීමක් දක්නට ලැබේ.

එනම්, ප්‍රධාන ම කාරණය මේ රටේ සිංහලයන් 74%ක් පමණ වෙසෙන බවත් ඔවුන් බෞද්ධයන් බවත්, ඔවුන් මේ රටේ අස්සක් මුල්ලක් නැර විසිරී පවත්නා බවත්, ඔවුන්ගේ සිද්ධස්ථාන වෙහෙරවිහාර මෙම රටේ සෑම තන්හි ම විසිරී පවතින බවත් අමතක කරති.

මෙම සිංහලයන් අතිබහුතරයක් ඇති අප රටේ බහුවිධ සමාජයේ අයිතිවාසිකම් සාධාරණ ලෙස ආරක්ෂා කරනවා නම් රජය සහ මෙම යෝජනාවලට නිශ්ශබ්දතාවය මුහින් සහාය පළ කරන (Silance gives concent) නිශ්ශබ්දතාවය තම කැමැත්ත පළ කරයි — මැක්ස්වෙල්) එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන යුතුකම වන්නේ උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ඒකපාක්ෂිකව නෙරපා දමා ඇති සිංහල බෞද්ධයන් පළමුව ඒවායේ පදිංචි කරවීම යි.

ඒ ඒ පළාත්වලට බලය බෙදා හරිනවා ය යන රජයේ තර්කය පිළි ගත්තත්, නැගෙනහිර පළාත ද අනෙකුත් පළාත් අට (8) වෙන් වෙන්ව ම පළාත් වශයෙන් ස්ථාපිත කළහොත් හරියට ම ⅓ අනුපාතයට බෙදී සිටින සිංහල, දෙමළ, මුස්ලිම් ජනයාට සමානව බෙදෙන නියම බහුවිධ ඒකකයක් ස්ථාපිත කළ හැකි ය.

රජය කියන විධියට බලය විමධ්‍ය ගත කර නොගෙන ඒවා බෙදා හැරීම ඒ ඒ ප්‍රදේශවල ජනතාවගේ පහසුව සඳහා කරනවා නම් දැනට පවතින නැගෙනහිර පළාත ඒ අයුරින් ම පිළිගතහොත් කිසිදු ජන කොටසකට අගතියක් සිදු වන්නේ නැත.

කලාපවලට රට කැඩීමේ රජයේ ඊළඟ තර්කය වශයෙන් මේ ආකාරයට විවිධ පාලන ඒකක ඇති කිරීමෙන් ඒවායේ ජනතාවගේ ආගමික, සංස්කෘතික, අනන්‍යතාව රැකෙන බව යි. මේ සඳහා හොඳ ම ක්‍රමය වන්නේ 90%ක පමණ දෙමළ ජනතාව වෙසෙන උතුරු පළාත වෙන ම ඒකකයක් වශයෙන් පිළිගැනීම යි. එවිට කාටත් සාධාරණ හෝ සමාන අසාධාරණකම් පිට හෝ ලංකාවේ පළාත් 9 යන මෙම අපභ්‍රංශය ක්‍රියාත්මක වේ.

රජය තමාගේ තර්කයන්ට ද පිටුපා සිංහල ජනයාගේ ඇස්වලට වැලි ගසා කරන උප්පරවැට්ටිය මින් පෙනේ. කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව නැගෙනහිර කලාපයෙන් කොටසක් උතුරට ඈඳීමත්, තවත් කොටසක් මුස්ලිම් ජනයාට භාර දීමත්, එහි වෙසෙන සිංහලයන් අනෙකුත් කොටසට ඈඳා ගැනීම යි.

මෙහි ප්‍රතිඵලය වන්නේ රටේ සරුම ඉඩම්වලින් 33%ක් හා වෙරළින් 60%ක් පමණ විශාල ප්‍රදේශයක් 9%ක් වන දෙමළ සුළුතරය සඳහා යොදා ගැනීම යි. මෙම යෝජනාවන් දෙමළ ජාතිවාදී පක්ෂවල සහ ඊළාම් ස්ථාන්කරුවන්ගේ උවමනාවට සිංහල ජනයා අතර බලයෙන් පටවන්නට හදනවා යැ යි කියන්නේ මෙම කාරණය නිසයි. රජයට පක්ෂව ක්‍රියා කරන භික්ෂූන් වහන්සේලා මෙම කාරණය හොඳින් අවබෝධ කර ගත

දුතු ය. මෙම කලාපයන් සෑදීමේ අවසාන තේරුම වන්නේ භූගෝලීය පිහිටීමට හෝ ආර්ථික ඵලදායිතාව, දූර ප්‍රමාණය ආදිය ගැන කිසිවක් නොසලකා හුදෙක් භාෂාව, ආගම ඇතුළු සංස්කෘතිය ඇතුළු ජාතික ප්‍රශ්න පමණක් රට කොටස් කිරීම ය. එනම දෙමළ ජනයාට එක් විශේෂ කොටසකුත් මුස්ලිම් ජනයාට තවත් විශේෂ කොටසකුත් වශයෙන් බෙදීම යි. මෙහි ඇති ප්‍රධානම හා භයානක ම විහිළුව වන්නේ බහුවිධ සමාජයේ ප්‍රධානතම ජාතිය වන සිංහලයන්ට එසේ වෙන් වූ විශේෂ කලාප යක් නොමැති වීම යි.

උතුරු නැගෙනහිර කලාපවල දෙමළ හා මුස්ලිම් රාජ්‍යයන් හෝ ඒකකයන් බෙද ප්‍රශ්න විසඳීමෙන් පසුව අනෙක් සෙසු පළාත් අටකට (8) කඩන්නේ කුමක් සඳහා ද ? එවිට මධ්‍යම – සබරගමුව – ඌව පළාත්වල වතු දෙමළ මළයනාඩුවට නැවත පාර කැපේ.

මෙම සියල්ලේ ම සමස්ත අර්ථය එක් මධ්‍යම බලාධිකාරයක් මඟින් මෙතෙක් ව්‍යවස්ථා සම්පාදනය, විධායක හා අධිකරණ වශයෙන් බලය ක්‍රියාත්මක වීම ඇනහිට ඒ ඒ ප්‍රාදේශිකයන් තුළ ස්වාධීන රාජ්‍යයන් බිහි වීම යි.

එහි අවසන් ප්‍රතිඵලය වසර 2500ක් තිස්සේ මේ රටේ රාජ්‍ය ආගම වශයෙන් බුද්ධාගමේ ක්‍රියාත්මක බව ඇනහිටීම යි. එවිට 9 වන වගන්ති යෙන් බුද්ධාගමට දී ඇති ප්‍රමුඛ තැන දෙමළ රාජ්‍යයේ මුස්ලිම් රාජ්‍යයේ පසු කලෙක මලයනාඩුවේත් නීති මඟින් ම ප්‍රතික්ෂේප වේ.

හින්දු ආගම හෝ මුස්ලිම් ආගම තම ප්‍රාදේශිකය තුළ ප්‍රමුඛ ආගමක් වශයෙන් ක්‍රියාත්මක වන නීති සම්පාදනය කර ගැනීමට ඒ ඒ ප්‍රාන්තවලට හැකි වේ. එසේ සම්මත කර ගත් අන්‍ය ආගම් සුරක්ෂිත කොට පෝෂණය කිරීම එකී ප්‍රාන්ත රජයේ වගකීම බවට නීති පැනවේ. එවිට රට පුරා පැවති බුද්ධාගමේ ප්‍රමුඛස්ථානයට සිදු වන්නේ කුමක් ද ?

වත්මන් මැලේසියාවේ මුස්ලිම් ආගමේ ප්‍රතිශතය 40%කි. අනෙක් 60% මුස්ලිම් නොවන ක්‍රිස්තියානි, බෞද්ධ, සීක් වැනි ආගම්වලින් සමන්විත වේ. එහෙත් ප්‍රාන්ත රාජ්‍යයන්ගෙන් යුත් සංධීය රාජ්‍යයක් වන මලාසියාවේ ද මුළු රටේ රාජ්‍ය ආගම වශයෙන් මුස්ලිම් ආගම නීතියෙන් සැලකෙන ආකාරයට නීති පැනවේ.

එයට හේතුව එකී ප්‍රාන්තයන් බෙද ඇත්තේ ජාතිය, භාෂාව හෝ ආගම ගැන සලකා ගෙන නොව රටේ භූගෝලීය පිහිටීම සලකා ය. සෑම තැනම විසිරී සිටින ජනවර්ගවලින් යුත් ඒකීය රටක් එක් ජනවර්ගයකු

උවමනාව පිට (දෙමළ ජාතිවාදයේ) කෘත්‍රිම ලෙස නැවත ඒකාබද්ධ කර (උතුරු-නැගෙනහිර) නැවත කඩා විසුරුවා නැවත එක්සත් කිරීමට (කෘත්‍රිම) ලෙස තැත් කරන්නේ මේ රටේ පමණි.

අනාගමික ප්‍රාදේශීය රාජ්‍යයන් තුළ පවතින බෞද්ධ වෙහෙර විහාරස්ථානවලට දෙවියන්ගෙ ම පිහිටයි. සියලු බලය ඒකරාශී කර ගෙනත්, ඒවා ත්‍රස්තවාදීන්ගෙන් බේරා ගත නොහැකිව සිටින අද දවසේ ත්‍රස්තවාදය හා බෙදුම්වාදය නීති ගත කළ පසු ඒවාට දෙවියන් වහන්සේගේ ම පිහිටයි. උතුරේ නාගදීපයත්, යාපනයේ නාග විහාරයත් කඩා විනාශ කළ අයුරු නාග විහාරයේ දෙළොස් රියන් බුදු පිළිමයේ ගෙල වටා ටයර් මාලයක් දමා ගිනි අවුලුවා පැය ගණන් පිළිස්සෙන්නට හැර විනාශ කළ අයුරු අපේ ස්වාමීන් වහන්සේලා සිහි කිරීම වටී. සියලු බලතල ඇති ඒකීය රාජ්‍යය තුළ අරන්තලාවේ භික්ෂු ඝාතනය, තන්තිරිමලේ නාහිමියන් සහ දිඹුලාගල නාහිමියන් දෙමළ ජාතිවාදීන් විනාශ කිරීම සිහි කිරීම වටී. මෙම සියලු අනාගමික ප්‍රාන්තවලින් බුදු දහම නිෂේධ වී ගොස් දළදා වහන්සේ රැක ගැනීමට මලයනාඩුවේ අනාගත ත්‍රස්තයන් සමඟ අපට යුධ කිරීමට සිදු වනු ඇත.

දෙමළ කලාපයේ සහ මුස්ලිම් කලාපයෙන් බුද්ධාගම නෙරපා දමා ඒ ඒ ආගම් ඒවායේ රාජ්‍ය ආගම් වශයෙන් ස්ථාපිත වන විට ඉතිරි කොටස් වල ද බුද්ධාගම රාජ්‍ය ආගම් වශයෙන් සුරක්ෂිත කිරීමට නීති සකසා තිබෙනවා ද ?

මෙම යෝජනා සම්පාදකයන්ගේ ප්‍රධාන අවශ්‍යතාව වන්නේ මේ රටින් බුදු දහම ක්‍රමයෙන් තුරන් කිරීම බව මෙම යෝජනා දෙස විචාරාත්මක ව බැලීමේ දී මොනවට පැහැදිලි වේ. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියේ ඇති ප්‍රතිපාදනයන් ගැන සඳහනක් වත් නැති ව සංවෘත ලැයිස්තුවේ (මධ්‍යම ආණ්ඩුවේ) 51 විෂයයට බෞද්ධ ධර්මය කියන අපැහැදිලි ආකාරයෙන් ඇතුළත් කර ඇත. මෙම කරුණු සම්බන්ධයෙන් ඕනෑම භික්ෂූන් වහන්සේ නමක් සමඟ තර්ක කිරීමට, අදහස් හුවමාරු කර ගැනීමට හෝ අදහස් දැන ගැනීමට අප සූදානම් ය.

එසේ නොවුනහොත් එයින් ගම්‍යමාන වන්නේ මෙම අදහස් සත්‍ය බව යි. එසේ නම් අද දවසේ භික්ෂූන් වහන්සේ නමකට කර ගත හැකි ලොකුම පිංකම බුද්ධාගමත් බුද්ධ ශාසනයත් මෙරටින් තුරන් කිරීමේ යම් අරමුණු ඇතිව ඉදිරිපත් කර ඇති මෙම යෝජනා මුළුමනින් ම ප්‍රතික්ෂේප කිරීම යි. තර්කානුකූල නොවී විචාරශීලි නොවී මේවා පිළිගැනීමෙන් පෙන්නුම් කරන්නේ තමා දරා සිටින බුද්ධ චීවරයට හා තම හෘදය සාක්ෂියට විරුද්ධව කුමක් හෝ ලාභ අපේක්ෂාවකින් කටයුතු කිරීම ය.

# නිර්මාණවාදී හා බෞද්ධ මත සැසඳුම

## නිර්මාණවාදී අන්‍යාගමික මතය

1. සත්ව ඝාතනය කළ හැකිය ; ඒ දේව කැමැත්තයි.
2. දෙවියන් පවසන ලදැයි සඳහන් සියල්ල සත්‍යය ලෙස පිළිගත යුතුයි.
3. මරණින් මතු තිරිසන් ආදී ආත්මවල නූපදී.
4. ලෝකයේ ශ්‍රේෂ්ඨතම තැනැත්තා මැවුම්කරු දෙවියාය.
5. සමාව ගැනිමෙන් පව් නැසේ.
6. සියළු ක්‍රියාවන්ට දෙවියන් මූලිකය.
7. නිදහස් ලෙස සිතිය නොහැකිය.
8. සියළු බාහිර මත ප්‍රතික්ෂේප කළ යුතුය.
9. අනිකුත් සියළු ආගම් වැනසිය යුතුය.
10. ප්‍රාතිහාර්‍ය්‍යය උතුම්ය.
11. දේව වචනයෙන් පිට සිතිය නොහැකිය.
12. භක්ති මාර්ගය උතුම්ය.
13. යාඥාව අත්‍යවශ්‍යය.
14. අදහන්නන්ට වරප්‍රසාද සෙස්සන්ට දඬුවම්.
15. තම ආගම අදහන්නන්ට පමණක් අනුකම්පාව හිමිවේ.
16. දේව නියමයට අනුව විපාක සිදුවේ.
17. යහපත් අයහපත් විපාක දේව කැමැත්තයි.
18. ලොව මැව්වේ සර්වබලධාරි දෙවියාය.
19. ලොව ඇති හැම දෙයම දේව මැවීම්ය.
29. නිර්මාණවාදය විශිෂ්ඨ ඥගැන්වීමකි.
21. ලොව මැවූ දෙවියා සදාකාලිකය.
22. අමරණීයත්වයට ඇත්තේ දේව මාර්ගයයි.
23. ලොව සිටින්නේ මැවුම්කරුවූ එකම දෙවියෙකි.
24. ආගම ලෝවට ලැබුනේ දේවදූත මාර්ගයෙනි.
25. පොතේ සඳහන් සියල්ල එලෙසම පිළිගත යුතුය.
26. ලොව මැවූ දෙවියා ගැන ප්‍රශ්න කළ නොහැකිය.
27. තමාගේ පිහිට දෙවියන්ය.
28. ආගම් නිර්මාණවාදීය.
29. දෙවියා අචින්ත්‍යය.
30. නිර්මාණවාදි චින්තනය රහස්‍යය.

## බෞද්ධ මතය

1. සත්ව ඝාතනය පාපයකි.
2. දෙවියන් හෝ කවුරුන් කීවද සත්‍යයට පටහැනි නම් භාර නොගත යුතුය.
3. සිදු කළ කර්මවලට අනුව සුදුසු ආත්මවල උපදී.
4. ලෝකයේ ශ්‍රේෂ්ඨතම සත්වයා මිනිසාය.
5. සිදු කරන ලද පව් සමාකරන්නෙකු නැත.
6. සියළු ක්‍රියාවන්ට මනස මූලිකය.
7. නිදහස් ලෙස සිතිය හැකිය.
8. සියළු බාහිර මත විමසා බැලිය යුතුය.
9. සියළු ආගම්වලට සැලකිය යුතුය.
10. ප්‍රාතිහාර්‍ය්‍ය වෛශ්‍ය වෘත්තිය බඳුය.
11. මිනිස් සිත නිදහස්ව පැවතිය යුතුය.
12. ඥාණ මාර්ගය උතුම්ය.
13. වන්දනා මාර්ගය ගුණ ඇගැයීමකි.
14. වරප්‍රසාද හෝ දඬුවම් දෙන්නෙක් නැත.
15. සියළු සත්වයන්ට කරුණා මෛත්‍රිය හිමි විය යුතුය.
16. කර්ම නියමයට අනුව විපාක සිදුවේ.
17. අයහපත අධර්මය සහිත ලොව මැව් නම් ඔහු අධාර්මිකයෙකි.
18. ගුණධර්ම පිරි සශ්‍රීක ලොවක් නොමැවූ දෙවියා ලොව වැනසූ අයෙකි.
19. ලොව සියල්ල නියාම ධර්මයෝය.
20. අංග සම්පූර්ණ මෝඩකමකි.
21. දෙවියන් බමුන් සහිත මුළු විශ්වයම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණත්‍රයට යටත්ය.
22. අමරණීයත්වයට ඇත්තේ සීල, සමාධි, ප්‍රඥ මාර්ගයයි.
23. විවිධ කුසල් කළෝ විවිධ දේව ආත්ම ලබති.
24. බුදුන්වහන්සේ කිසිවෙකුගේ පණිවිඩකරුවෙක් නොවේ.
25. පොතේ ආ පමණින් පිළිගත යුතු නැත. ධර්මවිනය හා සැසඳිය යුතුය
26. සර්වඥතාඥාණය වුවද විමසිය හැකිය.
27. තමාගේ පිහිට තමන්මය.
28. බුදු දහම පමණක් හේතුඵලවාදීය.
29. පන්සිල් රකින ගිහියාට පවා දෙවියන් පුදයි.
30. බුද්ධ ධර්මය විවෘත වන තරමට බබළයි.

—ගුණරුවන්

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : ..2017-10-03......................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ....S. A. C. Sadaruwan...................................

Signature : ..........................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN..........................................................

Name : T.N. NEIGHSOOREI..........................................................

Signature : ..........................................................

Mrs ... REI

Sab... of Sri Lanka

...anka

Date : 2017-10-03.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*